

# ප්‍රේම හිරු

එඩ්වඩ් මල්ලවආරච්චි

kathapothak.blogspot.com

## එඩ්වඩ් මල්ලවආරච්චි ගේ
## වෙනත් නිර්මාණ


ප්‍රාර්ථනා
පූජා
පූජා ප්‍රාර්ථනා
ආරාධනා
ආශිර්වාද
සංසාරේ
සතිනි
ලොකු දුව
හිමි අහිමි
පුංචි හෝනා
ප්‍රණාම
ඉසනැලි
චාතුර්යා 1
චාතුර්යා 2
චාතුර්යා 3
චාතුර්යා 4
පිබිදෙන්න ඉඩදෙන්න
අපර්ණා
චේතනා
කවිදෝ ඇවිදින්
උපාධිකා


මෙය මවිසින් රචනා කරන ලද අනිත් නවකථා වලට වඩා තේමාව විසින් වෙනස්ය. ජීවත්වීමේදී හැම පුද්ගලයෙක් කෙරෙහිම උන්නති කාමය තිබිය යුතුය. මිනිසුන් ඕනෑවට වඩා සම්පත් කෙරෙහි තණ්හා යාමට වෙරදැරීම ජීවිතයේ විවිධ ප්‍රශ්න ඇති කිරීමට හේතුවී ඇත. අද මෙවා රටේ ව්‍යාධි බවට පත්ව තිබෙන සමාජවිද්‍යාත්මක ප්‍රශ්නය.

මගේ නිර්මාණ කරණයට දිරිදෙන කුරුණෑගල මහජන බැංකු ප්‍රාදේශීය කාර්යාලයේ මූලස නිලධාරී සරත් කොඩිලවත්ත, පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ සුනිල් බණ්ඩාර, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජවිද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය බී. ටෙනිසන් පෙරේරා, කොතලාවල හමුදා අභ්‍යාස විද්‍යාලයේ සාජන් මේජර් සුසිරිපාල යන මිතුවතුන්ට මගේ ස්තූතිය පිරිනමමි.

ලේඛන කලාවේ විවිධ අංශයන්හි ජ්‍යෙෂ්ඨයෙකු වන මා මිත්‍ර කුමාර කරුණාරත්නයන් මේ කෘතිය පිළිබඳව අදහස් දැක්විය. බත්තරමුල්ල පර්ෂද විද්‍යාලයේ ආචාරිනී ශාස්ත්‍රවේදි ධම්මිකා රත්නායක, ශාස්ත්‍රවේදි දමයන්ති සෙනරත් මහත්මිය ද අදහස් දැක්වූහ.

අවසාන වශයෙන් අදහස් දැක්වූයේ මගේ බිරිඳ වන ලලිතා විසිනි. කිසියම් කලා කටයුත්තකදී එම චරිතයට හිමි භූමිකාව නිදහස්ව නිරූපනය කිරීමේ නිදහස ලේඛකයා සතුවිය යුතුය. මෙහි එන ඇතැම් චරිත පිළිබඳව අභිරුචියෙන් කළ වර්ණනා පිළිබඳව කුමාර, ධම්මිකා හා මගේ බිරිඳ එතරම් පැහැදීමක් නොතිබුණ බව මම වටහා ගතිමි. ඔවුන් පැවසුවේ යළි මේ පිළිබඳව සිතා බැලිය යුතු බවය. ස්වයං වාරණයට යටත්ව ඇතැම් කොටස් සංස්කරණය කිරීමෙන් අනතුරුව ඔබ වෙත ඉදිරිපත් කරමි. මෙහි ගුණ දොස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇත්තේ ඔබටයි.

එඩ්වඩ් මල්ලවආරච්චි

200, කොස්වත්ත,
තලංගම.

'ප්‍රථම හිරු' පිළිබඳ සියළු විමසීම් :

එඩ්වඩ් මල්ලවආරච්චි
200, කොස්වත්ත, තලංගම
දුරකථනය - 074 403759






දමිතා හදිසි අනතුරකින් මිය ගිය සාජන් මේජර් සෝමරත්නගේ දේහයට අවසන් ගෞරව දැක්වීමට තලාගේන පොදු සුසාන භූමියට ගියේ ඔහු සිය සැමියාගේ සමීපතම මිත්‍රයෙක් වූ බැවිනි. තවත් බොහෝ කලක් අප අතර ජීවත් විය යුතු පුරුෂයෙක් රට ජාතිය වෙනුවෙන් දිවි පුදා ඇත. මහා විශාල පිරිසක් රැස්ව සිටියත් පරිසරය පුරා පැතිර තිබුනේ මූසල නිහඬ බවකි. හමුදා අවසන් ගෞරවය දැක්වීම සඳහා වැයෙන බියුගලයේ පසු බැසීමේ වාදනයේ හඬ පරිසරය පුරා පැතිර ගියේ හදවත් තුළට වේදනාවක් පිවිසවමිනි.

සෝමරත්න හා සිය සැමියා වන රංජිත් පෙරේරා හමුදාවට බැඳී ඇත්තේ එකටය. උසස්වීම් ලබා ඇත්තේ

එකටය. එහෙත් රංජිත්, සෝමරත්නට වඩා දඩබ්බරයෙක් නිසා ඔහුට ලැබිය යුතු උසස්වීම් දෙකක් මග හැරී තිබුණි. සෝමරත්න ඉතා සංවිධානාත්මක ජීවිතයක් ගත කළ අයෙකි. මාලබේ ඉඩමක් ගෙන හොඳ නිවසක් සාදා ඇත. ගෙට ගෙවදින උත්සවයට ගිය මොහොතේ දමිතාට තමා ගැන දුකක් ඇතිවුණි. රංජිත්ට මෙවැනි ජීවිතයක් නැත. සෝමරත්න මිය ගියත් දූ දරුවන්ට යැපෙන්ට මගක් උදාකරදී ඇත. හොඳට කන බොන විනෝද වන රංජිත්ට මිතුරන් වැඩිය. අනාගතයක් ගැන සිතීමට ඕනෑකමක් නැත. පරිසරයේ නිහඬ බව බිඳිමින් කිසිවෙක් මියගිය සෝමරත්න වෙනුවෙන් ගුණ කථනයක යෙදෙනු ඇසේ. කෙලින් නොකිව්වත් දමිතාගේ හදවතේ සැඟවුණු බියක් ඇත. කවදා හෝ තමාටත් මෙසේ ශෝක දායක අත්දැකීමකට මුහුණ දීමට සිදුවෙනැයි යන බිය සිතෙන් ඉවත් වන්නේ නැත. කාලයත් සමග හිත හදාගෙන ජීවත් වුනත් මෙවැනි අවස්ථාවල යළි ඉස්මතු වී එයි.

ආදාහනාගාරය දෙපස නැඟිගත් අරලිය ගස්වල සුදු හා රතු මල් පිපී ඇත. නටු වලින් ගිලිහුණු මල් සුසාන භූමියට පැමිණෙන්නන්ගේ පාවලට පොඩි වෙමින් පවතී. සෝමරත්නගේ බිරිඳ වන අනෝමාගේ මුහුණ දෙපස සිප ආචාරකර සමුගත් දමිතා මාවතට බැස්සේ මුසුප්පු වූ සිතින් යුතුවය. දමිතා අගනුවර උසස් විදුහලක සේවය කරන පුහුණු ගණිත ගුරුවරියකි. විදුහලේ සිටිනා අනිත් ගුරුවරියනට සාපේක්ෂව තමාගේ දියුණුවක් නැති බව ඇය දනී. ප්‍රධාන හේතුව රංජිත්ගේ උනන්දුවක් නැතිකමය. දැනට සිටින ජයවඩනගම නිවසද ගත්තේ තම උත්සාහය නිසාය. දැන් ඇය සූදානම් වන්නේ රංජිත් හමුදාවෙන් ඉවත් කර රට යැවීමටය. සැමියාගේ ජීවිතය බේරාගැනීම හා මුදලක් උපයා හොඳ



ගෙයක් දොරක් සාදා මෝටර් රථයක් මිලදී ගැනීම වැනි සිතේ සැඟවුනු බලාපොරොත්තු ඇත. සටනේදී හටයන් මිය ගියාට රංජිත්ට නම් ගානක්වත් නැත. ඉකුත් නිවාඩුවට පැමිණි අවස්ථාවේ තම සැමියා හා මේ පිළිබඳව කතා කළ හැටි දමිතාට සිහිවෙයි.

"යුද්ධ කරන කොට එහෙම තමා. දෙපැත්තෙම මැරෙනවා. ඔයා බය නැතිව ඉන්න. දමිතා මට හමුදාව දාල නම් එන්න බෑ."

"කියන දේ අහන්න රංජි. ඒ පැන්ෂන් එක ඕනෑ නෑ. මම ඔයාට රට යන්න සල්ලි බඳින්නම්. එක අවුරුදු දෙකක් වැඩ කළොත් අපේ වැඩ ටික කරගන්න පුළුවන්." රංජිත් පිළිතුරක් දුන්නේ නැත.

"අනික ඔයාට මොනව හරි වුනොත් දරුවො දෙන්නයි මායි අනාථ වෙයි." දමිතා පහත්වී හිඳන ගවුමෙන් කඳුළු පිස දමමින් කීවාය.

"චි... චි... ඒක කොච්චර කැත කතාවක්ද මැරෙයි කියන බයට හමුදාව දාල එන්න බෑ. අනිත් එක අපි පැන්නොත් මිලිට්‍රි පොලිසියෙන් අපිව අල්ලනවා."

"හිරේ දාමට කමක් නෑ. ඔයාව මරන්නෙ නැහැ. මම මාරුව හදාගෙන මැණික්හින්නෙ අපේ ගෙදර යන්නම්..." ඇය රෝමයන් ගෙන් ගැවසීගත් සැමියාගේ ළයෙහි හිස හොවා ගනිමින් කීවාය.

"දූන් අජානිට අවුරුදු 12 යි. කොයි වෙලේද දන්නෙ නෑ. එතකොට වියදම් වැඩි වෙයි. වගකීම් වැඩි වෙයි. මෙච්චරකල් හමුදාවෙ හිටියා. ඔයා කීයක් ඉතුරු කරල තියෙනවද?"

ගියවර නිවාඩුවට රංජිත් පැමිණි වෙලේ ඔහු හා කතා කළ හැටි දමිතාට සිහිවෙයි. බසය ඉදිරියට ඇදී යයි. ඇය දෙනෙතේ නැගුණු කඳුළු පිස දමා ගත්තාය. ජයවඩනගම නිවාස සංකීර්ණය අසල රථය නතර කරන තෙක්ම ඇය සිහිකරමින් ආවේ සැමියා ගැනය. පරිසරය අඳුරෙන් වට වෙමින් තිබිණි. මාවත දෙපස සමාන්තරව නැගීගත් විථි ලාම්පුවල ආලෝකය අඳුර පලවා හරිමින් තිබුණි. මීට ඉහත ඇද හැලුණු වැස්සට, අබලන් වූ මාවතේ තැනින් තැන වූ කුඩා වලවල්වල වතුර පිරී ඇත.

ගේට්ටුව විවෘත කරත්ම දුව ඉදිරියට දිව එන අයුරු දමිතා දුටුවාය.

"අම්මා ගමේ ආච්චි අම්මා ආවා" අජානි මවගේ අතේ එල්ලෙමින් කීවාය.

"අම්මා ආවෙ කා එක්කද?"

"ලොකු පුංචිත් ආවා."

නිවස ඉදිරිපස වූ පයිප්පය වෙත ගිය ඇ කලින් සූදානම්කර තබාගිය දෙහි බැය හිස අතුල්ලා මුහුණ සෝදාගෙන නිවස තුළට ගියාය. අම්මා හා ලොකු නංගී පැමිණ සිටිනු දැකීමෙන් ඇගේ සිතට පිවිසුනේ අමතර ශක්තියකි.

"අම්මා කොයි වෙලාවෙද ආවෙ?" දමිතා කුඩය හා බෑගය සාලයේ වූ මේසය මත තබමින් ඇසුවාය.



"මෙහෙට එන කොට තුන විතර වුනා. මෙට ක්ලිනික් ඩේට් එක හින්දයි ආවෙ. ගිය සැරෙත් එන්න බැරිවුණා" ඉස්කෝලෙ හාමිනේ දුව දෙස බලමින් කීවාය.

දමිතා තමා දෙසට එන හංසිනී දෙස බැලුවාය. ඇය නිදහසේ වැඩුණු උඩවැඩියාවක් මෙන් මනා හැඩරුවින් යුතුය. කහ පැහැයට හුරු ජවි වර්ණය, සණව වැඩුණු නිල්වන් ඇහිබැම, සිහින් නාසය, දෙතොල් පෙති, කෙනෙකුට දෙවරක් නොව ඊට වඩා බැලීමට සිත් දෙවයි. හංසිනී අක්කාගේ උරමත අත තැබූවාය.

"කවද අක්කා මැරිල තියෙන්නෙ?"

"අනේ ලොකු නංගි අපේ රංජිත්ගෙ හොඳම යාළුවෙක්. පොඩි නංගි ඇටෙන්ඩ් වෙච්ච වෙලේ මැණික්හින්නටත් ආවා. පව් දෙයියනේ" දමිතා කම්පා වූවාය.

එකවර සැවොම දුකේ කොටස් කාරියන් වූහ.

"මේවා ඇහෙන කොට මගෙ ඇඟ පත හීතල වෙනවා. කන කැමක් පත්තියම් වෙන්නෙ නෑ. ලොකු දුව."

"මම දවසකට දාස්වාරයක් ඉපදිලා මැරෙනවා අම්මා. මට හම්බවෙලා තියෙන්නෙ කියන දේ අහන කෙනෙක් නෙමේ. මම දැන් කියල තියෙන්නෙ මටයි දරුවන්ටයි ආදරයක් තියෙනව නම් රස්සාවෙන් අස්වෙන්න කියලයි" දමිතා සුසු සාරියෙන් දෙනෙත් පිසිමින් කීවාය.

"රස්සාවෙන් අස්වෙලා මොනවා කරන්නද?" දමිතාගේ මව ඇසුවාය.

"රට රස්සාවකට යන්න මම දූන් සල්ලි බැදලත් එක්ක. අවුරුදු දෙකක්."

"අවුරුදු දෙකක් අක්කට ඉන්න පුළුවන්ද?" හංසිනි ඇසුවාය.

"දූනටමත් එන්නෙ මාස තුන හතරකට සැරයක්නෙ. මට දූන් ගානක් නෑ. අනික මෙහෙම ඉඳල බෑ අපිත් දියුණු වෙන්න ඕනෑ."

ඉස්කෝලෙ හාමිනේ ලොකු දුව දෙස බලා සිටියේ දුකින් යුතුවය. මේ හැම දෙයක්ම සිදුවූයේ දමිතාගේ හිතුවක්කාරකම නිසාය. ඇය විවාහකර දීමට සිටියේ අමුණුගම පාසැල් ගුරුවරයෙකුටය. මීට වසර දහතුනකට ඉහත බාරයක් ඔප්පු කිරීමට දළදා මාළිගයට පැමිණි හැටි ඉස්කෝලෙ හාමිනේට මතකය. තරුණ පිරිසක් එදා වන්දනාවේ පැමිණ සිටි බවක් ඇයට මතක නැත.

දමිතා හා රංජිත් ආදරයේ බහ තෝරා ගන්ට ඇත්තේ එදා බව ඉස්කෝලෙ හාමිනේ දූන ගත්තේ පසුවය. ලොකු දුව හොඳ කඩවසම් ඉලන්දාරියෙක් සමඟ වැව රවුමේ කතා කරමින් සිටි ආරංචිය නිවසට ලැබුනේ කුවීන්ස් හෝටලයේ සේවය කරන තැයෙකු මගිනි. රටේ ත්‍රස්තවාදී කලබල පැවැති සමයේ හමුදා අනුකණ්ඩයක් සමග පැමිණි උත්තුංග දේහධාරී හමුදා නිළධාරියාට විරුද්ධව වචනයක් ගලපා ගැනීමට නොහැකි වුණි. තෙදවත් ලෙස පැසූ "ප්‍රථම හිරු" මෙන් වූ එම පෞරුෂය තම බෑණා වීම වැළැක්වීමට ඇයට පුළුවන් වූයේ නැත. මේ හැම දෙයක්ම සිදුවූයේ ඔවුන්ගේ මනාපයටය.



දමිතා පිළිබඳව කැමැත්තෙන් අමුණුගම ගුරුවරයා පැමිණියත් ඇය ඊට කැමැති වූයේ නැත. අවුරුද්ද හා ඉකිරි වන්නට වී හාල් හා හොඳට ඉඩකඩම් ඇති ඔවුන් ගමේ වැදගතුන්ය. දමිතා කැමති වූයේ කඩවසම් පිරිමි කමටය. මුහුණ පුරා වැඩුණු රැවුල, ලෝමයන්ගෙන් ගැවසී ගත් ශක්තිමත් උරපතු සහිත රංජිත් හා අමුණුගම පාසැල් ගුරුවරයා ගැන සලකන විට ඔහු හෝන්ජල් පිරිමි අරික්කාලකි. දමිතා සමස්ත ජීවන ගමනම වෙනස් කර ගත්තේ පිරිමියෙකුට තිබී නියම පිරිමි කමට වශී වීම නිසාය. දුව දිගු කල්පනාවකට වැටී සිටිනු දුටු ඇගේ සිතේ ඇතිවූයේ දුකකි. මේ කිසිවකට තමා වැරදි නැත.

"මේවා අපේ කීමට කරපු ඒවා නෙමේනෙ ලොකු දුව."

"ඔය හැමදාම කියන කතාව නවත්තන්ට අම්මා. මම මේ ඔලුව ගින්දර අරන් ඉන්නවා. අම්මා මේ විකාර කියනවා."

"උඹලට අපි කියන කතා වැරදිනේ. ඕනෑ දෙයක්"

ඉස්කෝලෙ හාමිනේ නැගිට කාමරයට ගියාය. රාත්‍රී ආහාර ගනිද්දී ද මතු වුනේ මේ කතාවය. හංසිනී නම් අවංකව සොයුරිය පිළිබඳව දුක්වූවාය. අක්කා වෙතින් රංජිත් අයියා ගේ වැරදි කියවුනත් ඇයට නම් ඔහුගේ කිසිදු වරදක් පෙනෙන්නේ නැත. ඇත්තටම එවැනි පිරිමියෙක් ලැබීමට ගැහැණියක් පින්කර සිටිය යුතුය. ඕනෑම තැනකදී පළවැන්නෙක් මිස දෙවැන්නෙක් නොවේ. අක්කා පවසන්නේ උපයන මුදල මිතුරන් සමග නාස්තිකරන බවය. මත්පැන් පානය කළත් වෙනත් අය මෙන් වෙරිවී පිස්සු නටන අයෙක් නොවේ. ඔහුට බැරි දෙයක් නැත. අවුරුද්දට වරක් ඔහු මැණික්හින්න නිවසට

එයි. එවැනි දිනෙක ඔහු වැඩිපුරගත කරන්නේ හංසිනි සමගිනි. ඇත්තටම තමා සංගීතය විෂයක් ලෙස හැදෑරීමට පෙළඹුනේ රංජිත් අයියාගේ මග පෙන්වීම නිසාය. මදක් කට තෙත් වූ විට ඔහුට ගී ගැයීම අවශ්‍ය වෙයි. ඔහු තරමක් ශාස්ත්‍රීය ගීත ප්‍රිය කරන්නෙකි. සයිගාල්, හේමන්ත කුමාර්, මුකේශ් වැන්නවුන්ගේ ගීත ප්‍රියකරයි. මුළු නිවසම නව පණක් ලබන්නේ ඔහු මැණික්හින්නට පැමිණි පසුය. සංගීත ගුරුවරියක් වීමේ බලාපොරොත්තුව සිතට ඇතුල් කළේ රංජිත් විසිනි. නැඟීගිය සංගීතවේදී බී. වික්ටර් පෙරේරා ඔහුගේ හිතවතෙකි. හංසිනිට එතුමා යටතේ සංගීත හදාරන්නට අවස්ථාව ලැබුනේ මේ දන හැඳුනුම්කම නිසාය. පණ්ඩිත් රවි ශංකර් හා උස්තාද් අල්ලා රක්කාන් ශ්‍රී ලංකාවට පැමිණ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වූ ප්‍රසංගය නැරඹීමේ අවස්ථාව ලද්දේ රංජිත් අයියා නිසාය. සිය ඉඟ දෙපැත්තෙන් තදකර අල්ලා තමා ගැයුමට වඩා නැටුමට හොඳ බව කී හැටි මතකය. මෙවන් පිරිමියෙක් ලබන ගැහැණිය වාසනාවන්තය.





## 2

"ලොකු නංගි" අක්කාගේ හඬින් හංසිනී කල්පනා ලොවින් මිදුනාය.

"ලොකු නංගි මේ නයිට්ටිය ඇඳගන්ට"

දමිතා සොයුරියට රෝස පැහැති නිදන ගවුමක් දෙමින් කීවාය.

"මේක හොඳ වැඩියි අක්කා මට වෙන එකක් දෙන්ට"

"මේක එච්චර හොඳ එකක් නෙවේ නංගි යනකොට ගෙනියන්ට."

රංජිත්, මේ නිදන ගවුම් මිලදී ගත්තේ හමුදාවේ සේවා වනිතා ඒකකය විසින් පවත්වන ලද පොළකිනි. රංජිත්

හංසිනීටත් ගවුමක් මිලදී ගෙන ඇයට දෙන ලෙස කිවවත් දමිතා එය සොයුරියට දුන්නේ නැත. වරක් දෙවරක් ඇඳ නංගිට දීම ඇයගේ සිරිතකි.

හංසිනි මෙවර ඇඳගෙන විත් සිටින සල්වාරියද තිළිණ කරන ලද්දේ ද රංජිත් විසිනි. ඔහු අවුරුද්දට තත්තලට රෙදි ගන්නේ බිරිඳගේ සහෝදරියන්ටත් එක්කය. ඔහු ඇතැම් යට ඇඳුම්ද මිලට ගන්නේ හංසිනීටත් එක්කය. මෙවන් අවස්ථාවල දමිතාගේ සිතේ කිසියම් ඊර්ෂ්‍යාවක් ඇතිවුනත් තනියම විඳ දරා ගනී. දමිතා කෝප වන්නේ මෙවැනි සීමාවක් නැති වියදම නිසාය. මැණික්හින්නට යන්නේ හැම බඩුවක්ම කුළී රියේ දමාගෙනය. ඔහු සිටින දවස්වල කිසිවෙකුගෙන් වචනයක් ඇසීමට වැඩ කරන්නේ නැත. හංසිනී නම් දමිතක්කාගේ හැසිරීම් දනී. ඇය තමුන්ගේ සහෝදරියන්ට වුනත් වැඩිපුර සලකනවාට කැමති නැති බව දනී.

හංසිනී නේවාසිකාගාරයේ සිටිනා කාලයේ හමුදා ඇඳුමෙන් සැරසී ඔහු නේවාසිකාගාරයට යයි. ඔහු ගැහැණු ළමයෙකුට අවශ්‍ය හැම දෙයක්ම ගෙනියයි. කෑම බීම ගෙනෙන්නේ තනිව කෑමට නොවේ. එම උපකාර කරන්නේ අක්කාට රහසිනි. මෙවන් හොඳ ගති ගුණ ඇති තැනැත්තෙකු ප්‍රශ්නයකට මැදිව සිටිනු ඇසීම දුකට කරුණකි.

"අම්මා මෙහෙ ෆෑන් නැතිව ඉන්න බෑ රස්නෙයි. ෆෑන් එක දමා ගන්ට"

"උඹලා මේ හුණ්ඩුව ඇතුලෙ කොහොම නිදාගන්නවද මන්දා"



"මොනවා කරන්නද අම්මා. මේ ටියුෂන් ටික නැත්නම් මම ගමට එනවා. ඇත්තටම අපි ජීවත්වෙන්නෙ මේ ටියුෂන් නිසයි."

"අක්කා ඉතින් රංජිත් අයියා රට යන්න කැමතිද?"

"මොන, තවම කොල්ලා වගෙ නටල කියල ඉන්ට තමයි කැමැත්ත. ඔය රට යවන්නෙ මගෙ බලේට."

එකවරම නිහඬ බවක් ඇතිවුණි. හංසිනි අජානිගේ ඇඳේ පළසක ඇලවුණාය. ඉතා ඉක්මනින් රැකියාවක් සොයා ගත යුතුය. කොළඹ හෝ නුවර සංගීත ගුරුපත්වීමක් ලබාගත හොත් හොඳය. මේ සම්බන්ධයෙන් උපකාරයක් ලබා ගැනීමට සිටින එකම තැනැත්තා රංජිත් අයියා පමණි. ඔහු සමග යන ගමනක් වරදින්නේ කලාතුරකිනි. ඔහු ඉංග්‍රීසි බස හසුරුවන්නේ චතුර ලෙසිනි. තමා සමඟ ගමන් බිමන් යද්දී කොල්ලන්ගෙන් එල්ලවන සරදම් පාලනය කරන්නේ බැණ වැදීමෙන් නොව එකතැන සිට කඳ හරවා ආපසු හැරී රවා බැලීමෙනි. බස්නැවතුම්පළ වෙත ගියොත් පෝලිමක් නැතිව අසුන් ගැනීමට පුළුවන.

"අම්මා..." දමිතා මවට කතා කළාය.

"අම්මා දූන් ලොකු නංගිටත් විසිතුනට ලැබුවා. නිදහසක් වෙන්ට බැලුවෙ නැද්ද?"

"නුවර කච්චේරිය ක්ලාක් කෙනෙකුට කතා කළා. වී පර්යේෂණ ආයතනයෙ කියල කෙනෙකුට කතා කළා. මේ ළමයා මේ පළාත්වල අයට කැමති නැනෙ."

"මේ පළාත්වල තියෙන්නෙ බොරු ශෝභන අම්මා. අලුත්ම සංස්කෘතියක් තියෙන්නෙ. මෙහෙ දූන් රට ගෙවල්වල උයන්නෙත් නෑ."

"මෙයා ඉතින් පවුලෙ අනිත් අයට වඩා පෙනුමට ඉන්න කෙනානෙ. පිරිමියාගෙ හැඩ රුවත් හොයනවා" අම්මා පහත් හඬින් කීවාය.

"කා එක්ක හරි සම්බන්ධයක් තියෙනවද අහන්ට."

"එහෙම දෙයක් තියෙනවද කියල මට අහන්ට බෑ. ලොකු දුවම අහල බලන්ට. එහෙමත් නැතිනම් රංජිත් ළමයට කියල මේ පැත්තෙන් වැදගත් තැනක් බලන්ට."

"සත්තයි අම්මා මට දූන් කොළඹ එපා වෙලා. අපි කොළඹ ඉන්නව නම් ඒ තරගෙට ලැස්ති වෙන්න ඕනෑ. සත්තයි අපේ ස්ටාෆ් එකේ යාළුවන්ගෙ ගෙවල් වලට ගියාම මට ලැජ්ජා හිතෙනව. හැම දෙනාටම කාර් එකක් වෑන් එකක් තියෙනවා. ඒකයි මම රංජිට කිව්වෙ හමුදාවෙන් පැනල හරි ඇවිදින් රට යන්ට කියල."

"පොඩි නංගිව කොහොම හරි කොළඹ ඉස්කෝලෙකට දාගන්ට ඕනෑ."

"මම කතා කරලයි තියෙන්නෙ. උදෙන් නැගිටින්ට තියෙනවා. එහෙනම් නිදාගන්ට."

අම්මාගේ හා අක්කාගේ කතාව නිහඬ රැයේ හංසිනිට ඇසුණි. කපුවන් විසින් ගෙනෙන ලද යෝජනා දෙකටම ඇය



කැමති නැත. විවාහ වීමට ප්‍රථම කෙසේ හෝ ගුරුපත්වීමක් ලබාගත යුතුය. විවාහ වීම පිළිබඳව තම තවම සිතා නැත. ඇයට යළි රංජිත් සිහියට නැගුණි.

පරිසරය අතිශයින් නිහඬය. එම නිහඬ බව බිඳිමින් තිත්ත මැදියම් රැයේ ජීප්රියක් නතර කරන හඬ ඇසුණි. එය ඔබ වෙතදා එන වාහනය නොවේ. රංජිත් ආවානම් ගේට්ටුව ළඟ සිට තම නම ඇමතීම පුරුද්දකි. ගේට්ටුවට ගසන හඬ ඇසී දමිතාගේ දෙපා වලංගු නැතිව ගියේය. මේ පණිවිඩය එන්ට ඇත්තේ සටන් බිමෙනි. දෙවියනේ එහෙම දෙයක් නොවේවා! අනේ රත්තරනේ මම එච්චරම පව් කරලද. ඇගේ හදවත හඬා වැලපෙන්ට පටන් ගත්තේය.

"අක්කා... ජීප් එකක් වාගේ නේද?"

"මගෙ කකුල් දෙක පණ නෑ... ගවුමක් දාගෙන ගේට්ටුව ඇරල බලන්ට..." දමිතා සැටියේ වැතිර කීවාය.

සාජන් මේජර් සෝමරත්න මියගිය පුවතද ගෙනගොස් ඇත්තේ මැදියම් රැයේ මෙවන් වෙලාවකය. හමුදා පිරිස පමණක් මෙසේ එන්නට ඇත්තේ එවන් පණිවුඩයක් පවසන්නට විය යුතුය. හංසිනි නිදන ගවුමට උඩින් හවුස් කෝටයක් දමාගෙන ඉදිරිපස විදුලි පහන දැල්වූවාය.

"අක්කා ඔහොම ඉන්ට මම ගිහින් බලන්නම්" හංසිනි දොර හැර එළියට ගියාය.

"ඇයි කාව හම්බවෙන්නද?"

"මේ සාජන් රංජිත් පෙරේරාගෙ ගෙදර නේද?"

"ඔව් ඇයි?"

"අපි යුදහමුදා පොලිසියෙන්. කරුණාකරල දොර අරින්න."

කතාව සිදුවෙමින් පවතිද්දී දමිතා ගේට්ටුව අසලට පැමිණ එය විවෘත කළාය. ගේට්ටුව විවෘත කළ සැනින් හමුදා පොලිසියේ නිලධාරීන් ගෙවුයනට කඩා වැදුනහ. නිවස වටා හමුදා මුර යෙදූ හමුදා නිලධාරියෙක් අමිතා අසලට ආවේය.

"කතා කරන්න සාජන් රංජිත්ට"

"එයා ජැෆ්නා ගිහින් මාස තුනක් වෙනවා. ඇයි මොනවත් කරදරයක්ද?"

"අපිට බොරු කරන්න එපා. අපි ඇතුළට එන්න කලින් සාජන්ට එන්න කියන්ට."

"මාත් මේ මහත්තයා එනකල් බලාගෙන තමයි ඉන්නෙ. දළදා හාමුදුරුවන්ගෙ පිහිටයි. කරදරයක් නෑ නේද, ඇවිදින් බලන්ට."

හමුදා නිලධාරි නිවස පරීක්ෂා කළහ.

"රංජිත්ට මොකද වෙලා තියෙන්නෙ?"

"එයා හමුදාවෙන් පැනලා. අපිට අහුවුනොත් කරදර වෙයි. ඇවිදින් පොලීසියට හරි හමුදාවට හරි බාර වෙන්න කියන්න."



හමුදා පොලිසියේ නිලධාරීන් ගිය පසු දමිතා සාලයේ අසුන් ගෙන සිටි අම්මා අසලට ගියාය.

"අම්මා..." දමිතා අම්මා අසළින් ඉඳගත්තාය.

"මොකද මෙ ය් රංජිත් ළමයව හොයන්ට ඇවිදින් තියෙන්නෙ?"

"ඇවිදින් තියෙන්නෙ හමුදා පොලිසියෙන්. රංජිත් හමුදාවෙන් පැනල ඇවිදින් කියලයි කියන්නෙ."

"අක්ක නේද රංජිත් අයියට පැනල එන්න කිව්වෙ?"

"ඔව් කිව්වා තමයි." දමිතා කීවාය.

හංසිනී උඩ ගවුම ගලවා දමා යළි දරුවා ළඟ නිදා ගත්තාය. ඇගේ සිතේ අක්කා කෙරෙහි කෝපයක් ඇතිවුනි. මෙයා හමුදාව දාලා එන්න කියල දන් නොදන්නව වගේ කතාව. මෙහි නින්ද එතරම් සුවයක් නැත. ඇය පාන්දර පිබිදුනේ අක්කාගේ හඬිනි. රංජිත් හිටියා නම් අක්ෂි සායනය වෙත අම්මා යවන්නේ ඔහු සමගිනි. පෝලිම් තුණ්ඩු කොපමණ තිබුණත් ඔහු කෙලින්ම දොස්තරවරයා වෙත කැඳවාගෙන යයි.

"ලොකු නංගි මම අම්මාගේ ඇස් දෙක දොස්තරට පෙන්නල එන්නම්. හරිද? අයියාව හොයන්න හමුදාවෙන් ආව කියන එක කාටවත් කියන්ට එපා."

ඇය හිසවනා පිළිතුරු දුන්නාය.

දමිතා රෝහලට යනතෙක්ම කල්පනා කරමින් ගියේ රංජිත් ගැනය. ජුබිලි කනුවේ සිටින ඊ.කියා ඒජන්සිය අයිතිකාර තැනැත්තාගේ බිරිඳ දමිතා සේවය කරන ගුරු මණ්ඩලයේ විද්‍යා ගුරුවරියකි. සැමියා කම්කරු දෙපාර්ටමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වරයෙකි. ඔවුනට සල්ලි ලැබෙන්නේ වක්කඩ කැඩුවාක් මෙනි. නිවසට යාබද කොටසේ ගසා ඇති විද්‍යා පන්තියේ අකුරු සිඳුරු නැතිව සිසුන් සිසුවියන් පිරී සිටිති. රජයේ විද්‍යාලයේදී එතරම් උනන්දුවක් නැතිව උගන්වන ඇ නිවසට එන අයට හොඳින් උගන්වන බවට ප්‍රසිද්ධය. වතුර පොදක් හා ගැනීමටවත් කෑමට වෙලාවක්වත් ඇයට නැත. මෙතරම් සිසුන් නැතිවුනත් මසකට සෑහෙන ආදායමක් දමිතා ලබයි. කටාර්හි රජමාලිගයේ ආරක්ෂක නිලධාරි තනතුර රංජිත්ට ලැබෙන බවට හොඳටම විශ්වාසය. ඉන්පසු හොඳ තට්ටු දෙකේ නිවසක් සාදාගැනීමට හැකිවනු ඇත. එම බාස්ලා ලවාම උපකාරක පන්ති සඳහා වෙනම හට් එකක් ගසා ගත යුතුය. හොඳ රටයක් දූනට පාවිච්චි කරන කලු සුදු රූපවාහිනිය වෙනුවට හොඳ වර්ණ රූපවාහිනියක් වැනි දේ ඇගේ සිතේ ඇත. නිවස සාදා තරමක පිරිතක් කියා වස් දොස් ඇරිය යුතුය. ස්ටාෆ් එකේ අම්මණ්ඩිලාට නොකියා බෑ. සිය වාරය එනතෙක් රෝගීන් මැද සිටින විට ඉස්කෝලෙ හාමිනේට හිස කැක්කුම හැදෙයි.

"රංජිත් ළමයා හිටියා නම් මෙලහකට පෙන්නලත් ගිහින්."

එසේ කියද්දී දමිතාගේ දෙනෙත් කඳුල නැගුණි. කොහෙ හැංගිලා ඉන්නවද, මොනවා කැවද දන්නෙ නෑ. ඇය ලේන්සුවෙන් දෙනත් පිසදා ගත්තාය.



"අඩන්ට එපා රංජිත් පොඩි ළමයෙක් නෙමෙයිනෙ. ඉවසල ඉන්න කොයි වෙලේක හරි ගෙදර එයි."

"අම්මාව ගෙදරට ඇරලලා මම ඒජන්සියට ගිහින් ටිකට් එක ඇවිද්ද කියල බලන්නම්."

"බොහොම සිහි බුද්ධියෙන් වැඩ කරන්න ඕනැ වෙලාවක් මේක. තමුන්ගෙ හිතවත් කෙනෙකුට වුනත් රංජිත් ළමයා හැංගිලා ඉන්න තැන කියන්ටත් එපා."

"ඔව් අම්මා මට නම් කිසි කෙනෙක් විශ්වාස නෑ. මම හිතන් ඉන්නේ එහෙම විශ්වාසවන්ත තැනක් නැතිවුනොත් මැණික්හින්නට එවන්ට."

"ඔව් ඒක හොඳා. අපේ වලව්වට වුණාම කාටවත් හොයන්න බෑ."

අම්මාගේ මුහුණේ ජයග්‍රාහී හිනාවක් මතුවුණි. දමිතා ගේ සිතේ බර අඩුව ගියේ ඉන් පසුවය. අම්මාගේ ඇස් පරීක්ෂාවට ඊළඟ දිනය ජූලි 26 ට යෙදී තිබීම ගැන දමිතාගේ සිතේ ඇතිවූයේ දුකකි. අම්මාට දැන් කිට්ටුම තැනක තිබෙන දෙයක් දකිමට නොහැකි තරම් ඇස් දුර්වල වී ඇත. රජයේ රෝහලේ පොරොත්තු ලේඛණයේ සිට ශල්‍යකර්මය කිරීමට තව බොහෝ කලක් ගත වනු ඇත. පෞද්ගලික රෝහලක නම් එක දවසකින් කිරීමට පුළුවන. කාචය යෙදීම සඳහා ශල්‍යකර්මය කිරීම රෝහල් ගාස්තු වශයෙන් විශාල මුදලක් වැය කිරීමට සිදුවෙයි. රංජිත් ගේ පිටරට ගමනට වියදම් කළේ සෑහෙන අමාරුවකිනි. වෙන්පට, මගුල් මුද්ද හා එක වළල්ලක් හැරුන

විට සියලු රන් අබරණ උගස් කර ඇත.

"ප්‍රයිවෙට් හොස්පිටල් එකක ඔපරේෂන් එක කරන්න පුළුවන්. ඒත් මා ගාව සල්ලි නෑ අම්මා."

"මා ගැන දුක්වෙන්ට එපා. මට මෙහෙම කව කාලයක් ඉන්ට පුලුවන්."

"මෙයා රට ඇර ගත්තොත් මට එක මාසෙකදි දෙයියන්ගෙ පිහිටෙන් අම්මාගේ ඇස්වලට ලෙන්ස් එක දාන්ට පුළුවන් වෙයි."

රෝහලේ සිට පැමිණි වහාම දමිතා සොයුරියට කතා කළාය.

"ලොකු... රංජිත් අයියා ආවද?"

"නෑ අක්කා... මාත් බලන් හිටියෙ ඒකයි."

"ලොකු දුව... රංජිත් ළමයා නාවින්නෙ අම්මලාගේ ගෙදර ගියාද දන්නෙ නෑ."

"කොහෙද නාවින්නෙද? වැඩක් නෑ අම්මා. එහෙම ආවත් රංජිත්ගෙ අම්මා අපට කියන එකක් නෑ."

"ඒත් මේ වගෙ වෙලාවක රහසින් සොයා බලන එක හොඳා. සමහරවිට ඒගොල්ලන්ගෙ හිතවත් තැනක ඉන්නවද දන්නෙ නෑ."

මේ සිද්ධියෙන් හංසිනී බෙහෙවින් දුකට පත්ව සිටියාය. නිවසේ පිරිමි නොසිටියත් පවුලට එක්වූ පිරිමියා කරදරේක වැටීමත් සිත් වේදනා ගෙන දෙන සුළුය.



"රංජිත්ලාගෙ නංගිලාට හෙම හරි සාරයි. රෙදි කෑලි බිස්නස් එකෙන් හරියට හම්බ කරනවා. රංජිත්ලගෙ අම්මා ගෑණු දම්මලා ලේඩිස් අන්ඩ වෙයාර්ස් මස්සනවා."

"දියුණු වෙලා ඉන්න එක රංජිත්ට හොඳයිනෙ."

"එච්චර ඇඳුම් මහනව, මෙන් දූවේ ගන්න කියල එක ජංගි පොඩියක් මේ කෙල්ලට දීලා නෑ. මට දුක මෙයා යුද්ද කරලා දුකසේ හම්බ කරන සල්ලිත් ගන්ට බලා ගෙන ඉන්න එකයි."

"ලොකු දුව ඒවට මොකුත් කියන්න එපා."

"මම ඒවා ගැන අහන්නෙ බලන්නෙ නෑ. මම මහරගමට ගිහින් එන්නම් කියල රංජිත් අම්මාට සල්ලි දීලා එනවා."

දිවා ආහාරයෙන් පසු සූදානම්වූ අම්මා එළියට ආවාය. හංසිනී සල්වාරිය බැඟයේ දමා කහ මල් සහිත ගවුමකින් සැරසී සිටියාය.

"ලොකු දුවට මේ දවස්වල වියදම් ඇතිනේ" ඉස්කෝලෙ හාමිනේ දුවට මුදලක් දෙමින් කීවාය.

"එපා අම්මා. ඔයා තියාගන්ට."

"මට පැන්ෂන් හම්බවුණා."

ඇය සිනාමුසු මුහුණින් දුව අත මුදල් තබා පොඩිදුවගේ මුහුන සිප ගත්තාය.

"අපිට ළඟදීම පොඩි මඟුලකට එන්නවෙයි වාගේ."

ඇඟපත පුරෝදා මුහුණ තෙල් පෑ ගැන්වුණු යොවුන් වියේ එළිපත්තේ සිටින මිණිපිරියගේ මුහුණ සිපගනිමින් කීවාය. දමිතාගේ මුහුණේ අහිංසක සිනාවක් මතුවුනි.

"මාත් මේ අම්මට කිව්වෙත් ඒකයි. තව කිසි දෙයක් හැදුවෙ නෑ. එහෙම වුනොත් හෙට්ටි වීදියට ගිහින් ගන්නවා."

"තනිකරන්ට එපා."

දමිතා පහත්වී මවට වැන්දාය. ඒ අනුව ආච්චි අම්මාට දරුවන් ආචාර කළහ.

පිටකොටුවට ගොස් ඉන්ටසිටි බසයකට නැගුණ හංසිනි දිගු කල්පනාවකට වැටුනේ අම්මා නින්දට ගිය පසුවය. වායුසමනය කරන ලද බසයේ සිටින ඇයට මද ස්වරයක ගීයක් ගැයෙනු ඇසේ. එය තනිවීම වෙන්ව යාම පිළිබඳව වූ විරහ ගීතයකි. පෞද්ගලිකව තමාට නොවූවත් රංජිත් අයියාට සිදුව ඇති විපත පිළිබඳ වේදනාවක් සිතේ ඇත. ඔහු කොහේ ගියාද? ජයවඩනගම නිවසට ඒමට පෙර ඔවුන් වැඩි වශයෙන් ජීවත්වූයේ හමුදා නිල නිවාස වලය. හැම පාසැල් නිවාඩුවකටම හංසිනිට අක්කාගේ තනියට යාමට සිදුවෙයි. එසේ සිටියදී හමුදාවේ නිලධාරීන්ගෙ නිවාසවල පැවැත්වෙන සාද වලට යාමට සිදුවෙයි. ඒ හැම විටකදීම කැපී පෙනෙන පෞරුෂය වන්නේ රංජිත් අයියාය. අණදෙන නිලධාරියාට පවා රංජිත් අවශ්‍යය. උත්සවයේ නිවේදකයා, ගායකයා, රංගන ඉදිරිපත් කරන්නාද ඔහුය. බොහෝ විට ඔවුන්ට ආශ්‍රය කරන්නට වෙන්නේ උසස් නිළධාරීන්ය. තමා හැම දෙනාගේම



අවධානයට ලක්වූයේ මෙහිදීය. මැණික්හින්නේ මුළු ජීවිත කාලයම හිටියත් කවදාවත් එවන් තේජස් ඇති පිරිමි මූණ ගැසෙන්නේ නැත. මැණික්හින්නට එනවිට හොඳටම රැබෝවී තිබුණි. නංගිගේ තනියට සිටි අමුණුගම නැන්දා ජාතක පොත්වහන්සේ කියවමින් සිටිනු ඇයට ඇසුණි. ඉස්කෝලෙ හාමිනේ නිවසට පිවිස දූඩි වෙහෙස බවින් යුතුව ඇඳේ ඉඳ ගත්තාය.

"අක්කෙ දොස්තර මහත්තයා මොනාද කිව්වෙ?"

"ආයෙ 26 වෙනිදා යන්ට ඕනෑ. කාටෙ දාගන්ට සෑහෙන කාලයක් පෝලිමේ ඉන්ට ඕනෑ."

"අර රංජිත් ළමයා හිටියෙ නැද්ද? ඒ ළමයා මාව ඉස්පිරිතාලෙට එක්කගෙන ගිහින් බෙහෙත් අරන් දුන්නා. තෙරුවන් සරණින් වැඩි වැඩියෙ ලැබෙන්න ඕනෑ."

"රංජිත් ළමයා වැඩනෙ නංගියෙ."

"අක්කා ආපු එක හොඳා. මම හිටියෙ හෙට සිල්ගන්න බැරිවේද කියලයි."

"මාත් මේ දූවගෙන ආවෙ සිල්ගන්නයි."

හංසිනි මුහුණ සෝදා කාමරයට එත්ම බාල සොයුරිය වන දිස්නි ආවාය.

"ඔයා ලොකු අක්කා එක්ක රෙදි ගන්න නිරෝෂී එකට ගියේ නැද්ද?"

හංසිනි ඇඳෙන් නැගිට දොර තල්ලු කර යාබද කාමරයේ

සිටින අමුණුගම නැන්දා දෙස බැලුවාය. ඇය වියන් ඇදේ වැතිර දිගු නින්දක පසුවනු පෙනේ.

"හරි ජංජාලයක් වෙලා." ඇය සොයුරියට රහසින් කීවාය.

"ඇය මොනාද?" දිස්නි සොයුරිය අසල ඉඳගනිමින් ඇසුවාය.

"රංජිත් අයියා හමුදාවෙන් පැනල ගිහින්ලු. ඊයේ රෑ හමුදා පොලීසියෙන් ආවා."

"නෑ...!" දිස්නි දෑස් ලොකුකර දෑත ළයට තද කර ගත්තාය.

"අහුවුනාම වෙඩි තියනවද?"

"නෑ අහුවුනාම මොනායෙක් දඬුවම් දෙනවලු. වද දෙනවලු." හංසිනී කීවාය.

"ලොකු අක්කා මොකද කියන්නෙ?"

"එයා තමයි රංජි අයියාව අමාරුවෙ දාලා තියෙන්නෙ. මිව රට රස්සාවකට යන්ට පැනල එන්ට කිව්වලු. අපේ මෙයාට මොළේ නෑ. අයියා අමාරුවෙ දාලා දැන් අඬනවා."

හංසිනී කතා කළේ අක්කා පිළිබඳව උපන් කෝපයෙන් යුතුවය.

"ජයවඩනගම, වික්‍රමසිංහපුර, නාවින්න වාගෙ තැන්වල



හැංගෙන්න බෑ. පනාගොඩ හැම දෙනාම රංජි අයියාව දන්නවා."

හංසිනී දෙපා වැසෙන සේ පොරවන රෙද්ද ඇඟට දමා ගත්තාය. ඇයට හැඟී යන්නේ පෞද්ගලිකව තමාට වූ කරදරයක් ලෙසය. වෙනත් කෙනෙකුට වඩා හෙතෙම තම ජීවිතයට සමීපව සිටියේය. ගම්බද යුවතියක් ලෙස ජීවිතයේ සම්ප්‍රදායික සතුට තිබුණේ තමාට හුඟාක් ඇතිනි. රංජි අයියා ගෙදර එයි.

# 3

පරිසරයි අතිශයින් නිහඬය. රාත්‍රී දොළහේ කනිසම ඔර්ලෝසුවේ සටහන්වනු ඇසේ. තවම දමිතා වෙත නින්ද ළඟා වී නැත. සෑහෙන කලකට පසු අහස වැස්සකට අර අඳිනු පෙනේ. හමන සුළඟ තෙත් බවින් යුතුය. දාහය නිසා මඳක් විවරකර තැබූ ජනෙල් පියන සුළඟට තල්ලු වී පැමිණ යකඩ පට්ටමේ වදිනු ඇසේ. ඇඳෙන් නැගී සිටි ඈ පෝරණුව යට ජලය කාන්දුවන තැනට ප්ලාස්ටික් බාල්දිය තබා යළි ජනේලය අසලට ආවාය. කන්ද මුදුනේ නිවස පිහිටා තිබීම නිසා නිවාස සංකීර්ණයේ නැගීගත් විදුලි පහන්වල ආලෝකය පෙනේ. ආලෝකය කපාගෙන වැහිබිඳු වැටෙනු පෙනේ.

ජනේලය වැසූ ඈ තමාට නුදුරින් හිඳින දුව දෙස බැලුවාය. නිදන ගවුම විසිරීම නිසා යොවුන් විය කරා එළඹෙන සිරුර පෙනේ. ලොකු ළමයෙක් වූ පසු තවත් සිත්



ගන්නා ලෙස කය වැඩෙනු ඇත. විදුලි පහන නිවා දමූ ඈ යළි දැස් තරයේ වසා ගත්තාය. දරුවන් නින්දේ සුවය විඳිනු ඇසේ.

දැන් රංජිත් කොහේ ඇද්ද? තම උපදෙස් අනුව වැඩකලා නම් මෙලහටත් රටය. කිසි දේක ඕනෑකමක් නෑ. කන්නයි, බොන්නයි, සින්දු කියන්නයි තිබුනොත් ඇති. මාස ගණනාවකින් මේ ඇඳේ පිරිමියෙක් නිදාගෙන නැත. රංජිත් පැමිණියහොත් දරුවන් දෙදෙනා අනිත් කාමර වලට යැවීමට සිදුවෙයි. ඒ අවශ්‍යතා කාරණා කටයුතු වලද වෙනසක් නැත. විවාහවී මධුසමය ගත කිරීමට ගිය දිනට වඩා ඔහු දැනුවත්ව සිටී. සතියක් නතරව සිටියොත් ඇගේ අමාරුවක් කියා හෝ ගැලවීමට පුලුවන් කමක් නැත.

ගැහැණුන්ගේ ඇඟවල් හැමදාම එක ලෙස තිබෙන්නේ නැත. දරුවන් ලැබීමෙන් පසු විවාහයට පෙර තිබූ හීන්දෑරිකම පලා ගොස් ඇඟ ස්ථූලවීම වැළැක්විය නොහැක. හැමදාම කෙල්ලො වෙලා ඉන්නෙ කොහොමද? දැන් කරක් උසට දුවෙක් ඉන්නවා. ගෙදර එන්නේ ඇගේ එල්ලෙන්න බලාගෙනයි. වරෙක ඇගේ මුවගට සිනාවක් නැගෙයි. අපේ කාලෙ වාගේ ළමයි මෝඩ නෑ. අපි හැරෙන කොට උන් දන්නවා.

වැස්ස දිය පීලි ඔස්සේ ගලාගෙන යන හඬ ඇසේ. කිසිවෙක් ගේට්ටුවට ගසන හඬ ඇසී ඈ එකවරම නැගී සිටියාය.

දෙයියනේ ඒ කව්ද ආයෙත් හමුදා පොලිසියෙන්ද! ඈ විදුලි පහන නොදල්වා සවන් දුන්නේ සැලෙන හදවතින් යුතුවය.

වැසි හඬ පරයා නැගුණු කටහඬ ඈ හඳුනා ගත්තාය.

දෙයියනේ රංජි ඇවිදින්. ඇය විදුලි පහන දල්වා කුඩය අකැතිව දූවගොස් ගේට්ටුව විවෘත කර සැමියාගේ අතින් අල්ලාගෙන නිවසට දිව්වාය.

"කටහඬ හඳුනා ගත්තෙ නැද්ද?"

"පස්සෙයි හඳුන ගත්තෙ"

ඔහු තෙත් බර වූ කමිසය ගල්වා බිරිඳ අතට දුන්නේය. වහා තුවායක් ගෙනා ඇය ඔහුගේ හිස පිසීමට පටන් ගත්තාය.

"මොකද වුනේ කියන්ට"

"මොකුත් නෑ" ඔහු කලිසම ගලවා බිරිඳ අතටදී කොට කලිසමෙන් සිටියේය.

"කෝ ළමයි දෙන්නා?" ඔහු විදුලි පහන දල්වා ඇඳේ නිදන දරුවන් දෙස බැලුවේය. ලොකු දුව නිදා සිටියේ බිරිඳ යොවුන් වියේ ඇඳ බදා ගන්නා ආකාරයටමය. දූන් ඇය පසුවන්නේ යොවුන් බවේ අබියසය.

"දූව අදත් ඔයා ගැන ඇහුවා. හමුදා පොලිසියෙන් ඔයා බලන්ට ආපු වෙලේ ඉඳන් ළමයි දෙන්නා ඉන්නෙ බයෙන්. දූවට කතා කරන්නද?"

"එපා උදේට කතා කරමු. හමුදා පොලිසියෙන් විතරක් නෙමෙ තලංගම පොලිසියෙනුත් එයි."

ඔහු මේසය මතවූ දුම් වැටියක් දල්වා ගනිමින් කීවේය.



"මට බඩගිනියි කන්න මුකුත් නැද්ද?"

"ඇයි නැත්තෙ ඔයා ආවත් නාවත් ඔයාගෙ පංගුව තියෙනවා. ඔය කෙහෙල්මල විසිකරල ඇඟ හෝදගෙන එන්න. මම කෑම හදන්නම්."

රංජිත් දුම්වැටිය විසිකර නාන කාමරයට වැදුනේය. හමුදාවෙන් මිදී ඒමට සිතේ කිසිම කැමැත්තක් තිබුනේ නැත. මරණයට බියෙන් හමුදාව දමා එන නිවට සිතක් ඔහුට නැත. ජාතිය වෙනුවෙන් දිවි පුදන්නට බියක් නැත. මේ ගමන ආවේ බිරිඳගේ නාහෙන් ඇඩිල්ලෙන් මිදීමටය. තමාගෙන් නොවිමසා රැකියා ඒජන්සියකට මුදල් දී ඇති නිසා මේ තීරණය ගත යුතු විය. දිය බිඳු ගත සිප ගලා ගෙන යනවිට ලොකු සහනයක් දැනුණි.

කොයි මොහොතේ වුවද තමා අත් අඩංගුවට ගැනීමට බැරි නැත. වීසා බලපත්‍රය හා ගුවන් ටිකට් පත ලැබෙන තෙක් සැඟවී සිටිය යුතුය. නාවින්නට මේ වනවිටත් පොලීසිය යන්ට ඇත. මීගොඩ නෝනක්කලාගේ නිවසද පනාගොඩට කිට්ටුය. අපේ පොරවල් සෙට් කරල අල්ලලා දෙයි. රංජිත් තුවාය දවටාගෙන කාමරයෙන් පිටත පැමිණියේ කල්පනා කරමිනි. ගෙලට හා කිහිලි වලට ස්ප්‍රේයරය අල්වා ගත් ඔහු ගියවර පැමිණි දිනයේ දමා ගිය ඕල්ඩ් බාගය ගෙන අමුවෙන්ම බිව්වේය. මඳ වේලාවකට පසු දමිතා ඔහු සොයමින් ආවාය.

"හාතේ මම මේ කෑම ඇරල එනකල් බලා ඉන්නවා. දිවැස් තියෙන හැටි. කොහෙද ඕක තිබුනේ?"

"ඉව තියෙනවා" ඔහු දමිතාගේ කරවටා අතක් දමා ළඟට

තද කරගත්තේය. ඇය මෘදු ලෙස සැමියාගේ අතින් අල්වා ගත්තාය. ඔහු කිසි ආවරණයක් නැති ඇගේ හිස් පපුවට තදවුණි.

"මේ ඇඟිල්ලට මොකද වුනේ ?"

"පොඩි තුවාලයක් වුණා."

ඔහු තවත් වීදුරුවක් පුරවාගෙන කෑම මේසයට ගියේය. හමුදා භටයෙකු වූ රංජිත්ගේ රුචි අරුචිකම් ඇය මැනවින් දන සිටියාය. බිත්තර ඔම්ලට්, පපඩම් අච්චාරු වැනි දෑ ඔහු ප්‍රිය කරයි.

"පොඩි නෑ, ඔය විනාඩියට ඔක්කොම බිව්වද?"

"පශ්චාත් පරීක්ෂණ අවශ්‍ය නෑ. මට හැන්දක් ගේන්න."

සෑහෙන කාලෙකට පසු ඔව්හු ඔවුන්ගේ ලෝකවල තනිවූහ. දරුවන් දෙදෙනාට එම කාමරය දී ඔව්හු යාබද කාමරයට ගියහ. රංජිත් බිරිඳගේ සැලසුම් කිසිවක් දන සිටියේ නැත. ඇය එන්ට ප්‍රථම ඇඳ විට්ටමට කොට්ටයක් හේත්තු කළ ඔහු මොහොතක් දෑස් පියා සිටියේය. දමිතා සෙමින් සෙමින් පැමිණ රංජිත් අසල ඉඳගත්තාය.

"ඇයි කොර ගහන්නෙ. ආයෙත් වෙරිකෝස්ද?"

"වෙරිකෝස් නෙවේ. මට හරි අමාරු වුණා. දන හිස්ස නවන්න බැරිව ගියා. පස්සෙ ඩොක්ටර් විද්‍යාසාගරට පෙන්නුව."



රංජිත් නිහඬව පහත්වී දමිතාගේ දන මඬල අතගා බැලුවේය. ඇය කීවේ සත්‍යයකි. දනමඬල තරමක් ඉදිමී තිබුණි.

"තවත් පහුවෙලා ආවනම් කොරවෙන්න ඉඩ තිබුණා කිව්වා. දන් නැවෙන්න ඉඳගන්න බෑ."

"ඒක තමා මම මේ ඩොක්ටර් අල්ලන්න කිව්වේ." ඔහු ඇගේ දන මඬල සෙමින් පිරිමැද්දේය.

මේ සියුමැලි සිරුර තම ජීවිතයට නව එළියක් ලබා දුන් හැටි ඔහුට සිහිවෙයි. ඇගේ දේහය රස සාගරයක් වූ හැටි මතකය. සියුමැලි මනස්කාන්ත පැහැය සිත් සතන් සැනසූ හැටි. එහෙත් ඒ දේහය කාලයාගේ ඇවෑමෙන් වෙනස් වූ හැටි. මුනින් තලාවූ විට අද දකින්නේ නිල් නහර මතුවී තරබාරු වන වටොරය. ඔහු ඇයට නොරිදෙන පරිදි සෙමින් දන මඬල පිරිමැද්දේය.

"වෙලාවකට හිතෙනව සිංහල වෙදකම් කරන්න කියලා. කොහෙද මේ අම්මා හොඳ තැනක් කිව්වා එතන නිට්ටාවටම සනීප කරනවලු."

"නෑ නෑ එපා. සිංහල බේත් හොයන්නයි කසාය තම්බන්නයි, ඊටත් වඩා තෙල් ගාගෙන ඉස්කෝලෙ යන්න පුළුවන්ද?"

"දන් ළමයි ටියුෂන් එනවා වැඩියි. මට ඒවා කඩා ගන්ටත් හිත නෑ. සමහර වෙලාවට මගෙ ඇස්වලින් කඳුලු එනවා වේදනාවට. හිටගෙන ඉන්ට බෑ."

"මේ හැමටම කලින් තමුන් සනීප වෙන්න ඕනෑ නේද. මම රට ගියොත් ඔයා තනිව මේ වැඩ කරගන්න ඕනෑ නේද. අහස් මාලිගා ගැන හිතන්ට ඕනෑ නෑ. අපි මේ තියෙන විදිහට ජීවත්වෙමු."

ඇගේ සිතට තරමක කෝපයක් පිවිසුනේ ඉන් පසුවය. ජීවත් වීම තරගයක් බව ඔහුට තේරුමක් නැත. හමුදාවේ සේවය කරන බොහෝ පිරිමි දියුණුවීමට වෙර දරන්නවුන් වෙති. සාමසාධක හමුදාව පැමිණ දිනවල ගෙවල්වල ගැහැණුන්ට ඉන්දියන් සාරි වලින් කිසිම අඩුවක් නොතිබුණි. රත්තරං, බෙඩ් ෂීට්, කුස්සියට අවශ්‍ය තුම්පෙල් උදුන්, පිට්ටු බම්බු, කෝප්ප, පීරිසි, තලතෙල්, හොඳ එළගි තෙල් හමුදා නිවෙස්වල පිරීතිරී ගියේය. ඇතැම් හමුදා නිලධාරීන්ගේ බිරියන් ඒවා මෙහි අලෙවි කළහ. අඩු වශයෙන් රංජිත් එක මේස හැන්දක්වත් මෙහි ගෙනාවේ නැත. අනිත් පිරිමින් මෙන් නොව රංජිත් ඕනෑම ඇඳුමකට හැඩය. ඉන්ඩියන් බඩු සුලභ කාලයේ බ්‍රේස්ලටයක් හා රන් මාලයක් ගන්නා මෙන් ඇය සැමියාට බල කළාය. මේ පවුන් හතරේ මාලය ගත්තේ යාපනයෙන් නොව හෙට්ටි වීදියෙනි. බොහෝ ගුරුවරියන්ට මෝටර් රථ ඇත. එහෙම දෙයක් නැතිව පයින් යාමටද බැරිය. දූන් ගෙදරට රථයක් අත්‍යවශ්‍යය. බොරැල්ල ජයවඩනගම බසය වැඩ කරන්නේ උන්ට ඕනෑවෙලාවටය. ධනවත් ළමුන්ගේ නිවෙස්වල ගොස් ටියුෂන් කිරීමට හොඳ වාහනයක් තිබිය යුතුය. කැලි හැලෙන නයින්ටිය කැඩුනේ ඔහු එය මැණික්ගින්නට ගෙනගිය දවසකය. නැවත එය ගෙනෙන්නට ඇය ඉඩ දුන්නේ නැත. එය ජයවඩනගම දමන්ට ඉඩක් නැත.



"තියෙන විදිහට ජීවත් වෙන හැටි මට කියන්න ඕනෑ නෑ. අපිට නෙමේ මේ දරුවෝ දෙන්නට ලැජ්ජයි."

"හරි හරි කටාර් නෙමේ යක්ෂයගෙ කටට හරි යන්නම් ඒක තමයි ආවෙ?"

ඔහු තරමක කේන්තියෙන් යුතුව කීවේය. යළි නිහඬ බවක් ඇතිවුණි. යළිත් වරක් වැසි වැටෙන්නට සූදානම් වනු දූනේ. ඔහු ඇය ඔසවා ඇඳේ තැබුවේය.

"උංයි කකුල. හෙමින් හෙමින් නවන්න."

ඔහු ගතකළ ඉකුත් මාස කීපය තුළ සතුටක් ලෙස කළේ පොඩි අඩියක් ගැසීමය. සතුරු හමුදා කොහෙන් කඩා වදිද්දැයි බලා සිටිය යුතුය. ගැහැණියකගේ උණුසුමේ සැනසුණු දිනයක් මතක නැති තරම්ය. ඉස්සරනම් මෙවන් කටයුත්තකට දමිතාගේ උනන්දුවක්ද ඇත. සයනය එක් අයෙකුට පමණක් අයිති නැත. ගැහැණියකගේ යොවුන් සිතුවිලි මල්ඵල ගැන්වෙන්නේ පිරිමියෙකුගේ ඇසුර ලද පසුවය. ඇයට තමා කැමති පිරිමියෙකුගෙන් ලිංගික ආශ්වාදය ලැබීමට පූර්ණ අයිතියක් ඇත. සතුට වින්දනයක් බැවින් කිසිම විද්වතෙකුට ඒ පිළිබඳ පෙරවදනක් ලිවිය නොහැක. සතුටේ කොටස්කාරියක වීමට කිසිම විමසීමක් ඇයට අවශ්‍ය නැත. මෑතක සිට ඇගෙන් පිළිබිඹු වන්නේ උදාසීන බවකි. ඔහු උණුසුම් සිරුරෙන් යුතුව ඇය තමා දෙසට හරවා ගත්තේය.

"අනේ මට බෑ රංජ් මට සනීප නෑ" ඇය ඔහුගේ අත ඉවතට කරමින් කෙඳිරුවාය.

"හැමදාම මොනව හරි ලෙඩක්"

"අනේ මට තියෙන අමාරුව මම විතරයි දන්නෙ. දණහිස නවන්න බෑ. හරියට ඉදිකටු අනිනවා"

ඇය නිදහසට කරුණු පවසනු ඇසේ. රංජිත් එතරම කෝප වූ බවක් පෙන්වූයේ නැත. ක්‍රියාන්විත ප්‍රදේශවල සේවයේ යෙදෙන අවස්ථාවල නිවසට ඒමට ලැබෙන්නේ මාස තුනකට පමණ වරකි. ඔහු හා සේවය කරන ඇතැම් නිලධාරීන් නගරයට පැමිණි පසු කායික සුවය සොයා යන හැටි රංජිත් දනී. ඔහු කරන්නේ මේ හැම අමතක වීමට හදට දෙසක් දමා ගැනීමය. නිවාඩුවට පැමිණෙන්නේ සියලුම අඩුපාඩුකම් සපුරා ගැනීමටය. එහෙත් අද ඔහු නින්දට වැටුනේ සුන්වූ බලාපොරොත්තු වලින් යුතුවය. දමිතාද ඒ බව දනී. එහෙත් මේ ඇගේ අමාරු තියාගෙන ඔහුගේ ඉල්ලීමට කැමතිවිය නොහැක. රංජිත් ලෙහෙසියෙන් සතුටට පත්වන්නෙක් නොවන නිසා එවැනි කටයුත්තකට කැමති විය නොහැක.



# 4

රංජිත් වෙත නින්ද ළඟාවීමට ගතවූයේ මද වේලාවකි. එහෙත් දමිතාට නින්ද පෙනෙන තෙක් මානයක නැති තරම් ඈතින් ඇත. වරෙක ඇගේ සිතේ රංජිත් කෙරෙහි දුකක්ද ඇතිවෙයි. වෙනත් පිරිමි මෙන් ඔහු නරක නැත. ඔහු හා බැඳි ඉමිහිරි අතීත සිහිවටන ඇත. හමුදා ඇඳුමෙන් සැරසී මැණික්හින්නට පැමිණි පසු එහි ආඩම්බරය නමාවය. අත්කොට ටීෂර්ටයකින් සැරසී අව් කණ්නාඩි යුවළ පැළඳ සිටින විට හැම දෙනාගේම සිත් ඔහු වෙත යොමු වෙයි. හමුදා නිළධාරියෙකුට කැපී පෙනෙන පෞරුෂයක් දෙන උඩුරැවුල රංජිත්ට සුවිශේෂ පෙනුමක් ලබාදී තිබුණි. බැන්ටම් වේට් බර පන්තියේ බොක්සිං ක්‍රීඩකයකු වූ ඔහු නිසා ගුරුමණ්ඩලයේ පවා ඇයට තත්ත්වයක් ලැබී තිබුණි. ඒ උණුසුමෙ සැනසී

සිටියත් අද මේ රෝගාතුර බව නිසා ටික කලකට ඈත්වී සිටීමට සිදුවෙයි.

ඊටත් වඩා ඔහු පිටරට ගොස් අවුරුදු කීපයක් සිටීමට සිදුවන නිසා දැන්ම සිටන්ම ගැහැණියක ලබන කායික ඇසුරෙන් වෙන්ව සිටීමට පුහුණුවිය යුතුය.

දමිතා සිහිනයක දැවටී සිටියදී ඔහුගෙන් ලද උණුසුමෙන් පිබිදුනි. ඔහු තම බඳවටා අතක් දමාගෙන දිගු නින්දක පසුවනු දුටුවේ. දමිතාට දැන් වැඩිපුර නින්ද යන්නෙ නැත. ඊටත් වඩා නිදාගෙන බැරිය. උදේ හතේ සිට රෑ අට එකහෙතක් විදුලිත් පත්තී පැවැත්වෙයි. අද නම් කොහේවත් යාමට ලැබෙන්නේ නැත. උදෙන්ම මේසන් බාස් වැසිකිලියට කොමඩ් එක සවිකිරීමට ඒමට නියමිතය. දනගිස් නවා ඉඳ ගැනීමට නොහැකි බව රංජිත්ට පවසා බොහෝ කලෙකි. ඔහුට මේවා ගානක් නැත. මේ හැමටම වඩා රංජිත්ට ආරක්‍ෂා ස්ථානයක් සෙවීමට අත්‍යවශ්‍යය. ඉකුත් දින කතා කරගත් පරිදි ඔහුට ඇති හොඳම ආරක්‍ෂක ස්ථානය මැනික්හින්නේ ගෙදරයි. වැඩි දවසකට නොවේ. වීසා එක හම්බ වෙනකල්. දමිතා රංජිත්ගේ අත සෙමින් පසෙකට කර නැගිට විදුලි පහන දල්වා වේලාව බැලුවාය. දෙවියනේ පහට කිට්ටුයි. නිවාස සංකීර්ණය පිබිදෙන්නට ප්‍රථම රංජිත් පිටවිය යුතුය. දමිතා අවට ගෙවල් වල කිසිවෙක් සමග හිතවත් නැත. රංජිත් එසේ නොවේ. බසයෙන් බැස්ස තැන සිට මගදී හමුවන ඕනෑ කෙනෙක් සමග කතා කරයි. ඇතැම් විටෙක ඇය ඔහු තනිකර නිවසට එයි. තමා සමග කතා නොකළත් යාබද නිවසේ දේවිකා රංජිත් සමග එල්ලී එල්ලී කතාවට එයි. මෙහෙ ඉන්නෙ වතුර යටින් ගින්දර ගෙනියන්න පුලුවන් එවුන්. රංජිත් නිදා සිටියේ නියම



හමුදා කාරයෙක් විදිහටය. කවදාවත් නිදා ඉන්නා විට ඇඳුමක් නැත. ඒ ගැන කිව්වත් ගානක් නැත.

"රංජි නැග්ටින්න" ඔහු කොට්ටය බදා මුණින් අතට හැරුණා විනා කතා කළේ නැත.

"තව පොඩ් ළමයි හොඳා, ඇඳුමක්නම් කවදාවත් ඇගේ නෑ." ඇය සරම ගැට ගසමින් කීවාය.

ඔහු නිහඬව ඇය සිය ළයට තදකර ගත්තේය. නිදහස් ළය ඔහුගේ සිරුරේ ගැටුණි. වැඩ දුර දිග යන්ට වෙතැයි ඇයට සිතුනි. ඒ දඟකාරකම් දගමයකිනුදු අඩුවී නැත. උදේ පාන්දර සීතල සුළඟක් කවුලුව තුළින් කාමරයට ගලා එනු දුටුවේ. දැන් දින කීපයක සිට උදේට කොහේදෝ නැති වැස්සක් වැටෙයි. ඇය ඔහුගේ උණුසුමේ මොහොතක් තනිවූවාය. ඇයට ඔහු මුණ ගැසුණේ පාසැල් යුවතියක්ව සිටියදීය. ඒ කඩවසම් සොල්දාදුවා පාසැල් ගවුම පිටින්ම තමා ළයට තදකරගෙන දොතොල් සිපගත් හැටි සිහිවෙයි. නිවසට රහසින් වෙම්බිලි සිනමා ශාලාවේ තනිවූ හැටි ඇයට අද මෙන් මතකය. තවත් බොහෝ කලක් තනිවී සිහිකළ හැකි ඒ සුන්දර අත්දැකීම ලබා දුන්නේ රංජිත්ය.

"අනේ රංජි පරක්කු 'වුණා. පළවෙනි බස් එකේ යන්න ඕනෑ. නැත්නම් ඔයාට කරදර වෙයි."

ඔහු ඇයට නැගිටීමට ඉඩ දුන්නේ නැත.

"අද මහන්සි වුණාට වැඩක් නෑ. ඔයා ගෙදර යන්න මං එන්නම්." ඇය අත ඉවත් කරමින් කීවාය.

ඔහු නිහඬව නැගී සිටියේය.

"දැන් ඔයා මට ගමේ යන්නද කියන්නේ ?"

"ඔව් යන්න."

අජානි යට කලිසම හා බැනියම හැඳ අම්මා ගවුම මදිනතෙක් බලා සිටියාය. පෙරදින රැයේ ඇඳුම් මැද තැබීමට දමිතාට නොහැකිවූයේ රැකියා ඒජන්සිකරුගේ නිවසට යාමට සිදුවූ හෙයිනි. ගුරුමණ්ඩලයේ සිටින බොහෝ ගුරුවරියන්ට මෝටර් රථ ඇත. රංජිත්ට හමුදාවේ සේවය කිරීමෙන් කවදාවත් දියුණුවීමට නොපුළුවන. වැඩිපුර මුදලක් ලැබුණත් එය තමාට රහසින් නාවින්නේ සිටින අම්මාට හා අවිවාහක සහෝදරියට ගෙන දීම ඔහුගේ සිරිතය. තමුන්ටත් ගෑණියෙකුයි දරුවන් දෙදෙනෙකුයි ඉන්නවා යැයි ඔහු සිතන්නේ නැත. ඒ මහ අම්මණ්ඩි මහත්තයාව හූරාගන්නවා.

"අම්මා නංගි ටොයිලට් එකේ ඉඳන් කෑ ගහනවා."

"ආ... දුව ගවුම ඇඳගන්න. මම නංගිව හෝදල එන්නම්."

දමිතා කාමරයෙන් පිටව ගියාය. අජානි ගවුම හැඳ තේ බොන අතර නිවසට පිවිසෙන නාවින්නේ ආච්චි දුටුවාය.

"පොඩ්ඩුව කෝ අම්මා ?" රංජිත්ගේ මව මිනිබිරියගේ හිස අතගාමින් ඇසුවාය.

"අම්මා නංගිව හෝදනවා."



තල්පෙ හාමිනේ කෑම මේසයේ පුටුවක් ඇද ඉඳගත්තාය. මඳ වේලාවකට පසු දමිතා කඩිනමින් සාලයට ආවාය.

"අම්මා කොයි වෙලාවෙද ආවෙ?"

"මේ ආවා විතරයි. ඉස්කෝලෙ යන්නද?"

"ඔව් අම්මෙ උදේට එකම ගිනි යුද්ධයයි. අම්මා උදෙන්ම ආවෙ?"

"පොඩි මහත්තයා හොයන්න ඊයේ රෑ හමුදාවෙන් පැන්නා. ජීප් එක දැක්කම මට කලන්තෙත් හැදුනා. මොකද්ද දමිතා මේ වෙලා තියෙන්නේ ?"

"පෙරේදා හමුදා පොලිසියෙන් මෙහාටත් ආවා. එයා හමුදාව දාලා ඇවිදින්ලු."

තල්පෙ හාමිනේ මුහුණේ අතගසා ගෙන සිටියාය. මඳ වේලාවකට පසු ත්‍රිවිලරයේ සිටි රංජිත්ගේ බාල සොයුරා වන ජගත් නිවසට ආවේය.

"එන්න මල්ලි ඉඳගන්ට." දමිතා කිවාය.

"හිච්චි මහත්තයො අයියව බලන්න පෙරේදා මෙහෙටත් හමුදාවෙන් ඇවිදින් තියෙනවලු. කතාව ඇත්ත, හමුදාවෙන් පැනල ගිහින්."

"තනිකර මෝඩ වැඩක්. තව අවුරුදු හතරක් ඉඳලා ආවනම් ඉවරනේ." සොයුරා කීවේය.

දමිතා පිළිතුරු නොදී නිහඬව සිටියාය. ඔවුනට අවශ්‍යව ඇත්තේ රංජිත්ගේ ජීවිතය නොව ඔහුගෙන් ලබා ගන්නා තෑගිබෝග පමණි.

"දැන් ඉරිදට නිරෝමි බලන්න මනමාලයෙක් එනවා පොඩි මහත්තයා එනවයි කියල ලියුමක් එවලා තිබුනා."

"හැංගිලා ඉන්නව නම් අක්කා ඉන්න තැන දන්නවා ඇති. පණිවිඩයක් අරින්න බැරිද? කට්ටිය එනකොට අයියා ඉන්නවනම් ගේ පිරිලා" එකවරම දමිතා තිගැස්සුනාය.

"මම කොහොමද දන්නෙ. මම දන්නෙත් හිච්චි මහත්තයා දන්න එක විතරයි."

ඔවුනතර තරමක නිහඬ බවක් ඇතිවුණි. දමිතාගේ සිතේ තරමක කෝපයක් ඇතිවුණි.

"දැන් මනමාලයගෙ පැත්තෙන් ආවම ඉස්තෝප්පුව පාළුයි. පොඩි මහත්තයා ආපු වෙලේත් කිව්වා පිත්තල ලාම්පුව ගේන්න කියලා. ත්‍රීවිලර් එකේ යන එකනෙ අපි පිත්තල ලාම්පුව ගෙනියමු." තල්පෙ හාමිනේ කීවාය.

එකවරම දමිතාගේ සිතේ ඇතිවූයේ කෝපයකි. එය මිලයට ගත්තේ පුතා විසින් නොව තමා දුන් 'පිත්තල ලාම්පු' සීට්ටුවෙනි. කෙසේ වුවත් එය ගෙනයාම එපා කීමට පුලුවන් කමක් නැත. දමිතාගේ කිසිදු අනු දැනුමක් නොමැතිව හිච්චි මහත්තයා පිත්තල ලාම්පුව ගලවාගෙන ත්‍රීවිලයට රැගෙන ගියේය.

"දමිතාට පෝය දවසෙ උදේ නමයට දහයට විතර එන්න පුළුවන්ද?"



"පෝය දවසෙ නේද? එන්ට වෙන්නෙ නෑ ටියුෂන් පන්ති තුනක් තියෙනවා."

සිය පිත්තල ලාම්පුව රැගෙන යාම පිළිබඳව කෝපයෙන් යුතුවම දමිතා සූදානම් වූවාය. රංජිත්ගේ මව තමාට වෛනස්කම කරන්නේ විවාහ වී නිවසට කැඳවාගෙන ගිය දින සිටය. දේපල ඉඩකඩම් හා අත කණකර ඇතිව ආවත් රංජිත්ගේ මව තමාට ඇනුම් පද කී හැටි මතකය. ගුරුමණ්ඩලයෙන් පිරිනැමුණු පෝසිලේන් තේපැන් කට්ටලය ඇතුළු තෑගි රැසක් තවමත් රංජිත්ගේ මව ළඟ ඇත. විවාහයට හිත මිතුරන්ගෙන් ලැබුණ මුදල් කවර ඉල්ලා ගත්තේ අම්මාය. රංජිත් කවදාවත් අම්මා සමඟ මේ ගැන කතා නොකිරීම නිසා ඈ වරෙක කෝපවූවාය. කැලි රෙදි විකිණීමෙන් හා ඒවායින් ඇඳුම් මැසීමෙන් ඔව්හු ලොකු ආදායමක් උපයති. මේ හැමටම ආධාර කරන්නේ සිය සැමියාය. එසේ කර තිබියදීත් හැසිරෙන හැටි. ඇයට තම පුතාගේ ජීවිතය අවශ්‍ය නැත. වෙන අම්මලා නම් දරුවන්ගේ ජීවිත රැක ගැනීමට විවිධ උපක්‍රම යොදති. මේ අම්මණ්ඩිට නම් දරුවාට ගෙන ගැහිලා ගියත් කමක් නැත. ඇය නිතරම සූදානම් වන්නේ ලොකු පුතාගේ දේවල් කඩා වඩා ගැනීමටය. තමාට මුදල් දීමට පුරම අම්මාට මුදල් දීම ඔහුගේ සිරිතය. මේ ගෙන ගිය පහන නැවත ආපසු ගැනීම ලෙහෙසි කරුණක් නොවේ. සියළුම නැතිබැරිකම් කියන්නේ රංජිත්ට පමණි. කොච්චර දුන්නත් හැමදාම නැති බණෙම්ය.

ගෙදරට එන දිනෙක දරුවන් දෙදෙනාට ටොෆියක්, විස්කෝතුවක් වත් ගෙන එන්නේ නැත. රංජිත්ගෙන් ගන්නා දේවල් ඔක්කොම දෙන්නේ නංගිගේ දරුවන්ටය. රංජිත් රට ගියාම එවන සල්ලි ගන්නෙ මමනෙ. එක සතයක් දෙන්නෙ නෑ.

රංජිත් හිමිදිරි පාන්දරින්ම නිවසින් පිටව ගියේය. හමුදාව අතැර මෙවන් බියගුලු කටයුත්තක් කිරීමට ඔහුට සිතුනේම නැත. යුධ භටයන් මිය යාම ගැන බිය විය යුතු නැත. එය යුද්ධයේ ස්වභාවයයි. දමිතාගේ කං කෙදිරිය නිසා ඔහු මෙම තීරණය ගත්තේය. තමා සැමියා වුවද පවුලේ හැම කටයුත්තකම ප්‍රධානියා දමිතා වෙයි. තමා වෙනුවෙන් ඉලව් මගුල් කරන්නේ දමිතාය. ඇත්තටම ඇය උත්සාහවන්ත පවුලේ දියුණු අපේක්ෂා කරන ගැහැණියකි. රට යාමට තීරණය කළේ ඇගේ බලවත් ඉල්ලීම නිසාය.

ඔහු නුවර බලා දිවෙන බසයකට පිවිස දෑස් පියා ගත්තේය. අව්කණ්ණාඩිය පැළඳ ගත්තේ කාටවත් අඳුනාගැනීමට බැරිවීමටය. බිරිඳගෙන් උපදෙස් ලැබුනේ දිවා සමයේ ගමට නොයෑමටය. අඳුර වැටෙනතෙක් නගරයේ ඒ මේ අත ඇවිදිමින් සිටි ඔහු තනිකම මැකීමට අවන්හලකටද ගියේය. සොයුරියන් දෙදෙනාට රස කැවිලි හා තනිකම මකා ගැනීමට බෝතල් දෙකක්ද මිලදී ගෙන කුලී රියකට ගොඩ වැදුණි.



# 5

කුලීරිය ඉදිරියට ඇදෙයි. බිරිඳගේ නිවසට ගිය කාලයක් මතක නැත. සැදෑ අඳුර ලොව වටකරගෙන ඇත. ත්‍රිවිලරයේ කැන්වස් රෙද්ද මතට වැහි බිඳු වැටෙයි.

බිරිඳ ගන්නා ලද මෙම තීරණය පිළිබඳව ඔහු කිසිසේත් පෞද්ගලිකව කැමති නැත. පිටරට යාමට සැගවී සිටින්නේ කෙසේද?

ඔහු වලව්ව ඉදිරිපස මාවත අසලින් රථයෙන් බැස්සේය. අඳුර පරිසරය වෙලාගෙන ඇත. වලව්ව දෙසට පියවර මනින විට මලානික එළියක් ඈතට දිස් වෙයි. සෑහෙන කාලයකින් නිවසට යන පාර ශුද්ධ කර නැති බව අඳුරේ පා තබද්දී දැනෙයි. මෙවා ශුද්ධ පවිත්‍රකර සිටීමට හෝ ඒවා පිළිබඳව සොයා බැලීමට

පිරිමියෙක් නිවසේ නැත. ඇතැම්විට මේ උස තණපත් අත විසකුරු සතුන් පවා සිටින්නට බැරි නැත. වලව්වට කිට්ටු වෙද තවමත් නිවස තුළ දැල්වෙමින් පැවති පහනේ ආලෝක පෙනුණි. ගෙනගිය බෑගය බිම තබා ඔහු දොරට තට්ටු කළේය.

"කව්ද?" ඔහුට සිහින් ගැහැණු කටහඬක් ඇසුණි.

"ලොකු නංගි...."

රංජිත් තරමක් උස් හඬින් කතා කළේය. මඳ වේලාවක පසු දොර විවෘත වුණි. ඔහු බෑග් දෙක රැගෙන නිවස තුළ පිවිසුණි. නිදන ගවුම් වලින් සැරසුණ දෙසොහොයුරියන් මුහුණු මත සාලයේ දල්වන ලද පහනේ ආලෝකය වැ තිබුණි.

"අයියා ඔය කොළඹ ඉඳලා එන ගමන්ද?"

"ඔව්. කෝ අම්මා නිදි ද?" ඔහු පොඩි නෑනා දෙස බල සිනාසෙමින් ඇසුවේය.

"අම්මා නිදි. කතා කරන්නද?"

"අනේ එපා. මම මේ රෑ ඇවිදින් නංගිගෙ නින්දට කරදර කරනවා"

"හානේ... මා නම් කොහොමටත් ටිකක් රෑ වෙන කල් ඇහැරලා ඉන්නවා. එන්ට අයියෙ ඇතුළට. මම කාමරය හදල තියෙන්නෙ."

රංජිත් බෑගය රැගෙන නිවස තුළ වූ සුපුරුදු කාමරය ගියේය. බොහෝවිට එම කාමරය වෙන්ව ඇත්තේ කොළ



සිට එන පවුලේ අයටය. කාමරය තුළට පිවිසි සැනින් තේරුම් ගත නොහෙන මහා පාළුවක් දැනුණි. ඔහු පාවහන් ගලවා ඇඳ යටට කර මඳ වේලාවක් නිහඬව සිටියේය. මෙම උණුසුම් කාමරය සැමරුම් රැසකට හිමිකම් කිව හැකි. ඈගේ මවට හොර රහසේ දමිනා සිපගත් දොරමුල්ල තවම පෙර මෙනි.

"අයියේ මුහුණ හෝදාගන්න එන්න."

"හා රයිට් මම එන්නම්"

රංජිත් කලිසම ගලවා සරමෙන් සැරසී විදුලි පන්දමක් ඇතිව එළියට ගියේ යාබද ඇලට ගොස් සිතුසේ ඇඟ සෝදා ගැනීම සඳහාය.

"එන්ට අයියෙ මම බේසමට වතුර දැම්මා."

"අනේ ඇයි අපරාදෙ වතුර දැම්මෙ. මම ඇලට ගිහින් ඇඟ සෝදාගෙන එන්නම්."

"අම්මෝ...! මේ රෑ. දැන් එකොළහට විතර ඇති."

"අපිට ඕවා ගානක් නෑනේ නංගි අපි වැඩිපුර ඉන්නෙ කැලෑවල."

ඇය රංජිත් අයියාට මුහුණ සේදීමට පහසු වනසේ පහණ අල්වා සිටියාය. මුහුණ සෝදා ගත් ඔහු කාමරයට ගියේය. පරිසරය අතිශයින් නිහඬය. ජයවර්ධනගම නිවසේ සිටින විට නිබඳවම වාහන ගමන් කරන හඬ ඇසෙයි. මෙහි සිටියදී තමා හුස්ම ගන්නා හඬ පවා පෙරලා ඇසේ. මෙස

ලාම්පුවේ වූ මන්දාලෝකය කාමරයේ අඳුර පළවා හැර තිබුණි.

"අයියේ...." ඇය දොර රෙද්ද අසල සිට කතා කළාය.

"ඇත්ත කියන්න අයියෙ. කෑවෙ නැතිනම් කමු. බත් තියෙනවා."

"බඩගිනිනම් මම ඉල්ලාගෙන කනවනෙ. ඇත්තමයි කෑවා."

"එහෙමනම් මේ කෝපි එක බොන්න."

"මම හින්දා නංගිටත් කරදරවුණා. නින්දත් කැඩුනා."

"මොන්න වැඩක්. මොන කරදරයක්ද? මම නම් අයියා මෙහෙ හැමදාම වුනත් ඉන්නව නම් කැමතියි. අපි ඉන්නෙ කොච්චර පාළුවෙන්ද?"

ඔවුනතර තරමක නිහඬ බවක් ඇතිවුණි.

"දමිතාගේ පිස්සු වැඩ හින්දා ආමි එකෙන් පැනලා ආවා. නංගිට කතාව ආරන්චි වෙන්න ඇතිනෙ."

"අයියා ආපු එක හොඳා. අක්කා හිටියෙ හරි බයෙන්." ඈ දොරට හේත්තු වී කීවාය.

"මම නම් මේ කැමැත්තෙන් ආපු ගමනක් නෙවේ ලොකු නංගි. අපි උන්ව කවදහරි පරද්දනවා මම බය නෑ. ඒත් මේ අක්කා හැමදාම අඬනවා."

"ඒක ඉතින් සාධාරණයිනෙ අයියෙ. ගැහැණියෙකුට



තමුන්ගෙ සැමියා නැතිව මුළු ලෝකෙම දිනුවත් වැඩක් නැනේ." ඇය බිත්තියට හේත්තුවී කීවාය.

"ආ... මට අමතක වුණා. දමිතා ලොකු නංගිට දෙන්න කියල ලියුමක් දුන්නා."

රංජිත් කමිසයේ උඩ සාක්කුවේ තිබූ ලිපිය හංසිනිට දෙමින් කීවේය.

කාමරයට පැමිණි හංසිනි සොයුරිය විසින් එවන ලද ලිපිය කියවා බැලුවාය.

'ආදරණීය ලොකු නංගි වෙතටයි,

ලොකු නංගි, අයියාට සිද්ධවෙලා තියෙන දේ ලොකු නංගි දන්නවනෙ. මම මේ දේට රංජිව කැමති කරවා ගත්තේ හරිම අමාරුවෙන්. මම ඊයෙත් අයියලා එක්ක හමුදාවෙ හිටපු සාජන් මේජර් සෝමරත්නගේ මළගෙදර ගියා. ඒ පවුල අනාථ වුණා. අපේ රට බේරාගන්න රංජිත් අයියලා වාගෙ වීරයො රටට ඕනෑ. ඒත් ඒ අය මළාම දුක්විඳින්නෙ ගැහැණුයි. ඒ නිසයි මම අයියාව පිටරට රස්සාවක් අරන් දෙන්න ක්‍රමයක් හදාගත්තෙ. අපේ ස්ටාෆ් එකේ ටීචර් කෙනෙක්ගෙ මහත්තයෙක් රට අරින ඒජන්සියක් කරනවා. අනේ ලොකු නංගි මම අතේ තිබ්බච සල්ලියි වළලු මාල ඔක්කොම උගස් කරල සල්ලි බැන්දා. එමිර් වරයෙකුගෙ ආරක්‍ෂක නිළධාරි තනතුරක්ලු. අමාරුවෙන් හරි අවුරුදු තුනක් රස්සාව කරගත්තොත් අපිට ආයෙ දුක් විඳින්න ඕනෑ නෑ. අපේ ස්ටාෆ් එකෙ හැම කෙනාටම කාර් තියෙනවා. රංජි කාර් එකක් ගත්තොත් ටුවරිස් හොටෙල් එකකට දාලා හරි දෙයියනේ කියල ගානක් ගන්ට පුළුවන්.

ඉතිං ලොකු නංගි රංජි අයියාට විසා එක හමුවෙනකල් එයාව පරිස්සම් කරගන්ට ඕනෑ. ලොකු නංගි දන්නවනෙ මෙයාගෙ හැටි. ගෙදරින් පිට අරින්ට එපා. අපේ වලව්ව සැකයි වාගෙ නම් වත්තෙ තියෙන පොඩි ගේ අස්කරල දෙන්න. අනේ ලොකු නංගි මෙහෙ එයාට හැංගිලා ඉන්න තැනක් නෑ. පොලිසියෙන් ආවොත් සොල්දර තට්ටුවෙ කාමරේ හදා දෙන්න. කොහොමටත් අයියා රට ගියොත් නංගිලාගෙ වැඩවලටත් හොඳයි. මට මේ දවස්වල එන්ට විදිහක් නෑ. ටියුෂන් පන්තියට පාඩුයි. එග්සැම් කිට්ටු හින්ද ඉස්කෝලෙ ඉවර වෙලා ගිහින් ගෙදරත් පන්ති කරනවා වෙලාවක් ආපු හැටියෙ එන්නම්.'

හංසිනී ලිපිය කියවා නිම කළේ සොයුරියට උපකාර කිරීමට පොරොන්දු වෙමිනි.

රංජිත් ලද්දේ සුව පහස් නොවූ නින්දකි. පිබිදී බොහෝ වේලාවක් යනතෙක් කොහේ සිටින්නේද යන්න තේරුම් ගැනීමට නොහැකිව සිටියේය. ත්‍රස්තවාදී බංකරයකට පහර දෙන්නට යද්දී පසු බැසීමට සිදුවූ හැටිත් සතුරන් වළල්ලක් සේ සිට පහර දුන් සැටිත් එම අවස්ථාවේ එල්ල කළ පහරින් තමා ජීවිතක්ෂයට පත්වූ හැටිත් ලේ ගලද්දීම තමා දමිතාගේ නම අමතා කෑ ගැසූ හැටිත් ඔහුට මතකය.

තමං සිටින්නේ කොහේද යන්න සිහිවූයේ ලොකු නංගි තේ වීදුරුව හා වතුර කෝප්පය රැගෙන කාමරයට පැමිණි විටය.

තේ පානය කළ ඔහු ජනේලය අසල සිට ගත්තේය. විවර වූ ජනේලය තුළින් කාමරයට සිසිල් සුළං රැල්ලක් පිවිසෙමින්



තිබුණි. ඔහු දුටුවේ දියසිරි කලයක් උකුලේ තබා ගෙන එන තරුණ ගැහැණියෙකි.

නිවසින් පිටත පැමිණි ඔහු වත්ත පහළට ගමන් කළේය. විවාහයට ප්‍රථම තමා හා දමිතා කතා කරමින් සිටි කුඩා ගල් තලය තවමත් එසේමය. දැන් අතු පතරින් ගැවසීම නිසා එම ශෝභාව දැඩි අඳුරෙන් පවතී. මේ වත්තේ දිය පීල්ලට කිසිවෙක් එන්නේ නැත. රට යන තෙක් මෙහි ආරක්ෂාව හොඳටම ප්‍රමාණවත්ය. සරම ඉවත දැමූ ඔහු දිය පීල්ලට බැස්සේය. තමා සොයා එන රුව දුටුවේ බොහෝ වේලාවක් දිය නා ගොඩට ඒමෙන් පසුවය. දෙයියනේ මෙහෙම ඉන්නවා කවරුවත් දැක්කාද?

"කාගෙත් අහලද වත්තෙ ඇවිදින්නට ආවෙ?"

"හා... හා... මෙයත් දැන් මාව පාලනය කරන්න හදනවද?"

"අයියෝ නෑ. මම කරන්නෙ මෙහි නිසි බලධාරියාගේ උපදෙස් පිළිපැදීමයි."

අතු පතරින් ගැවසී තිඳල්ලේ වැඩුණු රුක්ස ගස් නිසා පරිසරයේ අඳුර වැඩිව තිබුණි. තවම උදා සුළඟ කෙත් බරින් යුතුය. ඔවුහු නිවස දෙසට ගමන් කළහ.

"මම ගෙදර මූණ හෝදන්න වතුරත් දාලයි ආවෙ" හංසිනී කීවාය.

"පිස්සුද ලොකු නංගී මොටද කරදර වුණේ ?"

"තුවාය ගේන්නත් බැරිවුණා. ඉන්ට' මම ගිහින් ගේන්නම්" ඇය ඔහු දෙස බැලීමට අසීරුව කීවාය.

"නෑ අවශ්‍ය නෑ මෙහෙම යනවා. ඊයෙ රෑ ඇඟ හේදුවා මදි. ඒකයි වතුරට බැස්සෙ. අපි යමු."

මුහුණ පිසදමා ගත් ඔහු අල්මාරියේ පළිඟු කණ්ණාඩියෙන් සිය ප්‍රතිබිම්බය දෙස බැලුවේය. උඩුරැවුල වවා තිබීම නිසා හමුදා පෙනුම තවත් වැඩිවී ඇත. මෙවැනි රැවුල් ඇති, සිරුර පුරා ගැවසී ගත් රෝම කූපයක් ඇති පිරිමින්ට ගැහැණු කැමතිය. කමිසයක් නැතිවම ඔහු තේ මේසය දෙසට ගියේය.

"කෝ... අම්ම ?"

"අද පසලොස්වකනෙ. අම්මා ගලේ පන්සලේ ගියා සිල් ගන්ට"

"ඇත්තමයි මම හිතුවෙ නැන්දම්මා තවම නිදි ඇති කියලයි. කෝ පොඩි නංගි ?"

"රංජි අයියා එයාව බලන්ට එයි කියල අහංකාර කමට ඇඳට වෙලා ඉන්නව"

ඔහු නිහඬව බාල සොයුරිය නිදන කාමරයට ගියේය. ඔහු ඇය එනතෙක් කොට්ටයේ මුහුණ ඔබා මුණින් තලාවී සිටියාය.

"කවුද දන්නෙ මේ ළමයා ඇහැරල ඉන්නවා කියලා. වෙරි සොරි. වෙරි සොරි."



ඔහු ඇඳේ පසෙක හිඳ සොයුරියගේ හිස අතගෑවේය.

"මන් නෑ කතා කරන්ට" දිස්නි හිස සැලුවාය.

"ඉවස් ඔකේ. එන්න තේ බොන්න"

ඔහු ඇගේ දෙවුරෙන් හිස එසෙව්වේය. තම දූවට වඩා දිස්නි වැඩිමල් වූයේ වසර දෙකකිනි. දිස්නි ලොකු ළමයෙක් වූයේ මෙ ළඟදීය. වැඩිවිය පැමිණි සැනින් සිරුර විසින් ඈ මනාව වැඩී සිටියාය.

"තාකී හුරතල් කරන්නෙ නැතිව එන්ට අයියා"

හංසිනී සිනාසුනාය. මද වේලාවකට පසු බාල සොයුරිය ඔහුගේ අතගෙන කෑම මේසය වෙත ආවාය.

"අයියා ආස නිසා රොටියි ලුණු මිරිසුයි හැදුවා. කැමතිනම් හිල් බතුත් තියෙනවා."

"අපරාදෙ මහන්සි වුණේ මොටද? මම හිල් බත් කනවනෙ. දැන්ම තේ බොන්න බෑ."

හංසිනිට හා දිස්නිට අද ප්‍රීතිමත් දවසකි. අක්කා නොපැමිණීම නිසා ඔවුනු බෙහෙවින් සතුටු වූහ.

"චූටි නංගි අපි ගමනක් ගිහින් එමු"

"කොහෙද යන්න හදන්නෙ. මොනවද ඔහෑ?" හංසිනී ඇසුවාය.

"මම පත්තරෙයි සිගරට් පැකට් එකකුයි අරන් එන්නම්. යමු නංගි"

"ඔකට අයියා යන්න ඕනැ නෑ. අක්කා ලියල තියෙන්නෙ ගෙදරින් හෙල්ලෙන්න දෙන්ට එපා කියලයි."

ඔහු මද වේලාවක් නිහඬව සිටියේය.

"නංගි අර පොඩ්ඩිට කතා කරල, හන්දියට ගිහින් අයියට ඕනෑ දෙයක් ගෙනැත් දෙන්න."

දිස්නි මුදල් ගෙන පිම්මේ දුව ගියාය. දිස්නි පිටව ගිය පසු නිවස තුළ ඇතිවූයේ දැඩි නිහඬ බවකි. දමිතා ඇත සිට හැම දෙයක්ම සැලසුම් කර ඇත. පියා මිය ගිය පසු පවුල මේ තත්ත්වයට ගෙන ඒමට උර දුන්නේ දමිතාය. හංසිනි මහාමායා විද්‍යාලේ ඉගෙනීම ලැබුවේ දමිතා නිසාය. ඇගේ නේවාසික ගාස්තු ගෙව්වේ දමිතාය. එවැනි කැපකිරීමක් කිරීමට හැකිවූයේ රංජිත් වැනි නිර්ලෝභී මස්සිනා කෙනෙක් ලැබීම නිසාය. රංජිත්, හංසිනි නේවාසිකාගාරයේ සිටින විට යුවතියකට අවශ්‍ය හැම දෙයක්ම ඔසවාගෙන යයි. ගැහැණිය ලස්සනට හැඩවැඩ කර ඇන්දවීමට ඔහු දත සිටියේය. තමා ලස්සන කර ඇත සිට හැඩ බලන්නේ ඔහුය. ජීන්ස් කලිසමක් ඇඳ ගමේ සිට යාම අපහසු කරුණකි. එවැනි ඇඳුමක් වුණත් ඇඳීමට දිරි දෙන්නේ ඔහුය. ජයවර්ධනගම පැමිණි පසු කොළඹ සංචාරය සඳහා ගෙන යයි. හමුදා කඳවුරේ සාද වැනි අවස්ථාවල හේ තමා පෙරමුණේ ගෙනයයි.

"එහෙනම් මාව නිවාස අඩස්සියට තබන්නයි කල්පනාව."



"වෙරි සොරි ගෙදරින් හෙලවෙන්න දෙන්න බෑ. මේක අපේ ලොක්කිගෙන් ආපු ඉහළ ටොප් ක්ලාස් නියෝගයක්."

ඔහු ඇගේ දීප්තිමත් සිනාව දෙස බලා සිටියේය.

මැද පෙරදිග යාම සඳහා වීසා ලැබෙන තෙක් මෙහි සැඟවී සිටිය යුතුය. එය කවදා කොයි මොහොතක ලැබේ දැයි කිව නොහැක. මේ ප්‍රශ්නය වඩාත් දරුණු වන්නට ඉඩ තිබුනේ වෙනත් නිවසක සැඟව ඉන්ට සිදුවුණා නම්ය. ඔහු ඉස්තෝප්පුවේ වූ පුටුවක ඉඳ ගත්තේය.

# 6

රංජිත්ගේ නෙත් යොමුව තිබුනේ කැලෑවට ගොස් තිබුණු වත්ත දෙසය. ඔහු මිදුලට බැස්සේය. අඩුම වශයෙන් සෙරෙප්පු යුවලක්වත් නැතිව මිදුලේ වැඩි දුරක් ඇවිදින්ට බැරි තරම්ය. තණ කොළ අතරින් මතුව තිබූ නිදිකුම්බා කටු පඳුරු ඔහු නෙත ගැටුණි. කබරස කොළ හා දණවටක් නැගිගත් මානා හෝ එම පඳුලේ තණගාල දකිමින් සිතට බියක් ඇතිවුණි. මේ නිවසට සතා සර්පයන්ගෙන් අනතුරක් නැද්ද, පසෙකින් නිවසට පහත්ව තිබුණු ගස් නිසා සිංහල උළු වහලේ කොළ රැඳී තිබුණි. වත්ත මැදහරියේ නැගීගත් තිල් උණ ගස් නිසා තවත් අනවශ්‍ය අඳුරක් පරිසරයට පිවිස තිබුණි. ප්‍රධාන හේතුව වත්ට ඇත්තේ මෙවැනි දේවල් සොයා බලා වැඩ කිරීමට කෙනෙක් නැතිකමය.



වත්තට පිවිසෙන අය දෙස රංජිත් ඔනෑකමින් බලා සිටියේය. පත්තරය හා සිගරට් පැකැට්ටුව අතැතිව නිවස දෙසට එන රුව රංජිත්ට හොඳටම මතකය. ඉස්කෝලෙ වලව්වේ වැඩ වලට උදව් පදව් කළ ගොළු කෙල්ල ඉකුත් වසරේ දීග ගොස් ඇත. දකින දවස්වල තිබූ හුරතල් බව තවම පහව නැත. ඇයට තිබුනේ පිරිමියෙක් වසඟයට ගන්නා අමුතුම ලස්සන පෙනුමකි. ස්වභාවධර්මය කොතරම් සාධාරණද, ගොළු තරුණියක් වූ ඇයට පිරිමියෙකුගේ සිත ඇදීයන අඩු නැති රුවක් ස්වභාවයෙන්ම පිරිනමා ඇත. වී කැම්බීමට, වී කෙටීම, ගොයම් වැඩවලට හා කැම පිසීමට පොඩ්ඩි වලව්වට එන බව ඔහු දනී. ඇ රංජිත් දෙස බලා ගෞරව සම්ප්‍රයුක්තව සිනාසුනාය.

"කොහොමද පොඩ්ඩි ?"

ඔහු පත්‍රය හා සිගරට් පැකැට්ටුව අතට ගනිමින් සිනාසුනේය. පොඩ්ඩි ගොළු භාෂාවෙන් විමසුවේ කුමක්දැයි ඔහුට තේරුණේ නැත. ඉස්තෝප්පුවට එමින් සිටි හංසිනි රංජිත් අසලට ගියේය.

"මොනවද පොඩ්ඩි කියන්නෙ ?"

"අක්කයි ළමයි දෙන්නයි කෝ කියල අහනවා" හංසිනි කීවාය.

රංජිත් තමා ඉදිරියේ සිටින ගොළු කෙල්ල දෙස බලා සිටියේය. රෙද්ද සහ හැට්ටය ඇඳ සිටීම නිසා ඇගේ පුළුලුකුල මනාව දිස්වුණි. රංජිත්ට මුහුණ දිය නොහැකිව ඇය බිම බලා ගත්තාය. පොඩ්ඩි ගිය පසු රංජිත් සොයුරිය දෙස බැලුවේය.

"පොඩ්ඩිගෙ මනුස්සයා මොකද කරන්නේ ?"

"ඔය කුලී වැඩ කරන කෙනෙක්. මට නම් මේකි ගැන හරි දුකයි. ඒ මිනිහා හරි බේබද්දෙක්. දිග නොගියා නම් මීට හොඳා."

"දැන් පොඩ්ඩි ඉන්නෙ කොහෙද? මේ ගෙදර නෙමේද?"

"කසාද බැන්දයින් පස්සෙ ඒ දෙන්නට ඉන්න කියලා අපේ වත්තෙ මූරගේ දුන්නා. සමහර දවස් වලට මගෙ තනියට ඉන්නවා."

රංජිත් පත්‍රය පෙරලා බැලුවේය. පත්‍රයේ සිරස්තලයට තිබුණේ හමුදාවෙන් පැන ගිය සෙබලුන් ගැනය. සැඟව සිටීමත් පහසු නැත. රජය පැන ගිය සෙබලුන් ඇල්ලීමට දල එලා ඇත. ඒ සඳහා දැඩි සේ ක්‍රියා කරන බව සඳහන්ව තිබුණි. හංසිනී රංජිත්ගේ පිටුපස සිට පත්‍රය දෙස බැලුවාය.

"ගෙවල්වලට පොලීසියෙන් ආවට මෙහාට එන්නෙ නෑ-" හංසිනී රංජිත්ගේ බිය නැති කිරීමට කීවාය.

"ඒ වුනාට බැරිවෙලාවත් පොලීසියෙන් ගෙදරට ආවොත් ගෘහමූලිකයාට විරුද්ධව නඩු දමාවි. මා නිසා ඔගොල්ලො කරදරේ වැටෙයි."

"මෙවගෙ ආරක්ෂා ස්ථානයක් කොහෙවත් නෑ. මම සොල්දරේ උඩ කාමරය හදල දෙන්නම්. එතකොට ඉවරයි."

"මට මේ නිවාස අඩස්සියෙ ඉන්නද කියන්නෙ? මට බෑ-"



"කියන දේ අහන්නකො. අක්කා කියන්නෙ තියෙන ආදරේ නිසානෙ. හරි පස්සෙ කතා කරමු. එන්න තේ බොන්ට."

රංජිත් අසුනින් නැගිට කෑම කාමරයට ගියේය. ඔහු නිහඬව අසුන් ගත්තේය. හංසිනී කඩිසර ලෙස රංජිත් අයියාට කෑම බෙදුවාය. තේ පානයෙන් පසු ඔහු නිවසින් පිටතට බැස සිමෙන්ති පොළවේ ඉඳ ගත්තේය. පරිසරයේ ඇතිවූයේ නිහඬ බවකි. මඳ වේලාවකට පසු පොඩ්ඩි මිදුල මැද පහත්වී මාගලක් එලනු රංජිත් දුටුවේය. ඉන්පසු තම්බන ලද වී කුල්ලකට දමා මාගලේ අතුරණ අයුරු ඔහු නෙත ගැටුණි. ඇය හැඳ සිටි චීත්තය ඔසවා ඉනේ ගසා සිටියේ වැඩ කිරීමේ පහසුව සඳහා විය යුතුය. බිත්ති කුලුනට හේත්තු වී සිටින රංජිත්ව උස්ව වැඩුණු ක්‍රෝටන් පඳුරු නිසා කිසිවෙකුට පෙනෙන්නේ නැත.

පොඩ්ඩි දකින විට ඇය කෙරෙහි දුකක් ඇතිවෙයි. යොවුන් වියේ සිටින ඇය බෙහෙවින් සුන්දර යුවතියකි. ඇයට මුළු ජීවිතයම ගොළු හීනයක් මෙනි. ආදරය, ස්නේහය, වියෝව, වැනි වේදනා ඉදිරියේ ඇය ගොළුවන රැක්කත් හදවත වැලපෙන විලාශය කිසිවෙකුට නොතේරේ. හැම දුකක්ම හිමිව ඇත්තේ මේ ගොළු කෙල්ලටය. කහපාට මුහුණට උදාහිරු රැස් පැහැය වැටී ඇත. පැහැපත් නාසය පැතලි නුනානම් මීට වඩා ලස්සන වීමට ඉඩ තිබුණි. අත් කොට කළුපාට හැට්ටය නිසා නිරුවත් උරපතු පෙනෙයි. කිසිම ලෙසකින් තම හැඩ රුව ගැන සැලකිලිමත් වන බවක් නොපෙනේ.

රංජිත් පොඩ්ඩි දෙස යොමුවූ නෙතින් සිටිනු දුටු හංසිනී එදෙස බැලුවාය. ඈත තියාගෙන වී අතගානවිට ඇගේ කලවා පෙදෙස ප්‍රදර්ශනය වෙමින් තිබෙන හැටි ඇය දකින්නට ඇත.

ඈත සිට වී මාගල ළඟට පැමිණි හංසිනි පොඩ්ඩි කැඳවාගෙන ගියාය. පොඩ්ඩි යළි ආවේ හොඳට චීත්තය පහළට කර ඇඳගෙනය.

රංජිත් නිහඬව කාමරය තුළට ගියේය. ඒ වනවිට හංසිනි ඇඳුම් මාරුකරගෙන නිවසින් පිටවීමට සූදානම් වෙමින් සිටියාය. පොඩ්ඩි චීත්තය ඇඳගෙන බෑගයක් අතැතිව ඇය පසුපස කඩය බලා ගියාය.

නිවසේ ඒ මේ අත ඇවිදි ඔහුට ගබඩා කාමරයේ ඇති උදැල්ල නෙත ගැටුණි. සරම ගලවා කොට කලිසම පිටින්ම එළියට ගියේය.

රංජිත් අයියා නිවසට එන බව ඇසූ මොහොතේ හංසිනිගේ සිතට ඇතිවූයේ සතුටකි. ඔහු පිරිමින් අතර සුවිශේෂ පිරිමියෙකි. බොහෝ පිරිමි වෙත ගැහැණු ගති ඇත. හිතේ කහටක් නැති, ලෝභ කමක් නැති කෙනෙකුගේ දුකේදී පිහිට වන, කේලම් නොකියන ඔහුගේ සිතේ රංජිත් කෙරෙහි ඇත්තේ අමුතුම ආදරයකි. මට කොච්චර උදව් කරල තියෙනවද? වෙන මස්සිනාල වියදම් යනවට නාහෙන් අඬනවා. රංජිත් අයියා එහෙම නෙවේ. මොනවද නංගි ඕනෑ කියලයි අහන්නෙ. ඔහු සිටින විට මුළු නිවසම පිරීගොස් ඇති බවක් පෙනේ. කරන කියන කිසිවක බරපතලක් නැත. ඔහු තවම පොඩ්ඩන් වියෙන් සමුගෙන නැත. අක්කා සිටියදී තමා ඔසවා මට ගොඩින් එහා පැත්තෙන් තැබූ හැටි. හොඳ මතකයිලයෙ. කරන ඕනෑ දෙයක් එළිපිට. පොඩ්ඩි දිහා බලන හැටි මම දක්කා. මේ මෝඩ පිරිමියෙක් ඉන්න බව දන්නෙ නැතිව වෙනදා විදිහට වැඩ කළා. ඇගේ මුවගට සිනාවක්



නැගුනි. පනාගොඩ සිටියදී ඔහු අක්කාගේ මුහුණ සිප ගන්නා හැටිද දැක ඇත. හිරු මෙන් දීප්තිමත් පිරිමි කමට ඇය කැමතිය. කමිසයක් නැතිව සිටින විට රෝමයන්ගෙන් ගැවසීගත් සිරුර සිහිවෙයි. ඇගේ සිත තුළ පවතින්නේ මෙවන් පිරිමියෙක් පිළිබඳව වූ සිහිනයකි. ඔහු පවුලේ ආරක්ෂාවට සිටින එකම පිරිමියා වෙයි. රංජිත් ආරක්ෂා කිරීම තමාගේ ප්‍රධාන යුතුකමකි.

නිවසේ පිටස්තර කිසිවෙක් සිටින බව කිසිවෙකුට දැන ගැනීමට ඉඩ නොතැබිය යුතුය. පත්‍රය හන්දියේ කඩයෙන් ගෙනාවට ප්‍රශ්නයක් නැත. පෞද්ගලිකව දුම් ඉරීම ගැන අකමැති වුවත් රංජිත් අයියාගේ විනෝදය වසා දැමීමට ඇයට හිතුනේ නැත. ඇය රංජිත්ට අවශ්‍ය කළමනා ගෙන දින කීපයකට ප්‍රමාණවත් බඩු මිලට ගත්තාය. පොඩ්ඩිටද කොහේදෝ නැති සතුටක් ළඟාවී ඇත. ඇය ගොළු බසින් දොඩමලු වනු පෙනේ. අවශ්‍ය බඩුමිලට ගත් හංසිනි ඒවා පොඩ්ඩිට දුන්නාය. නිවසට එද්දී දුටු දසුනින් ඇය පුදුමයට පත්වූවාය. කොට කලිසමකින් හා බැනියමක් හැඳ වත්ත සුද්ද කරන රංජිත් අයියා දුටු ඇය පුදුම වූවාය.

"හානේ... කව්ද මහන්සි වෙන්න කිව්වෙ ඕක තියලා එන්න ගෙට. එන්න ගෙට..."

"මේ වත්ත සුද්ද කරන්න ඕනෑ. සර්පයො ඇති. කෙරකටත් මේක උදලුගාන්න ඕනෑ. ගිහින් මට බොන්න දෙයක් ගේන්න."

නිවසට දුව ගිය හංසිනි රංජිත් වෙනුවෙන් විදුලි

ගෙඩියක් සූදානම් කළාය. පොඩ්ඩිට කෑම පිසීමට උපදෙස් දුන් හංසිනි සිසිල් බීම වීදුරුව සූදානම් කරගෙන ගියාය.

"යමු හෙවනට..." හංසිනී යෝජනා කළාය.

රංජිත් උදැල්ල පසෙක තබා ගස් හෙවන යටට ගොස් ඉඳගත්තේය. මධ්‍යාහ්න හිරු රැස් පොළවට ලම්බකව වැටී තිබුණි. හංසිනී රංජිත්ට දිවුල්කිරි වීදුරුව පෑවාය.

"මොටද අයියෙ මහන්සි වෙන්නෙ. බන්ඩියා ලබන සුමානෙ මේක සුද්ද කරන්න එනවා කිව්වා."

"එහෙනම් බන්ඩියාට දෙන කුලිය මට දෙන්න. එනකොට කතාව ඉවරයි."

"හානෙ පව් කතා කියන්ට එපා." රංජිත් ගස් හේධාව යට ඉඳගත්තේය.

පෙරවරුවේ කපන ලද තණකොළ වලින් නැගුණු නැවුම් කොළ සුවඳ සමග පැතිර ඇත. පරිසරයේ අමුතුම නිහඬ බවක් තැන්පත්ව ඇත. ඈත ඉඳන් හමා එන සුළං රැළි ඇගේ මුහුණේ වැදෙයි. කාගේවත් හව්හරණයක් නැතිව නැගී ගස් වලට නැඟිගත් වැල් එතිම නිසා පරිසරයට අමුතුම හැඩයක් ලැබී තිබුණි.

නිවසට ගිය හංසිනී කැත්තක් රැගෙන ආවාය.

"එපා වැඩකරන්න. නංගී මෙහාට වෙලා ඉන්න..."

"බෑ අයියෙ මාත් වැඩ කරන්නම්. මේ අපේ වැඩෙනෙ."



"එපා එපා... ඔය ලස්සන මූණ කළුවෙලා කැතවෙයි. අව්වෙ ඉන්න එපා." ඔහු ඇගේ අතින් ඇද නිහඬව සිය කැප් තොප්පිය හංසිනීගේ හිසේ පැළැන්දුවේය.

"දූන් නම් නංගි හින්දි නිළියක් වගේ."

"හිනාවෙන්ට එපා. මම එච්චර ලස්සන නෑ..."

මද වෙලාවකට පසු පොඩ්ඩි ඔවුනතරට ආවාය. ඇය පැමිණීම ගැන හංසිනිගේ සිතේ එතරම් කැමැත්තක් තිබුනේ නැත. රංජිත්ගේ මෙම ක්‍රියාව ගැන ඇගේ හිතේ පැහැදීමක් ඇතිබව ගොළු බසින් පැවසුවාය.

එය සුන්දර සන්ධ්‍යාවකැයි හංසිනිට සිතුණි. හිරු බැසයන්ට සූදානම් වෙමින් තිබුනි. දිවා සමයේ දීප්තිමත් ලෙස පායා තිබූ හිරු රශ්මියට තෘණ පත් තැම්බීමෙන් අමුතුම සුවඳක් වහනය වෙමින් තිබුණි. එය ගොයම් පාගද්දී ගොයමින් නගින සුවඳට හුරුය. හංසිනී වෙහෙසට පත්ව සිටියත් පොඩ්ඩි නොනවත්වාම වැඩ කළාය.

"අදට නවත්වමු. අම්මාව එක්කගෙන එන්න පන්සල් යන්ට ඕනෑ."

"නැන්දම්මා තවම මා ආපු බව දන්නෙ නැතිව ඇති"

"අම්මා ඒ බව කිව්වා. පොඩ්ඩියි මායි ගිහින් අම්මාව එක්කගෙන එන්නම්. හැබැයි ටිකක් රෑ වෙයි."

"අපි දූව දේවාලෙ වඩින්ට ගිය පන්සල නේද? මාත් එනවා."

"නෑ නෑ ගෙදරින් හෙල්ලෙන්න බෑ... මේවා ඉහළින් ආපු නියෝග..."

ඇ යටැසින් බලා සිනාසුනාය. ඇගේ සිනාව බෙහෙවින් සුන්දරය. මුළු දේහයම යෞවනය මන්ත්‍රය ජපකළ අඳුනක් වෙතැයි ඔහුට සිතුනි. රංජිත් පිට්ටනියේ තණ කොළ මතට වී සිටියේය.

මද වේලාවකට පසු හංසිනී නිවසින් පිටතට එනවා රංජිත් දුටුවේය. ලා කහපාට ගවුමකින් සැරසී බෑගයක් අතැතිව ඇ රංජිත් අසලට ගියාය.

"අපි ගිහින් එනකල් ගේ ඇතුළට වෙලා ඉන්න."

"තනියමද යන්නෙ"

"පොඩ්ඩියි මායි යන්නෙ"

ඇය සිනාමුසු මුහුනින් යුතුව කීවාය.



# 7

පරිසරය නිහඬය. හිරු බැස යන්ට ආසන්නය. කිසි කමකට නැති ඔසරියකින් සැරසුණු පොඩ්ඩි විදුලි පන්දමක් අතැතිව එනු රංජිත් දුටුවේය. කිසිම ක්‍රමයක් නැතිව පීයර මුහුණේ අතුල්ලා තිබීම නිසා මුහුණේ විසුලු පෙනුමක් තිබුණි.

"අයියෙ, කෑම මේසෙට ඇරලා තියෙනවා වතුර නියල තියෙනවා, අපි එනකල් ඉන්න එපා කාල නිදාගන්න."

රංජිත් පිළිතුරක් නොදී හිස වැනුවේය.

"ඔය කෙල්ලගෙ මූණට පියරු වැඩියි. ඒක පිහදාගන්න කියන්න" ඔහු සිනාසෙමින් කීවේය.

හංසිනීගේ උපදෙස් අනුව පොඩ්ඩී ඉවතට හැරී මුහුණ පිස දමා ගත්තාය.

"අගේ ඇති පෙරහැර. මේ ප්‍රශ්නෙ නොතිබුණා නම් අයියටත් එන්ට තිබුණා."

ඔහු පිළිතුරක් දුන්නේ නැත. රංජිත් සමගින් ගමන් යන්ට හංසිනි කැමතිය. ඔහු විනෝද කාමියෙකි. නුවර පෙරහැර ඇති කාලයට පෙරහැර බලන්ට යන්නේ රංජිත් සමගිනි. මෙවන් ගමන් වලදී ඔහු වියදම් කිරීමට ලෝභ නැත. විනෝද වන්නේද එසේමය. අද මේ ගමන ආවා නම් කොතරම් ප්‍රීතිවන්ට තිබුනාද? සිරකරුවෙක් මෙන් ඔහු නිවසේ දමා ඒම කළේ සිතේ කැමැත්තෙන් නොවේ.

අම්මා පන්සලේ උපාසිකා සංගමයේ ප්‍රධාන දායිකාවක් නිසා පෙරහැර බැලීමට ඒමට ලැබෙන්නේ නැති බැව් හංසිනී දනී. පන්සල් වත්තට පිවිසෙන මග දෙපස විශාල පිරිසක් රැස්ව සිටිනු ඇය දුටුවාය.

"අම්මා රංජිත් අයියා ආවා"

"මම හිතුවා එයි කියලා. රට යන්න ලියුම එවනකල් හැංගිලා ඉන්න කියන්ට."

"පව් අම්මා. අපේ අක්කට නම් මොළේ ඇත්තෙම නෑ. රංජිත් අයියා ඉන්නෙ කැමැත්තෙන් නෙමේ."

"දමිතා කියන දේත් ඇත්ත. රංජිත් සෙල්ලක්කාර වැඩියි. ගෙයක් දොරක් හදාගෙන මනුස්සයො වාගෙ ඉන්නනේ ඔය හදන්නෙ."



මුළු පූජා භූමියම එකම සැණකෙළියක් ගෙන තිබුණි. නුවර පෙරහැර වාගේම එය පැරණිය. පන්සලට යාබද භූමියෙහි කතුරු ඔන්චිල්ලා, මැරිගෝ රවුන්, මාරක ළිඳේ මෝටර් සයිකල් පැදීම වැනි ක්‍රීඩා තිබුණි. නොයෙක් වයිවාරන්න තාවකාලික විසිතුරු සාප්පු කැමහල් තිබුණි. කප් සිටුවීමෙන් ඇරඹෙන උත්සවය සතර මහා දේවාලවල පෙරහැර පැවැත්වීමෙන් පසු අවසන් මහ පෙරහැරින් නිමවෙයි. අස්වනු නෙළා ගත් පසු එළඹෙන මෙම වසන්ත සැණකෙළියෙන් ගම්වැසියන් අනාදිමත් කාලයක සිට සතුටට පත්වූ බව පෙනේ. බණ දහම්වලට මෙලෙස මිනිසුන් ඇදී එන්නේ නැත. ආරම්භ පෙරහැරට විශාල පිරිසක් රැස්ව සිටියහ.

හංසිනිගේ සිතට මහා දුකක් පිවිසුනේ රංජිත් අයියා සිහිවීමෙනි. ඔහුත් සිටියා නම් සතුටු විය හැකිව තිබුණි. ගොළු කෙල්ල හංසිනී අසලම දුවටී සිටියාය. මේ පරිසරය දකිමෙන් ඇය ඉමහත් සතුටකට පත්වන්ට ඇත. එහෙත් ඒ සතුට හැමදාම ගොළුය. බොහෝ විට ගම්වැසියන් අමන්දා නන්දයට පත්වන්නේ මෙවන් ප්‍රාදේශීය උත්සව වලිනි. වෙනදා ගමේ පන්සලට දේවාලයට යාමට චිත්තයක් හෝ ගවුමක් අඳින පොඩ්ඩී මෙවන් දිනයක ඇගේ වටිනාම ඔසරිය ඇඳීමට ප්‍රිය කරයි. ඔවුනට පෙරහැර නැරඹීමට සුදුසු තැනක් ලැබුනේ නැත. හැම තැනම එකසේ ජනාකීර්ණව ඇත. මෙය ගමේ පෙම්වතුන් පෙම්වතියන්ට වසරක් පාසා උදාවන අවස්ථාවකි. විදුලි පහන් ආලෝකයෙන් හා කොප්පරා ලාම්පුවල ආලෝකයෙන් යුවතියන්ගේ මුහුණු දීප්තිමත් වනවිට තරුණයන් ඔවුන් වෙත ඇදී යන්නේ නිරුත්සාහයෙනි.

හංසිනිට පෙළගැසී සිටීමට සිදුවූයේ ඉදිරිපස වළල්ල තුළ නොවේ. අඳුරේ සිට ඇඟිලි අගින් පෙරහැර නැරඹීමට සූදානම් වෙද්දී පසුපසින් කිසිවෙක් තම උණුසුම සෙවීමට වෙර දරණු බවක් දැනුණු නිසා සිතේ ඇතිවූයේ කෝපයකි. මෙවැනි ස්ථානවල ගෑණුන්ගේ උණුසුම පැතීමට එන කාමාතුරයන් විරල නොවේ. කරන්නම් හොඳ වැඩක්. ආපසු හැරෙද්දී දුටු රුව ඇගේ සිතේ ඇතිවූයේ දරාගත නොහැකි සතුටකි.

"හානේ අයියෙ ඇයි මේ ආවෙ. එන්න එපා කිව්වා නේද?"

කවදත් හිතුවක්කාරය. දඟකාරය. ඔහු පිළිතුරක් නොදී සිනාසුනේය. පොඩ්ඩිගේ මුහුණේ මහා අහිංසක සිනාවක් පැතිර ගියේය. පෙරහැර බැලීම නවතා ඇය එළියට ආවාය.

"ඇයි ආවෙ. දැන් අක්කා දන්නවානම් ඉන්න හම්බ වෙන්නෙ නෑ"

"නොකිව්වහම ඉවරයිනෙ" ඔහු සිනාසුනේය.

"අනේ අයියෙ කව්රුවත් දැකල පොලිසියට කියයිද?" හංසිනී බියට පත් මුවැත්තියක මෙන් කීවාය.

"මොන පිස්සුද මම අපරාධ කාරයෙක්යැ." සතුටට පත්ව සිටි පොඩ්ඩි කිසිවක් පවසනු පෙනේ. ගොළු භාෂාව මැනෙවින් දැනසිටි හංසිනී ඇය හා දොඩනු පෙනේ.

"පෙරහැර එන්න තව හුඟක් වෙලා යයි. අපි කානිවල් එක පැත්තෙ යමු."



"අනේ... බෑ ඒකෙ සෙනඟ ඉන්නවා. අයියාව හඳුනා ගනීවි."

"ඒ දේ මට අයිති දෙයක්. එහෙම වුනොත් ඒක මම බලා ගන්නම් යමු."

"අක්කා මේ හිතුවක්කාරයා එක්ක කොහොම ඉන්නවද දන්නෙ නෑ. ඕන් මම එන්නම් හැබැයි මා අත වැරදී නැත."

"මේ රහස පිටවුනොත් අපි දෙන්නා ගෙන්නෙ. මේ ගොළු කෙල්ල දැනගත්තත් කොහොම කියන්නද?"

"අපෝ... මේ පොඩ්ඩිද. මෙහෙම හිටියට හරියට කේලං කියනවා. කේලම් මල්ල"

ඔවුන් පවසන දෑ ඉවෙන් මෙන් හඳුනා ගත් පොඩ්ඩි බොල් හිනා හඬක් නැගුවාය. සැණකෙළි භූමිය දෙසින් ජෝතිපාලගේ ගීතයක් නිකුත්වනු ඇසේ. 'ඔන්චිලි චිලි චිල්ලමලේ යා. චිලි චිලි චිල්ල මලේයා...' රංජිත් භූමියට පිවිසීමට අවසරපත් තුනක් මිලට ගත්තේය. මේ ලෝකයේ මිනිසුන්ගෙන් වැඩිදෙනෙක් දුප්පතුන්ය. ලෝකයේ එක් පිරිසක් කෑමට බීමට නැතිව නිරාහාරයෙන් මියයති. තවත් පිරිසක් නිෂ්පාදිත ආහාර අතිරික්තයක් වෙළඳ පල මිල මට්ටම ආරක්ෂා කරනු වස් විනාශ කරති. ඒ අතර මරණය පෙනි පෙනී අහඹු අවස්ථාවක් ලදහොත් විනෝද වෙති. මේ ගම්බද සතුට කොතරම් නිර්ව්‍යාජද? ප්‍රථමයෙන්ම ඔහු රට කජු ගොටු තුනක් මිලට ගත්තේය. තිදෙන ඒවා කමින් ගමන් කළහ. හංසිනිගේ සිතට ඉමහත් සතුටක් ගලනු දැනේ. මැණික්හින්නේ වලව්වකට

කොටුවී සිටින ඇගේ ජීවිතයේ කිසිදු විචිත්‍ර බවක් නැත. කෑම නිදාගැනීම වැනි කටයුතු කීපයකට පමණක් ඇගේ ජීවිතය සීමා වී තිබුණි. ඉඳහිට මේ ජීවිතයේ වෙනසක් දකින්නේ රංජිත් අයියා නිසාය. පනාගොඩ හමුදා කඳවුරට ගිය පසු මැණික්හින්නේ ජීවිතය ගැන කිසිවක් සිහි නොවේ. රටකජු කා නිමවීමත් සමගම ඔහු අයිස් චොක්ස් මිලදී ගැනීමට ගියේය.

"එපා අයියෙ එපා"

"පිස්සුද ළමයො කාපු දෙයක් විතර තමා ඉතිරිවෙන්නේ"

පෙරහැර පටන් ගැනීමට තවත් බොහෝ වේලාවක් ගතවනු ඇත. හංසිනි පවසන්නේ වැඩිපුර ජනාකීර්ණ තැන්වල නොගැවසෙන ලෙස කියාය.

"අක්කා අද නැතිනම් හෙට විසා එක අරගෙන එයි. ඊට පස්සෙ අවුරුදු ගානකට මේවගෙ ගමනක් යන්ට වෙන එකක් නෑ"

රංජිත් අයියාගේ කතාව නිසා ඇගේ සිතේ මහා දුකක් ඇතිවුණි. කොච්චර විනෝදකාමියෙක් වුවත් ඔහු නරක පුද්ගලයෙක් නොවේ. ඔහු ප්‍රිතිවූයේ බිරිඳ දරුවන් හා බිරිඳගේ සහෝදරියන් සමග බව හංසිනි දනී. වෙනත් පිරිමි මෙන් තැනින් තැන ගැහැණු සමග ඇසුරු පවත්වන්නෙක්ද නොවේ. එවන් පිරිමියෙක් ලැබීම අතින් අක්කා වාසනාවන්තය.

"මැරිගෝ රවුමෙ යමුද?" රංජිත් යෝජනා කළේය.



"පොඩි ළමයින්ගෙ වැඩයි අපේ වැඩයි අතර වැඩි වෙනසක් නෑ නේද?" රංජිත් ඇසුවේය.

"ඒක නම් ඇත්ත. මෙරිගෝරවුන්ඩ් යන්න ආසයි. බැරිවෙලාවත් විසිවුනොත් ?" හංසිනි කීවාය.

"විසිවෙන්නෙ මොටද. හයියෙන් අල්ලාගෙන ඉන්න. ඇයි පොඩ්ඩික් ඉන්නෙ."

"මට බෑ පොඩ්ඩි එක්ක යන්න." ඈ රංජිත් දෙස බැලුවාය.

"මෙරිගෝරවුන්ඩ් එකේ නෙමේ කතුරු ඔන්චිල්ලාවෙ යමු."

තමාද නොදැනුවත්වම රංජිත්ට නැඹුරුවන බවක් හංසිනිට දැනේ.

"පොඩ්ඩිවත් එක්ක යමු පව්නෙ නංගි"

"හනේ බෑ පොඩ්ඩි බයයි. අන්තිමට පොඩ්ඩි මේකෙන් පනීවි."

හංසිනි කතුරු ඔන්චිල්ලාවෙ යාමට පොඩ්ඩිට ආරාධනා කළාය. ඇගේ මුහුණේ පැතිර ගිය නිරවුල් සිනාව රංජිත් දුටුවේය. හංසිනි කී පරිදි ඒතරම් බියක් හෝ අසතුටක් නොමැති බව රංජිත්ට වැටහුණි. මෙවන් පිරිසක් සමග සතුටු වීමට ඇති අකමැත්තක් ඇගේ සිතේ තිබුණු බව ඔහුට හැඟිණි.

"මට බයත් එක්ක. මේ ජීවිතේ පළවෙනි වරට මේ වගේ ගමනක් යනවා." ඇය ළයට අත තබා බියමුසු සතුට ප්‍රකාශ කළාය.

"මිනිහෙක් ජීවිතයේ එක දවසක් හරි මේවගෙ අවදානමක් දරන්ට ඕනෑ. එක්කො මේ කතුරු ඔන්චිල්ලාව කැඩිලා විසිවෙලා අපිව මැරෙන්ට ඕනෑ. එහෙමත් නැතිනම් ලොකුම ලොකු අත්දැකීමක් ලබන්ට ඕනෑ."

"ඔයාට නම් තියෙන්නෙ අන්නවාදී අදහස්"

එකිනෙකා කතුරු ඔන්චිල්ලාවෙ අසුන්වලට පිරෙද්දී ඔවුන් තිදෙනා සිටි අසුන ඔන්චිල්ලාවේ මුදුනට වූණි.

"අනේ රංජි අයියෙ මට බෑ වාගෙ මට බහින්න ඕනෑ. ඔලුව කැරකෙනවා වගේ."

"පිස්සු නැතිව ඉන්න. ඔයාට වඩා මේ පොඩි ළමයි ඉන්නෙ." රංජිත් ඇය අස් වැසුවේය.

ප්‍රථම රවුම ආරම්භවත්ම ඇය බියට පත්වුණි. එකවරම ඇය රංජිත්ගේ ළය බදා ගත්තාය. ඔහු ඇය උණුසුම් සිරුරට තද කරගත්තේය. කොහේදෝ නැති නව සතුටක් ඔහුගේ සිතට හා ගතට පිවිසුනි. පවනට බඳු වේගයෙන් කැරකෙද්දී ඈ කුඩා දැරියක් මෙන් ඔහුගේ ඉණ බදා කෑගැසුවාය. මෙය රවුම් සියයක් වැනි ප්‍රමාණයක් කැරකුනා නම් හොඳ යැයි ඔහුට හැඟුනේ මේ ක්ෂණික පිබිදීම නිසාය. ගමන නතරවී තරමක් වේලා යනතෙක් වූවද ඇය එම උණුසුමින් මිදීමට එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. ගමන ආරම්භ වූ සැනින් පොඩ්ඩී රංජිත්ගේ අතින් අල්වා ගත්තේය. ඒ අහිංසක ගැහැණිය ආරක්ෂා කිරීමද තම යුතුකමකි. පොඩ්ඩිට මෙතරම් ලස්සනට සිනාසීමට පුළුවන් බව දැනගත්තේ එදාය.



# 8

හංසිනී කතුරු ඔන්චිල්ලාවෙන් බැස පොඩ්ඩී ළඟට ගියේ හද පිරී ගිය අමුතුම සතුටකින් යුතුවය. සමහරවිට පොඩ්ඩී තමා සිටි ඉරියව්ව දකින්ට ඇත. ජීවිතයේ කිසිදාක මෙතරම් වෙලා කිසිම පිරිමියෙකුගේ උණුසුමක තනිවී නැත. එය කොතරම් ආශ්වාදජනකද? එහෙත් එය කිසිවිටෙක සිහි නොකළ යුතු අහඹු තහනම් දෙයකි. බැරි වෙලාවත් අක්කා දුටුවානම්. රංජිත් අයියා නම් ඒකවත් ගණන් ගන්නෙ නෑ. ඇය කිසිවක් නොදුටුවාක් මෙන් සිටියේය.

"දැන්නම් මට යකෙක් කන්න බඩගිනියි. මොනව හරි කන්න ඕනෑ"

"හානේ... මම මේසෙට කෑම ඇරල වතුරත් තියලයි ආවෙ..."

"මට තනියම කන්න බෑ"

ඔහු ඇගේ උපදෙස් නොපතමින්ම යාබදවූ කඩයකින් ආප්ප මිලට ගත්තේය. උම්බලකඩ සම්බෝලයද ප්‍රණීතය.

"දැන් මොකද කරන්නෙ. අපි නැන්දම්මට කතාකරමුද?"

"අම්මා මේ වෙලාවෙ එක්ක යන්න බෑ. අන්න පෙරහැර පටන්ගන්න වෙඩිල්ල ගැහුවා. අපි ඉඳලා ආපු තැනට යමු."

"අපි එකට හිටියෙ නැතිනම් මග හැරෙනවා. පේනවද ඉන්න සෙනඟක්."

ඔහු නුග ගස යට සිටි පිරිස අතරට එක්වුණි. මෙම නුග ගස අතු පතරින් ගැවසී ගත් විශාල වෘක්ෂයකි. අපේ මිනිසුන් සතා සීපාවට පමණක් නොව ගස් කොළන් වලටද ආදරය කළහ. ගෞරව කළහ. ගස් වලට පූජා පැවැත්වීමට තරම් මිනිසුන් ස්වභාවයට ආදරය කළහ. සාඩම්බරව නැගීගත් අඳුරු රුක යට ඔවුහු සිටගත්හ.

"මේ කෙල්ල මගහැරෙයි. එහෙමනම් ඔක්කොම එකට ඉන්න."

තවම පෙරහැර පෙනෙන තෙක් මානයකවත් නැත. පහත රට, සබරගමුව වැනි නාට්‍ය සම්ප්‍රදායන් තිබුණත් වැඩියෙන් තැනක් ලැබෙන්නේ උඩරට නැටුමටය. උඩරට



පහත රට බෙර මිශ්‍රව එන හඬ ඔහුට ඇසෙයි. පෙරහැර ළංවෙද්දී පසුපස සිටි පිරිස ඉදිරියට ආහ. රංජිත් වෘත්තීය ආරක්ෂක නිලධාරියෙක් වුවද හංසිනී ආරක්ෂා කර ගැනීම අසීරු කරුණක් වුණි. ඔහු සිටියේ ඇගේ පසුපසිනි. පොඩ්ඩි ඒ අසලම සිටියාය. ඔවුනොවුන් තරයේ ස්පර්ශවීම වැලැක්විය නොහැක. ඇතැම්විට අත් පහළට යොමුව තිබුනේ සමීප ලෙසය. ඇයට රංජිත් ගේ අත අල්වා ගැනීමට සිදු වූයේ විසිරෙතැයි බියෙනි. ඔහුට මෙතරම් රළු පිරිමි අතක් ඇතැයි ඇය කිසිවිටෙක සිතුවේ නැත. පෙරහැර තුළින් එතරම් කිවයුතු අසිරියක් නොදුටුවේ ඇයි? සරඹ නමස්කාරය දක්වා පාරම්පරික නර්තන ශිල්පය ආරක්ෂා කරන උඩරට නැට්ටුවන් දෙස ඇය බලා සිටියාය.

පෙරහැර නුගගස අසලින් ඈතට යනතෙක් වුවද ජනකායේ අඩුවක් නැත. පිරිස අඩුවූ පසු හංසිනී නිවසට යාම සඳහා අම්මාට කතා කළාය.

නිවසට පැමිණි හංසිනී ඇඳ බදා ගත්තද එතරම් ලෙහෙසියෙන් ඇය වෙත නින්ද ළඟ වූයේ නැත. දෙයියනේ අද වෙච්ච දේවල්.

කතුරු ඔන්විල්ලාවේ ගිය ගමන ගැන නම් ඇය නිකමටවත් සිතා නොතිබිණ. රංජිත් අයියත් ඕනෑකමින් කළ දෙයක් නොවේ. මම රංජිත් අයියාගේ පපුව බදාගෙන කොච්චර වෙලා හිටියද? මට ම මතක නෑ. ඇයි පෙරහැර බලනකොට හිටපු හැටි. මාව එහාට මෙහාට වෙයි කියලා මගේ උරහිසින් අල්ලා ගෙන හිටිය. ඊට පස්සෙ එක අතක් ඉඟටියට තියා ගෙන ඉන්න කොට තමයි මම අතින් අල්ලා

ගත්තෙ. එහෙම කළේ නැත්නම් අපිව මගහැරෙන්ට තිබුණා. මෙ වගේ වෙලාවලට අක්කා හිටියා නම් තමයි වැඩේ. මම කැම්ප් එකේ ඉන්නකොට මා දිහා අහැ ගහගෙනමයි ඉන්නෙ. රංජිත් අයියයි මායි එකට දාල එළියට වත් යන්නෙ නෑ. හැමදාම ඉන්නෙ ඒතරම් සැකෙන්. රංජිත් අයියා ඕනෑ දෙයක් කරන්නෙ එළිපිට. ඒත් අද වෙච්ච දේ නම් මට හිතා ගන්නත් බෑ.

හංසිනි උදේ පිබිදුනේ හොඳටම දවල්වීය. පෙරහැර නරඹා එනවිට පාන්දර තුන පමණ වී තිබුණි.

"පොඩ්ඩුව... නැගිටින්ට" ඉස්කෝලෙ හාමිනේ හංසිනිගෙ එසවි ගෙල දෙසට රොක්වී තිබූ ගවුම පහළට දමමින් කීවාය.

"මට තව ටිකක් නිදාගන්ට ඕනෑ"

"නිදා ගන්ට නෙමෙ අර දරුවට තේ එකක් හදල දෙන්නෙ නැද්ද?"

අම්මා පවසන්නේ කුමක් දැයි හංසිනිට තේරුම් ගියේ පසුවය. ඇය නිදන ගවුම පිටින්ම ජනේලය අසළට දුව ගියාය. ඉකුත් දිනයේ කැලෑවෙන් වැසී තිබූ ඉස්තොප්පුව හා අවට පරිසරය ආලෝකමත්ව තිබෙනු පෙනෙයි.

"ඇයි රංජිත් ළමයට කියල මෙහෙම වැඩ කරව ගන්නෙ? ලොකු දූව දන්නව නම් ඔක්කොටම බණී."

"එයා ඉතින් බණින්නෙ නැත්තෙ කාටද? මේ අපි කියල නෙමේ අයියට අපි ගැන දුක හිතිලයි වත්ත සුද්ද කරන්නෙ."





"ඔය කතාව තියල බොන්න දෙයක් හදන්න."

නිවස තුළට ගිය හංසිනි නිදන ගවුම ගලවා වෙනත් ඇඳුමකින් සැරසී මුහුණ සෝදා තේ පිළියෙල කළාය. නැවත වරක් ඉකුත් දින රැයේවූ සිදුවීම් මතකයට ගලා ආවේය. උදේ කෑම පිසින පොඩ්ඩි හංසිනි දෙස බලා සිනාසුනාය. ඉකුත් දින රැයේ වූ සිදුවීම් වෙතින් ඇගේ සිතේද පිබිදීමක් ඇතිවී ඇති බව ගොළු බසින් පවසයි.

"කතාව තියල වැඩේ කරපං"

"මහත්තයා වැඩ" ඇය ගොළු බසින් කීවාය.

"කෝ උඹේ මිනිහා එයාටත් ඇවිදින් මහත්තයාට උදව්වෙන්න කියපං"

"ඊයෙ රෑ අරක්කු බීලි නිදි, මට ඒ මිනිහ පෙන්වන්න බෑ" ඇය හස්ත මුද්‍රාවෙන් කීවාය.

හංසිනි තේ පිළියෙල කරගෙන යනවිට රංජිත් ඈ දෙස බලා සිනාසුනේය.

"ඔක නවත්වන්න අයියෙ. බැරි වෙලාවත් අක්කා ආවොත් දන්නවනෙ හැටි. අපි ඔක්කොටම බණීවි."

ඔහු තිහඬව තේ වීදුරුව ගත්තේය. ඔහු හැඳ සිටියේ අත නැති කළු බැනියමක් හා කොට කලිසමකි. කොට සායකින් හා අත් කොට කමිසයකින් සැරසී සිටි හංසිනි ඔහු තේ පානය කරන තෙක් බලා සිටියාය.

"අක්කා හදන තේ එක තරම් රස නැතිව ඇති"

"එයා දෙන තේ මම ම බොනවා මිසක් මොන බල්ලෙකුටවත් බොන්න බෑ. මෙන්න තේ. ගානට කහට, ගානට කිරි, ගානට උණුසුම."

"ඔය බොරු"

"සත්තයි දෙයියම්පල්ල.

"ඇති ඇති බොරුවට දිව්රන්න එපා. එන්න ඇවිදින් ගෙට වෙලා ඉන්න. දන්නවනෙ අක්කගෙ හැටි. ආව ගමන් අම්මා ගෙ ඉඳල ඔක්කොටම දෙහි කපයි."

"අර පොඩ්ඩිගෙ මනුස්සය ඉන්නවනම් එක්කා ගෙන එන්න. අද වැඩ කළොත් අපිට රෑවෙන්න කලින් ඉවර කරන්න පුළුවන්."

"ඒකා බේබද්දෙක්. අම්මාගෙන් ණයට ඉල්ලා ගෙන වැඩකරන්නෙ නැතිව ඉන්නවා. ඒ හොරාට කතා කරන්න එපා."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"අදත් රෑට පෙරහැර බලන්න යමුද?"

"අම්මෝ... මතක් කරන්ට එපා. අම්මා නම් මට යන්න දෙන එකක් නෑ"

"වෙන එකකට නෙමේ, ආපහු කතුරු ඔන්චිල්ලා පදින්න."



ලජ්ජාවෙන් මුහුණ වසාගත් ඈ නිවස දෙසට දුව ගියාය. දිවා ආහාරය පිළියෙල කළ පොඩ්ඩි සිය සැමියා කැඳවාගෙන ඒමට වත්ත කෙළවරේ වූ මුර ගෙයට ගියාය. ඒ වනවිටත් ඔහු වෙරිමතින් නිදා සිටියේය. ඇය ඔහුගේ දෙවුරෙන් අල්වා සෙලෙව්වාය. ඇයට තේරෙන යුතුකමක්වත් මොහුට දැනෙන්නේ නැත.

"නැගිටිනවා ගිහින් අර මහත්තයාට උදවු ගාන්ට උදව්වෙනවා" ඇය ගොළු බසින් කීවාය.

"බැහැපිය බැල්ලි එළියට"

"වලව්වෙන් දෙන දේ නිකං කාල තවත් ආඩම්බර කතා."

"තෝ ගියාට මම එන්නෙ නෑ. දුවපිය. ගහකට පයින් බෙල්ල කැඩෙන්ට." ඔහු පොඩ්ඩිව තල්ලු කළේය.

ඇය හඬමින් වලව්ව දෙසට ගියාය.

"මොකද උඹ ඇඬුවෙ?"

පොඩ්ඩි පිළිතුරු නොදී හිස වැනුවාය.

"අරක්කු බොන්න දෙනවා කිව්වොත් නම් එයි. උඹ නිකන් හිටපං."

ඇගේ සිතේ පවතින්නේ දුකකි. ඉස්කෝලේ පවුලේ අය නොවීනම් තමා මිය ගොස්ය. මේ බේබද්දා හා විවාහවීම නිසා තම ජීවිතය විනාශ විය. ඔහු තමා විවාහ කරගත්තේ ගොළු ගැහැණියක් බව දැන දැනය. ගැහැණියක ලෙස ජීවිතයේ ලබාගත යුතු බොහෝ දේ පවතින්නේ ඇතිනි. ඉකුත් දිනයේ

හදවතට පිවිසි චමත්කාරය ජීවිතයේ කිසිදාක ලැබී නැත. ලොකු බේබිගේ සැමියා අන් අය මෙන් නොවේ. ඇය ඒ පිරිමියාගේ හැඩ රුව පිළිබඳව සතුටු වූවාය. හිතේ පවතින සතුට මේ ගොළු හදවතට පැවසිය නොහැක. හරියට උදේ පායන ප්‍රථම හිරුමෙන් දීප්තිමත් පිරිමියෙකි. ඉකුත් දින රැයේ සිදුවූ හැම දෙයක්ම ගොළු කෙල්ලට මතකය. කතුරු ඔන්චිල්ලාවේ යාමට තමාට කතාකළ හැටි. කිසිම ලෝභ කමක් නැතිව කෑම බීම දුන් හැටි. පෙරහැර බලද්දී අතරමංවිය හැකි නිසා සිය අතින් අල්ලා ගත් හැටි සිහිවුණි. රළු පිරිමි අතක්. ඒ ස්පර්ශය විදුලියක් මෙන් ගත පුරා විහිද ගිය හැටි. අඳුර වැටෙන්න ඔන්න මෙන්න කියා තිබෙන තෙක් ඔවුහු එළිමහනේ වැඩ කළහ.

ඉකුත් දින හිරු රශ්මියට තණ හා ගස් මැළවී තිබුණි. රංජිත් දල්වූ ගිණි මැලයට පොඩ්ඩි අමු අතු ගෙනැත් දැම්මාය. ඒවා චට පට චට පට යන හඬින් දැවීයන්ට වන. රාත්‍රිය ළංවීම නිසා ඇගේ මුහුණට ගින්නේ පැහැය වැටී තිබුණි. බිම ඇනතියා ගෙන සිටින විට ඇගේ නිරුවත් කලවා මතට ගින්නේ පැහැය වැටුණි. හංසිනි ආවේ ඔවුන් දෙදෙනා බොහෝ වේලාවක් තනිව. සිටි පසුවය. ගින්න දෙසට සැඳෑ සුළං හමනු පෙනේ.

"නංගි මේ කෙල්ලට දන් ඇති කියන්න."

"උන්ට මේ වැඩ පුරුදුයි. අයියා වැඩ නතර කරන්න. ඒකි කලාවේ.."

රංජිත් යාබද ඇල්ලට ගොස් දිය නා ගත්තේය. දින



කීපයක්ම නිවස තුළම සිරවී සිටි ඔහු කාමරයට ගොස් සූදානම් වී එළියට ආවේය. රංජිත් සූදානම්වී සිටිනු දුටු හංසිනි පුදුමයට පත්වූවාය.

"හාමේ.... මේ කොහෙ යන්නද?"

"මම යන්න යනවා. මම ගියා කියල අක්කාට කියන්න."

"අනේ අයියෙ යන්න එපා. අම්මා මේ බලන්න රංජී අයියා යන්න හදනවා."

"අනේ ළමයො යන්න එපා. දමිතා එන්න කලින් ගියොත් අපිට බණියි. දන්නවනෙ හැටි."

"ඒක තමා කොහෙවත් යන්න දෙන්න එපා කියලා ලියුමකුත් එව්වා."

ඉකුත් දින සැරසුණු ඔසරියෙන්ම සැරසී නිවස දෙසට එන පොඩ්ඩි දෙස හංසිනි බලා සිටියාය.

"මොකද මේ පොඩ්ඩි ලෑස්තිවෙලා කොහෙ යන්නද?" හංසිනි පොඩ්ඩිගෙන් තොරතුරු විමසුවාය.

"ආ... උඹ පෙරහැර බලන්න යන්නද? අනේ අපට බෑ. උඹ තනියම යන්නෙ කොහොමද?"

"ඒකිට මහැ දිහාවක් යන්න කියන්න."

"එහෙනම් මම පොඩි ගමනක් ගිහින් එන්නම්. ටිකක් ර් වෙයි."

"අනේ අයියෙ... යන්න එපා." ඈ බැගෑපත් වූවාය.

"නෑ... මම නුවරට ගිහින් එන්නම්."

ඔහු අඳුරේම මිදුලට බැස්සේය. ඇය මෘදු ලෙස ඔහුගේ අත මොහොතක් අල්වා ගෙන සිටියාය.

හංසිනිගේ සිතේ මහා වේදනාවක් ඇතිවුණි. ඇය රාත්‍රී ආහාර නොගෙන බලා සිටියේ ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙනි. ඉකුත් දිනයේදී මෙන් පෙරහැර බලන්ට යන්න තිබුණා නම්. දෙයියනේ කතුරු ඔන්චිල්ලාවේදි මාව කුරුල් කර ගත්තා. ඒ පිරිමි සුවඳ මගේ ගත පුරාම පැතිරුණ හැටි. නිවස දෙසට වාහනයක් එන හඬ ඇසුන සැනින් හදවත පුරා පැතිර ගියේ බියකි.

"අම්මේ ජීප් එකක් එනවා"

"අර ළමයා මෙහෙ ඉන්න බව ආරංචි වෙලාද?" අම්මා ඇසුවාය.



# 9

නිවසේ ඉදිරිපස නතර කළ රථයෙන් බැස එන අය දෙස ඇය බලා සිටියාය. මධ්‍යම රැය වන තෙක් සිටියේ කොහේද? රථය නික්ම ගියපසු රංජිත් වැනි වැනී එන හැටි හංසිනි දුටුවාය. දෙයියනේ හොඳටම බීලා. ඇය ඉදිරියට ගොස් ඔහුගේ අතින් අල්වා ගත්තේය. අම්මා දිගු නින්දකට වැටී සිටීම ඇයට පහසුවක් වුණි. රංජිත් හංසිනිගේ සහායෙන් කාමරයට ගියේය. ඔහු ඇඳුම පිටින්ම ඇඳේ පෙරලුණේය. හංසිනි මැදිවූයේ මහත් ගැටළුවකටය. රංජිත් අයියා මෙවැනි තත්ත්වයකට පත් කිරීමේ වරද අක්කා බාරගත යුතුයැයි ඇයට සිතේ. ඇය පහත්වී ඔහුගේ පාවහන් මිදෙව්වාය. ඔහු නිදන කාමරයේ දොර වැසූ ඇය සිය කාමරයට ගියාය. ඇඳට ගියද සෑහෙන වේලාවක් ගතවන තෙක් වුවද ඇය වෙත නින්දක් නොලැබුණි. ඇය පිබිදුනේ හොඳටම දවල් වූ පසුවය.

"දුව.... මොකද ළමයො කරන්නෙ නැගිටින්නකො. අර ළමයට තේ එකක් හදල දෙන්නෙ නැද්ද? රංජිත් කීයටද ආවෙ?"

"රෑ දෙකට විතර ආවා. මම හිතන්නෙ බීලයි හිටියෙ."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"දූන් කෝ ?" හංසිනි විමසුවාය.

"අර උදෙන්ම නැගිටල වත්තෙ වැඩ කරන්නෙ."

අම්මා මද සිනාවෙන් යුතුව කීවාය.

අම්මා අමාරුවෙන් තේ සූදානම් කිරීමට වූවාය. වෙනදා උදෙන්ම නිවසට එන පොඩ්ඩී තවම නැත.

"මොකද පොඩ්ඩී තවම නාවෙ."

"ඒකි පෙරහැර බලන්න යනවා කියලා ගියේ. කා එක්කද දන්නෙ නෑ ගියේ."

"තනියම ඔය පාළු ගෙදර නිදාගන්න ඒකිට මොන තනියක්ද?"

ඈ තේ ජෝගුව රැගෙන වත්තට ගියාය. ඔහු හැඳ සිටියේ කොට කලිසමකි. නිරුවත් උඩුකය කාලවර්ණ මවිල් වලින් ගැවසී තිබුණි. ගෙල බැඳි රත්රන් චේන්පට වඩාත් කැපී පෙනුණේ සිරුරේ කාලවර්ණ බව නිසාය. ඉකුත් දින රැයේ කළ හිතුවක්කාරකම අක්කා දන්නේ නම් බැණුම් අසන්ට



සිදුවන්නේ තමාටය. කිසිවෙක් අයියා මේ නිවසේ සැඟවී සිටින බව දැනගත හොත් අක්කාගේ සියළු උපක්‍රමයන් අසාර්ථක වනු ඇත. ඇය සූදානම් වන්නේ හොඳ වැටුපකට අයියා පිටරට යැවීමටය. කොළඹ සිටින අක්කාගේ හිතවතුන් බොහෝ දෙනෙක් හොඳ සුවපත් ජීවිත ගත කරන්නවුන් වෙති. ඇයටද අවශ්‍ය එවැනි ජීවිතයක් ගත කරන්නටය. අක්කලා හොඳින් ඉන්නවාට ඇගේ සිතේ කිසිම අමනාපයක් නැත. දූන් මේ වත්තෙ වැඩ කරන බවක් අක්කා දැන ගතහොත් එය ප්‍රශ්න මතුවීමට බැරි නැත.

හංසිනි තේ බඳුන රැගෙන වත්ත දෙසට ගියාය. දඟකාර සිනාවක් රැඳි රංජිත් අයියාගේ මුහුණ දෙස ඇය බැලුවේ නැත.

"එන්න තේ බොන්න"

"ඔය හෙවනෙන් තියන්න."

"ඕන් නෑ හීනා වෙන්න. ඊයෙ රෑ කළ දේ මම දැක්කා"

"හමුදාවෙන් පැනල ආපු තවත් යාළුවෙක් ඉන්නවා. මම මිනිහව හම්බ වෙන්න ගියා. දන්නෙ නැද්ද යාළුවො හම්බ වුණාම."

ඔහු අඳුරු වූ සෙවනේ ඉඳ ගනිමින් කීවේය. උදා පින්නට තවම තණපත් තෙත්ව පවතී. වත වදුල දෙසින් නිරවුල් සුළගක් හමනු දැනේ. නිවසට නුදුරු වල් බිහිව ඇති කොටස පමණක් ශුද්ධ පවිත්‍ර කරනවා හැර ස්වභාවිකව නැඟී ගත් ගස් වැල් කපා දැමීමට ඔහුට සිතුණේ නැත. ආදරයෙන් වැළඳ ගන්නා පෙම්වතුන් පරිදි ගස්වලට වැල් එති තොස් තිබුණි.

"මෙතන හොඳද බලන්න. මම විවේක ගන්න කුටියක් හැදුවා." ඔහු ගස්වලින් ගැවසී ගත් අරණ පෙන්වමින් කීවේය. ඔහු එසේ කීවා නිවැරදිය. ඈය පඳුරු අතරින් රිංගා ගොස් බැලුවාය.

"අපි කැලේ යුද්ධ කරන්න ගියාම මේවාගෙ තැන් හදා ගන්නවා. මේක ගෙදරට වඩා සනීපයි නේද?"

ඈය හිස වනා පිළිතුරු දුන්නාය.

"දැන් ඉතින් මේක නවත්තලා ගෙදරට එන්න. පෙරහැරත් තියෙන බව දන්න නිසා අක්කා එන්න බැරි නෑ."

"පිස්සුද ! දමිතා පෙරහැර නෙවේ බුදුහාමුදුරුවො මැණික්හින්නට වැඩියයි කිව්වත් ව්‍යුහෙන් හතර කරලා එන්නෙ නෑ"

"එයා ලැස්තිවෙන්නෙ හම්බකරන්න නෙ අයියෙ."

"සල්ලි හම්බකරල විතරක් බෑ. ජීවිතයේ සතුට සල්ලි විතරක් නෙමෙ." ඔහු සමස්ත ජීවිතයම හකුළුවා කීවේය.

හංසිනි නැගිට නිවසට ගියාය. ඔහු බෙහෙවින් පරිසරයට ඇලුම් කරන්නෙකි. ගමේ ඉපදුනද අක්කා ආදරය කළේ කොන්ක්‍රීට් වනාන්තරයටය.

පොඩ්ඩි නිවසට ආවේ රංජිත් අයියා උදේ කෑම ගනිමින් සිටින විටය. දෑතේ වළලු දමා සිටි පොඩ්ඩිගේ මුහුණ සතුටින් දිලිසෙමින් තිබුණි.

"හේයි බොල මෙකිගෙ අත් දෙකේ ලස්සන."

අම්මා පොඩ්ඩි දෙස බලා සිනාසුනාය.

"ලස්සනයි. කවද උඹට මේවා අරන් දුන්නෙ?"

රංජිත් ඔවුන් දෙස නොබලා කෑම කමින් සිටියේය. පොඩ්ඩිගේ ගොළු සතුට සිනාවකට පරිවර්තනය වී මුහුණේ නතරව තිබුණි. ඒ සිනාව ලස්සනය, ජීවි බවින් යුතුය. සුදු දසන් පෙළ "මධුරි ට" සමානය. හංසිනි ට අවශ්‍යව තිබුනේ රංජිත් ගේ ගමන් බිමන් නතර කිරීමටය.

"අම්මා මෙන් රංජිත් අයියා ඉන්නවා."

"මොකද දරුවො මේ තැන් තැන්වල ඇවිදින්නෙ?" ඉස්කෝලෙ හාමිනේ බෑණා ගෙන් ඇසුවාය. රංජිත් සිනාමුසු මුහුණින් යුතුව සිටියා විනා පිළිතුරක් දුන්නේ නැත.

"මෙහෙ ඉන්න අය මාව අඳුනන්නෙ නැතෙ අම්මා."

"ඔය මම කිව්වෙ. කතා කරල බේරෙන්ට බෑ"

"අනිත් දාහක් දෙනා රට බෙදන ත්‍රස්තවාදීන්ට විරුද්ධව සටන් කරද්දි මට හැංගිලා ඉන්න වෙලා. මේක කැත වැඩක්."

"ඒ වුණාට ළමයො ගැහැණියෙකුට තමුන්ගෙ ස්වාමිපුරුෂයා නැතිවුණාම ඒ අඩුව පිරිමහන්න කාටවත් බෑ. ඒ අත්දැකීම මට තියෙනවා."

ලියුම්කරුගේ බයිසිකලයේ සීනු හඬින් නැගී සිටි හංසිනි ගේට්ටුව අසලට ගියාය.

"මට ලියුම් තියෙනවද?"

"අයියාට නෑ. මට ටෙලිග්‍රාම් එකක්" ඇය විදුලි පුවත දෙස බලමින් කීවාය.

"ඉන්ටවිව් එකකට එන්න කියලා තියෙනවා. වැඩක් නෑ, මම යන්නෙ නෑ"

"එහෙම කියල බැනෙ පොඩ්ඩුව"

"වැඩක් නෑ අම්මා. දැන් ඉන්ටවිව් කීයකට ගියාද? ඊට වඩා හොඳයි ගෙදරට වෙලා ඉන්න එක."

"මගෙ ඔලුව පිස්සු කරන්න එපා ළමයිනේ. දෙයියම්පල්ල උඹලා හින්ද කවදහරි මට පිස්සන් කොටුවට යන්න වෙයි. ලැබෙිද නැද්ද කියලා මෙහෙම ඉදන් පේන කියන්නෙ කොහොමද?"

හංසිනි කඳුළු පිරි දෙනෙතින් යුතුව සිටියාය. පවුලේ ප්‍රශ්න වලට සෘජුව පිවිසීමට නොහැකි නිසා ඔහු මද වේලාවක් සිට කතා කළේය.

"මොකද්ද අම්මා ප්‍රශ්නෙ ?"

"මේ රටේ ඉන්න ඉලන්දාරි බෝම්බ වලට අහුවෙලා මැරිලා යනවා. මේ කාලකණ්ණි මාව එහෙම වත් මැරෙන්නෙ නැතෙ."

නැවත වරක් එම ප්‍රශ්නය ගැන විමසීමට රංජිත්ට සිතුනේ නැත.



"පස්වෙනිදා ඉසුරුපාය‌ෙ ඉන්ටවිව් එකක් තියෙනවා ඒකට යන්න කිව්වම බෑයි කියනවා, හිය සැරෙත් ඉල්ලුව හම්බවුණෙ නෑ කියල මෙහෙම ඉඳන් පේන කියනවා."

"ඒක හරි වැඩක්නෙ. ඉන්ටවිව් එකට යන්න බැහැයි කියන මෝඩ ළමයා කවුද?"

"කව්රුවත් නෙමේ අන්න අර ඉන්නෙ"

ඉස්කෝලෙ හාමිනේ මුරණ්ඩු ලෙස බිම බලා සිටින හංසිනි දක්වා කීවාය. ඇය කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා බිම බලා සිටියාය.

"රංජිත් ළමයො මම පුළුවන් කමකට නෙමේ කොළඹ යමු කිව්වෙ. මට දැන් ඇස් දෙක හරියට පෙන්නෙ නෑ. අඩි හතරක් යන්න බෑ. විලුඹ රිදෙනවා බත් කෙන්ද රිදෙනවා. මූත් මහ මෝඩ ජාතියක්."

"ඔව් මම මෝඩ තමයි. දැන් කීයකට ගියාද? නර්සින් ගියා, ක්ලැරිකල් ගියා, වගා නිලධාරි ගියා, පුස්තකාලයට ගියා කෝ හම්බවුණාද?"

ඇය හඬමින් කීවාය. මව හා දුව අතර ප්‍රශ්නය උග්‍රවන බව හැඟීගිය නිසා රංජිත් අසුනින් නැගී සිටියේ සාම නියෝජිතයෙක් ලෙසටය. ඇය හඬන විට ඔහුගේ සිතේ වරෙක දුකක් ද ඇති වෙයි. තමා මේ අත්දැකීම ලැබුවේ මීට වසර ගණනාවකට ඉහතය. උසස් පෙළ විභාගෙන් හතරම සමත්ව සිටියදී පවා හොඳ රස්සාවක් ලබා ගැනීමට පුළුවන් වූයේ නැත. කිසිම පුදුසු කමක් නැති අය දේශපාලන වාසි මත

හොඳ ඊකියාවල් ලබා ගනිද්දී තමාට හමුදා භටයෙක් වීමට සිදුවූයේ අකමැත්තෙනි.

"ලොකු නංගි විතර නෙමේ මාත් සම්මුඛ පරීක්ෂණ හිසේ කෙස් ගානට ගිහින් තියෙනවා. අපි මේකට ගිහින් බලමු."

"ඒක තමා රංජිත් ළමයො කියන්නෙ. කොහෙද ඉතින් ඔනෑවට වැඩියෙ පැහිලනෙ"

"අම්මා ලොකු නංගිට බණින්නෙ නැතිව ඉන්නකො එයා යයි. මම චරිත සහතික හොයා දෙන්නම්. අපි පොඩි තල්ලුවකුත් දෙමුකො."

හංසිනි නිහඬව හිස එසෙව්වාය.

"එහෙනම් අපි උදේට කතා කරමු. අම්මටත් නිදි මත ඇතිනේ නිදා ගන්න" රංජිත් කීවේය.

කාමරයට පිවිස ඇඳේ ඇලවුන රංජිත් ගේ සිතෙහි හංසිනි කෙරෙහි දුකක් ඇතිවුණි. කෙසේ හෝ ඇයට උපකාරයක් කිරීමට ඇත්නම් හොඳයැයි ඔහුට සිතුණි. දේශපාලන උපකාරයක් ලබාදීමට උවමනා නම් ඒ සඳහාද බැරිකමක් නැත. ප්‍රධාන ප්‍රශ්නය වී පවතින්නේ කොළඹට යාමට නොහැකි කමය. දන්නා හඳුනන කිසිවෙකුට මුණ ගැසුනොත් දමිතා සූදානම්කර ඇති උපක්‍රම විනාශවනු ඇත. නිදන ගවුමින් සැරසුන හංසිනි කාමරයට එන හැටි ඔහු දුටුවේය. වතුර වීදුරුව මේසය මත තැබූ ඇගේ රුව ඔහුට යාන්තමින් එළිය වූ පහනේ ආලෝකයෙන් පෙනුණි. ඇය හා කතා කළ යුතුද? ඔහු මොහොතක් සිතුවේය.



# 10

දවස ආරම්භ වූයේ වැස්සත් සමගිනි. සොල්දර වහලය ඇති තැන හැරුණ විට වැහි කාලයට සිංහල උළු වහලය තෙමෙයි. රංජිත් රෙද්දට වකුටුවී මද වේලාවක් සිටියේය. ඔහු නැගී සිටියේ හංසිනීගේ හඬිනි.

"අයියෙ එන්න තේ බොන්න"

ඔහු නැගිට එළියට ආවේය. මුව සෝදමින් වැස්ස දෙස බැලුවේය. ඉකුත් දින කෙටූ පොළවට වතුර උරා බී ඇත. සියළුම කොළ රොඩු පොඩ්ඩි සිටින මුර මඩුව දෙසට සෝදා යනු පෙනේ.

"පුදුම වැස්සක්."

"ළඟදීම වැස්සක් වැටෙයි කියලා මම හිතුවා. ධාතු වැඩමවූමට පස්සෙ මෙහෙම වහිනවලු" නැන්දම්මා ගේ හඬ ඇසුණි.

"මොකද මේ ලෑස්තිවෙලා කොහෙවත් යන්නද?"

"ඉන්ටවිව් එකට යන්න යාළුවෙක් හොයන්න යනවා"

"මේ කෙහෙල්මල නැතිනම් මම එනවා. දමිතලා ගේ පිස්සු වැඩ"

හංසිනි කිසිවක් පැවසුවේ නැත.

"මම පේරාදෙණියට ගිහින් එන්නම් මගෙ යාළුවෙක් ඉන්නවා. මා එනකල් කොහෙවත් යන්න එපා."

හංසිනි බෑගය හා කුඩය අතට ගෙන නිවසින් පිටව යාමට සූදානම් වුණි. කුස්සියේ කිසිවක් කරමින් සිටි පොඩ්ඩි කැඳවූ හංසිනි ගොළු භාෂාවෙන් ඇයට අවවාදයක් දුන්නාය. ඇසේ ශල්‍යකර්මය කරන තෙක් අම්මා පසුවන්නේ අමාරුවෙනි. මෑතක සිට අම්මාට එළියට පහළියට උනත් යාමට තරමක අසීරු බවක් ඇතිව තිබුණි. රංජිත් අයියා සෙමින් සෙමින් කාමරය දෙසට යනු දුටු හංසිනිගේ සිතේ තරමක සතුටක් ඇතිවුණි. පිරිමියෙක් පමණක් සිටින නිවසේ ගොළු ගැහැණියක වූ පොඩ්ඩි දමා යාම යෝග්‍ය නැත. පිරිමියෙකුගේ සිත උදුරා ගන්න තරම් කතා කරන සරාගී දේහයක් ඇති තරුණියක සමග අයියා තනිකර දමා යාමටද නොහැක. මුළු ගතම මවිල් වලින් ගැවසුණු, තේජවන්ත පිරිමිකමක් ඔහු සතුය. ඕනෑම ගැහැණියක් තමා වෙත



කැන්දවා ගැනීමට හැකි ජප කළ මන්ත්‍රයක් වැනි රංජිත් අය්යා හා ගැහැණියක් දමා යාමටද නොපුළුවන. හංසිනි යළි පොඩ්ඩිට අතින් සංඥාවක් දුන්නාය. පොඩ්ඩි පන්මල්ලක් රැගෙන ඔවුන්ගේ නිවස පිහිටා ඇති ලන්ද දෙසට පියවර මනිනු ඈ දුටුවාය. පොඩ්ඩිට හිතානුකූල විවාහයක් තිබුනත් ඔවුනතර බැඳීමක් නැත. සැමියාට ඇත්තටම ගැහැණියෙක් අවශ්‍ය නැති නිකමෙකි. මොනවා හෝ කුලී වැඩක් කර ලැබෙන මුදලින් මත් පැන් බී ඊළඟ මත් පැන් වේල වෙනුවෙන් නවත් කුලී වැඩක් කරන බේබද්දෙකි. කොහොමටත් සතියකට වරක් දෙකක් සැමියා පොඩ්ඩිට පහර දෙනු ඇසේ. ජීවිතය බේරා ගැනීමට ඇය නිවසට දුව එයි. කිසිම අණක් ගුණක් නැති කැලෑ බල්ලෙක් බඳු වූ ඔහු තරමක් හෝ ගරු කරන්නේ හංසිනිගේ අම්මාට පමණි. කොච්චර ගුටි කෑවත් පොඩ්ඩි කිසිවිටෙක ඔහුගේ වරදක් පවසන්නේ නැත. හංසිනි වඩාත්ම පොඩ්ඩිව යැව්වේ තමා නැති අතර ඇගේ සැමියා එනැයි සිතුණ හෙයිනි. හංසිනි මිතුරිය හමුවීමට ගියේ යාන්තම් වැස්ස වැටෙද්දීය. කුඩයකින් යාමට නොහැකි තරම් වැස්ස වැඩිව තිබුණි. නිවසින් බැහැරව ගොස් සිටි මිතුරිය එනවිට සැහෙන්ට සවස් වී තිබුණි. ඇයට ඒමට සිදුවූයේ මිතුරියගේ නිවසින් දිවා ආහාරයද ගැනීමෙන් පසුවය. සිතූ පරිදි ඇය ගමනට සූදානම් කරවා ගැනීමට ලැබුනේ නැත.

"අනේ කෙල්ලෙ මට හෙට වැදගත්ම ගමනක් යන්න තියෙනවා. නැත්නම් මම ඉවර් එකට උඹ එක්ක එනවා."

"මම උඹත් එක්ක යන්නයි හිතුවෙ"

"දැන් ඉතින් මොනාද කරන්නෙ. ඇයි අම්මා?"

"අම්මාට ප්‍රෙෂර් එකයි ඇඟේ අමාරුවයි දෙකම. අතින් එක මේවගෙ ගමන් අම්මා එක්කගෙන ගියාම හරි කරදරයි."

"නොගිහින් ඉන්න එපා. අක්කා ඉන්නෙ කොළඹ නේද?"

"මට පිටකොටුවට විතරයි යන්න දන්නෙ. ඊට පස්සෙ පාරවල් හොයාගෙන යන්න දන්නෙ නෑ."

"ගිහින් අතරමං වුනොත් නේද? තනියම නම් යන්න එපා. දන්නවනේ අද රටේ හැටි."

හංසිනි බසයේ අසුන් ගත්තේ දහසතුන් එකක් ප්‍රශ්න හිස දරාය. ජයවඩනගම සිටියා නම් මේ වනවිටත් රැකියාවක් සොයාගෙනය. දැන් ඉතින් ස්වාධීනව ජීවත්වීමට අනවශ්‍යය. සංගීත හා නැටුම් ඉගෙනුම ලැබුවත් දැන් සෑහෙන කලෙකින් පුහුණුවක් ලැබී නැත. සංගීත ගුරු පරීක්ෂණයට යාමට ප්‍රථම ගුරුතුමා හමුවීමට සිතා සිටි මුත් ඔහු ජන්මාන්තර ගතව සිටීම ප්‍රශ්නයකි. හෙට කෙසේ හෝ යා යුතුය.

ඇය නිවස දෙසට ගමන් කලේ තීරණයක් නැතිවය. ඇය කෙළින්ම ගියේ අයියා නිදන කාමරයටය. ඉකුත් හෝරාවේ ඇද වැටුණු වැස්ස නිසා ඔහු නිවසට වී සිටිනවා විය හැක. අක්කාගේ සැමියා නිදන කුටියට එකවරම පිවිසීමට ඇයට සිතුනේ නැත. ඇය සෙමින් සෙමින් කාමරයට පිවිසුනාය. කාමරයේ වැතිර සිටි අය දෙස තවත් සමීප වී බැලුවේ සැලෙන හදවතිනි. බැරිවෙලාවත් ඔහු ඇතින් අල්වා තුරුල් කරගත හොත්. පනාගොඩ හමුදා කඳවුරේ සිටියදී එක් දිවා සමයක ඈ පන්ති ඇරී කාමරයට පිවිසෙද්දී දුටු දසුන තවමත් අමතක කළ



නොහැකි සිදුවීමක් ලෙස සිතේ ඇත. හංසිනිට වැසි හඬ ඇසුණි. යාන්තමින් විවරව ඇති කවුළුවෙන් කාමරයට සුළං රැළි ගලා එනු දුනෙයි. ඇඳේ තිබුනේ කොට්ටය මත තබන ලද ඇඳ රෙද්ද පමණි. හංසිනි ආපසු හැරී කාමරයෙන් පිටතට ආවාය. වැස්ස තවම එකසේ පවතී. ඔහු සැඳෑ අරණට නොයන්නටද ඇත. පොඩ්ඩීත් ගෙදර නැත. වැස්ස තුරල් කර මඳ වේලාවකට පසු ලන්දේ සිට කඩිනම් ගමනින් නිවස දෙසට එන තැනැත්තා ඇය හඳුනා ගත්තාය. එම අඩිපාර යොමුව තිබුනේ පොඩ්ඩීගේ පැල්පත දෙසිනි. කිසිත් නොදක්තියක මෙන් හංසිනි සාලයේ ඉඳ නුවරින් මිලදී ගත් යොවුන් පත්‍රයක නවතම කලාපය දෙසට යොමු වූ ඇසින් යුතුව සිටියාය.

"ලොකු නංගි කොයි වෙලේද ආවෙ?"

"මේ දැන් ටිකක් වෙලා. මාව වැස්සට අහුවුණා. අයියා නිදාගත්තද?"

"ඔව්.. නෑ මම මේ කම්මැලි කමට ටිකක් ඇවිදින්න ගියා වැස්සට අහුවුණා."

"හා ඇත්තද?" ඈ ව්‍යාජ සිනාවකින් මුව සරසා ගත්තාය. මෙයා පොඩ්ඩිලාගෙ ගෙවල් පැත්තෙ ගියාද? ඇගේ පපුවේ නොදන්නා ගින්දරක් ඇතිවුණි. රංජිත් අය්යා නිවසේ මෙහෙකාරිය වෙත යාමට තරම් පහළ තත්ත්වයකට පත්වේද? ලෝකයේ ගැහැණු නිර්මානය වන්නේ එක පරිද්දෙනි. සිතුම් පැතුම් ආශාවන් අවශ්‍යතාවයන් එකය. ලස්සන සුදක් ඇති ඈ මේ ගමේ කොයි කාටත් වඩා හැඩය. වෙනසකට ඇත්තේ ගොළු බව හා නැති බැරිකම පමණි. මේ ලොව සිටින

ගැහැණුන්ගෙන් වැඩි කොටසක් නැති බැරිකමින් හා නුගත්කමේ ව්‍යාධියෙන් පෙලෙන්නවුන් වෙති.

ආර්ථික, මානසික හා ලිංගික වශයෙන් සූරා කෑමට හසුව සිටිති. හංසිනිගේ නිවසේ වැඩ කළත් පොඩ්ඩිට ලැබෙන්නේ කුස පුරවා ගැනීමට ප්‍රමාණවත් කෑම ටිකක් හා හාල් ටිකක් පමණි. සවි ප්‍රකාරයෙන්ම ඇය සොඳුරු ගැහැණියකි. ඇගේ කය ඔනෑම සැපයකට සුදුසුය.

"අයියාට තේ එකක් හදලා දෙන්නද?"

"නෑ එපා. අවශ්‍ය නෑ"

ඔහු සිය කාමරය දෙසට යමින් කීවේය. වෙනදා සරලව සැහැල්ලුව කතා බස් කරන ඔහු අද තමාට මුහුණ නොදෙන හැටි. කාමරයට පිවිසි ඔහු තදින් දොර වසා ගන්නා හඬ ඇසුණි. වැස්ස පායා තිබුණි. යළිත් තෙත්වූ ගස් අතරින් තෙත හුළං හමනු දුනෙන්. තණපත්වල හා ගස්වල තවමත් පිණි බිඳු ඇත. ඇඟිලි අතරින් වැහි දිය ගලා යාම නිසා මිදුලේ තෙත් බව අඩුව ඇත.

කොළඹට ගොස් පාර අසාගෙන පොඩ්ඩි සමග ඉසුරුපායට යා යුතුය. ඇය දොර අඩවන් කර පොඩ්ඩි සිටින නිවස දෙසට ගියාය. හැම දෙයක්ම ලැබෙන්නේ ප්‍රශ්න අතරිනි. පොඩ්ඩි හදිසියේ කැඳවාගෙන යාම සඳහා ඇඳුම් සපයා දිය යුතුය. වෙනදානම් ඇය රෑ කෑම පිළියෙල කිරීමට පැමිණ හමාරය. තවමත් නැත්තේ ඇයි?

යාන්තමින් අඩවන් කර තිබූ දොරෙන් ඇය මුරගෙය තුළට එබිකම් කර බැලුවාය. පරිසරය අතිශයින් නිහඬය.



අක්කර පහළොවක් පමණ වූ භූමි භාගය තුළ ඇත්තේ වලව්ව හා මුර ගෙය පමණි. බැස යන හිරු ගේ ආලෝකය ජනේලය අතරින් කාමරය තුළට ගලමින් තිබුණි. ඇය ලබමින් සිටියේ සුව පහස් නින්දකි. චිත්තය විසිර යාම නිසා ස්වේත වර්ණ කාන්තිමත් වටොර දිස්වෙමින් තිබුණි. කිසිදාක මෙවන් අවේලාවක ඇය නිදන්නේ නැත. එවන් විවේකී බවක් ඇගේ දිවියේ නැත. නිදා සිටින ඉරියව්ව පිරිමියෙක් දැක්කොත් ? ඇය පොඩ්ඩිට කතා නොකර ආපහු හැරී නිවසට ආවාය.

ඉස්තෝප්පුවේ සිමෙන්ති පොළවේ ඉඳ දුම්වැටියක් උරන රංජිත් අයියා ඇගේ නෙත ගැටුණි.

"ගිය ගමන මොකද කර ගත්තෙ?"

"ඒක හරියන්නෙ නෑ අයියෙ. යාළුවට වැඩක්."

"මොනවා වුනත් මේ අවස්ථාව නැතිකරගන්න එපා."

"ඒක තමා මාත් කල්පනා කළේ. මම හිතුවෙ තනියට පොඩ්ඩිව එක්ක යන්නයි."

ඔහු ඒ පිළිබඳව කිසිවක් කීවේ නැත.

"බැරිවෙලාවත් ඔය කෙල්ල අතරමං වුනොත් තවත් කරදරයක්. ඉන්න මම ගිහින් ඇරලවන්නම්"

"නෑ... නෑ... එපා. එපා. ඉසුරුපාය තියෙන්නෙ අයියලාගෙ ගෙවල් කිට්ටුව නේද? කවුරුවත් දැක්කොත් ?"

"අම්මා සෙමින් සෙමින් කාමරය දෙසට එනු හංසිනි දුටුවාය.

"මොකද දුවේ කරගත්තෙ. අනුෂ්කා ගමනට කැමති වුණාද?"

"එයාට ගමනක් යන්න තියෙනවා කියල බෑ කිව්වා." ඇය කඳුළු පිසදා ගනිමින් කීවාය.

"මගේ ආරක්ෂාව මංම සලසා ගන්නම්. ඔයා උදේ ලෑස්තිවෙන්න. අපි පාන්දරින්ම යමු."

"අනේ ළමයො එහෙනම් බොහොම පරිස්සමින්. ඔක්කොටම වඩා තමුන්ට වැදගත් ගමනකුත් යන්ට තියෙනවනේ."

"අම්මා බයවෙන්න එපා. ලොකු නංගිට ලෑස්තිවෙන්න කියන්ට."

ඔහු සිය කාමරයට යමින් කීවේය.

නිවස තුළ පැතිරුනේ නිහඬ බවකි. රංජිත් අයියා මෙවැනි වික්‍රම ක්‍රියාවල යෙදීමේ නිපුණත්වයක් ඇත්තෙකි. සංගීත භාණ්ඩයක් අතින් ඇල්ලූ දිනයක් මතක නැති තරම්ය. ඇය වයලීනය ගෙන තත් එකක් කර බැලුවාය. මඳ වේලාවකට පසු කාමරයට හිස පොවන අය නෙත ගැටුණි.

"බැරි වෙලාවත් හෙට ඉන්ටවිව් එකේදි මොනව හරි වාදනය කරන්න කිව්වොත් ?" ඇය රංජිත් දෙස බලා කීවාය.

"ප්‍රැක්ටිස් පාරක් දෙමු." ඔහු කාමරයේ තිබූ තබ්ලාව එළියට ගනිමින් කීවේය.



යාන්තම් සංගීත භාණ්ඩය අතපත ගෑමට දන සිටියත් විෂයක් ලෙස ඔහු සංගීතය පුගුණ කර තිබුණේ නැත. කාලය අනුව ඇයට සහාය වීමට තරම් හැකියාවක් ඔහු වෙත තිබුණි. මෙම වාදනයට සහෘදයෙක් ලෙස සිටියේ ශ්‍රවණාබාධිත පොඩ්ඩි පමණි. ඔවුනට නුදුරින් දණගසා අසුන්ගෙන සිටි පොඩ්ඩිගේ දෙනෙත් යොමුව තිබුනේ තෙදවත් පිරිමියා වෙතය. මධුරවූ සංගීත රාවයක් විසිර ගියත් ඉන් සතුටක් ලැබීමට ඇය අභාග්‍ය සම්පන්නව සිටියාය. මේ ජීවිතය මිනිසාට තිළිණ පිරිනමන හැටි කොතරම් කුරිරුද? ඔවුන් ඉදිරියේ දණ ගසාගෙන සිටින අහිංසකාවිය පිළිබඳව දැඩි දුකක් රංජිත් ගේ සිතේ පවතී. මෙම පුහුණුවේදී රංජිත් අයියා ගෙන් ලැබුනේ නොමඳ සහායකි.

"දෙවියො පය නොගහන තැන්වල මෝඩයෝ පිනුම් ගහනවලු. කව්රු හරි දන්න කෙනෙක් හිටියානම් මට හූ කියයි" රංජිත් වාදනය නවතා සිනාසුනේය.

"නෑ නෑ. අයියා හොඳට සෙල්ලම් කරන්න දන්නවා. ඇත්ත කියන්න. කොහෙන්ද ඉගෙන ගත්තෙ ?"

"රාහුලේ ඉගෙන ගන්න කාලෙ පන්තියෙදි මේ ටික ඉගෙන ගෙන තිබුණා."

ඔවුන්ට තවත් සුන්දර රාත්‍රියක් වුණි. පොඩ්ඩි තේ පැන් සංග්‍රහයක් කළේ කිසිදු ආරාධනයක් නැතිවය. පණ්ඩිත් අමරදේව, සුනිල් එදිරිසිංහ, පී.වී. නන්දසිරි, නන්දා මාලිනී මෙන්ම මුකේශ්, උදිත් නාරායන්, අල්කායග්නි, අනුරාධා පෞද්වාල් වැනි හින්දුස්තානි ගායක ගායිකාවන්ගේ ගීතද ඔවුහු ගායනා කළහ. මේ සංගීත රාත්‍රිය නතර කළේ පසුදින ගමන යෙදී තිබුණු හෙයිනි.

## 11

හංසිනී ඊ නිදාගන්ට ප්‍රථම ගමන සඳහා අවශ්‍ය කළමනා සම්පාදනය කර තැබුවාය. මේ ගමන පිළිබඳ දෘඩ ස්ථිර බවක් සිතේ ඇත. පරීක්ෂණයට යන්නේ නියම සුදුස්සා සමගය. එහෙත් සිතේ සැහෙන බියක් ඇත. අක්කා රංජිත් අයියා මෙහි එව්වේ වීසා බලපත්‍රය එනතෙක් සඟවා තැබීමටය. යම් විදිහකින් මෙම ගමනේදී අයියා පොලිසියට අසුවුවහොත් ඇගේ සමස්ත උත්සාහයම ගඟට කැපූ ඉණි පරිදි අසාර්ථක වනු ඇත. රංජිත් අයියා නම් යකාටවත් බය නැති මිනිසෙකි. කෙසේ වුවත් ඇය ඔහු කරන මැරකම් වීරකම් අගය කළේය. පාසැල් සිසුනට දමන විනය නීති දමිතක්කා අයියාට දැමීමට සූදානම් වෙයි. කව්රුවත් නැති දිනෙක අයියා අක්කා ගේ පසු පසින් පැමිණ ගවුම ඉහළට ඉස්සූ හැටි හංසිනී



දුටුවාය. එහි ප්‍රතිඵලය වූයේ කෝපවූ අක්කා ගේ වටේ පසුපසින් එලවා පහර දීමය.

හමුදාවේ මාස දෙක තුනක් ගතකර එන අයියා අක්කා ගේ නීති රීතිවලට යටත් වෙන්ට කැමැති නැත. අක්කා කලත්තැනි පාසැල් ගුරුවරියක් වීමට කැමති වුනත් රංජිත් තරුණකම අතැර දැමීමට අකමැතිව සිටියේය.

ඔර්ලෝසුවේ පාන්දර හතරේ කණිසම සටහන් කරන මොහොතේදී ද ඇය සිටියේ පිබිදීය. ගතේ ස්වභාවික වෙනස දැනගත් මොහොතේ සිතට පිවිසුනේ තරමක කෝපයකි. මේ කරදරේ අදම වුණා. ඒ අනුව ඇඳුම් ද වෙනස් කරන්ට සිදුවුණි.

රතු පැහැති සාරිය හංසිනිගේ ගතට තවත් එළියක් එක් කළේය. ඇය මේ ඇඳුම තෝරා ගත්තේ මව හා සාකච්ඡා කිරීමෙන් පසුවය.

"ලොකු නංගි සහතිකයි, ඩිපාමන්ට් එකෙන් එව්ව ලියුමයි අයිඩෙන්ටිටි කාඩ් ඔක්කොම ගත්තද?" රංජිත් ඇසුවේය.

හිස වැනූ ඈ ඒ මේ අත ලත වුනාය..

"ඇයි මොනවත් ප්‍රශ්නයක් තියෙනවද?" ඔවුන්ගේ අසංවිධාන බව ඉවෙන් මෙන් වටහා ගත් රංජිත් ඇසුවේය.

"අම්මා මම යනවා" ඇය පහත්වී මවට වැන්දාය.

"අනේ රංජිත් ළමයෝ, මම මේ කෙලීව යවන ගමනක්

නෙමේ අපිත්තෙ. දන්නවනේ අපේ ලොක්කිගෙ හැටි. මේ ළමයා බොහෝම පුවේසම් වෙන්න ඕනෑ. පොලීසියට නෙමේ ගමේ අය ගෙනුත් වසන් වෙන්න ඕනෑ."

"අම්මා අරක නංගිගෙන් ඉල්ලා දෙන්වකො" ඈ රංජිත් ගෙන් මදක් ඈත්ව මවට කීවාය.

"පොඩ්ඩුව... ඕක අක්කාට දෙන්ට, ඇවිදින් දෙයිනෙ."

දිස්නි දෑස් පිසිමින් එළියට ආවාය.

"මට බෑ. අද පත්තරෙන් පොටෝ ගන්ට නිසා මට වෙන් එක ඕනෑමයි."

"අක්කා යන්නෙ කොළඹ ඉන්ටවිව් එකකට. සාරියක් ඇඳල කර හිස් වෙලා යන්ට බෑ පොඩ්ඩුව."

"දෙනවා මම ගිහින් ඇවිදින් දෙන්නම්" හංසිනි කඳුළු පිරි දෙනෙතින් කීවාය.

දිස්නි කාමරයෙන් පිටව ගිය පසු හංසිනිගේ සිතට පිවිසුනේ ආත්මානුකම්පාවකි. ඈ කාමරයට ගොස් ඇඳේ ඉඳ කොට්ටයේ මුණ හොවා ගත්තාය. මඳ වේලාවකට පසු කාමරයට පිවිසි රංජිත් අයියා කතා කරන හඬ ඇසුණි.

"නැගිටින්න අපට පරක්කුයි." ඔහු ඇගේ දෙවුර සොලවමින් කීවේය. හංසිනි හිස එසෙව්වාය.

"මෙන්න මේක තියාගන්න" ඔහු අගේ අත දිග හැර



සිසිවක් තබමින් කීවේය. මොහොතකින් ඇගේ දෙනෙත් වල කඳුළු මතුවුණි.

"එපා අයියා, මේක ඔයා තියාගන්ට. වෙන් එකක් නැතිවට කමක් නෑ."

"කෝ එහෙනම් මම බඳින්නම්. ලොකු නංගි මේක මගෙ තෑග්ගක් කියල හිතා ගන්න."

ඔහු ඇගේ ගෙලවටා මාලය බඳිමින් කීවේය. ඉන්පසු ඈ මඳ වේලාවක් දෑස් වසා හැඬුවාය.

දළදා ප්‍රදර්ශනය නිසා නගරය හිමිදිරියේ සිටම ජනාකීර්ණව පැවැතුණි.

"රංජි අයියා මා නිසා කරදරවුණා නේද?"

"පිස්සුද මට දුක ලොකු නංගිට පයින් ඇවිදින්ට වෙච්ච එකටයි."

"අයියෝ... මට අමාරු නෑ. අද නම් අයියෙ අතට යන්ට වෙන එකක් නෑ."

රංජිත් කඩිනමින් ඉදිරියට ගියේය. ඔහු නියමිත කොළඹ නුවර දිවෙන වායු සමීකරණ බස් රථයකට පිවිසුණි.

"අයියෙ මේකෙ දෙගුණයකට වඩා ගාන ගන්නවා නේද?"

"අවශ්‍යතාවය මිල කරන්නෙත් නෑ. එවගේ අයිතිකාරයාට නීතියකුත් නෑ. මෙතනින් ඉඳගන්න."

ඇ නිහඬව සුවපහස් අසුනේ ඉඳගත්තාය. ඔහුගේ කතාව කොතරම් භාව පූර්ණද? මිනිසා අවශ්‍යතාවය වෙත දුව යන්නේ අවිචාරයෙනි. එය ලබා ගැනීම හැර ඒ පිළිබඳව ඇති නීති රීති පිළිබඳව විමසන්නේ නැත. ඇගේ අත සෙමින් ගියේ ගෙල බැඳි රන් පළඳනාව වෙතය. අඩු වශයෙන් එය පවුම පහට වැඩිවිය යුතුය. මෙවන් රන් පළඳනාවක් ජීවිත කාලයේදී කිසි දවසක පැළඳ නැත. දමිතක්කාගේ ගෙලේ ඇත්තේ ද කුඩා ප්‍රමාණයේ චේන් පටකි. බැරිවීමකින් වත් අක්කා මෙය දුටුව හොත් නිත්‍ය වශයෙන්ම අයියාට හා තමාට බණිනු ඇත.

අයියා මාලය ගෙලේ බඳින විට අමුතුම හැඟීමක් ඇගේ සිතේ ඇතිවුණි. 'මෙක මගෙන් තෑග්ගක්' ඔහු කීවේ තිර ලෙසිනි. මම ඒක අයියාට ආපහු දෙනවා. නංගි ලොකු ළමයෙක් වෙච්ච දවසෙත් මාලයක් දුන්නා.

"මොනවද කල්පනා කරන්නෙ?"

"නෑ මුකුත් නෑ." ඇ ලේන්සුවෙන් නාසය පිස දමා ගනිමින් කීවාය.

"දමිතක්කාට තරහ යාවි"

"මම මාලෙ පිට ගෑනියෙකුට දුන්නෙ නෑනේ. තමුන්ගෙ නංගිට නෙ දුන්නෙ. අනික ලොකු නංගිට චේන් එකක් දෙන්න හිතා ගත්තෙ පොඩි නංගිට තෑග්ගක් දුන් දවසෙයි. ගණන් ගන්ට එපා."

ඔහු ඇගේ අතට සෙමින් තට්ටු කළේය. බසය තුළ මන්ද ස්වරයක සංගීත නාදයක් පැතිරෙමින් පවතී. එය හදවත සෙමින් සිරි මැදීමක් වැන්න. දල්වන ලද විදුලි පහන් නිසා බසය තුළ මඳ



එළියක් පැතිර තිබුණි. ඇතැමෙක් සුවපහස්වූ පාන්දර නින්දේ කොටස් කරුවන්ව පසුවූහ.

"මෙහෙ නාවනම් හොඳයි කියල රංජි අයියාට හිතන්නෙ නැද්ද?"

"මම ජීවිතේ එච්චර ඈතට සංවිධානය කරන්නෙ නෑ. අද සමණයි ජීවත් වෙන්නෙ"

"එතකොට අක්කා. දරුවො...?"

"අපේ හොඳම යාළුවො හුඟදෙනෙක් සටනේදි මැරිලා. මම හිතුවෙ නෑ ඒ ගැනු තොබදීවි කියල. දැන් සමහර අය හිටියට වඩා හොඳ ජීවිත ගතකරනවා."

"ඔයා හරි නරක කතා කියන්නෙ. ඔයාට තියෙන ආදරේ නිසා නේද අක්කා මේ විදිහට හංගාගෙන ඉන්නෙ."

"මම හමුදාවෙ හිටපු නිසාද මම දන්නෙ නෑ. මගෙ හිත දැඩිවෙලා. මට අවශ්‍යවෙලා තිබුනෙ දමිතාගෙ හිත හදන්න. මාව හදිසියෙන් දමිතාට අහිමිවුනොත් එයාට හිත හදාගෙන ජීවත්වෙන්න පුළුවන් කම තියෙන්න ඕනෑ. මම මළාට පස්සේ වෙනින් මිනිහෙක් එක්ක යන්න පුළුවන් වෙන්න ඕනෑ."

"හරි නරකයි" ඇ රංජිගේ අතට සෙමින් පහරක් ගැසුවාය.

ටික දුරක් යද්දි ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි. කඩුගන්නාව තරම වෙද්දි ඔහු නින්දකට වැටී සිටින හඬ ඇයට

ඇසුණි. ඔහුගේ හිස තම උරට හේත්තු වී තිබීම නිසා ඇගේ සිතට සතුටක් දැනුණි. ඔහු කතාවෙන් ක්‍රියාවෙන් සෘජු හැසිරීම හෙළි කර ඇත්තෙකි. ජීවිතයේ කිසිම දිනෙක තමා පිරිමියෙක් හා මෙතරම ළඟින් ඇසුරු කර නැත. අක්කා සිටිනවිට ඔහුට දැක්වූයේ ගෞරව පෙර දැරිවූ හිතවත් කමකි. ඈ යළි ගෙලේ වූ චේන්පට අතගා බැලුවාය. මේක දැක්කොත් අක්කට පිස්සු හැදෙයි.

අගනුවර 'පැමිණි පසු බස් නැවතුම් පලේ වැඩිපුර ගැවැසීමට ඔහු කැමැතිවූයේ නැත. හංසිනි කිසියම් අපහසුතාවයකින් ඒ මේ අත ඇඹරෙනු ඔහු දුටුවේය.

"ඇයි මොනවත් ප්‍රශ්නයක්ද?"

ඈ මඳ සිනාවකින් යුතුව බිම බලා ගත්තාය. එය අවබෝධ කර ගැනීමට රංජිත්ට වැඩි වේලාවක් ගතවූයේ නැත. ඔහු මධ්‍යම ප්‍රමාණයේ හෝටලයක් වෙත ඇය කැඳවා ගෙන ගියේය.

"ඇයි මේ අපි කොහෙද යන්නෙ?" ඇය තරමක සැකයකින් යුතුව හෝටලයේ පිය ගැට නගිමින් ඇසුවාය.

"අපි යන්නෙ උදේට තේ බීල විවේක අරගෙන යන්න"

"උදේට තේ බොන්න මේවගෙ හෝටලයකට එන්න ඕනැද? මට බෑ එන්න" ඈ පඩි පෙළ අසල නතර වෙමින් කීවාය.

මොනවා හෝ සූදානමක් ඔහුගේ සිතේ තිබුණා වන්ට බැරි නැත. පිරිමි නම් කවදාවත් විශ්වාස කළ නොහැකි ජාතියකි. දහස් ගණනක් වටිනා මාලයක් දුන් පලියටම ඔහුට ජීවිතය පාවා දිය නොහැක. ඊටත් වඩා ඔහු තම සොයුරියගේ සැමියා වෙයි. කිසිසේත් ඇයට ද්‍රෝහි විය නොහැක.



"මේ සෙනඟ බලා ඉන්නවා. එන්න ඇතුළට" ඔහු කාමරයේ දොර විවෘත කර හංසිනි හෝටලයේ කාමරය තුළට ගත්තේය. සුදු ඇඳ ඇතිරිලි දමන ලද නිදන යහන දැකීමෙන් ඇගේ දෙපා පණ නැතිව ගියේය.

'දෙයියම් පල්ල ළඟට ආවොත් කෑගහනවා' ඈ තමාටම කියා ගත්තාය.

# 12

කාමරයේ විදුලි පහන දල්වා විදුලි පංකාව ක්‍රියාත්මක කළ රංජිත් අයියා තමා දෙසට එනවිට ඇගේ ගත සසලව ගියේය.

"අපි නමෙට යන්න ඕනෑ. මම තේ ලෑස්ති කරන්ට කියල එන්නම්"

ඔහු කාමරයෙන් පිටව ගියේය. ඔහු විසින් සලසා දුන් අවස්ථාව පිළිබඳව ඇගේ සිතේ ඇතිවූයේ ගෞරව පූර්වක හැඟීමකි. ගැහැණියකගේ හදවත ඉවෙන් මෙන් වටහා ගැනීමට සියුම් දැනුමක් ඔහුට තිබුණ හැටි. නාන කාමරයට ගොස් මුහුණ සෝදා සූදානම්වී එනවිට ගතට දැනුනේ අමුතුම සහනයකි. කණ්ණාඩිය ඉදිරියේ හැඩ වෙද්දී නිසියාකාරව ඈ ගෙල බැඳි රන්දම් වැල දුටුවාය. මුහුණට අමුතු ලස්සනක්



මෙතෙක් කල් හිස්ව තිබූ ගෙලට අමුතු හැඩයක් ලැබී තිබුණි. රංජිත් අයියා ආවේ කලබලයෙනි.

"හංසිනී, අපි තේ බීලා ඉක්මනට යමු"

"මට නම් තේ බොන්ට බෑ අයියෙ"

"ඇතිවෙන්න කෑම කාල යන්න ඔනෑ. අම්මාගෙවල ඉන්වව්ව එක දෙක තුන වෙනකල් තියෙන්ට ඉඩ තියෙනවා" ඔහු ඇගේ පිඟානට ඉඳි ආප්ප බෙදමින් කීවේය.

උපගුරු පත්වීම තිබුනේ දුෂ්කර පළාත් සඳහාය. පැමිණ සිටි වැඩි දෙනෙක් ඈත පළාත් වල අයදුම් කරුවන්ය. හංසිනිට නම් පත්වීම නො ලැබෙන්ට කිසිදු හේතුවක් නැත. තමා අද පත්ව තිබෙන තත්ත්වය අනුව ඇයට උපකාර කිරීමට පුළුවන් කමක් නැත. බත්තරමුල්ල, තලවතුගොඩ, වැඩි දෙනෙක් ඔහු හඳුනති. හමුදා පොලීසියට හෝ පොලීසියට අසුවීමට වඩා බිරිඳට අසුවීම වඩාත් භයානකය. ජයවඩනගම නිවාස සංකීර්ණයේ කීප දෙනෙක්ම ඉසුරුපායේ සේවය කරති. ආමි පොලිසියේ සේවය කරන රුක්ෂාන් ගේ බිරිඳ වන අයෝමා මෙහි ලිපිකාරිනියකි. ඇය ගෙ දුව ඉගෙන ගත්තේ දම්තා යන විද්‍යාලයේය. බිම් බෝම්බයකට අසුව මිය ගිය සාජන් මේජර් ඉක්බාල් ගේ බිරිඳත් ඉන්නේද මෙහිය. පාවුම්මා බිරිඳගේ හොඳම මිතුරියෙකි. මේ කව්රු දක්කත් වස බිව්වාස් වැනිය.

සම්මුඛ පරීක්ෂණය අවසන් වන විට දෙක පමණ වී තිබුණි. දහයට පමණ ආරම්භ වූ වැස්ස ඒ වනවිටත් තුරුල්ව තිබුනේ නැත. ඔහු කාර්යාලයට පැමිණි ත්‍රීවිලරයකට ගොඩ වැදී ඉටි රෙද්දෙන් කවුළුව වසා ගත්තේය.

"කොහොමද?" ඔහු ඇගේ අත මත සියත තබා ඇසුවේය. ඇය පිළිතුරක් නොදී නිහඬව සිටියාය.

"ඔයා බය නැතිව ඉන්න. හිත දුර්වල කරගන්ට එපා. ඉන්ටවිව් එක ඉවරනෙ මට ඔයාගෙ නම්බර් එක තියෙන කොලේ දෙන්න."

ත්‍රීවිලරය ගැස්සෙන නිසා ඇය ඔහුගේ අතින් අල්වා ගත්තාය.

"ගෙවල් පැත්තෙ කව්රුවත් අයියාව දක්කද?"

"කීප දෙනෙක් දක්කා මම හැංගිලා වාගෙ හිටියෙ.." ඔහු සිනාසුනේය.

ත්‍රීවිලරය හෝටලය ඉදිරියේ නතර කළේය. වැස්සේම ඔව්හු හෝටලයට පිවිසුනහ. උදේ වරුවේ තිබූ අවිශ්වාසය දිවා සමයේදී ඇය වෙතින් පහව ගොස් තිබුණි. කාමරයට පිවිසි වහාම ඔහු ඇඳුම් පිටින්ම ඇඳේ වැතිර ගත්තේය.

"රංජි අයියාට මහන්සි ඇති"

"මහන්සි නෑ කම්මැලියි. වොෂ් එකක් දාගන්ට ඕනෑ"

ඔහු කමිසය හා ඇඳුම් මුදවා තුවායත් දවටාගෙන නාන කාමරයට වැදුනේය. තමාටත් ඇඟ සෝදා සැරසීමට අවශ්‍යය. අක්කාගේ සැමියා වුවත් ඔහු තරුණ පිරිමියෙකි. දඟකාරකම් අනන්තයට ගිය පුද්ගලයෙකි. අක්කා විවාහ වූ අලුත දෙදෙනාට රස කැවිලි බඳුන රැගෙන එද්දී දුටු දසුන අමතක



නොවන ලෙස සිතේ සටහන්ව ඇත. බොහෝ දේ අමතකව ගියත් යොවුන් ජීවිතයේ දී සිතට පිවිසි එම සිද්ධිය කවදාවත් අමතක නොවන්නකි. ගැහැණියක ලෙස කවදා හෝ තමාටත් එවන් අවස්ථාවකට මුහුණ දීමට සිදුවනු ඇත. සමහරවිට මේ මධුසමය ගත කිරීමට එන තැනක් විය යුතුය. හංගිනි ජීවිතයේ කවදාවත් මෙවැනි හෝටල් කාමරයකට ගොස් නැත. තුවාය දවටා ගත් ඔහු කාමරයෙන් පිටතට ආවේය.

"වොෂ් එකක් දාගන්නවද?"

ඈ හිස වැනුවාය. එහෙත් රංජිත් අයියා සිටියදී ඇඳුම් මාරු කිරීමට පුළුවන් කමක් ද නැත. නාන කාමරය තුළ ඇඳුම් ගැලවුවහොත් ඒවා අපිරිසිදුවීම වළක්වනු බැරිය. මුහුණ පමණක් නොව මුළු ගතම සෝදා ගත යුතුය. හිස ඔසවා බිත්තිය දෙස බැලීමට නොපුළුවන. බිත්තියේ ගසා ඇති කණ්ණාඩියෙන් ඔහුගේ ප්‍රතිබිම්බය දර්ශනය වෙයි.

"මම කෑම ඕඩර් කරල එන්නම්. මම වෙතින් ටවල් එකක් එවන්ට කියන්නම්. මම මේකෙන් ඇඟ පිස්සා."

"ඕන් නෑ මට මේක හොඳා..." ඈ තුවාය අතට ගෙන සිනාමුසු මුහුණින් යුතුව දොර වසා ගත්තාය. ඇඳුම් මුදවා වතුර මලේ දිය බිඳු පහස දරද්දී ගතට අමුතු සහනයක් දැනුණි. ඇඟ සෝදා ඇඳුම් මාරු කරගත් ඈ කණ්ණාඩියෙන් ප්‍රතිබිම්බය බැලුවාය. පළඳනාව අයියාට දිය යුතුය. දුවෙක් සිටියදී තමා වැනි පිටස්තර කෙනෙකුට මාලයක් දීමේ ඇති අවශ්‍යතාවය කුමක්ද? 'මොකද මෙච්චර පරක්කු. දහ සැරයක් කෑම ඕඩර් කරන්න වෙලා. දෙයියනේ අපි දැන් කීයටද යන්නෙ?'

මද වේලාවකට පසු දුම් වැටියක් දල්වා සිනාමුසු මුහුණින් එන රංජිත් අයියා හඳුනා ගත්තේය.

"මොකද පරක්කු වුණේ. ගිය කෙනා නොමේ ආවෙ" හංසිනී සිනාසුනාය.

"අයි ඇම් වෙරි සොරි කෙල්ලෙ. මම පහළට යනකොට අපේ රෙජිමන්ට් එකේ වැඩ කරපු කැප්ටන් වලගම්බාහු හම්බවුණා. ඉතින් මගෙ රංජියෝ කියල මෙන්න මෙහෙම බදා ගත්තා. මොකද අපි ආමි එකේ දාපු සෙල්ලම් එකෙන් වත් දාල නෑ"

ඔහු හංසිනිට ළයට තදකර අල්වා ගත්තේය. හංසිනි හැකිතාක් ගත හැකි දෙයක් නැතිව ඔහුගේ උණුහුමට මැදිව සිටියාය. ඔහු හිනැටින් ගෙනා හංසිනීගේ ගෙල දෙස බැලුවාය.

"කෝ මේ බෙල්ලෙ බැඳපු මාලෙ? මම ඒක බැන්දෙ ආයෙ ගලවන්ට නොමේ"

"මේ මාලෙන් කරගන්ට තිනෑ වැඩේ කරගත්තනේ. දැන් ඉතින් අයියා මේක ගන්ට." ඈ මාලය පාමින් කීවාය.

"මම දුන්න දේ ආපහු ගන්න ජඩයෙක් නොමේ. කෝ මේ මාලෙ? එකම බෙල්ලට දෙපාරක් එකම මාලෙ බැන්දම හයිය වැඩියි. මීට පස්සෙ මාලෙ ගැලෙව්වොත් මිරිකනව තාගෙ" ඔහු සෙමින් ඇගේ නාසය සෙලෙව්වේය.

ඇය ඔහු අනුවම් කෑම් සාලාව වෙත ගියේය. කෑම් මේසය වූයේ ඇගේ සිතේ ඇතිවූයේ පුදුමයකි.



"ඇයි අපරාදෙ මෙච්චර වියදම් කළේ?" ඇය කම්පා වෙමින් කීවාය.

"ඔයාට කෑමක් දෙන්න මට ලැබුණේ නෑ.

"බලන්ට හරියට මඟුල් මේසයක් වගේ

වේටර්වරයා නැවත බීම වීදුරුවක් රැගෙන ආවේය.

"අනේ අයියෙ බොන්ට එපා. දැන් කෙලින් ඉන්ටත් බෑ වාගෙ."

"ඔයා කෑම කන්න. මට එපා. ඉන්න මම බෙදන්න."

ඔහු හංසිනිට කෑම බෙදන්ට පටන් ගත්තේය.

දිවා ආහාරය නිමවන විට සවස පහ පමණ වී තිබුණි. ප්‍රධාන ප්‍රශ්නය වී පවතින්නේ නුවර බලා යන බසයක් අල්වා ගැනීමය. විශේෂයෙන් ගම හරහා යන බස් රථයෙන් ගියහොත් ඉතිරි ප්‍රමාණය කුලී රියකින් හෝ යා හැක.

"අපි එන්ට ප්‍රමාද වෙලා. බස් එක මිරිලා" හංසිනී කීවාය.

"අපි නුවරට ගියත් අන්තිම බස් එක අල්ලන්න බෑ. හිටගෙන තමා යන්න වෙන්නෙ. කැමතිද ?"

"කොහොම හරි මට ගෙදර යන්ට ඕනෑ" හංසිනී කීවාය.

බසය ආරම්භ වූයේ පැයි ගියාය. ඒ වෙනුවෙන් වුවද ...... තිබුණේ නැත. බසය ..... පිරී තිබුණි. .....

ආධාරකය අල්වා ගැනීමට තරම් දුරක ඇය සිටියේ නැත. කළ යුතු එකම විසඳුම ඔහුගේ අතින් අල්වා ගැනීමය. තරමක සැකයකින් අල්වා ගත්තත් වැඩි වෙලාවක් යන්ට පෙරම ඔවුනොවුන්ගේ දෑත් එකට බැඳුණේය. ඔවුනොවුන් අතර කිසිදු වෙනසක් නැත. ඈ නිහඬව ඔහුගේ ළයට හිස හොවා ඉණ වටා අතක් දමා තරයේ අල්වා ගත්තාය.

නිවසට එනවිට රාත්‍රී දොළහ පමණ වී තිබුණි. නිවසට පැමිණි වහාම හංසිනිට නින්ද ලැබුණේ වෙහෙස ගතිය නිසාය. සාන්දර පිබිදුණු ඈ දැන් පියාඹෙන කල්පනා ලොවකට පිවිසුනාය. ඒවා කිසිවක් ඕනෑ කමින් කළ ඒවා නොවේ. මේ කිසිවක වරද රංජිත් අයියා පිට පැටවිය නොහැක. ඔහු හෝටලයේ දී හැසිරුණේ කොතරම් සංයමයෙන් යුතුවද? තමා ඇඳුම් අඳින අවස්ථාවේදී පවා ඔහු කාමරය තුළ රැඳී නොසිටීමට වග බලා ගත්තේය. එහෙත් බසයේදී ඔවුනොවුන් උණුසුමට බැඳුන හැටි. බසයේ තමා අඳුනන කෙනෙක් ඇද්ද නැද්ද යන්න පවා බැලීමට නොසිතුන හැටි. තමා සිටින්නේ අක්කාගේ සැමියා සමග යැයි ඇයට සිතුනේ නැත. දෙයියනේ අක්කා දැන ගත්තොත්. එහෙත් සැක කළ යුතු කිසිවක් සිදුව නැත.

අපිට එහෙම කරන්න විශේෂ හේතුවක් තිබුනෙ නෑ. වැටෙන්න යන හින්දයි අතින් අල්ලා ගත්තෙ. එහෙත් උණුසුම වන ගතේ තැවරෙන්ට හිත අනුබල දුන් හැටි. රංජි අයියාට මුහුණ දෙන්නේ කොහොමද කිසිවෙක් දොරට ගසන හඬින් ඈ පිබිදුනාය. දෙයියනේ අක්කාවත් ඇවිදින් ද!



# 13

දමිතා සැමියා බැලීමට යාමට අදහස් කළේ බොහෝ දුරට කල්පනා කිරීමෙන් පසුවය. රැකියා ඒජන්සියට සල්ලි බැඳ තිබුනත් තවම වීසා ලැබී නැත. මුදල් ගැන නම් කිසිම අවිශ්වාසයක් නැත. මේවා හොර රහසේ කළ යුතු ඒවාය.

"අම්මා අපි නුවර ආවවිලා ගෙදර ගිහින් ගොඩක් දවස් ඉන්නවා නේද?" දුව විමසුවාය.

"නෑ දුව ඉක්මනින් එන්ට ඕනෑ"

"අනේ අම්මා අපි ගොඩාක් දවස් ඉමුකො"

"බෑනෙ දුව. දැන් විභාගෙත් කිට්ටුනෙ. සෙනසුරාදා ටියුෂන් ක්ලාසස් තියෙනවානෙ"

දරුවන්ටත් තමා මුහුණ දෙන ප්‍රශ්න ගැන අවබෝධයක් නැත. රංජිත් රැකියාවක් කළත් නිවසට ගෙනෙන දෙයක් නැත.

වැටුපෙන් මාසයක් ගෙවන්නේ හමුදාවේ ආපන සාලාවටය. මත්පැන් පානය කිරීම සඳහා වියදම්කර, ඔහුගේ මවට හා නංගිට මුදල් දුන් පසු ගෙදරට එවන්ට දෙයක් නැත. පවුලේ බර තනිව දැරීමට සිදුව ඇත්තේ දමිතාටය. කොච්චර දුක් වින්දත් නරක නාමය අසන්ට වෙන්නේත් දමිතාටය. සැමියාගේ පවුලේ නෑයින්ට දමිතා පෙන්වන්ට බැරිය. පිට අය තමා අම්මා හා නංගිලාත් තමා සැර පරුෂ බව පවසති. කාටත් රංජිත් හොඳය. හිතේ කිසි වරක් නෑ. තවම කොල්ලා වගේ. රංජිත් රට යවා ගතහොත් මේ ආර්ථික ප්‍රශ්නවලින් මිදෙන්ට පුළුවන.

කෙසේ හෝ නුවර ගමන පිළිබඳව දරුවන් පසුවූයේ අපමන සතුටින් යුතුව බව දමිතා දනී. පාන්දරින්ම නිවසින් පිටවූයේ අවට අයට සොයා ගැනීමට බැරිවන පරිද්දෙනි. රංජිත් හමුදාවෙන් පැන ගිය පුවත දැන් පොලිසිවල අය දන්නවා විය හැක. හතර වටේට ඉන්නෙ ඉරිසියා කාරයො. පෙරවරු එකොළහට වලව්වට යාමට ලැබුණි. හන්දියෙන් ගත් කුලී රියෙන් යද්දී දරුවන් සතුටින් කෑගැසූහ. රථය නතර කළ වහාම දරුවන් ඉන් බැස වලව්ව දෙසට දුව ගියහ.

දැන් සැහෙන දවසක සිට වාත රෝගයෙන් පෙලෙන නිසා දමිතා රථයෙන් බැස්සේද අමාරුවෙනි. හංසිනි අක්කා බසින තෙක් රථයේ දොර අල්වාගෙන සිටියාය.

"පාන්දරින්ම ආවාද?"

"නැත්නම් මේ වෙලාවට එන්නෙ කොහොමද නංගියේ? ඔන්න ඔය වාහනේ බඩුවාගයක් ඇති ගන්ට. කෝ පොඩි නංගි?"

"එයාට අද පන්ති නේ අක්කෙ"



හංසිනි රථයේ තිබූ බෑගය එළියට ගෙන දොර වසමින් කීවාය. රථය පිටවී ගිය පසු ඇගේ නෙත ගියේ ගස් කොළන් කපා තව ශ්‍රියාවක් නොතිබූ අවට පරිසරය වෙතය.

"බලන්නකො දැන් මිදුලෙ ලස්සන. කියක් ගියාද?"

"තවම කුලිය දුන්නෙ නෑ. යමුකො වැඩ පෙන්වන්ට."

"කෝ... රංජිත් ?"

"මේ රංජිත් අයියගෙ වැඩ තමා" හංසිනි සිනාසෙමින් කීවාය.

අක්කාගේ මුහුණේ සිනාවක් සටහන්වුණි.

"මම හිතුවෙ කම්මැලිකමට ගෙදරට වෙලා නිදන් ඇති කියලයි" ඇය වමත ඉණට තබා කොර ගසමින් ගියාය.

"ඔහොම දිගටම ගිහින් අක්කලාගෙ 'කරාබු' වත්ත දිහා බලන්ට"

දමිතා ඇඳුම් මාරු නොකරම වත්ත පහළට ගියාය. ජයවඩනගම කොන්ක්‍රීට් ලෝකයක සිරවී සිටි තමා සුපුරුදු ලෝකයේ තනිවූවා සේ දමිතාට හැඟුණි. මීට ඉහත වැසි ඇද වැටීම නිසා ගස් කොළන් තෙත්ව තිබුණි. හමන සුළඟ නිරවුල්ය. ජීව ඔවින් යුතුය. කුණු ගොඩවල්, කානු, බෝතල්, කසල බාල්දි හා මුසුව හමන සුළඟට වඩා මේ සුළඟ කොතරම් පවිත්‍රද ? දමිතාට දායාද වශයෙන් ලියා දුන් අක්කර පහ තිබෙන්නේ දොළට නුදුරෙනි. අප්පච්චිගේ මරණයෙන් පසු මෙවා වල් බිහිවූයේ සොයා බැලීමට කෙනෙක් නැති හෙයිනි. ඇතට ඇයට දරුවන්ගේ කෑගැසීම ඇසුණි. බැනියමකින් හා

කොට කලිසමකින් සැරසුණු රංජිත් 'කරාබු' ගස් අවට කැලෑව ශුද්ධ කරමින් සිටිනු දමිතා දුටුවාය.

"උදේ කීයටද එහෙන් ආවෙ ?"

"ජයවර්ධනගමින් පාන්දර හරවන බස් එකෙන් ආවා..." දමිතා දාඩිය බිඳුවලින් වැසී ගිය සැමියා දෙස බලමින් කීවාය.

"අපරාදෙ මේ දේපල විනාශ වෙනවා. මම මේ කම්මැලිකමට මේ වැඩේ කරන්ට පටන් ගත්ත."

ඔව්හු සෙමින් සෙමින් වත්ත මැදවූ මුර මඩුව දෙසට ගමන් කළහ. අප්පච්චි ජීවත්ව සිටියදී හොඳ සවිශක්තියෙන් සදන ලද මේ නිවස කාමරයක් හා කුස්සියකින් හා පටු ඉස්තෝප්පුවකින් සමන්විත වූණි. දමිතා පරණ පත්තර පිටුවක් එලා මුර නිවසේ බිම ඉඳගත්තාය.

"ඔයා හිටියට පාර පැත්තෙ කෙම යන්ට එපා."

"දමිතා මට හිරකාරයෙක් විදිහට මේ ගෙදරට වෙලා ඉන්න බෑ. දැන් සුමාන දෙකකුත් ගෙවුනා. කෝ වීසා එක එවන්නෙ නැද්ද?"

"මම ඊයෙත් මිරිහානට ගිහින් ඒජන්සි කාරයා හම්බවෙලයි ආවෙ. ඔයාගෙ ඩී වෙල්ස් ඔක්කොම ඇරලලු තියෙන්නෙ"

"මට ඒ බයිලා කතා වලින් වැඩක් නෑ. මට බෑ මේක ඇතුළට වෙලා මදුරුවො තල කලා ඉන්න."

"පොඩ්ඩක් කල්පනා කරන්නකො රංජි. මේ මම ඔයා එක්ක තියෙන තරහට කරනවා නෙමෙයිනෙ. අපිත් ගෙයක් දොරක් හදාගෙන මනුස්සයො වාගෙ ඉන්ට ඕනෑ. හොඳ කාර්



එකක් ගන්ට ඕනෑ..." ඇය සැමියාගේ අතින් අල්වා ගනිමින් කීවාය.

"දැන් හමුදාවට ගිහින් අවුරුදු හතක් වෙනවා. ඔයා මොනවද කරගත්තෙ. මොනවද ලැබුණ දීමනාව ?"

"තව අවුරුදු දෙකක් හිටියා නම් මගෙ පැන්ෂන් එක ගන්න තිබුණා. ඒ ඔක්කොටම වැඩිය අපි වාගෙ එවුන් හමුදාව අතෑරල ආවමයි කිවවට පිළිගන්නෙ නෑ. මම මේ වැඩේ කළේ හිතට විරුද්ධවයි. හැබැයි වුනත් මම හමුදාවට යන්න කැමතියි."

"පිස්සු නැතිව ඉන්ට, මේ හිටපු විදිහට තව ටික දවසක් ඉන්ටකො."

අත් නැති කහපාට ගවුමකින් සැරසුණු හංසිනී ඇත සිට දුව එන දශකාර විලාශය දමිතාගේ නෙත ගැටුණි. නරියට නිදහස්ව පිපුණු කැලෑ මලක් වගේ.

"අක්කා යමු නේ බොන්ට. කෝ දුව ?"

"දැන් ඉතින් ඒ දෙන්න අල්ලන්ට බෑ. අන්න දොල පැත්තට දිව්වා. මෙලහට වතුරෙ නටනවා ඇති"

"අනේ ලොකු නංගි පොඩ්ඩුවට හෙම්බිරිස්සාව. පසුගිය හතිය වාගෙ තිබුණු හින්දා ඉස්කෝලෙ ඇරියෙත් නෑ. ගිහින් පාරක් දීල එක්කගෙන එන්ට."

"එහෙනම් අක්කා ගෙදර යන්ට. මම එක්කගෙන එන්නම්."

හංසිනී අක්කා යවා දොළ දෙසට පියවර මැන්නාය. ගස් හේඩාව අතරින් යද්දී ඇයට තමා පසු පස එන රංජිත් අයියා නෙත ගැටුණි.

# 14

ලොකු නංගි දුන් තේ කෝප්පය පානය කළ දමිතා කුස්සිය දෙසට ගියාය. කුස්සියේ පෝරණුව අසල පසුපස හරවා හාල් ගරමින් සිටින ගැහැණිය ඇගේ නෙත ගැටුණි. විත්තයට හා හැටියට හොඳට කැපී පෙනෙන සිරුර සිත් ගන්නා සුළුය. ඇඟ වාත්තු කළාක් මෙනි.

"ලොකු නංගී... කවුද අර ?"

"අඳුන්නෙ නැද්ද, මේ අපේ පොඩ්ඩිනෙ"

"හානේ මෙයි නවත් ලස්සන වෙලා. කෝ බලන්ට මෙහාට හැරියං මෙහාට හැරියං"

දමිතා ගොස් ගැහැණියගේ උරහිසින් අල්ලා කීවාය. පොඩ්ඩිගේ මුහුණේ ඇතිවුණේ නිවුල් සිනාවකි.



"හානේ... මෙයි නවත් ලස්සන වෙලා !"

කරමින් සිටි කාර්යය නතර කළ පොඩ්ඩි සැහැල්ලු සිනාවකින් මුව සරසා ගත්තාය. ඇත්තටම ඒ සිනාව ලස්සනය. අකාරුණික වූ ජීවිතය මිනිසාට තිළිණ දෙන හැටි. මේ දුප්පත් ගැහැණියට කටහඬක් දුන්නා නම් කොච්චර හොඳද?

"අක්කෙ පොඩ්ඩිත් ළඟදි බැන්දානෙ"

"හානේ... කවද දන්නෙ. මට මෙකිට මොනවත් දෙන්ට බැරිවුණා. මගෙ පරණ සාරි ගොඩක් තියෙනවා පොඩ්ඩිට ගෙනැත් දෙන්න ඕනෑ."

"කවද පොඩ්ඩිව බැන්දෙ?"

"අනේ... පොඩ්ඩි කරුමෙකට කර ගැහුවෙ. අමු බේබද්දෙක්. කුලී වැඩ කරනවා, කුඹුරු වැඩ කරනවා. හම්බ කරන ඔක්කොම බොනවා. ඒ දීගෙ හරියන එකක් නෑ"

"අපරාදෙ. ෂහ්..! ලස්සන වළලු හම්බ වෙලා තියෙන්නෙ. කවුද අරන් දුන්නෙ ?"

"පෙරේදා පොඩ්ඩි තනියම පෙරහැර පොළට ගියා. එහෙදි අරන්. කවුරු අරන් දුන්නාද දන්නෙ නෑ."

"මේ ඔය ප්ලාස්ටික් වළලු අතේ දාගෙන කුස්සියෙ වැඩ කරන්න එපා. ගිණි ගනියි" දමිතා ගොළු බයින් කීවාය.

"එච්චර වීදුරු වළලු" අභිමානයෙන් කියූ පොඩ්ඩි දත් දිග හැර සිනාසුනාය. දමිතා කෙලින් ඇය [illegible] කීවාය.

"ලොකු නංගි කෙල්ලෙ ඉන්නෙ මෙහෙද?" ඇය තරමක් සැකයෙන් ඇසුවාය.

"නෑ අක්කා. දවල්ට, රෑට උයා දීලා ගෙදර වැඩක් කරල යනවා. අපේ මුර ගෙදර ඉන්නවා."

රංජිත් වත්ත දෙසින් නිවසට එනු දමිතා බලා සිටියාය.

"මෙයා පාර පැත්තට යන්න හදන්නෙ නැද්ද?"

"ඇයි නැත්තෙ. මම කෙල්ලව ඇරල සිගරට් පත්තර ගේනවා. පාරට යන්ට රණ්ඩු කරනවා"

"ඔය මගේ කටට බයේ ඉන්නවා මිසක් යකඩ දම්වැලක් දාලවත් හිරකරගෙන ඉන්ට පුළුවන් කෙනෙක් නෙවෙ" දමිතා සිනාසුණාය.

දෙවියනේ අපි පන්සල් ගිය හැටි, අපි කොළඹ ගිය හැටි දන්නවා නම් මට දෙහි කපයි. ඇය සොයුරියට මුහුණ දීමට නොහැකිව සිටියාය.

"ලොකු දුව ඔය දණහිස් අමාරුව තියෙනවා නම් බලා ඉන්න එපා. බේත් ගන්න ඕනෑ." ඉස්කෝලෙ හාමිනේ කොර ගසමින් යන ලොකු දුව දෙස බලා කීවාය.

"බේත් ගන්නවා අම්මා. අත් කකුල්වලට ව්‍යායාම කරන්න තියෙනවා. මේ ටියුෂන් හින්දා කිසි දෙයක් කරන්න වෙලාවක් නෑ"

"ළමයො ලෙඩ වලට බේත් ගන්නෙ නැතිව බෑ. මට



ඇල්වතුර අල්ලන්ට හොඳ නෑ. මිය පොඩිඩ් ඉන්න නිසා වතුර ටිකක් රත් කර ගන්නවා."

"මටත් ඇල්වතුරෙන් නාන්ට හොඳ නෑ. බයත් රූම් එකට හීටරයක් ගහන්න ඕනෑ. මෙයා රට ගියාම නම් ප්‍රශ්නයක් නෑ. නව ටික දවසනේ"

රංජිත් බිරිඳ පැමිණ සිටින නිසා වැඩ නතර කර දිය නා ගැනීමට සිතුවේය.

"දමිතා යමු නාන්න. අයිස් කැට වගේ නියම වතුර"

"අනේ රංජී මට ඇල්වතුර හොඳ නැතෙ. මාව කොරවෙයි. මම කෙල්ලව කියලා වතුර ටිකක් රත් කරගන්නම්."

"ඔයා ලෙඩ ගෝදාවක්නෙ. ඔය ඇඟ උස්සාගෙන එන්න ඇල්වතුර ටිකක් නාන්න." ඔහු ඇගේ උරට අත ගසා කීවේය.

"රංජී දැන් මගේ බරත් වැඩිවෙලා. රාත්තල් 150 ක් වෙලා. මගෙ උසේ හැටියට බර වැඩියි කියලා ඩොක්ට කිව්වා. අනේ මම ඉස්සර කොච්චර හීනියට ද හිටියෙ. පොඩ්ඩිටත් වඩා හීනියි නේද?"

ඇය කාමරයට පිවිස ඇඳේ අතගසා ඉඳගනිමින් කීවාය.

"ඇයි මට මතක නැත්තෙ. ඉස්සර මම අත් දෙකට උස්සගන්නෙ"

ඇය සිනාසී රංජිත්ගේ අතට සෙමින් පහරක් ගැසුවාය.

ඒ අතීත සැමරුම් කොතරම් ප්‍රිය කරුද? ඒ අද ඊයෙක නොවේ. විවාහ අපේක්ෂකයා ලෙස මැණික්හින්නේ වලව්වට ආ දිනෙක අම්මා ඇස් වසන නිමේෂයේදී ඔහුගේ දඟකාර කමට යටත් වූ හැටි සිහිවෙයි. ඒ දිනවල තමා විසින් ඔහුට දුන්නේ අනු බලයකි. කියන කරන ඕනෑම දඟකාර කමකට ඉඩ දුන්නේ කොතරම් සතුටකින්ද? අම්මාගේ විරුද්ධතා මැද දිය පීල්ලට පැන්න හැටි සිහිවෙයි. කළ යුතු නොකළ යුතු ඕනෑම දඟකාර කමක් සතුටින් ඉවසූ හැටි මතකය. ඒ ජීවිතය ගැන කිසිම වගකීමක් නොතකන අතිශයින් සුන්දර යොවුන් කෙල්ලක්ව සිටියදීය. විවාහයෙන් අවුරුදු දාසයකට ඉහතය. අද ඒ අයුරින්ම සැනසිය නොහැක. රංජිත් නම් පරණ රංජිත්මය. තවත් වල් වෙලා. දිවා ආහාරයෙන් පසු දමිතා මඳ වෙලාවක් නිදා ගන්නේ ගමන් වෙහෙස නිසාය. නිවාස යෝජනා ක්‍රමයේ නිවාස හතර වටින් කොටුවීම නිසා සුළං රැල්ලක් හමන්නේ නැත. මේ පරිසරය කොතරම් ප්‍රියකරුද? අතුපතරින් ගැවසී ගත් රුක් සිප නිබඳව හමන සුළං කොතරම් සිසිල්ද? කෘත්‍රිම සුළඟින් එළිවන තෙක් කය වේලනවා හැරෙන්ට ගතට කිසිම සහනයක් නැත. ඇය එක්වරම පිබිදුනේ උස් හඬින් කවුදෝ කෑගසනක හඬිනි.

ඇය බැරි බැරි ගාතේ කුස්සිය දෙසින් මිදුලට දුව ගියාය. කැත්තක් අතින් ගත් බණ්ඩියා බැණ වදිමින් පොඩ්ඩි පසුපස එලවන අයුරු පෙනේ.

"මම මේකිව මරනවා." ඔහු කැත්ත ගෙන පොඩ්ඩි පසුපස එලවන්ට පටන් ගත්තේය. පොඩ්ඩි ජීවිතාරක්ෂාව පතා හංසිනි අසලට දුව ආවාය. බණ්ඩියා ගේ මුහුණ වෘකයෙකුගේ මෙනි.

"බණ්ඩියා දුවනවා අහකට" හංසිනි කීවාය.





"මැණිකේ අහකට වෙන්න. මම මේකිව කැතිගානව. මට මේකිව මරන්ඩ ඕනෑ." ඔහු වෛරී මතින් කීවේය.

ඔහුගෙන් පොඩ්ඩී ආරක්ෂා කිරීමට ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බව හංසිනීට හැඟුණි. මේ සිද්ධිය ඈත සිට බලා සිටි රංජිත් ඔවුනතරට ආවේය.

"තවත්තපං ඔය වැඩේ" රංජිත් තදින් කීවේය.

"සර් මට මේකිව මරන්න ඕනෑ. මේකි මගේ ගෑණි මට ඕනෑ දෙයක් කරන්න පුළුවන්."

"උඹේ ගෑණි වුනත් එහෙම මරන්ට දෙන්න බෑ. පලයං අහකට"

එන්න එන්න බණ්ඩියා සාහසික වනු දුටු රංජිත් ඉදිරියට පැන කැත්ත උදුරා විසිකර ඔහුගේ මුහුණ හරහා පහරක් දුන්නේය. වේගවත් පහරින් විසිවී ගොස් බිම ඉන්දවුණු බණ්ඩියාගේ කට නතර වුණි. ඔහු පසු පස අත පිසිමින් වැනි වැනී යන්ට ගියේය. ඔහුගේ තොල්වලින් ලේ මතුවූයේ හංසිනි බලා සිටියදීය.

"බණ්ඩියාගෙ තොල් දෙක පැලිලා" හංසිනි කීවාය.

"මේ වගෙ එවුන්ට වෛරී හිඳෙන්ට දෙන්ට ඕනෑ. අකාල වැඩක් නෑ" රංජිත් කීවේය.

පොඩ්ඩිගේ හැඬීමද නතරවුණි. බණ්ඩියාට පහරදීම ගැන පොඩ්ඩිගේ එතරම් කැමැත්තක් තිබූ බවක් නොපෙනුණි.

"ඔයා මොටද බණ්ඩියාට ගැහැව්වෙ? මොනවා වුනත් ඒ

පොඩ්ඩිගේ මිනිහා." දමිතා කීවාය.

"ඒකිගෙ මිනිහා නම් ඒවා උන්ගෙ ගෙවල්වලට ගිහින් බලාගන්න ඕනෑ. ඒ මෝඩයා මෙතන පොඩ්ඩිව මැරුවා නම් මොකද වෙන්නෙ. අපිට උසාවි යන්න වෙයි. අපිට සාක්කියට යන්න වෙයි. රිදෙන්ට දුන්නෙ ඒකයි"

"පව්. රංජි මටනම් දුක හිතුනා." දමිතා කීවේ සැමියා ගේ ක්‍රියාව නිවැරදි හෙයිනි.

නැවත මේ පිළිබඳව සාකච්ඡා වුනේ නිදන්ට ගිය විටය. තමා ඉඳහිට මුර මඩුව දෙසට යාම පිළිබඳව බණ්ඩියාට ආරංචි වී ඇතැයි ඔහුට සිතුණි. ඔහු බිරිඳට තරවටිටු කරන්නට ඇත්තේ මෙනිසා විය හැක. බණ්ඩියාගේ කණ රත්වීමට ගැසීමේ ලොකු වුවමනාවක් රංජිත්ට තිබුණි. ඔහු අහිංසක ලෙස තමා දෙස බලා සිටිද්දී දැනුණේ සතුටකි. රාත්‍රිය නිහඬය. ජයවඩනගම සිටියදී නිදන්නේ සැහැල්ලු නිදන ගවුමක් හැඳය. ඇය රෙද්දක් පොරවනවා රංජිත් දුක නැත. හිසේ සිට පාදාන්තය දක්වා පොරවාගෙන නිදන බිරිඳ දෙස ඔහු මොහොතක් බලා සිටියේය. ගැහැණියකගේ ඇසුරක් ලද කාලයක් මතක නැත.

"නිදිද?" ඔහු නිහඬ රැයේ ඇගේ කන් පෙත්තෙන් සොලවමින් ඇසුවේය. ප්‍රතිචාරය යහපත් නැත. ඇය මුණින් අතට හැරී ඉරියව්ව වෙනස් කර නිදා ගැනීමට සූදානම් වූවාය. සිරුර නිදහස් මුත් පිවිසීමට අවසර නැත.

"අනේ රංජි නිකං ඉන්නකො. මගෙ කකුල් රිදෙනවා"

"ඔයාගෙ ඉතින් රිදුනෙ නැත්තෙ කවද්ද?"



ඔහු කතා කළේ කඩවූ බලාපොරොත්තු ඇතිවය.

සැමියා කෝප වූ බව හැඟී ගිය නිසා ඇගේ නිදිමත ගතිය නැති වී ගියේය. ඇය ඇඳෙන් නැගිට වරල ගැට ගසා ගත්තාය. ඔහුගේ හැසිරීම වල වෙනසක් නැත. ගැහැණුන්ගේ ශරීර හැමදා එක ලෙස පවතින්නේ නැත. ඔහු තවමත් සිතන්නේ තමා දාහත් වසරකට ඉහත එක්වූ දමිතා කියාය. ඒ දිනවල ඔහු දෙන වද තිස් දෙකත් ඉවසීමට පුළුවන. අද ඔහු තමා දරුවන් දෙදෙනෙක් සිටින තලතුනා මවක් ලෙස සිතන්නේ නැත.

"බොරු කියනව නම් මේ බලන්න. දණහිස් දෙක ඉදිමිලා තියෙන හැටි..." ඇය ඇඳිවත මදක් ඔසවා දණ මඩල පෙන්වූවාය.

ඔහු කොට්ටයේ මුහුණ හොවා ගෙන සිටියා විනා කතා කළේ නැත.

"මගේ උසේ හැටියට ඇඟ බර වැඩිලු. දූන් කෑම අඩු කරලා. දූන් පපුවෙ හතියත් තියෙනවා"

ඔහු මෘදු ලෙස ඇගේ දණ මඩල අතගා බැලුවේය. ඇගේ කතාව සත්‍යයකි. සැමියා ලෙස තමාට බිරිඳගේ දුක සැප සෙවීමට පුළුවන් කමක් නැත. මීට ඉහත සමස්ත දේහයම සිත බඳිනා ජපකළ මන්ත්‍රයක් වැන්න.

"දූන් කරන ව්‍යායාම කළාම දණහිස හරියයි. එන්න අපි නිදා ගම්මු"

ඇය ඇඳේ වැතිර ඔහුගේ බඳ වටා අතක් දැම්මාය.

"තරහද?" ඇය කනට කර පහත් හඬින් ඇසුවාය.

"දැන් හෙට උදෙන්ම යන්න තියෙනවානේ නිදාගන්න." ඔහු ඇය දෙසට නොහැරී කතා කළේය. වෙනදා මෙවන් සරාගී අවස්ථාවල අනුගමනය කරන විකල්ප ක්‍රියාවකින් හෝ සතුටු වීමට ඔහුට සිතුනේ නැත.

පසුදින හිමිදිරියෙන්ම පිබිදුනු ඇය දරුවන් සූදානම් කර ගත්තාය.

"මෙ ටියුෂන් කර කර ඉන්න එපා. හරියට බෙත කරගන්න. ඉණත් මහතයි." ඔහු දැතින් ඉඟටිය තදකර කීවේය.

"කෑමත් අඩුකළා රංජි. මම මහතයි කියලා ස්ටාෆ් එකේ ඔක්කොම හිනාවෙනවා."

"පොඩ්ඩක් කල්පනා කරන්න. මට මේ ගෙදර හිරවෙලා ඉන්න බෑ. මම ආපහු ආමි එකට යනවා."

"ඔයාට පිස්සුද? ඔයාගෙ පෙනුමෙ හැටියටයි පලපුරුද්දටයි ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුර ලැබෙන්නත් පුළුවන්. මැසේජ් එක ආපු ගමන් දෙන්නම්."

"එහෙනම් පරිස්සමින් යන්න."

ඇය එසවී ඔහුගේ මුහුණ සිප ගත්තාය.

"ඊයෙ වැඩේට තරහ වෙන්ට එපා. නිදහස්ව හම්බවෙමු."

ඇය යටැසින් බලා අතින් අල්වා ගත්තාය.

"අර පොඩ්ඩිගෙ මිනිහ එක්ක කතාවට යන්ට එපා. ඔයාගෙන් පළිගනීවි. ඔවුන් හොඳක් නරකක් දන්නෙ නෑ."

දරුවන්ගේ මුහුණ සිප ඔවුන්ගෙන් සමුගත්තේය.



# 15

බිරිඳ ගිය පසු නිවස තුළ ඇතිවූයේ නිහඬ බවකි. ඇය මේ හැම යෝජනාවක්ම කරන්නේ පවුලේ දියුණුව සඳහාය. ඔහු එදින වත්තේ වැඩට ගියේ නැත. ඉස්තෝප්පුවේ සිට බලන විට මුරගේ දක්වා දිවෙන පටු අඩි පාර පෙනේ. ඔහු එනවිට මේ පරිසරය ලඳු කැලැවක් සේ දිස්වුණි. එළිකල බිමෙහි මොනවා හෝ සිටුවීමට සිතුණි. වැස්ස වැටෙන්නේ තදට නොවේ. ඔහුගේ නෙත යොමුව තිබුනේ අඩිපාර දෙසටය. වෙනදා නම් පොඩ්ඩි මේ වෙලාවට පැමිණ හමාරය. ඇය තමා සමග අමනාප වීද? හංසිනි රංජිත්ට තේ කෝප්පයක් රැගෙන ආවාය.

"පොඩ්ඩි තරහ වෙලා වගේ. ඒකිටත් පොඩ්ඩ බැරිවෙන්න බෑ හරි ආඩම්බරයි." ඇය තේ කෝප්පය දී පසෙකට වෙමින් කීවාය.

"තරහ වෙලා තියෙන්නෙ මම ඒයෙ බණ්ඩියට ගහපු එකටද?"

"සමහර විට ඒකත් වෙන්ට පුළුවන්. කොච්චර ගැහුවත් ඒකි මිනිහට ආදරෙයි."

"මම ඒකිට කළේ උපකාරයක්. ඒ දේ කළේ නැතිනම් සමහරවිට මෙතන මරණයක් වෙන්න තිබුණා. බණ්ඩියා හරි කුරිරු මිනිහෙක්." ඔහු පිළිකුලෙන් යුතුව කීවේය.

"මෙහෙ මිනිහෙක් ගැහැණියෙකුට ගැහුවා කියලා පොලිසි යන්නෙ නෑ. ඒවා වෙරි හිඳුනාම ඉවරයි."

"එහෙම නම් සිද්ධියෙ වැරදිකාරයා මමයි."

"අයියා ඒ ගැන හිතන්න එපා. අහංකාරකම බැස්සම එයි. ඒකි සමහර වෙලාවට මා එක්කත් එල්ලිගෙන එනවා"

උදෙන්ම කෑම පිළියෙල කළ ඇ කෑම මේසයට තැබුවාය. ඔහු තවමත් සිටින්නේ පාර දෙස බලාගෙනය. වැහි අඳුර පහව නැත. වැස්ස නිට්ටාවටම අවසන්ව ඇත. හංසිනී මනාව සූදානම්ව එළියට ආවාය.

"නංගි ලෑස්තිවෙලා කොහෙ යන්නද?"

"මම කොලෙජ් එකට ගිහින් එන්නම්. කැරැක්ට සෙටිපිකට් එකක් ගන්න තියෙනවා. මම එන්න ටිකක් හවස් වෙයි. මේසයට කෑම ඇරලා තියෙනවා. අයියා කන්න."

"කෝ ... කරේ දාගෙන හිටපු මාලෙ ?"



ඇය පිළිතුරක් නොදී හිස පහත් කරගත්තාය. තරමක නිහඬ බවක් පැවතුණි.

"කෝ මාලෙ ?" හෙතෙම තරමක උස් හඬින් ඇසුවේය.

"අක්කා ඉල්ලාගෙන ගියා"

ඇය නිවසින් පිටත බසිමින් කීවාය. එකවරම ඔහුගේ සිතේ බිරිඳ කෙරෙහි කෝපයක් ඇතිවුණි. ඇගේ හැසිරීම මෙසේ නොවිය යුතුව තිබුණි. කමක් නෑ රට ගිහින් එනකොට නංගිට හොඳ මාලයක් ගේනවා. තමා අතින් පොඩ්ඩිට වරදක් විනැයි සිතුනේ බොහෝ වේලාවක් කල්පනා කිරීමෙන් පසුවය. අහස තරමක් පැහැදිලිය. හමන සුළඟේ තෙත බව ඉවත්ව නැත. ඔහු සාලය දිගේ ඉදිරියට ගියේය. ඉදිරිපස දොර වසා ඇත. නැන්දම්මා පසුවන්නේ ලෙඩ ගානේය. ඇය දිගු නින්දක පසුවනු පෙනේ. ඔහු සරම පිටින්ම වත්තට බැස්සේය. විරිමඩ මතුව ඇත. තමා වැටුණ අතු වැදීම නිසා වැඩිදුරක් යන්ට ප්‍රථම තෙත් වුණි. තමා අතින් සිදුවූ වරදට ඇගෙන් සමාව ඉල්ලා සිටිය යුතුය. අහසේ පැහැබර ගතිය ඉක්ම වූ නොබෝ වේලාවකින් වැසි වැටෙන්ට පටන් ගත්තේය. ඔහු මූර මඩුව වෙතට දුව ගියේය. ඉදිරි පස දොර අඩවන් කර තිබුණි. දෙදෙනාගෙන් කව්රු සිටියත් කමක් නැත. සමාව අයදිමට උස් පහත් භේදයක් නැත. සෙමින් දොර විවෘත වුණි. නිවසින් පිටතට පැමිණි පොඩ්ඩි ඔහු දක පුදුමයට පත්වූවාය.

"මොකද ආවෙ නැත්තෙ ?" ඔහු ගොළු බසින් ඇසුවේය. ඇය පිළිතුරක් නොදී හිස පහත් කර ගත්තාය.

"කෝ උඹෙ මහත්තයා ?"

"මට ගහලා යන්න ගියා" හස්ත මුද්‍රාවෙන් පවසා බිම බලා ගත්තාය.

"මම මිනිහට ගැහුවෙ හිතලා නෙමෙ. පොඩ්ඩිට ගහන කොට බලා ඉන්න බැරිව ගියා."

ඇය පහත් කරගත් හිසින් යුතුව සිටියාය. ඇය පහත් වී වීත්තයෙන් දෙනෙත් පිසදමා ගත්තාය.

"උඹට ගැහැව්වෙ කොහෙන්ටද?"

ඇය අත දිගු කළාය. මදක් ඉදිරියට ගිය ඔහු ඇගේ අත දෙස බැලුවේය. පෙරහැර පලෙන් තමා විසින් මිළදී ගෙන දුන් කදාවළලු කඩා බිඳ දමා තිබුණි. අමුතු හැඩයක් දුන් සුදු දැත් හිස්ය. නුවර ගොස් එන ගමනේදී ඔහුට යළි හදිසියෙන් පොඩ්ඩිව පෙරහැර පලේදී මුණ ගැසුණි. ඉකුත් දිනයේ හමුවූ කුළුපගකම වෙනස් ව නොපැවතුණ හැටි මතකය. කදා වළලු යුවලක් ගැනීමට අවැසි බව ඔහු සිතා ගත්තේ වළලු වෙළෙන්දන් අසල සිටිද්දීය. ඔහු ඇගේ උරට අත තබා කතා කළේය.

"හානේ... පොඩ්ඩි කා එක්කද ආවෙ ? මැණිකෙලත් ආවද ?" රංජිත් ඇසුවේය.

"කෝ.... මැණිකෙලත් ආවාද?" පොඩ්ඩි ගොළු බසින් ඇසුවාය.

"නෑ මම ආවෙ තනියම." ඔහු ගොළු බසින් කිවේය.

"පොඩ්ඩිගෙ මහත්තයත් ආවද?"



"නෑ නෑ" හිසවනා සිනාසුනාය.

රංජිත්ගේ හිතේ තිබූ බිය තරමක් අඩුවී ගියේය. පෙරහැර භූමියේ දල්වන ලද වයිවාරන්න විදුලි පහන් නිසා පරිසරය ආලෝකමත්ව තිබුණි. ඉකුත් දිනට වඩා අද දින පිරිස වැඩිව ඇත. විදුලි පහන්වල ආලෝකය අහිංසක ගොළු ලිය ගේ මුහුණ මත වැටී ඇත.

"අදත් කතුරු ඔන්චිල්ලාවෙ යමුද?" ඔහු කතුරු ඔන්චිල්ලාව දක්වමින් ඇසුවේය.

"අම්මෝ.... බෑ බෑ... බයයි බයයි..." ඇය ගොළු බසින් කීවාය.

"මේ මුදලාලි මෙයා ඉල්ලපු වළලු දෙන්න"

ඔහු පොඩ්ඩි කැඳෙව්වේය. තමාගෙන් වළලු ගත්තොත් වලව්වේ අය දැන ගනීවි යන බියෙන් ඇය ඒවා ප්‍රතික්ෂේප කරන බව පෙනේ. ඒ වනවිට සැහෙන්ට මත් පැන් පානය කර තිබූ නිසා ලජ්ජා බිය රංජිත් වෙතින් තුරන්ව තිබුණි. පොඩ්ඩිගේ සියුමැලි දෑත පිරෙන තෙක් කදා වළලු දමමින් ඇගේ විරෝධතා පවතිද්දීය.

තමා සමග මැදියම් රැය වන තෙක් පොඩ්ඩි පෙරහැර පලේ සිටියේ කිසිදු විරුද්ධතාවක් නැතිවය. එදා අරන් දුන් වළලු කුඩු කරන්ට ඇති හේතුව කුමක්ද? ඒ බව දැනගෙනද? ඔහු බණ්ඩියා පහර දුන් අත දෙස බැලුවේය. ඇය පසුවූයේ නැති ගත් මුහුණින් යුතුවය. ඇය බියපත්ව ඇත්තේ නිවසේ අය මේ පිළිබඳව දැන ගන්ට ඇතැයි කියා විය යුතුය.

"අනේ යන්න යන්න ලොකු නෝනලත් දක්කොත් මට ඉන්ඩ වෙන එකක් නෑ" ඇය හිසේ අත ගසා කීවාය. පවුලේ සැමටම දමිතාට බය පක්ෂපාතිය.

"ඉස්කෝලෙ නෝනා ගියා. කොළඹ ගියා" ඔහු ගොළු බසින් කීවේය.

"එහෙකොට පොඩි මැණිකේ ?" පොඩ්ඩි ඇසුවාය.

"එයත් ගියා."

"ලොකු ඉස්කෝලෙ හාමිනේ ?"

"එයා නිදි" ඔහු අභිනයෙන් නිදිබව හැඟවූයේය.

වැස්ස තවම තුරල්ව නැත. ඔහු සෙමින් පොඩ්ඩි අසලට ගියේය. සමහරවිට ඇය ඉවෙන් මෙන් ඔහුගේ අපේක්ෂාවන් හඳුනා ගන්ට ඇත. ඔහුට අවශ්‍යව තිබුනේ ඇගේ අත අල්වා ගැනීමටය. ඇය එක්වරම දොර වසා ගත්තාය. මඳ වේලාවක් කල්පනා කරමින් සිටි ආපසු නිවස දෙසට පියවර මැන්නේ බියෙන් යුතුවය. අනිසි වේලාවේ ගෙදරට ආ බව නැන්දම්මාට පැවසුවහොත් ?



# 16

රංජිත් නිවසට ගියේ වැස්සේ තෙමෙමින්ය. ජීවිතයේ කිසිදාක මෙවන් දෙයක් සිදුව නැත. ගෙදර කිසිවෙක් නැති වෙලාවක, තමා පොඩ්ඩි බැලීමට ගිය බව බණ්ඩියා දැනගතහොත් ඔහු කැත්ත රැගෙන තමාගෙන් පළි ගැනීමට එනු ඇත. පොඩ්ඩි මෙය ලොකු නංගිට කිව්වොත් ඇයට මුහුණ දීමට බැරි වනු ඇත. ඊටත් වඩා මෙය දමිතාට ආරන්චි වුවහොත් පවුල දෙදරා යාමට ද බැරි නැත. වෙච්ච ලැජ්ජාවෙන් මිදීමට නම් නිවසින් යා යුතුය. නුවර සිටින මිතුරා කීවේ සැඟවී සිටීමට ගමේ නොසිට ඔහුගේ නිවසට එන ලෙසය. නැන්දම්මා දැනගතහොත් ? වැස්සේම ඇඟ සෝදා ගත් ඔහු ඇඳේ වැතිර සිටියේ නුවර යන ආකාරය සිහි කරමිනි. මඳ වේලාවකට පසු කිසිවෙක් දොර අසල සැරිසරන බවක් දැනුණි

හෙයින් ඔහු හිස ඔසවා බැලුවේය. සමහරවිට නැන්දම්මා අහර ගැනීමට කතා කරන්ට ආවා විය හැක. මදක් දොර රෙද්ද මෑත් කළ ඔහු රුව හඳුනා ගත්තේය. දෙවියනේ.... පොඩ්ඩි නැන්දාව පැවසීමට ආවාද? ඇය දුටු සැනින් සිතේ වූ බිය තුරන්ව ගියේය. ඇය කාමරය අසලට ආවේ කුමකටද? ඇගේ මුහුණේ සැහැල්ලු සිනාවක් සටහන්ව තිබුණි. දිය නා දිගු කොණ්ඩය මුදා හැර තිබූ නිසා ඇය වෙතින් අමුතු සුන්දර බවක් දිස්වුණි.

"එන්න කෑම කන්න" ඇය අතින් සංඥා කළාය. පෙරවරුවේ සිතට පිවිසි අමනාපකම තවම පහව නැත. මඳ වේලාවක් ඇඳේ සිටි ඔහු නැගී සිටියේය. ඔහු සෙමින් පොඩ්ඩි අසලට ගියේය. පහත් කරගත් හිසින් යුතුව සිටි පොඩ්ඩි වෙතින් අමුතුම සුවඳක් හමා ගියේය. ඔහු මෘදු ලෙස ඇන්ඩියා විසින් පහර දුන් අත ඇල්ලුවේය.

බියට පත් සාපොව්වෙකුගේ මෙන් ඇගේ සියුමැලි අත සසල වනු දැනෙයි. පරිසරය නිහඬය. මෙවන් වැසි දිනෙක නැන්දම්මා කාමරයෙන් බැහැරව එන්නේ නැත. පිරිමියෙකුගේ සිත සසල කරන මහා අනුරාගී ආකර්ශනයක් ඇය වෙතින් දිස්වෙයි. සෙමින් දොර අඩවන් කළ ඔහු ඇය සිය ලයට තදකරගත්තේ අමනාපකම ඉවත දමමිනි. අඩවන් දෙනෙතින් සිටියා විනා ඇය වෙතින් කිසිදු විරෝධතාවයක් දිස්වූයේ නැත. රැක් අත්තන හෝ සමන් පිච්ච වැනි මල්වල සංකලන සුවඳක් ඇගේ ගෙලෙන් මිදී ආවේය.

යළින් වැස්ස උත්සන්න වනු ඇසේ. ඔහු ඇය බිත්තියට තදකර ඇගේ දොතොල් පෙති සිප ගත්තේය. මේ රළු පහස ලැබීම පිළිබඳව ඇගේන් කිසිදු විරෝධතාවයක් නැගුනේ නැත.



එය ඉදිරි කටයුත්තකට අනුබලයක් වුණි. ඔහු උල්ව නැගීගත් සුසිනිඳු රෝස පැහැති අඟින් යුත් කුසුමන් අතර මුව හොවා ගත්තේය. විවාහකයකු ලෙස වසර දාහතරක අත්දැකීම මේ තරුණ ගැහැණිය පුබුදු කිරීමට ප්‍රමාණවත් වුණි.

හංසිනිගේ සිතට පිවිසියේ අසමාන සතුටකි. ගිය ගමන අභිගයින් සාර්ථකය. ගුරු විද්‍යාලයට සමත්වූ බව දනගන්ට ලැබුණේ ලියුම්කරු අතර මගදී දුන් ලිපියෙනි. මේ පුවත දන්වීමට කලට වේලාවට එන්ට නොලැබුණේ ඇද හැලෙන අනෝරා වැස්ස නිසාය. මෙවන් වැස්සක් සැමෙන කලකින් මැණික්හින්නට ලැබී නැත. බොහෝ දුරක් ආවේ සෙරෙප්පු දෙක අතේ එල්වා ගෙනය.

හංසිනි කුඩය දිගහැර ඉස්තෝප්පුවේ තබා නිවස තුළට ගියාය. සිංහල උළුවලින් තගින පින්නෙන් සිමෙන්ති පොළව තෙත්ව තිබුණි. අම්මා පින්නෙන් බේරීමට සාරි රෙද්දකින් හිස වසා ගෙන සොල්දර සිවිලිම යට නිදනු හංසිනි දුටුවාය. තෙත ගවුම ගලවා වෙනත් ගවුමකට මාරු වෙද්දී ඇයට රංජිත් අයියා සිහිවුණි. ඇය ප්‍රථමයෙන්ම ගියේ රංජිත් මුණ ගැසීමටය. ඇය මේසය මතවූ කෑම වැස්ම ඔසවා බැලුවාය. ඔහු කෑම කා තිබූ බවක් පෙනෙන්ට නොතිබුණි.

"අම්මා රංජිත් අයියා අද කෑම කෑවෙ නැද්ද?"

"අනේ දරුවො මේ වැහිපින්න නිසා මම එළියට ආවෙ නෑ. ඇයි කාලා නැද්ද?"

ඔවුනතර කෙටි නිහඬ බවක් ඇතිවුණි.

"සැහෙන කාලෙකින් පොළව හරියට තෙත්වුනේ අදයි."

"ඔව් අම්මා. ඇනිකට් එකේ වතුර පිරිලා. මේ විදිහට ගියොත් ලොකු විනාසයක් වෙයි" රංජිත් එනු දුටු හංසිනිගේ මුහුණේ සිනාවක් මතුවුණි.

"කොහොමද නංගි ගිය වැඩේ"

"අයියේ වැඩ ඔක්කොම සාර්ථකයි. නුවර කාර්යාලයට රපෝර්තු කරන්ට කියලා ලියුමක් එවලා."

"ඉතින් මරුනෙ. දෙන්ඩකො අත. මයි කන්ගැජුලේෂන්" ඔහු ඇගේ අත ගනිමින් සිනාසුණේය.

"අයියා දෙවි කෙනෙක් වගේ ඇවිදින් මේ උපකාරෙ කළේ නැතිනම් කවදාවත් මේ වැඩේ කර ගන්ට බෑ. අයියාට පින් සිද්ධ වෙනවා."

"පිස්සුද ඔිවා ගණන් ගන්ට එපා."

"ඇත්තමයි රංජිත් ළමයා ආව නිසා තමයි මේ වැඩේ කෙරුනෙ."

"දූන් ඉතින් ඉකිරිවා ඕම්පල්. පුහුණුවෙන් පස්සෙ අපි කිට්ටුවකට හදා ගනිමු. නැද්ද ටීචර්."

"එන්න එපා පලේ දාන්න. රංජි අයියෙ අපි කොළඹ ගිය ගමන අක්කාට ආරන්චි වුණා නම් දෙන්නටම වේවැල් පාර."

සැවොම එක්වරම සිනාසුනහ.



"රංජි අයියා කෑවෙ නැද්ද?" ඇය වේවැල් කූඩය ඔසවා බලමින් කීවාය.

"කෑවා. අද බඩගිනි නෑ"

"කෑම සීතල වුණාම කන්ට බැරිව ඇති. අම්මා... පොඩ්ඩි ආවෙ නැද්ද?"

"ඇවිදින් නෑ වගේ"

ඔහු නිහඬව සිටියේය.

"අයියා අර ඊයෙ බණ්ඩියාට ගහපු එකට ඒකී මූණ දික්කරගෙන හිටියා. ගහපු එක හොඳා. උන් මෙතන මිනී මරා ගත්තම අපිත් අමාරුවෙ වැටෙනවා."

රංජිත් එම කතාවට මැදිවීමට ගියේ නැත. තවමත් තමා පසුවන්නේ ඇගේ සුවඳින් සුවඳවත් වූ ගමන්ය. එවන් උණුසුම් සතුටක් ලබා දුන් ඇයට මුළු හදින්ම ණය ගැතිය.

"මෙකි තරහට දවල්ට කන්නත් ඇවිදින් නෑ වගේ. පොඩ්ඩුව ඒකිට අසනීපයක්ද දන්නෙ නෑ. පොඩ්ඩක් ගිහින් බලන්ට."

මද වේලාවකට පසු කුස්සිය පැත්ත දෙසින් පහත් කරගත් හිසින් යුතුව එන රුව ඔහු දුටුවේය.

"හා මේ එන්නෙ අපේ අලුත් හාමු. උඹට බුලත් හුරුල්ලක් අරන් එන කල්ද හිටියෙ"

හංසිනි විමසුවාය. පොඩ්ඩි පහත් කරගත් හිසින් යුතුව සිටියාය.

"හා... හා... දූන් ඔකි එක්ක එල්ලෙන්ට එපා. කෙල්ලෙ ඇවිදින් කාහං" ඉස්කෝලෙ හාමිනේ හස්ත මුද්‍රාවෙන් කීවාය.

පොඩ්ඩි නිහඬව මේසය මතවූ කෑම බඳුන් කුස්සියට ගෙන යනු රංජිත් බලා සිටියේය. මඳ වේලාවකට පසු පොඩ්ඩි මැටි කෝප්පයකට බත් බෙදාගෙන කුස්සියේ බංකුවේ ඉඳ ගිල දමනු ඔහු බලා සිටියේය. ඔහුගේ සිතේ පොඩ්ඩි කෙරෙහි දුවි දුකක් ඇතිවුණි.

"කෝ දූන් බණ්ඩියා ?" රංජිත් හංසිනි දෙස බලා ඇසුවේය.

"ඌ ගෙදරින් තරහවෙලා ගිහින්ලු. මට මේකිව තරහ කරගෙනත් බෑ. දූන් මට ටීචිං ප්‍රෝග්‍රෑම් එකට ගියාම ගෙදර වැඩ කරන්න කෙනෙක් නෑ"

රංජිත් පිළිතුරක් දුන්නේ නැත. කිසිම වැඩක නිරත වීමට සතුටක් නැත.

රාත්‍රී ආහාරය සූදානම් කළේ පොඩ්ඩි විසිනි. ඒ කාලය තුළ ඔහු නිකමටවත් කාමරයෙන් එළියට ආවේවත් නැත. කෑමට කතා කරන තෙක් කාමරයේ තිබූ සඟරාවක් ඒ මේ අත පෙරලමින් සිටියේය. දිවා සමයේ සිදුවූ දෑ නැවත නැවත සිහි වෙයි. මේසයට කෑම ගෙනෙද්දී වුවද ඇය රංජිත් දෙස නිකමටවත් හිස ඔසවා බැලුවේ නැත. මේකිත් හොඳට කට්ටකම් දන්නවා.

"පොඩිදුව බණ්ඩියා ගෙදරින් තරහ වෙලා ගිහින් කියනවද?"

"ගිහින් කියන්නෙ. ඌට ගෑණියෙක් ඕනෑ මිනිහෙක්





නෙවේ. මට දුක මේ කාලකන්නි පොඩ්ඩි ගැනයි."

ඔවුනතර කෙටි නිහඬ බවක් ඇතිවුණි.

"මිනිහත් නැතිව පොඩ්ඩිට පාළු ගෙදර ඉන්න දෙන්න එපා. මොනව හරි වුණොත් අපිට වග කියන්න වෙයි. ඇවිදින් මෙහෙ නිදාගන්න කියන්න." නැන්දම්මා කීවාය.

එන්න එන්න වැස්ස වැඩිවන බවක් පෙනේ. රාත්‍රී අහරගත් හංසිනී වෙනදාට කලින් නින්දට ගියේ හිමිදිරියෙන් නිවසින් පිටව යාමට ඇති හෙයිනි. රාත්‍රී ආහාරයෙන් පසු රංජිත් ඇඳට ගියේය. මේස ලාම්පුවේ එළියට අවුකළ ඔහු කොට්ටය ඇඳ විට්ටමට හේත්තු කර දෑස් තරයේ පියා ගත්තේය.

දිවා සමයේ සිදුවූයේ කිසි ලෙසකින් නොසිතූ ක්‍රියාවකි. තමා දමිතාට ද්‍රෝහිවූවාදැයි ඔහුට හරියටම පැවසිය නොහැක. එවැනි සිද්ධියකින් මිදී සිටීමට තරම් වූ දියාරු පිරිමි කමක් ඔහුට තිබුනේ නැත.

විවාහක පිරිමියෙකු ලෙස එවැනි කටයුතු පිළිබඳව ලබා ඇති අත්දැකීම් ඇය වසඟයට ගැනීමට බෙහෙවින් උපකාරී වූ හැටි ඔහුට සිහිවෙයි. ඒ සුන්දර ක්‍රියාවන් කෙරෙහි ඇය වඩාත් ආසක්තව සිටියේ නුහුරු සතුට නිසාද? ආලිංගන සංඝාත වූ ක්‍රියාවලියට ඈ කිසිදු විරුද්ධතාවයක් නොදැක්වීම නිසා ඔහු ලද්දේ අසීමිත සතුටකි. යාබද කාමරයේ හැන්දා සිටින බව දන්නා නිසා සිතා සිටි පරිදි දිගු වේලාවක් සතුට බෙදා ගැනීමට ලැබුනේ නැත. ලද හැකිවූයේ සුසිනිඳු ස්පර්ශ සුවය පමණි.

දැන් ඒ සතුට සිහිනෙන් ගෑ සුවඳක් මෙනි. එය නැවත

නැවත සිහිකර සතුටු වීමට තරම් දර්ශන සිතේ පෙළගැසී නැත.

මෙකින් ඉඳලා තියෙන්නෙ කැමැත්තෙන් වගේ. ලාපතක් වගේ මට තුරුල්ව සිටියා. ඒ සියුමැලි ලැමේ, ගෙලේ කිසිලිවල සුවඳ තවමත් හදවත තුළය. මේ නුහුරු සතුටේදී දමිතාට එරෙහිව සංසන්දනයන් මතුවීම වැළැක්විය නොහැක. හංසිනිටත් වඩා වයසින් බාල තරුණියක් වූ පොඩ්ඩී ගේ සිරුරේ තරුණකම ඉහ වහා ගොස් තිබුණි.

දරුවන් දෙදෙනෙක් පෝෂණය කිරීම නිසා ක්ෂය වූ එල්ලා වැටෙන ලැමට වඩා උල්ව නැගීගත් ලැම දුඩිය.

කොට්ටය අනිත් අතට හරවා නිදා ගැනීමට සූදානම් වුණි. අද පොඩ්ඩී නිදන්නේ කුස්සි කාමරයේ විය යුතුය. දමිතාට මෙන් නොව හංසිනිට හොඳ නුවණක් ඇත. අතට අහුවුණොත් ආත්මෙම ඉවරයි. ඔහු ලාම්පුව නිවා දුම්මේ එක්තරා තීරණයකට එළඹීමෙන් පසුවය.



## 17

රංජිත් පිබිදුනේ හොඳටම දවල්විය. මෙතරම් දිගු නින්දක් ලද දිනයක් ඔහුට මතක නැති තරම්ය. ඇඳේ වැතිර සිටියේ උදාසීන බවින් නොව හදවත වටකරගත් උද්දාම ගතියෙනි. නිවස තුළ පැතිර තිබුනේ නිහඬ බවකි. කිසිවෙක් මිදුල අමදින හඬ ඔහුට ඇසෙයි. ඒ පොඩ්ඩී විය යුතුය. ඔහු සෙමින් ජනේලය විවෘත කළේය. අඩ දීප්තියක් ඇති උදාහිරු රැස් එකවරම කාමරයට පිවිසුනි. ඔහුගේ නෙත ගැටුනේ පීත වර්ණ මල් ගොමුව අසල සිටින තවත් සුවිශේෂ කුසුමක් වෙතය. ජනෙල් කවුළුව දෙසට පසු බා මිදුල අමදින පොඩ්ඩී දෙස ඔහු බලා සිටියේය. ඇය හැඳ සිටි සාමාන්‍ය ප්‍රමාණයේ වූ කොට ගවුමට ඇගේ නිහඬ මැනෙවින් දිස්වුණි. ඇය ජනේලය අසල දුවටෙමින් සිටින්නේ තමා පිබිදීම අපේක්ෂාවෙන් විය යුතුය. රංජිත් නැන්දම්මා ගේ හඬින් දොර විවෘත කර එළියට ආවේය.

"අම්මෙ ලොකු නංගි ගියාද?"

"ඔව්. මේ හරවන බස් එක අල්ලන්න කියල උදෙන්ම ගියා."

ඔහු තුවායත් රැගෙන මුහුණ සෝදා ගැනීමට ළිඳ දෙසට යාමට සූදානම් වුණි. ඉකුත් දින රැයේ ඇද වැටුණු වැස්සට ප්‍රාණවත් වූ තුරු මත විචිත්‍ර වර්ණ මල් පිපී තිබෙනු ඔහු දුටුවේය. ඔහු ආපසු හැරී බැලුවේ පොඩ්ඩි තමා ළඟ සිටි හෙයිනි. ඇගේ මුහුණේ පැතිරගත් සිනාව කොතරම් සුන්දරද? රෝස පැහැති තොල් සඟල සිනාවේ ආකර්ශනය වැඩි කළේ යැයි රංජිත්ට සිතුනි.

"මූණ හෝදන්න බේසමට වතුර දාලා තියෙන්නෙ" ඇය බේසම දක්වමින් ගොළු බසින් කීවාය.

"ඇයි දූමෙ මම ඇලට යනවා" ඔහු හස්ත මුද්‍රාවෙන් ඇල දක්වමින් කීවේය.

"ම්හු... යන්න එපා මෙයින් හෝදා ගන්න." ඇය යටැසින් බලා කුලෑටි සිනාවක් පෑවාය.

"දෙන්නම යමු...!" ඔහු අතින් යෝජනා කළේය.

"අම්මෝ... ලොකු මැණිකෙ ඉන්නවා"

ඇය දෑස් ලොකු කර අකමැත්ත ප්‍රකාශ කළාය. මුහුණ සෝදා ගැනීම සඳහා ඔහු කමිසය ගැලෙව්වේය. ඇයගේ නෙත් යොමු වූයේ කාලවර්ණ මවිල් වලින් ගැවසී ගත් ළැම හා



උරපතු වෙතය. කඩවසම් පිරිමි දේහයේ නැගී ගත් වර්ධනය වූ ශක්තිමත් මාංශ පේශීන් ඇගේ නෙත ගැටුණි. ඔහු හා සසඳන විට සැමියා අර්ධ පිරිමියෙකි. නිරුවත් උඩුකයින් යුතුව සිටින විට බණ්ඩියා රෝහල් ගතව සිටින රෝගියෙක් මෙනි.

ඇය ආපසු හැරී නිවසට දුව ගියාය. මොනවා හෝ අයිති නැති අයිතිවාසිකමක් තමාට පැවැරී ඇත. මුහුණ පිසදමා තුවාය අතැතිව එන රංජිත් වෙත උණු එළකිරි ජෝගුව පිරිනැමීමට ඈ මඟ බලා සිටියාය.

"කෝ පත්තරේ ගෙනාවද?"

ඇය හිසවනා පිළිතුරු දුන්නාය. නිවස තුළට දුවගිය ඇය පත්‍රය ගෙනැවිත් තේ පානය නිමකළ රංජිත්ට පෑවාය.

"කෝ සිගරැට් පැකට් එක?" ඔහු ඇසුවේය.

"සිගරැට් බොන්න හොඳ නෑ. කැස්ස හැදෙයි" ඇය අභිනය විලාශයෙන් කීවාය. රංජිත් අමනාප වේතැයි යන බියෙන් යුතුව ඇය දුම්වැටි පැකැට්ටුව දී ආපසු දිව්වාය.

වෙනදා නැති සතුටක් වලව්ව තුළ පැතිර ඇත. දුවට රැකියාව ලැබීම පිළිබඳව නැන්දම්මා පසුවන්නේ සතුටින් යුතුවය.

"මෙහෙ ඉඳලා වෙලාවට යන්න එන්න බැරි නිසා පොඩි දුවගෙ පන්තියෙ යාළුවෙකුගෙ ගෙදර මාසයක් විතර නතර වෙන්න ඕනෑ කිව්වා."

"ඔව් පන්ති පටන් ගන්න වෙලාවට නොහිටියොත් හොඳ මදි. මේ බස් ගමන නම් අන්තිමයි. මගේ සයිකලේ හදා ගත්තා නම් නංගිව නුවරට දාල එන්න තිබුණා."

"නෑ නෑ ඒ තමන් මිත්තෑ. දම්සා දකගත්තොත් අපි මිස්සකාරම බණී. සිරි කළයක් පුරෝලා ගොම දාන්නෙ මොටද?" හැන්දම්මා කීවේ හැඟීම් බරවය. ඇගේ කතාව තමාට එල්ල කළ පහරක් මෙනි.

ඉතුරු සති කීපය තුළ එළි පෙහෙළි කළ බිමෙහි වගාව කළ යුතු කාලය පැමිණ ඇත. රැදූ පාළුව පලවා හැරීමට නම් කිසියම් අර්ථවත් වැඩකට සිත ගත යොමු කළ යුතුය.

බීජ සිටුවා නිමවනවිට හොඳටම සවස් වී තිබුණි. මේ කාලය ඇතුළත පොඩ්ඩිගෙන් ලැබුනේ නොමඳ සහායකි. රංජිත් විසින් සාදන ලද රුක්ගොමුව වෙනදාට වඩා සුන්දරය. ඔහු රුක් හේඩාව අතරින් රිංගා ගොස් සෙවන යටට වී සිටියේය. එය මලින් සැරසූ යහනක් මෙනි. නිවසින් ගෙන ගිය පැදුර එළාගත් ඔහු දිවා ආහාරයෙන් පසු මඳ වේලාවක් හේඩාව තුළට වී සිටියේය.

රංජිත් මඩුවේ දමා තිබූ යතුරු පැදිය එළියට ගෙන පිසදා බැලුවේය. බිරිඳගේ කෑ ගැසීම අනුව මෙහි ගෙනාවා විනා සයිකලයේ එතරම් බරපතල වරදක් නැත. බැටරිය චාජ් කර පැට්‍රල් ගසා ගෙන කිවටුව පානකට යාමට පුළුවන. ඒ සඳහා නගරයට යාමට පුළුවන් කමක් නැත.

පහත් කරගත් හිසින් යුතුව වත්ත මැදින් යන බණ්ඩියා දුටු රංජිත්ගේ සිතේ තරමක අනුකම්පාවක් ඇතිවුණි. ඔහු මේ එන්නේ ඉකුත් දිනවල අම්හිරි සිදුවීමෙන් පසුවය.

"බණ්ඩියා, බණ්ඩියා" රංජිත් ඈතින් යන බණ්ඩියාට ඇසෙන සේ උස් හඬින් කතා කළේය. මඳ වේලාවක් කල්පනා



කරමින් සිටි බණ්ඩියා ආපසු හැරී රංජිත් සිටි තැනට ආවේය.

"බණ්ඩියා ඊයෙ ඇ කොහෙද ගියේ ?" පිළිතුරක් නොදුන් බණ්ඩියා හිස පහත් කරගෙන සිටියේය.

"අයියෙ බණ්ඩියා මම ඊයෙ තමුසෙට ගැහුවෙ හිතලා නෙමේ. ඒ වෙලාවෙ මට කේන්ති ගියා."

"ඇත්තටම සර් මමයි වැරද්ද කළේ. මට සමාවෙන්ඩ. මම අමු මී හරකෙක්" ඔහු වරද පමුණුවා ගනිමින් කීවේය.

"අද මෙච්චර වෙලා මොකද කළේ ?"

"හැමදාම තිකං ඉඳල හරියන්නෙ නෑ. මම රස්සාවක් හොයන්ට ගියා. ඉස්සර වාගෙ මහන්සි වෙන්න බැරි නිසා දැන් මාව බාරගන්නෙ නෑ."

රංජිත් එක එල්ලේ බණ්ඩියා දෙස බලා සිටියේය. මිතුරාගේ කොන්ත්‍රාත් වැඩපලේ වැඩක් ලබා දුනහොත් ඔහු වත්තෙන් පිට කිරීමට පුළුවන.

"මුර වැඩට කැමතිද? හැබැයි ගෙදර එන්න වෙන්නෙ මාසෙකට සැරයයි. කමක් නැද්ද?"

"අනේ පින් සිද්ධ වෙයි සර්. මට මුර වැඩේ අරන් දෙන්ට. දැන් මට ගහකට යන්නත් බෑ පපුවෙ හතිය."

"හැබැයි එතන ගිහින් බීලා පිස්සු නටන්ට බෑ. මගෙ නම්බුව ආරක්ෂා කරන්න ඕනෑ. හොඳා උදේට එනවා මම ලියුමක් දෙන්නම්"

මණ්ඩියා නොරව පූර්වකව රංජිත් දෙස බලා සිටියේය.

"දැන් මුකුත් වැඩක් තියෙනවද?"

"නෑ සර් මුකුත් වැඩක් නෑ"

"පිහින් කෑම කාලා වලුමට පිහින් බැටරිය චාර්ජ් කරල පැට්‍රල් ගැලුමක් අරන් එනවා."

මණ්ඩියා කැමැත්තෙන්ම එය පිළි ගත්තේය. ශාලාව ඇට් කිවකට එන හංසිනී සිනාමුසු මුහුණින් මඩුනාහට ආවාය.

"ආ... මේ ඇවිදින් ඉන්නෙ. කෝ වීගෙ උණේ සිබිවල රස්" හංසිනී කතා කළේ තරමක් සැරෙනි. ඔහු හිස පහත් කරගෙන අහිංසකව හිස කැසුවා විනා කතා කළේ නැත.

"හා සිසිල්ලා කාලා එනවා" රංජිත් කීවේය.

මණ්ඩියා නිහඬව කුස්සිය දෙසට ගියේය.

"මම කිව්වෙ උන්මග හැටි ඔහොම තමා" ඈ සිනාසුනාය.

"කොහොමද ලොකු හංසිගෙ ඉගෙනීමෙ වැඩ?" රංජිත් ඇසුවේය.

"ගෙදර ඉඳලා ගියොත් මගෙ රස්සාව නැතිවෙයි. වෙලාවට යන්න වෙන්නෙ නෑ. මම දැන් ආපහු නුවර යනවා. මේ මාසෙ මගෙ යාළුවාගෙ ගෙදර නතර වෙන්ට පුළුවන්."



රංජිත් පිළිතුරක් නොදී නිහඬව සිටියේය.

"මේ දවස් වලත් අයියා ඉන්න එක ලොකු දෙයක්. නැත්නම් අම්මාට දාල යන්ට විදියක් නෑ. මම නිතරම හොස්ටල් එකට ගිහින් කාලිම එන්න එන්නයි"

"මුවී නංගියෙත් ඉගෙනීම නැති වෙනවනෙ. ප්‍රශ්නයක් නෑ. මම ඉන්නවනෙ."

"රට යන්න හොඳුකින් පණිවුඩයක් ආවොත් අයියා මට ඇවිදින් කියා ගෙන යන්න ඕනෑ. අද තෙරම එයි"

මිදුනු කතා කරමින් නිවස දෙසට ගියා. ඇය හෙට්ටු ඇනීමට කුස්සිය දෙසට යද්දී මණ්ඩියා කුස්සියේ බිම හරින ලද කුවා මාලුවක ඉඳගෙන මැටි කෝප්පයක බත් කමින් සිටිනු රංජිත් දුටුවේය.

"සර් මම බත් ටික කාල එන්නම්" මණ්ඩියා කීවේය.

"කඩිස්සියක් නෑ කාල එනවා"

ඔහු සාලයට එනවිට හංසිනී මුහුණට ඇලුම් දමමින් සිටිනු දුටුවේය.

කෙල්ල පමණක් නිවසේ දමා යාම පිළිබඳ තරමක බියක් ඇගේ සිතේ හොබිහුණා නොවේ. මණ්ඩියා නැවත සිටිනු දකීමෙන් සිතේ බිය තුරන් වුණි. මැගය පසෙක තැබූ ඇය පොඩ්ඩිට දීර්ඝ අවවාදයක් දෙනු රංජිත් දුටුවේය. ඇය එසේ පවසන්නට ඇත්තේ තමාගේ අවශ්‍යතාවයන් පිළිබඳව බව රංජිත් දනී.

දවල්වත් නැති රෑටත් නැති අහරවේල ගත් බණ්ඩියා ගේ කුස සෑහෙන්ට පිරී තිබුණි. සුළඟිල්ලෙන් දත හාරා කෙල ගැසූ ඔහු සරමේ අත පිස දමමින් රංජිත් අසලට ආවේය.

"බැට්‍රිය චාජ් කරගෙන පැට්‍රල් ගැලුමක් ගේන්න ඕනෑ හරිද?"

ඔහු හිස වනා එය පිළිගත්තේය.

"බණ්ඩියත් ගහන සැර පැට්‍රල් ජාතියක් බෝතලයක් ගහනවා. මට මේ කොලේ ලියල තියෙන ජාතියෙන් එකක් ගේනවා"

බණ්ඩියා බැටරියද රැගෙන යන්ට ගියේය. සැඳෑ අඳුර ගලමින් තිබුණි. අවසන් රැස් දහර ගිලියාමට ප්‍රථම ඔහු ඇලෙන් ගොඩ වී වලව්වට ආවේය. ඒ වනවිට වුවද බණ්ඩියා පැමිණ සිටියේ නැත. නිවසට ගිය වහාම පොඩ්ඩි උණු කෝපි කෝප්පය රැගෙන ආවාය. ඇය ඉස්තෝප්පුවට වී බලා සිටියේ බණ්ඩියා ගේ පැමිණීම පිළිබඳව විය යුතුය. රංජිත් මහත්තයාගේ මුදල් රැගෙන යන්ට ගියාද යන්න පිළිබඳව ඇයට සැකයකි. ඇය බණ්ඩියාගේ ස්වභාවය දනී. හොරෙක් නූනත් ඔහු මුදල් පරිහරණය කිරීමට දන්නෙක් නොවේ. දෙන මුදලින් මත්පැන් පානය කර අගලක වැටී ඇතැයි පොඩ්ඩිට සිතේ.

දැන් නුවරින් එන්ට බසයක් නැත. ඇය දුක්වන්නේ තමාට කළ මදිකම ගැන විය යුතුය. පරිසරය නිහඬය. හමන සුළඟ සිසිල්ය. කොහේ හෝ නිවසක සංකාරියක් පටන් ගැනීමට පෙර මගුල් බෙරයක් වයන හඬ ඇසේ.

"බත් කන්න." ඈ අතින් සංඥා කළාය.



"බඩගිනි නෑ. තව රෑ වෙලා කනවා" ඔහු ගොළු බසින් කීවේය.

"ලොකු නෝනත් නිදි කාල නිදාගන්න"

ඇය බිත්තියට හේත්තුවී දිගු වරල අග ඇඟිලි අගින් කරකවමින් කීවාය. ඔහු ඉදිරියට ගොස් ඇගේ අතින් අල්වා ගැනීමට පෙර දුරුවේය.

"එපා... එපා..." ඇය පස්සෙන් පස්සට ගියාය. "ලොකු නෝනා ඉන්නවා"

"ඇයි එපා" ඔහු ඇයට සමීප වෙමින් ඇසුවේය.

"අම්මෝ.... බයයි. ලොකු මැණිකෙ අර කාමරේ...."

ඇය පසු පසට ගියත් අතින් ඇල්ලීමට විරුද්ධ වූයේ නැත. ඇය විවෘත වූ දොරෙන් එළියට ආවේ ඔහු අතින් අල්වා සිටියදීය. සෞම්‍ය සඳ රැස් මිදුලට වැටී ඇත. සඳ දිය දහරින් මුළු ලොවම වැසී ගොස්ය. ආලෝකය ඔබ්බෙන් වූ වන ලේඛාව දෙසින් අඳුරු සෙවනැලි වැනෙනු පෙනේ. එසේ වැටී ඇත්තේ උස්ව නැඟී ගත් පුවක් අරඹේ ඡායාව විය යුතුය. මේ නිවස තුළ උණුසුම් හදවත් වලින් සිටින්නේ ඔවුන් දෙදෙනා පමණැයි රංජිත්ට සිතේ.

මේ හැසිරීම පිළිබඳව ඇගෙන් හැඟුණ කිසිදු විරෝධතාවයක් නැත. ඔහු එකවරම ඇය සිය ළයට තද කරගත්තේය. කිසිදු හේතුවක් නැතිව ඇගේ හද ස්පන්දනය දනේ. මහා නොතේරෙන ගැහැණු සුවඳක් ඇගේ ගෙලෙන් හමයි. නිවසේ පිට බිත්තියට තදකර දොතොල් සිප ගත්තත් කිසිදු බියක් නැතිවය. මෙතෙක් තමා වෙතින් තද බල වරදක් සිදුව නැතිකම

ඔහු දනී. විවාහක කතක් හා ස්ව කැමැත්තෙන් බැඳීම සාපරාධී වරදක්ද? එවැනි කටයුත්තක් මේ නිවස තුළ සිදුකළ නො හැක. ඔහු ගේ මනසට නැගුණේ තමා විසින් දිවා වරුවේ ගත කළ වන අරණය. රංජිත් ඇගේ අතින් අල්වා ගෙන එදෙසට ගියේය.

මුදුන් වූ සඳ එළිය සුදු දිය දහරක් ලෙසින් බිමට පතිත වෙමින් තිබුණි. සඳ, දිය, මෙන්ම අඳුර ගස්වැල් සුළඟ නිශාචරයන් ගේ සිහින් කෙඳිරිලි නාද ස්වභාවයේ දායාදයන්ය. මේ, මනුෂ්‍යයන්ද සමාජ සත්වයන්ය. අනිත් සෑම සතෙක් මෙන්ම මනුෂ්‍යයාද උපත ලබන්නේ නිරුවතිනි. අතිශයින් සතුටු වී ඇත්තේද නිරුවතින් සිටින අවස්ථාවන්හිදීය.

රංජිත් පොඩ්ඩිගේ බඳ වටා අත දමා ළයට තද කරගෙන සිටියේය. ඔහු ඇගේ නැඹ අසලින් යට කර තිබූ ඇඳි වත සෙමින් මිදෙව්වේය. ඒ වන විට ලැම හිස්ව බොහෝ වේලාවකි. කාලවර්ණ රෝමයන් ගෙන් ඔහුගේ පපුව උණුසුම් වූයේ රෝස පැහැති නෙළුම් පුඩු සහිත ඇගේ ලැමෙනි. දියාරු සඳ එළිය පරදවන පීත වර්ණ එළියක් මුකුත් නැති ඇගෙන් පැතිරෙමින් තිබුණි.

පොඩ්ඩි නියුණු ලෙස ගිනියම් වූ පිරිමි සිරුරක් හා සමාධිගතව නැත. එහෙත් ස්වභාවිකව ගැහැණියකට හිමි රංගනයට ඇගේ කය සූදානම්ව තිබුණි. රංජිත් විසින් අතුරන ලද ඇගේ චිත්තයේ පොඩ්ඩි වැතිරුණේ උපන් ලෙසිනි.

සඳේ තඹ පැහැති ආලෝකය බොරුපත් බඩයක පැහැයෙන් යුතු උඩුබැල්මෙන් සිටින ස්වභාව ධර්මයේ අපූර්ව නිර්මාණය වෙත වැටී තිබුණි. යාන්තම් අඳුරක් දිස් වූයේ දෑඩි ආකර්ශනයක් බිහිකළ නැඹ හා නිල් කෙස් පොදින් ගැවසුණු



යටිකයේ සුළු පෙදෙස පමණි. මේ රළු පිරිමිකමේ ආශ්වාදය ඇයට නුහුරුය. ඇය රංජිත්ගේ ගෙල බදා ගත්තේ මෙම ආශ්වාදයෙන් ලද තියුණු කම්පනය නිසාය. විවාහ වී මාස ගණනාවක් ගෙවී ගියත් ජීවිතයේ වූ අපූර්ව සතුට ලැබීමට තරම් ඇය වාසනාවන්තියක් වූයේ නැත.

ඇගේ සියුමැලි සිරුර පිරිමියෙකු ගේ රළු උණුසුමින් වැසී තිබුණි. ඇයට පිරිමියෙකුගේ සුවඳ හරියාකාරව දැනුණේ එදාය. එහි ගැලී සිටිනවා හැර ප්‍රතික්ෂේප කිරීමට තරම් ඕනෑකමක් තිබුණේ නැත. රංජිත් විසින් පැවරූ කටයුත්තට ආධුනික වුවත් කැමැත්තෙන් ලොල්වූ පරිදි යුහුසුළු වෙමින් සිටියාය. වඩාත් සංවේදී ප්‍රියතම ක්‍රියාවෙන් හෙතෙම ලද්දේ ඇඟ රිදවන සියුම් සතුටකි. දමිතා මෙවන් කටයුත්තකට කැමති කරවා ගන්නේ කොතරම් බැගෑපත් වීමෙන්ද? විවාහ වූ දිනවල තිබූ උණුසුම හා කැමැත්ත දමිතා වෙතින් පහව ගොස් ඇත.

රාත්‍රියේ වලන් පිගන් සෝදා ළමයින්ගේ ඇඳුම් මැද අතිරේක පන්තිවල ප්‍රශ්න පත්‍ර බලා නව නිබන්ධන සකස්කර ඇඳට එන ඇයට වෙනත් කටයුතු අවශ්‍ය නැත. ඇතැම් විට මේ කටයුතු සිදුවන්නේ ඒක පාර්ශවීය කටයුත්තක් ලෙසිනි. මේ උදාසීන ඕලාරික බව නිසා ඔහු කිසි දිනෙක උපරිම සතුටක් ලබන්නේ නැත. එහෙත් අද මේ ගෙවී යන්නේ කොතරම් උණුසුම් වූ රාත්‍රියක්ද? පොඩ්ඩි වෙතින් තමා යළි උපදින බවක් රංජිත්ට දැනේ. ඇගේ මුව නිදහස්වූ මද වේලාවකින් ඔහු ඇගේ නිකටින් ඔසවා මුහුණ දෙස බැලුවේය. ගොළු බව අදහස් ප්‍රකාශනයේදී අඩුවක් තිබුණත් දෙනෙන් දොඩමළුව තිබුණි.

"තරහද?" ඔහු ඇගේ හිස පිරිමදිමින් ඇසුවේය.

"මිහු.... ආදරෙයි" ඇය ගොළු බසින් කීවාය. පරිසරයේ පැවතුනේ නිහඬ බවකි. ඔහු පහත්වී ඇගේ නැඹ සිප ගත්තේය. ඇය සිටියේ ඔහු කැඳවන ඉරියව්වකිනි. අත්දැකීම බහුල පිරිමියෙක් වූ ඔහුට එම ආරාධනය තේරුම් ගැනීමට අපහසු වූයේ නැත. ඇය ගොළු ගැහැණියක් නොවූනා නම් ගතකරන අවස්ථාවේ සතුට මීට වඩා හැඟුම් බරව බෙදා හදා ගත හැකිව තිබුණි. ඔහුට එකවරම දමිතා සමඟ මධුසමය ගතකිරීමට ගිය උණුසුම් රාත්‍රිය සිහිවුණි. එම මොහොතේ දමිතා කෑගසමින් තම ගෙල බදා ගත් හැටි ඔහුට සිහිවුණි. එහෙත් ගොළු කෙල්ල සොඳුරු වේදනාව දරුවේ කිරුල පලන් රැජිනක මෙනි. සතුටේ කෙළවර ඇය යළි ඔහුගේ ගෙල දෑතින් බදාගත්තාය. ඇගේ නිරුවත් ලැමේ ස්පර්ශය හා හදේ සිඳුම් ස්පන්දනය ඔහුට දැනුණි. අඩ අඳුරේ සිට ගොළු බසින් පවසන දෑ ඔහුට හරියට පැහැදිලි නැත.

ජීවිතයේ කිසිම දිනෙක කිසිම ගැහැණියෙක් කිසිම කොන්දේසියක් නැතිව සිය සිරුර පිරිනමන්නේ නැත. ඇය පිරිනැමුවේ පිරිසිදු කයකි. ඇය මෙතෙක් කල් කන්‍යාවියකව සිටි බව දැනුනේ ඇය සතු වටිනාම දේ තමාට දන් දුන් බැවිනි. ඔහු මෘදු ලෙස ඇගේ දෙනෙතේ නැගුණු කඳුළු පිස දැම්මේය. ඇයට කැමති සේ ප්‍රීතිය බෙදා ගැනීමට ඉඩ හැර ඔහු නිහඬව සිටියේය. පොඩ්ඩිට නිවසට යාමට කිසිදු උවමනාවක් නැතිබව ඔහුට හැඟුණි. නිදි පෙති ගෙන නිදන නැන්දම්මා නැවත පිබිදෙන්නේ උදේටය. නිදහස් ලෙසට ඇය ඔහුගේ අතගෙන නැගී සිටියාය. පොඩ්ඩි රංජිත්ගේ පසු පසින් සිට ඉගෙන් අල්වා උරෙහි හිස හොවා ගත්තාය.

වලාකුලින් වැසී තිබූ සඳ යළි දීප්තිමත්ව බබලන්ට පටන්



ගත්තේය. තිරිඟු කරලක වර්ණ මුසු වූ ඇගේ ලා කහ පැහැති නිරුවත් කය යළි දිස්වුණි. ඇය රංජිත් බදාගෙන සිටියේ රුකක එතුනු මල් ලතාවක් පරිදිය. ඔහු පොඩ්ඩි සිය ශක්තිමත් දෑතට ඔසවා ගත් අතර ඇය ගොළු හඬින් කොඳුරා රංජිත් ගේ ගෙල බදා ගත්තේ දැරියක මෙනි. මේ සොඳුරු ස්පර්ශය තුළින් නැවත වරක් ගත අනුරාගයෙන් සසලවන බවක් ඔහුට දැනුණි.

# 18

පොඩ්ඩි පැදුර බිම එලා වැතිරෙන විට මැදියමත් පසුව තිබුණි. සිත ගත පුරා පැතිර ගිය දරා ගත නොහෙන සතුටක් ඇයට ඇත. තමා ගැහැණියක් බවට පත්වූයේ ඉකුත් දින රැයෙහිය. හදවතට පැයූ ප්‍රථම හිරු මෙන් මුළු ජීවිතයම ආලෝකමත් කල හැටි ඇයට මතකය. ගතට තියුණු කම්පනයක් ඇති කළ සුන්දර පීඩාව මෙතරම් හැඟුම්බර එකක් යැයි ඇය සිතුවේ නැත. මත්පැන් බී හතර ගාතෙන් පැමිණ කෝලහාල කර නිදාගන්නා සැමියා පිළිකුල්ය. රංජිත් හා ගත කළ කාලය තුළ තම දේහය කුසුමක් සේ සිපගත් හැටි. හදවත ඔද වැඩී තිබුණේ ගොළු සතුටකිනි. මේ හැම සතුටක් ම ලැබුනේ ජීවන ගමනේ වූ අත් වැරද්දක් ලෙසය. නැතිනම් මෙවන් සතුටක් කිසිදාක තමාට හිමි වන්නේ නැත. මුළු කයම තලා පෙළා දැම්මාක් මෙනි. එළිවනතෙක්ම දුටුවේ සුන්දර



සිහිනය. ඇය පිබිදුනේ ලොකු ඉස්කෝලෙ හාමිනේ උර හිසින් සොලවන හඬිනි. කවදාවත් මෙතරම් දවල්වන තෙක් නිදන පුරුද්දක් ඇයට නැත.

"මොකද උඹට සනීප නැද්ද?" ඉස්කෝලෙ හාමිනේ ඇසුවාය.

පොඩ්ඩි නොනැගිටම පැදුරේ සිට දිගු වරල ගැට ගසා ගත්තාය. අත්දැකීම ලත් ගැහැණිය ගේ තියුණු නෙත පොඩ්ඩි වෙත යොමුව තිබුණි. පොඩ්ඩි පහත් වී පැදුර අකුලද්දී දුර්වල දෙනෙතට වුවද එහි පැහැය දිස්වුණි. ඇය පොඩ්ඩිගේ උරෙන් අල්වා දැන්වූවාය.

"ඉක්මනට ඔය චීත්තය මාරු කරපං" ඇය ආපසු හැරී බැලුවාය.

"අර මහත්තයත් ඉන්නවා. ඉක්මනට ගෙදර ගිහින් වරෙන්"

පොඩ්ඩි නිවසට ගියේ දෙවෙනි ගමන යන මනාලියක් ලෙසිනි. තමා මෙතෙක් කල් හොඳ ගැහැණියක්ව සිටි බව දන්නේ එක් අයෙක් පමණි. වෙනත් චීත්තයකට මාරුවෙද්දී ඇගේ දෙනෙත් කඳුලෙන් තෙත්ව ගියාය. ඉස්කෝලෙ හාමිනේ වෙතින් තදබල සැකයක් ඇතිවන්ට විදිහක් නැත. ගැහැණියක් මෙවන් අවස්ථාවකට මුහුණ දීම ස්වභාවිකය. ඒත් මා එහෙම නොවේ.

තමා වෙනදාට වඩා ප්‍රියකරුව සිටිය යුතුය. අද තමාට විශේෂ දිනයකි. දිය නා ගනිද්දී දැනුනේ සුන්දර වේදනාවකි. පොඩ්ඩි වරලෙන් දිය බේරෙද්දීම වලව්ව දෙසට දිව්වෙ තම

ජීවිතය වෙනස් කළ පිරිමියාට උණුසුම් තේ බඳුනක් දීම සඳහාය.

"කොහෙද කෙල්ලෙ ගියේ. අර මහත්තයාට තේ එකක් හදපං. මොකද මේ ජැන්ඩියට ඇඳගෙන" ඉස්කෝලෙ හාමිනේ කෑ ගැසුවාය.

ඇයට මුහුණ ඔසවා කතා කිරීමට ශක්තියක් නැත. තේ පිළියෙල කරද්දී බණ්ඩියා කුස්සිය දෙසින් එනු දුටුවාය. සමහරවිට තමා මූරමඩුව දෙස සිට එනවා ඔහු දකින්නට ඇත. එනිසා සිතේ බියක්ද නැත.

"ඉක්මනට මහත්තයාට තේ එකක් දීපං" ඔහු බිරිඳට සැරෙන් කීවේය.

"කොහෙද ඊයෙ රෑ හිටියෙ. බීලා පාරෙ බුදියා ගත්තාද?"

ඇය ගොළු බසින් විමසුවාය. ඔහු පිළිතුරු දුන්නේ නැත. කඩිනමින් තේ ජෝගුව පිළියෙළ කරගත් ඇ රංජිත් හමුවට ගියාය. කොට කලිසමකින් හා හමුදා බැනියමකින් සැරසී සිටි ඔහු මෝටර් සයිකලය සදමින් සිටියේය.

"සර් මේ තේ එක බොන්න. මේකි ඊයෙ රෑ ගෙදර ඉඳල දුනුයි ආවෙ"

රංජිත් කිසිත් නොදොඩා සිටියේය. ඔහු සයිකලයට බැටරිය සවිකර පැට්‍රල් දමා පණ ගැන්වූයේය. එක උත්සාහයෙන්ම පාපැදිය ක්‍රියාත්මක වූ නිසා ලද සතුට නිසා ඔහු උස් හඬින් කෑගැසුවේය. ඔහු යතුරු පැදියේ නැගී වට කිහිපයක් වලව්ව වටේ ගියේ කෑගසමිනි. තමාද එම දූෂ්‍ය සතුටේ කොටස් කාරියෙකි. හරියට දඟකාර කොල්ලෙක් වගේ.



වගේ නෙමෙ දඟයෙක්, ඊයෙ තමා හැටි දැනගත්තේ. මුකුත් නැති මාව දැතට වඩාගෙන හිටියා.

"මේක බොන්න මට වැඩ තියෙනවා"

ඇය යටැසින් බලා ගොළු බසින් කීවාය. මෝටර් සයිකලය ඇය ඉදිරියේ නතර කළ ඔහු වට පිට බැලුවේය. කිසිවෙක් පෙනෙන්ට නැත.

"ඔය තොල් දෙකට මොකද වෙලා තියෙන්නෙ?" ඔහු ඇගෙන් විමසුවේය. දරා ගත නොහෙන සතුටක් ඇතිවුනත් එය ප්‍රකාශ කිරීමට ක්‍රමයක් නැත. ඇය ලජ්ජාවෙන් බිම බලා ගත්තේ දිය යුතු පිළිතුරක් නැති හෙයිනි. දුන්න වද කියා ගැනීමට විදිහක් නෑ. මම ගොළුයි. ඇගේ දෙනෙතේ කඳුලක් නැගුනේ දුක නිසාම නොවේ. තේ කෝප්පය බී නිම වන විට බණ්ඩියා රංජිත් වෙත ආවේය.

"බණ්ඩියා මේක හොඳට හෝදල අව්වෙ තියපං"

"හොඳමයි සර්" ඔහු වගකීම තමා වෙත පවරා ගත්තේ සතුටිනි.

දිවා ආහාරය පිළියෙල වනතෙක් හිනමටවත් නොඩිඩි එළියට ආවේ නැත. ආහාර පිළියෙල කරන අතර ඇය ලොකු ඉස්කෝලෙ හාමිනේට නෑම සඳහා වතුර රත් කළාය. තම ගත උදුරා ගත් සොඳුරු මොහොත සිහි නොවන අවස්ථාවක් නැත. සිත සැහෙන්ට අවුල්ව ඇත. ලොකු ඉස්කෝලෙ හාමිනේට නාන්ට සූදානම් කළ උණුකළ වතුර බාල්දිය නිවස තුළට ගෙන ගියේ ප්‍රකෘති ලෝකයක නොසිටි හෙයිනි.

"ඇයි නාන බාල්දිය ගෙට ගෙනිච්චෙ? උඹට පිස්සුද?" ඉස්කෝලෙ හාමිනේ විමසුවාය.

පොඩ්ඩි පහත් කරගත් හිසින් යුතුව සිටියාය. දිවා ආහාරයෙන් පසු රංජිත් මඳ වේලාවක් ඇඳට වී සිටියේය. නින්දක් නම් පෙනෙන තෙක් මානයක නැත. එක් අතකට තමා මේ මුහුණ දුන්නේ ජීවිතයේ කිසිදාක අපේක්ෂා නොකළ සංසිද්ධියකටය. මේ ලද්දේ කිසියම් අයුරකින් පිරිමියෙකුට නොලැබෙන අවස්ථාවකි. භාවතිගය අමුතුම චමත්කාරයක් මේ උණුසුම තුළ තිබුණේ ඇය සිය කැමැත්තෙන්ම සිය ජීවිතය බාර දුන් බැවිනි. ඒ උණුසුම් රාත්‍රියේදී බෙදාගත් සතුට තවම පහව නැත. කොයි මොහොතේ ලංකාවෙන් යාමට සිදුවේදැයි කිව නොහැක.

"රංජිත් ළමයෝ..." අම්මා ගේ හඬින් තිගැස්සී නැගිට්ටේය.

"ඇයි අම්මෙ...?" ඔහු එළියට එමින් කීවේය.

"මෙන්න මේ බණ්ඩියා කතා කරනවා. මම හිතන්නෙ ගාතක් කඩා ගන්ට වෙන්නැති. වැඩිය දෙනන එපා. ඕක බෙබද්දා"

"කීයක්වත් නොදී බැනෙ අම්මෙ"

"පොඩ්ඩිත් තේබාල වගේ. අසනීපයක්ද දන්නෙ නෑ. මේ වෙලාවෙ මේකි පැත්ත වැටුනොත් ඔක්කොම ඉවරයි."

"එහෙම නම් පොඩ්ඩිට බේත් ගේන්න කියල බණ්ඩිට කියමු" ඔහු එළියට ආවේය.



"සර් මම කවදාවත් ගිහින් නෑ. මාව බයිසිකලේ රවුමක් එක්ක යනවද ?"

"හරි. ඒක පොඩි වැඩක්. දැන් බණ්ඩියා වැඩට යන්නෙ කවද්ද?"

"මම හෙට උදේන්ම යන්නම්"

තැන්දම්මාට තිබුනේ ලොකු කත් දෙකකි. ඇය බලා ඉන්නේ තමා වැඩි පුර ගාතක් බණ්ඩියාට දෙතැයි කියාය.

"දැන් බණ්ඩියාට හෙට වැඩට යන්න අතට ගාතකුත් ඕනැනෙ. මෙන්න මේක තියා ගන්නවා" ඔහු හිස පහත්කර මුදල අතට ගත්තේය.

"ඉස්කෝලෙ හාමිනේ කිව්වා පොඩ්ඩිට සනීප නෑ වගේ කියලා. ඒකිට බේත් බෝතලයක් අරන් දීලා යනවා. මෙන් සල්ලි."

"පිස්සුද සර්. ඕකිට බේත් ඕනැ නෑ. කොත්ත මල්ලි වඩියක් ගැහුවම හරි යයි."

ඔහු දත්වල බුලත් කහට අතේ වූ කෝටුවකින් සූරා ගනිමින් කීවේය.

"අද මට උදව් කළානෙ. ඊයෙ රෑ ගෙනාපු බෝතලේ අරන් යනවා. හැබැයි දන්ම බෑ. ටිකක් රෑ වෙලා ඇවිදින් ගෙනියනවා. මම මෙතන මල් පෝච්චිය ඇතුලෙ තියන්නම්."

බණ්ඩියා ගේ මූහුණේ පැතිර ගියේ මහා පුදුමාකාර කැදර සිනාවකි. සියළු අමනාපකම් පහවී කුඩා දරුවෙක් මෙන් කට අයා සිනාසුනේය.

මේ කටයුත්ත කළ යුත්තේ පොඩ්ඩිට රහසිනි. හිරු බැස යන්ට ඔන්න මෙන්න කියා තිබියදී අම්මා නිවස ඉදිරි පස පහන් පැළ අසල සිට බුදුන් වඳිනු පෙනේ. පොඩ්ඩි අසනීප වීම හා ඉකුත් දින රැයේ සිදුවීම අතර සම්බන්ධයක් ඇද්ද? මව පහන් දල්වන අතර ඔහු පොඩ්ඩි සිටි තැනට ගියේය.

"ඇයි සනීප නැද්ද?"

ඇය හිස වැනුවාය. ඇයට ඔහුගේ රළු අතේ පහස දැනුණි. විදුලියක් මෙන් එම උණුසුම සමස්ත දේහය පුරාම පැතිර ගියේය.

"ඉස්කෝලෙ හාමිනේ ඉන්නවා"

ඇය හස්ත මුද්‍රාවෙන් කීවාය. ඔහු නිහඬව ඇගේ හිසට ළයට අත තබා බැලුවේය. එම ප්‍රිය ඇසුර ඇය ප්‍රිය කරයි.

"අද නිදන්නෙ මෙහෙද ගෙදරද?"

"බණ්ඩියා ඉන්න නිසා ගෙදර ඉන්නවා." ඈ මද සිනාවෙන් යුතුව කීවාය.

"මම අද රෑ පොඩ්ඩිගෙ ගෙදර එනවා"

රංජී ඇය ළයට තද කරගෙන කීවේය.

"එපා... එපා... මිනිහ ඉන්නවා" ඇය ඔහුගෙන් මිදුනේ



ඉස්කෝලෙ හාමිනේ මල් පැළට තෙවරක් වැද ආපසු හැරෙනු දුටු හෙයිනි. කඩිනමින් සාලයට දුවගිය ඈ මැද සාලයේ වූ ලාම්පුව දල්වූවාය. ඉන් නිකුත්වුණු ශාන්ත එළිය ඉස්කෝල වලව්වේ සාලය පුරා පැතිර ගියේය. ඉස්කෝලෙ හාමිනේ ගේ කාමරයේ දල්වෙන්නේ සාමාන්‍ය එළියක් නිකුත්වන චිමිනි ලාම්පුවකි. පොඩ්ඩි රංජිත්ගේ කාමරයේ පහන් දල්වා එද්දී ඔහු කොරිඩෝරයේ දී ඇගේ අතින් යළි අල්වා ගත්තේය.

"මොකද මේ වෙලා තියෙන්නෙ. ලොකු නෝනා ආවොත් මම ඉවරයි" ඇය බියෙන් ඉවතට පැන්නාය.

"බෑ මම අද මුර ගෙදර එනවා"

"එන්න එපා" ඇය ගොළු බසින් කීවාය.

"මම එහෙනම් හෙට කොළඹ යන්ට යනවා"

ඔවුනතර කෙටි නිහඬ බවක් ඇතිවුණි.

"යන්ට එපා" ඇය ඔහුගේ ළයෙහි හිස හොවා කීවාය.

ඔහු ඇගේ හිසට ලැමට අත තබා රෝග විනිශ්චයේ යෙදුනේය.

"අපි දෙන්නා හෙට බේත් ගේන්න නුවර යමු."

"අපි දෙන්නා... බෑ බෑ.. මැණිකෙ දකීවි."

ඔහුට එකවරම අම්මාගේ හඬ ඇසුණි.

"කෙල්ලෙ මහත්තයාට කෑම බෙදා දීලා. උඹත් කෑම අරන් පලයං. දැන් රෑ වුනා."

ඇය සිනා මුහුණින් යුතුව සිටියාය.

"තව රෑ වුනොත් අර පෝරිසාදය එදා වගේ උඹට ගහයි. ඕකා කිසි කමකට නැති එකෙක්."

"අම්මා මේ වෙලාවෙ කෙල්ල අසනීප වුනොත් කරදරයි. හෙට නුවර ගිහින් බෙහෙත් ගේන්න කියන්න."

රංජිත් නිවසින් පිටත බසිමින් කීවේය. මල් පෝච්චියේ සඟවා තිබූ මත් පැන් බෝතලය එහි නැත. ඔහුගේ සිතේ සියුම් සතුටක් ඇතිවෙයි. අත පත් සතුට විඳීමට නිහිරීහි සෙවිය නොහැකිය. හදිසියෙන් හෙට රට යන්ට සිදුවුනොත්. ඇය මේසයට කෑම යවා හිස ඔසවා රංජිත් දෙස බැලුවාය. මැටි කෝප්පයට බත් දමා බෙලෙක් පිඟානින් වසාගත් ඈ හුලු අත්ත දල්වා ගත්තාය. ඔහුගේ නෙත යොමුව තිබුනේ අඳුර අතරින් බැද්දට වදින පොඩ්ඩි ගේ රුව වෙතය. ඔහු කාමරයට ගොස් ඇඳේ වැතිරුණේය. රාත්‍රි දහයේ කණිසම වදින තෙක් ඔහු පිබිදී සිටියේ තීරණයක් ගත නොහැකිවය. රාත්‍රි නිදි පෙති ගන්නා නැන්දම්මා උදය වනතෙක් පිබිදෙන්නේ නැත. පැහැදිලිවම දමිතා ගෙන් නොලද සතුටක් පොඩ්ඩි ගෙන් ලද බව කිව යුතුය. ඇය ඇසුරෙන් ලද කම්පනය කිසිසේත් අමතක කළ නොහැක. ආශ්වාදයක් ලද බව සැබෑවකි. ඇයට සැමියා සිටියදී එවන් ගමනක් ඒමට තරම් මානසික තත්ත්වයක් ගොඩ නගා ගත නොහැකිද? ඔහු ඇඳෙන් නැගිට දොර විවෘත කර එළියට ආවේය. සඳ එළිය ඉකුත් දිනට වඩා පැහැදිලිය.



ඔබ්බෙන් පිහිටි අඳුරු තිල්වත් වන පෙත අඳුරින් වැසී ඇත. බටහිර දිසාවෙන් හමන සුළඟ පොඩ්ඩි සිටින අඳුරු ගෙදර දෙසට හමායයි. පාවහන් පැළඳ ආවා නම් පොඩ්ඩි සිටින නිවස දක්වා පයින් ගොස් තොරතුරු විමසිය හැකිව තිබුණි. තමා විසින් දෙන ලද මත්පැන් බෝතලය පානය කළ බණ්ඩියා කිසිම සිහි කල්පනාවක් නැතිව නිදනු ඇත. උගේ ගැහැණිය සමග රමණයේ යෙදීම සඳහා මෙවැනි පහත් උපක්‍රමයක යෙදීම ගැන වරෙක රංජිත් ගේ සිතේ ලජ්ජාවක් ඇතිවෙයි. බණ්ඩියාගේ සිතේ තමා පිළිබඳ සැක සිතක් නැතැයි කීමටද නො පුළුවන. මත් පැන් පානය නොකර තමා එනතෙක් සැඟවී සිට පහර දුන හොත්. එය බිරිඳගේ දරුවන්ගේ හා නෑයන් ගේ ගෞරවයට කැළලකි. ඔහු සෙමින් සෙමින් සිය අරණ වෙත පියවර මැන්නේය.

යොවුන් තරුණියකගේ ගත සිත දෙකම කිසිම කොන්දේසියක් නැතිව බාර දුන්නේ මෙහිදිය. පරිසරයේ පවතින්නේ නිහඬ බවකි. හදිසියේම සිය අරණ දෙසින් ගැහැණියෙක් ඉකි බිඳින හඬ ඇසුණි. ඔහුට එහි සිටින්නේ කව්දැයි විමසීමට අවශ්‍ය වුනේ නැත. දෙදණ මත හිස හොවා සිටින රුව දුටු සිත විසිර ගියේය. අඳුරේ දණ ගා පැමිණි පොඩ්ඩි රංජිත්ගේ ළැමෙහි හිස හොවා ගත්තේ අයිති නැති බලතල තමා වෙත පවරා ගනිමිනි. අද ඇය පැමිණ සිටින්නේ සැකෙන් බියෙන් තොර ආශ්වාදනීය රැයක් ගෙවීම අරමුණු කරගෙනය. ඔහු ඇගේ දෙ වටොරෙහි හිස තබා ගත්තේ දිගු ගමනක් ආරම්භ කිරීම සඳහාය. ඇය මුදු ලෙස රංජිත්ගේ හිස පිරිමැද්දාය.

# 19

රංජිත් විසින් එවන ලද ලිපිය දමිතාට ලැබුණේ ටියුෂන් පන්ති නිමවා නිවසට පැමිණි පසුවය. පාන් රාත්තල මේසය මත තබා බටර් බාගය ශීතකරණය තුළට දමූ ඈ කාමරයට වැදුනාය. ඔසරිය ගලවා ගවුමට පිවිසි ඈ ලිපිය විවෘත කළාය. රට යාම පිළිබඳව නම් රංජිත්ගේ කිසිදු කැමැත්තක් නැත.

"කෝ එවනවා කිව්ව වීසා එක. මට දැන් මේ හිරගෙදර එපා වෙලා. අම්මාට හරියට ඇස් පේන්නෙ නෑ. වචනයක් කතා කරන්න කෙනෙක් නෑ. මේක අන්ධ ගොළු පාසැලක් වගේ."

දමිතා සිනාසුනාය. ඔහුගේ ලිපියෙන් කියවෙන්නේ ගොළු කෙල්ල ගැන හිතවත් කමක් නැති කමය. ඒ පිළිබඳ ඇගේ යටි සිතේ කැමැත්තක් ඇත.



ආයෙ එනකොට මගෙ කබඩ් එකේ තියෙන ඉංග්‍රීසි පොත් ටික ගේන්න. මරදානෙ මැකලම් පාරෙ පරණ කඩවල හොඳ ඉංග්‍රීසි පොත් තියෙනවා. හැරල් රොබින්ස්ගෙ බෙට්සි, පයරේට් කියන පොත් දෙක කොහොම හරි හොයා ගෙන එන්න ඕනැ.

ඕනැවට වඩා නැහීගෙන සල්ලි පස්සෙ එලවන්න එපා. ගෑණු දරුවො දෙන්නම ගෙදර තනියම ආලා ටියුෂන් යන්න එපා. මම ඔයාට ගේ ඉස්සරහ තාප්පෙට අල්ලලා පන්තියක් හදලා දෙන්නම්. ළමයි දෙන්නත් අරන් වෙලාවක මෙහෙ එන්න."

ඇගේ සිතේ වරෙක රංජිත් කෙරෙහි දුකක්ද ඇතිවෙයි. ඔහු තමාට හා දරුවන්ට ආදරය කරන බැව් දනී. පසුදිනම මරදානට ගිය ඔහු ප්‍රියකරන කතුවරුන් ගේ පොත් කීපයක්ම මිලට ගත්තේ නිවසේ තබා ගැනීම සඳහාය. පොත් කියවීමේ රුසියෙක් වූ හෙතෙම හොඳ පොතක් ලැබුනොත් ඇඳෙන් බසින්නේ නැති බව ඇය දනී. අතිරේක පංති පොහෝ දිනයන්හි අවලංගු වූ හෙයින් ඇය ගමට යාමට සිතුවාය. රට ගිය මිතුරියකගේ සැමියෙක් ගෙනෙන ලද ප්‍රංස වයින් බෝතලයද රංජිත්ට ගෙන ගියේ ඔහු සතුටෙන් තැබීම සඳහාය. දරුවන් රථයෙන් බැස දුවන්ට වූහ.

"අම්මා.... මේ බඩුටික බාන්න කෙල්ලට කතා කරන්න"

ඇය රථයේ වූ බඩු බිම තබමින් කීවාය.

"අම්මා කෝ කෙල්ල ?"

"මට නාන්න වතුර රත්කරන්න දර ටිකක් අරන් එන්න පල්ලෙහාට ගියා."

"රංජිත් කෝ මගේ ඇඳුමලද ?"

"දැන් හිටියා ඇල දිහා ගියාද දන්නෙ නෑ. අද එයි කියල පාර බලන් ඉඳල ගියේ"

දමිතාගේ දෙනෙත් යොමුව තිබුනේ දර කෝටු රැසක් ඔසවාගෙන එන පොඩ්ඩි වෙතය. ඇය හැඳ සිටියේ නංගිනිගේ පරණ ගවුමකි. අත් නැති ගවුමට ඇගේ සිහිනිඟ පුළුලුකුල හොඳින් මතුව තිබුණි. දමිතා මේ සුන්දර ගැහැණිය දෙස බලා සිටියේ අමනාපයක් සිතේ රඳවා ගෙනය.

"අම්මා ඇයි කෙල්ලට මෙවගෙ ඇඳුම් අඳින්න දෙන්නෙ?"

"ඔවා නංගි අඳින්නෙ නැතිව අහක දාපුවනෙ"

වතුර කල්දේරම අසල දර බිම දැමූ පොඩ්ඩි හිස ඔසවා දමිතා දෙස බැලුවාය. කිසි අඩුවක් නැති සුදු දසන් මුහුණට නව ආලෝකයක් ළං කළේය.

"අර බිම තියෙන බඩු ටික ගෙනෙන්"

දමිතා හස්ත මුද්‍රාවෙන් කීවාය. පොඩ්ඩි නිවසින් බඩු ගෙනයන හැටි දමිතා බලා සිටියාය. කොහේදෝ නැති අමනාපයක් සිතේ ඇතිවන්නේ ඇය දකින විටය. කොට කලිසමින් සැරසුණු රංජිත් ලන්ද දෙස සිට පියවර මනිනු ඇය දුටුවාය. හමුදා බූට්ස් යුවලක් පැළඳ එන සැමියා දුටු ඇය ඉදිරියට ගියාය.

"කෝ ළමයි දෙන්නා ?"



"වතුරට පනින්න යන්න ඇති." ඇය සිනාමුසු මුහුණින් යුතුව කීවාය.

ඔහු කුස්සියේවූ සිමෙන්ති පඩිය අසලින් ඉඳගත්තේය.

"මගෙ පොත් ටික ගෙනාවද?"

"ඔව්. හොඳට ඉංග්‍රීසි පොත් කියවන ටීචර් කෙනෙක් හම්බ වෙලා තෝරලා දුන්නා." ඇය සිනාසුනාය.

මද වේලාවකට පසු පොඩ්ඩි අලිගැටපේර විදුරු දෙකක් සදාගෙන ආවාය.

"බලන්නකො මේකිගෙ ලස්සන. එන්න එන්න ලස්සන වෙනවා." දමිතා කීවාය.

ඔහු ඒ පිළිබඳව කිසිවක් කීවේ නැත. ඇගේ ලස්සන හරියටම දන්නේ තමා යැයි කිසිවෙකුට පැවසීමට නොහැක.

ඇඳුම් මාරුකර ගත් දමිතා සැමියා සමග කාමරයට වී මද වේලාවක් සිටියේය. ඔහු බෙහෙවින් සතුටු වූයේ කැමතිම ලේඛකයන් කීප දෙනෙකුගේ පොත් ගෙන ඒම පිළිබඳවය.

"තවත් බඩුවක් ගෙනාව. හැබැයි මේවා දෙන්නත් හොඳ නෑ." ඇය වයින් බෝතලය දෙමින් කීවාය.

"අයියෝ... මේක බීල වැඩක් නෑ... මේක ලේඩීස් ඩ්‍රිංක් එකක්. ඔයා කැමට කලින් බොන්න"

"අනේ අපි ඔය ජරාව බොන්නෙ නෑ" ඇය කීවාය.

"ලොකු දුව කෑමට කලින් නා ගන්නවද?"

"මට ඇල්වතුර හොඳ නෑ අම්මා"

"මේ 'කෙල්ල කල්දේරමක් උණු කරල තියෙන්නෙ නාගන්න"

වතුර ටිකක් නාගත හොත් මැනවයි ඇයට සිතුණි. ඇයට දිය නෑමට සහාය වුණේ පොඩ්ඩිය. දක්ක වෙලේ සිට මොනවා හෝ වෙනසක් ඇය වෙතින් දිස් වෙයි. ලිඳෙන් වතුර අදින විට අමුතු රංගනයක් දිස්වෙයි. එක් වෙනසක් ලෙස දුටුවේ කිසිලිවල අනවශ්‍ය රෝම කපා පිරිසිදුව සිටීමය. නිරුවත් දෑතින් ලස්සන කාන්තියෙන් විහිද තිබුණි. මෙතෙක් කල් සිරුර ගැන උනන්දුවක් නොදක්වූ ඇය වෙතින් හදිසි පිබිදීමක් මතුවූයේ කෙසේද? නගරයේ සිටින තමාට වත් එලෙස හැඩ වැඩ වෙන්ට වෙලාවක් නැත.

"අම්මේ... මෙකි දැන් මෝඩි වෙලා වගෙයි"

"ඉතින් ඒකිත් තරුණ එකියක්නෙ දුව"

"මෙකිට ඕවා කපන්න රේසර් අරන් දෙන්නෙ කව්ද?"

"නංගි අහක දාන ඒවා ගන්නවා ඇති"

රංජිත්ගේ හිසට මහා බියක් පිවිසුනේ බිරිඳගේ කතාව ඇසීමෙනි. මේස ලාච්චුවේ වූ කාන්තා රේසරය දුටුව හොත් මහා විනාශයක් වනු ඇත. කෙල්ල ලවා පිට අතුල්ලමින් සිටින අතර කාමරයට පිවිසි ඔහු ලාච්චුවේ තිබූ රේසරය ගෙන ජනේලයෙන් ඈතට විසි කළේය.



"අම්මා මෙකිට ඇගට හිරවෙච්ච අත් නැති ගවුම් අඳින්න දෙන්න එපා."

"ඔය අඳින්නෙ සල්ලි වලට අරන් නෙමේ. නංගි දෙන ඒවයි. වීත්තය ඇඳලා ඉන්න කොට ඔයිටත් හැඩයි."

දමිතා දිය රෙද්ද ගලවා ගවුමක් ඇඳ කොණ්ඩයේ තෙත මාත්තු කර ගත්තාය. ඉස්සර කිතුල් රැන සේ නිතඹ පසුකරන කෙස් විහිදුණ කෙස් කළඹ අද උරහිස තරමට කොට වී ඇත. දෙවෙනි දරුවා ලද පසු කොණ්ඩය ගැලවී ගියේය. දැන් හවරියක් නැතිව ගැට ගැසීමට නොහැකි තරම්ය. පොඩ්ඩි කෙරෙහි තරහක් එන්නේ නිරෝගි දිගු කෙස් කළඹ නිසාය. කෑම මේසයට යැවූ පසු කිසිවෙකුට නොදන්වා පොඩ්ඩි යන්ට ගියාය. දිවා ආහාරයෙන් පසු දමිතා සැමියා නිදන ඇඳේ වැතිරුණාය. කොළඹ සිට නිවසට පැමිණි විට ඇය හොඳට නිදා ගනී. දරුවන් දෙදෙන නිදාගත්තේ ලොකු නංගිගේ කාමරයේ වීම නිසා මේ නින්ද ලබා ගත හැකි වුණි. ඇය පිබිදී එළියට ආවේ දරුවන් ගේ හඬිනි. ඒ වන විට රංජිත් සුපුරුදු ලෙස ව්‍යායාමයන්හි යෙදෙනු ඇය දුටුවාය. ඔහුගේ නිරුවත් උඩුකය ඩාදියෙන් තෙත්ව තිබෙනු දුටුවාය.

"රංජිත්ට දැන් මොනව හරි බොන්න ඕනැවෙන වෙලාව. කෝ මේ කෙල්ල ?"

"ඒකි උයලා යන්න ගියා"

"කෑම මෙසෙ අස්කළෙත් මම. මට පෙන්වන්න බැරි මෙකිගෙ ඔය අහංකාරකමයි" දමිතා අමනාපයෙන් කීවාය.

"ඔය ඒකිගෙ හැටි. උන්න හිටි ගමන් දවසෙ දෙකේ මගෙ මූණ දිහා බලන්නෙ නැතිව ඉන්නව.' අද දවල්ට කන්නවත් ආවෙ නෑ"

වතුර ලිපේ තැබූ නොබෝ වේලාවකින් පොඩ්ඩි එනු දමිතා දුටුවාය. ඇය ආවේ බෝරිච්චි අත් දමන ලද නංගිගේ ගවුමකින් සැරසීය. ගොළු වුවත් තමා කී දේ ඇයට තේරුම් ගිය බව දමිතාට හැඟුණි. කිසිවෙක් දෙස නොබැලූ ඇය වතුර රත්කර තේ සූදානම් කර මේසය මත තබා රාත්‍රී ආහාරය සූදානම් කරන්ට වූවාය.

"උඹ කන්නෙ නැද්ද?" ඉස්කෝලෙ හාමිනේ ඇසුවාය.

"වඳින්ට යන්න එපා අම්මෙ. ඕනෑ නම් කන්නෙ නැතෑ. මේකි අහංකාරකම් පෙන්වන්නෙ මටයි."

"මේ අහිසංක එකී එක්ක පැටලෙන්න යන්න එපා. ඒකි රණ්ඩුවෙලා යන්න ගියොත් මට කරදරයි."

"ඒකයි මම සද්ද නොකර ඉන්නෙ. නැතිනම් මම ගහල පන්නනවා"

හාල් ලිපේ තබා පොල් ගාන ගමන් ඇය මිදුල දෙස බැලුවාය. දවල් දුටුවාට පසු තවම දුක්කේ නැත. කෑම පිළියෙල කළ මේසයට යවා පොඩ්ඩි කුස්සියට වී සිටියාය.

"රංජී ඔයාට මතකද චිත්‍රා, චිත්‍රා පද්මෙිරිය."

"අර කොට්ය ගෙ වයිෆ් නේද?"





"පව් අනේ, ඔයා මිනිස්සුන්ට හිනාවෙනවා. කියන්න හැලුවෙ මේකයි චිත්‍රා ට්වින්ස්ලට 'මාලේ' ගියා.

"මෝල්ඩිවුස් වල හොඳට ගෙවනවා"

"එයාට වඩා ලේසියෙන් මට යන්න පුළුවන්. මට එන්න කියල පොරේ."

"ඔයාට පිස්සුද මේ ගෑණු ළමයි දෙන්නෙක් දාලා"

"යන්ට නෙමේ. යන්ට පුළුවන් කියලයි මම කිව්වෙ"

"ළමයින් නිදන්ට කලින් කන්ට දෙමු."

"අපි පාන්දරින්ම යන්න ඕනෑ. මට හෙන්දෑවෙ සිබල් ඇවනිව එකේ පන්තියක් තියෙනවා."

රාත්‍රී අහර ගනිද්දිත් සාකච්ඡා කළේ රට යෑම පිළිබඳවය. ඔහු මේසයේ අසුන් ගෙන සිටියත් කෑම කෑවේ නැත. පොඩ්ඩි මේසයට අඩු පාඩු ගෙනැවිත් තබා යන්ට ගියාය.

"ඔයත් කාල එන්න කො" ඇය ළිඳ ළඟට ගොස් දත් මැද මුහුණ සෝදා ගනිමින් කීවාය.

"රෑ වෙලා කාල පුරුදු වෙලා තවම බඩගිනි නෑ"

තුවාය කරලා ගත් දමිතා නිවසට පිවිස නිදන ගේමකට පිවිසුනාය. මුහුණේ හා කිසිලිවල පියර අතුල්ලා සූදානම්වූ ඇ නිබන්ධනය සඳහා අවශ්‍ය සටහන් බලන්ට වූවාය.

රංජිත් තුවාය රැගෙන කාමරයෙන් පිටතට ආවේය. දමිතා පැමිණි මොහොතේ සිට පොඩ්ඩි වෙනස්ය. තවදත්

පොඩ්ඩි අහංකාරය. දවල්ට නොකෑවේ ඇයි? විදුලි පන්දම දල්වා ගත් ළිඳ ළඟට ගොස් ඇඟ සෝදාගත් ඔහු නිවසට ගියේය. ඔහු කුස්සි කාමරයේ සිටින පොඩ්ඩි දෙස බැලුවේය. ඇය තේරුමක් නැතිව හඬනු පෙනේ. රාත්‍රී අහර ගනිද්දී ඇය මේසය අසලට ආවේ නැත. වෙනදා හොඳට කෑම කෑවත් අද එවන් ප්‍රිය මනාප බවක් නැත. බෙදාගත් බත් ටික වත් කෑමට නොපුළුවන් වුණි. අත සෝදාගත් ඔහු කාමරයට ගියේය. සටහන් පොත ලය මත තිබියදීම දමිතා දිගු නින්දකට වැටී සිටියාය. ඇය සැහැල්ලු නිදන ගවුමකින් සැරසී කල්තියාම තමාට ආරාධනා කලේ කුමකට දැයි ඔහු දනී. උඩු බැලි අතට වැතිර සිටීම නිසා ගවුම මදක් එසවී තිබුණි. දෙපාවල ඉස්සර පැතිරුණු දිස්නය දැන් නැත. ඔහු සෙමින් කුස්සිය දෙසට ගියේය. තම්බා කෑම කෑ පිඟානේ ඉතිරිවූ ඉඳුල් කන ගොළු කෙල්ල දුටු ඔහුගේ සිතේ ඇතිවූයේ දැඩි වේදනාවකි. පොඩ්ඩි දොරවල් වැසූ පසු ඔහු දමිතා අසලින් වැතිරුණි. ඒ වනවිට ඇය පිබිදිය නොහැකි තරම් දිගු නින්දක පහස ලැබ සිටියාය.

දමිතා පාන්දරින් නැගිට කොළඹ යාමට සූදානම් වූවාය. පොඩ්ඩි නිවසින් ගොස් සිටි නිසා පාන්දර තේ සූදානම් කිරීමට සිදුවූයේ දමිතාටය. දමිතාගේ විරෝධතාවය නොසලකමින් ඔහු බස් නැවතුමට ගියේය.

"පුළුවන්තරම් ඉක්මන් කරන්න. මට මේ විදිහට ඉන්න බෑ."

"හරි හරි. මම අද ටියුෂන් එකට සිබෙල් ඇවනිව් එකට යනවා. ඒ ගමන් මිරිහානට ගිහින් බලන්නම්."

බසය එනු දුටු ඇය ඔහුගේ ගෙල බදා මුහුණ සිප ගත්තාය.



බසය නොපෙනී යනතෙක් බලා සිටි ඔහු ආපසු හැරී නිවස දෙසට ගමන් කළේය. තවම එළිවී නැත. ඔහු නිවසට නොගොස් පොඩ්ඩි නිදන නිවස දෙසට ගමන් කළේය. විදුලි පහන දල්වන්නේ නැතිව ඉදිරියට යද්දී මුරගේ දෙසින් දල්වෙන ලාම්පුවේ ආලෝකය පෙනුණි. ඉස්තෝප්පුවේ ලී බංකුව මත සිටි රුවක් නැගී සිටින ඡායාව ඔහු දුටුවේය. බණ්ඩියාද? ඔහු විදුලි පහන් දල්වූයේය.

ඇය එකවරම රංජිත් දැක නැගිට්ටේ නැත. මැය ඉකුත් රැයේ නොනිදා මෙසේ සිටින්ට ඇත. ඔහු නිහඬව ගොස් ඇය අසල ඉඳගත්තේය. මුළු ගතම සිසිල්ව තිබුණි. ඔහු මෘදු ලෙස ඇගේ හිස ළයට හේත්තු කරගත්තේය. ඇය හඬමින් ඔහු ගේ උණුසුමට මැදිවුණි. ඇය එළිවන තෙක් මෙතනට වී නිදිවරව සිටින්ට ඇත. ඇය දෑතට ඔසවා ගත් රංජිත් ඇගේ මුහුණ සිප ගත්තේය. කබල් ඇඳේ වැතිරුණු පසු ළයේ හිස හොවා උණුසුම ලැබුවාය. ටික වේලාවක් යද්දී ඇගේ සිහින් අමනාපකම් පහව ගොස් තිබුණි.

ඇඳෙන් බැස ගිය ඈ කෝපි කෝප්පයක් සදාගෙන ආවාය. ඇය පානය කළේ ඔහු ඉතිරිකළ කෝපි ටිකය. ඉකුත් දින රැයෙහි අහිමි වූ උණුසුමට පිවිසීමට තද ඕනෑ කමක් ඇගේ සිතේ තිබුණි.

ආපසු එනතෙක් වුවද නැන්දම්මා නිදා සිටිනු දැකීම රංජිත්ගේ සිතේ ඇතිවූයේ සතුටකි.

# 20

කැලෑව එළිවී තිබෙනවිට ඉස්කෝලෙ හාමිනේගේ සිතේද සතුටක් ඇතිවෙයි. සැමියා ජීවත්ව සිටියදී වත්තේ හැම බිම් අඟලකින්ම ඵල ප්‍රයෝජන ගත්තේය. තමුන්ගේ දුවට වඩා ඉස්කෝලෙ හාමිනේ බෑණාට කැමතිය. දමිතා නංගිලා දෙදෙනාට උදව් පදව් කරන්නේ සීමාවකටය. කොළඹ සිට පැමිණි අවස්ථාවල අක්කාගේ කුම්මැහි කම් දෙදෙනාම පවසති. රංජිත්ට දෙදෙනාම එක වගේම ආදරවන්තය. නෑනලා ජේත්තුවට ගෙන යාමට ඔහු කැමතිය. විශ්වාසයෙන් යුතුව ඔහු හා ඕනෑම ගමනක් යැවීමටද පුළුවන. පැමිණි යුගය තුළ හෙහෙම වත්ත දෙවනත් කළේය.

දැන් ඇත පුළුල් මිටියාවත පෙනෙනවා විය හැක. වත්තට ගිය කාලයක් මතක නැත. කොට්ටන්, කොස්, කොහොඹ,



නෑදුන් වැනි ගස් තිබූ බව මතකය. ඒ තුරු හිස් මත නැඳු කුරුළු කූඩු තිබූ හැටි තවමත් මතකය. ඉස්සර සෑම සඳුරකම යායට මල් පිපී තිබුණු හැටි. පැණි උරන්ට මී මැස්සන් ඉගිල ආ හැටි. "පරාග" පෝෂණය වූ මල් වලින් වන පෙතම එකළු වූ හැටි ඉස්කෝලෙ හාමිනේට මතකය. සැවොම නිවස හැර ගිය පසු තමා පොඩ්ඩී සමග නිවසේ තනිවූ හැටි මතකය.

අම්මා ගේ මරණයෙන් පසු ගොලු කෙල්ල නිවසට කැඳවාගෙන ඒම ගැන ඉස්කෝලෙ හාමිනේ ගේ සිතේ කැමැත්තක් නොතිබුණි. සැමියා හා ගොළු කෙල්ලගේ මව අතර තිබූ බැඳීම ඇය ඉවසුවේ දැඩි වේදනාවෙන් යුතුවය. පොඩ්ඩීට තිබුනේ ඇගේ මවට හුරු රූ සපුවකි. කොතරම් නැති බැරිකම් තිබුනත් ඇයට හිමිව තිබුනේ සැමියාගේ ආඩම්බර ගති පැවතුම්ය. නිවසේ වැඩ පළ කළත් ආඩම්බරකම් අහංකාරකම් මිය ගිය සිය සැමියා මෙනි. සැමියා ජීවත්ව සිටියා නම් සමහර විට ඇගේ ජීවිත කතාව මීට වඩා වෙනස් වන්ට ඉඩ තිබුණ බව ඉස්කෝලෙ හාමිනේ දනී. කෙල්ල කෙරෙහි තිබූ අමනාපකම් දැන් නැත. මෙවැනි විවාහයක් කරගත්තෙත්, තනිව ජීවත් වන්නේත් ඇගේ අභිමානය නිසා විය හැක. ඇය තරමක් හෝ මෙල්ල වී සිටින්නේ තමාට පමණි. කෑම පිස මේසයට යවනවා හැර රංජිත් ළමයාට පවා වැඩි සැලකිල්ලක් නොදක්වන බව පෙනේ. එය සතුටට කරුණකි.

සැප්තැම්බරයේ අහස වැහි වළාවන්ගෙන් පුතුය. මේ තෙත ගතිය ගස්වැල් වලටද බලපා ඇත. වැහි පින්න ඉස්කෝලෙ හාමිනේට අගුණ නිසා සොල්දර සිවිලිම ඇති ප්‍රදේශයෙන් ඇතට යන්නේ නැත.

පොඩ්ඩි කෑම මේසයට ඇර වැහි පොද වැටෙද්දීම නිවසින් පිටතට බැස්සාය. අඳුරෙන් පිරී තිබූ හදවතට සතුට පිවිසුනේ තමා නොදන්නා වෙලාවකය. බණ්ඩියා මුර වැඩට ගොස් ඇත. සිත හා ගත කළ එළි දුටුවේ මේ ආගන්තුකයා නිසාය. මඩුවට යද්දී ඉස්තෝප්පුවේ සිටිනා රුව දුටු ඈ තිගැස්සී සිටියාය. ඔහු නොදුටුවාක් මෙන් කාමරයට පිවිසි පොඩ්ඩි බිත්තියට පිටදී මොහොතක් නිහඬව සිටියාය. අක්කර පහළොවක් විස්සක් පමණ විශාලවූ මේ බිමට ඉඳ හිට එන්නේ කැලෑ මීමින්නෙක්, කුකුල්ලු කෑමට එන හෝතඹුවෙක් වැනි සතෙක් පමණි. නිරන්තර හමන සුළඟ කිසියම් හඬක් නැගුවත් ඉන් කාටත් හිරිහැරයක් නැත. ඉකුත් දිනක ඔහු ප්‍රවිෂ්ඨ වූයේ සිතට පමණක් නොවේ. එළියට ගොස් දෑතින් අල්වා ගෙට කැඳවා ගෙන ආවොත් තම අභිමානයට බාධාවක් වනු ඇත. විවෘත වූ දොර වැසෙන හඬ ඇසුණි. ඊළඟ නිමේෂයේදී තමා අසලට එන හඬ ඇසුණි.

එම කය අභිෂේක ලැබ තිබුණේ පිරිමි කමිනි. නිකටින් ඔසවා මුහුණ දෙස බලද්දී දෑස් පියවුණේ නොදැනුවත්වමය. ඉන් පසු රළු දොතොල් පොති අතර අතරමං වනවිට බලාපොරොත්තුවේ උණුසුමින් ලේ නහර නෙත්වනු දැනුණි. ඇය එදා මෙන් ගෙල බදා ගත්තාය. ඔහු වඩාත් උණුසුම් ලෙස ළැමෙහි මුව තබනවා ඇයට දැනුණි. කිසිම ඇඳුමක් නැතිවුනත් හමන සුළඟින් ගතට සිසිලක් දැනුණේ නැත.

ඔහු පොඩ්ඩිගේ රෝස පැහැති කය දැඩිව අල්වා ගත්තේය. සඳ පහනින් එළිය වැටුණු රාත්‍රියට වඩා දිවා කළ මේ සිහින් සුකුමාල දේහය දකිමට ඔහු ආශා කළේය. පොඩ්ඩි නිරුවතින් ලැලි ඇඳේ දණගසා හොඳින් විවෘතව ඇති



ජනේලය වැසීමට සූදානම් වෙමින් සිටියාය. දණ ගසා ඉදිරියට නැමෙද්දී රෝස පැහැති නිතඹ හා බිමට යොමු වූ පුන් පියවුරු දිස්වුණි. ඇය සිටින ඉරියව්වෙන් ප්‍රකට වූ ලිංගික ආකර්ෂණය රංජිත් කෙරෙහි සෘජු ලෙස බලපෑවේය.

නිදහස් උරපත්තේ සිට රෝස පැහැති පසුපසට විවෘතව වූ නිතඹ දක්වා වූ කොඳුඇට පේළිය අවසානය තෙක් දිවෙන සිහින් දාරය සුවිශේෂ සුන්දර බවක් හෙළි කළේය. ඇය තවදුරටත් එම ආකර්ශණීය ඉරියව්ව තුළ රැඳී සිටිනු දැක්ම ඔහු ප්‍රිය කළේය. ජනෙල් පොලු අතරින් කාමරයට කාන්දුවූ ආලෝකය තුළින් ඔහු ඇගේ දේහය විවෘතව දුටුවේය. ස්වභාවය කොතරම් කුරිරුද? ඇය ගොළු ගැහැණියක් නූනා නම් මේ ගතකරන අවස්ථාවේ සතුට මීට වඩා හැඟුම් බරව බෙදාගත හැකිව තිබුණි. සෙමින් ඇරඹුණු වැස්ස කෙමෙන් වර්ධනය වනු පෙනේ. සමස්ත දේහයම විවෘතව තිබුනේ ඔහු වෙනුවෙනි. ඇඳේ මුණින් තලාවී වැතිර සිටින විට ඇය කොපු ගලවන ලද ඉරිඟු කරලක පැහැයෙන් යුත් ආකර්ශණීය සිවමැලි දේහය දිස්වෙයි. ඇය නිහඬව ඔහුගේ ළයෙහි හිස හොවා ගත්තාය. වැස්ස මඳක් තුරල් වූ පසු ඇය රංජිත් ගේ මුහුණ තමා දෙසට හරවා ගත්තාය.

"ලොකු හාමිනේ හොයයි. දැන් යන්න." ඈ ගොළු බසින් කීවාය.

"මට බෑ." ඔහු ගොළු බසින් කීවේය.

ඇය දමා යාමට නොහැකි තරම බැඳීමක් දිනෙන් දින වර්ධනය වන බවක් පෙනේ. තමාට වඩා දෙගුණයකට වඩා වයසින් බාල තරුණියක් තමාට ඇල්ම දක්වීම පුදුමය.

"රැට එනවද?"

"මහු බෑ." ඇය සිනාසෙමින් හිස වැනුවාය.

ඔහු අමනාප වූ බව තේරුම් ගිය පසු ඇගේ සිතට පිවිසුණේ දැඩි ආදරයකි. තමා වැනි ගොළු ගැහැණියකට ආදරය කරන්නේ හුදු රාගය නිසාද? රාගය පරදවා හිස ඔසවන වෙනත් මනෝභාවයක් ඔහුගේ සිතේ ඇතැයි ඇයට සිතේ.

"නෑ. නෑ. එනවා. එනවා" ඇය ඔහුගේ ගෙල බදා ගොළු බසින් පැවසුවාය.

රංජිත් නිවසට පිවිස නොබෝ වේලාවක් ඔහුට නැන්දම්මාගේ හඬ ඇසුණි.

"රංජිත් ළමයො"

"ඇයි අම්මෙ ?" ඔහු නිගැස්සුණි.

"මේ ළමයා කෑවද? කෙල්ල කෑම බෙදලා ගියාද කොහෙද?"

"කෑවා අම්මෙ. ඇයි කතා කළේ ?"

"අද මගෙ ක්ලිනික් කාඩ් එක බලන කොටයි මතක් වුනේ. හෙට විසි හත බව. හෙට නොවරදවාම යන්ට ඕනෑ.



හෙට ඇහැ ඔපරේෂන් කරාවි"

"ඉතින් මොකද කරන්නෙ?" ඔහු මොහොතක් කල්පනා කළේය.

"ඉතින් අපි යමු" ඔහු යෝජනා කළේය.

"හම්මෝ.... ලොකු දුවට ආරංචි වුණොත් විසුමක් වෙන්නෙ නෑ. වෙන දවසක යමු"

"ඇස් දෙක එක්ක සෙල්ලම් කරන්ට එපා. මම මගේ ආරක්ෂාව බලා ගන්නම්, මේ මූණ පුරා රැවුල වැඩිලා තියෙන නිසා කාටවත් මාව අඳුනන්ට බෑ"

ඇගේ මුහුණේ ස්තුති පූර්වක සිනාවක් සටහන් වුණි. බෑණා දක්ෂයෙක් බව ඇය දනී.

"එතකොට පොඩ්ඩිට මොකද කරන්නෙ. මට මෙකිව දාල යන්ට බයයි."

ගොළු කෙල්ල කැඳවාගෙන යාමට සිතුනත් එසේ ගෙන යාමට ක්‍රමයක් නැත.

"එක්කගෙන ගියොත් අම්මාට නම් හොඳයි. ඒත් එක්ක යන්න ක්‍රමයක් නෑ, ගේ බලාගෙන ඉන්න කියමු. අපි හැන්දෑවෙ එන එකනෙ. සමහරවිට බණ්ඩියත් එයි."

"එහෙම නම් අද නිදිපෙති බොන්නෙ නෑ. පුතා ගිහින් නිදාගන්ට"

රංජිත් සිය කාමරයට වැදුනේය. පොඩ්ඩි වෙනුවෙන් ඔහු ගේ සිතේ සියුම් රහසිගත සැලසුමක් තිබුණි. නැන්දම්මා එළිවනතෙක් පිබිදී සිටින නිසා එය ක්‍රියාත්මක කිරීමට ලැබුණේ නැත. පොඩ්ඩි කුස්සියේ නිදන බව දන්නා නිසා බිඳුණු සිතින් යුතුව තනිව නිදාගත්තේය. පසුදින පිබිදුනේ නැන්දම්මාගේ හඬිනි.

ඒ වනවිට පොඩ්ඩි පිබිදී තේ පිළියෙල කරමින් සිටියාය. මුහුණ සෝදාගත් ඔහු තේ පානය කර යතුරු පැදියේ අසුන් ගත්තේය. නැන්දම්මා ජීවිතයේ ප්‍රථම වරට යතුරු පැදියේ ගියේ එදාය. නුවරින් බසයට මාරුවූ පසු ඔහු දිගු කල්පනාවකට මැදිවුණි. සිත තමාටම මෙල්ල වන බවක් නොපෙනේ. සිත අනුරාගයෙන් පිරී ඇත. නැන්දම්මා අක්ෂි සායනයට පිවිසි පසු ඔහු පිටතට වී සිටියේය. මුහුණ පුරා රැවුල වැවී ඇති නිසා පෙනුම සපුරා වෙනස්ව ඇත. වෛද්‍යවරයා පැමිණීමට සෑහෙන වේලාවක් ප්‍රමාද වුණි. හමුදා හැඳුනුම් පත නිසා නැන්දම්මාට ප්‍රමුඛත්වයක් ලැබුණි. නැන්දම්මා එළියට ආවේ කඩවුණු සිතින් යුතුවය.

"යමු ඒ වැඩේ වෙන එකක් නෑ"

"ඇයි අම්මා. මොකද්ද ප්‍රශ්නය ?"

"අද කාචය දමා ගන්න පුළුවන් කිව්වා"

"ඉතින් හොඳනේ අම්මා. ඕකනේ අම්මා මෙච්චර කල් බලන් හිටියෙ."

"ඉතින් ඕවට සල්ලි කොහෙද? මම ඒ වගෙ දේකට ලෑස්තිවෙලා ආවෙ නෑ."



රංජිත් මද වේලාවක් නිහඬව සිට වෛද්‍යවරයා හමුවීමට ගියේය. වෛද්‍යවරයා හමුවී අදාල විස්තරය කතා කරගත් ඔහු එළියට ආවේය. මෙම ශල්‍යකර්මය කිරීමට සූදානම් වන්නේ පෞද්ගලික රෝහලකය.

"ඇයි පරක්කු වුනේ. දැන්ම ගියොත් රෑ වෙන්ට කලින් යන්ට පුළුවන් වේවි."

"අම්මා අපි මේ වැඩේ කර ගම්මු. ප්‍රයිවේට් හොස්පිටල් එකට ඇතුල්වෙලා හෙටම මේ ඔපරේෂන් එක කරගන්ට පුළුවන්. සල්ලි මා ළඟ තියෙනවා."

"අනේ දරුවෝ. ඒවා තමුන්ගෙ රට යන වැඩවලට ඕනෑ දේවල් නේද?" ඇය කඳුළු පිරි දෙ නෙතින් යුතුව කීවාය.

රංජිත් වෛද්‍යවරයා දන්වා සිටි රෝහලට නැන්දා ඇතුල් කර ශල්‍යකර්මය සඳහා මුදල් බැන්දේය.

"දැන් පුතා මොනවද කරන්නෙ. ගෙදර යනවද? ගෙදර කිව්වෙ බත්තරමුල්ලට හෙම නෙමේ. දමිතා දැනගත්තොත් මටත් දෙහි කපයි" ඇය සිනාවක් මුව රඳවා කීවාය.

"නෑ නෑ මම ගෙදර යන්නෙ නෑ"

"නුවර යන්ටත් වෙලා නෑ නේද? කෙල්ල විතරයි ගෙදර"

"පොඩ්ඩි දවසක් තනියම හිටියාවෙ. ගෙදරට කවිරුවත් එන්නෙ නෑ. මම දවල්ට අම්මා බලන්න එන්නත් ඕනෑ. මම යාළුවෙකුගෙ ගෙදර නවතින්නම්"

"ඔකී කටගැහුවට රෑට බයයි. පුළුවන්නම් ගියොත් හොඳයි." නැන්දා කීවාය.

රංජිත් බසයට පිවිසුනේ සැහෙන්ට ප්‍රමාදවය. නැන්දම්මාට මේ උපකාරය කිරීමට ලැබීම සතුටට කරුණකි. බසය නුවරට එනවිට රාත්‍රි නමය පසුවී තිබුණි. මිතුරාගේ බෝඩිමට ගොස් යතුරු පැදිය ගෙන කෑම පාර්සල් දෙකක් හා රසකැවිලි මිලයට ගත් ඔහු වලව්වට ගියේය.

පොඩ්ඩී මුළු සැදෑවරුවම ගත කළේ පාර බලාගෙනය. මීට පෙර එකාකාරී ජීවිතයක් ගත කළද අද තම ජීවිතයේ මහා පිබිදීමක් බිහිව ඇති බවක් ඇයට දැනේ. ගතවූ මාස එකහමාර පමණ වූ කාලය තුළ ගැහැණියෙක් ලෙස ලබාගත හැකිවූ හැම දෙයක්ම ලැබී ඇතැයි ඇයට සිතේ.

බොහෝ රාත්‍රිවල තමා ඔහුගේ උණුසුම ලැබූ හැටි ඇයට සිහිවෙයි. සදාකාලිකව හිමිකර ගැනීමට නොහැකි බව සැබෑවකි. එහෙත් ඒ උණුසුම දැන් නැතිව බැරි තරමය. කවදා හෝ ඔහු තමා අතැර යන බව දනී. උදේ ගිය ඔහු තවම නැත. මේ විරහව කොතරම් පීඩාවක් ගෙන දුන්නාද? එදා පුන් සඳ පායා තිබූ හැටි මතකය. එක් සඳක් ගෙවී ගොස් තවත් පුර හඳක් ලැබීමට ආසන්නය. තනිව සිටින විට ජීවිතයේ මහා පෙරළියක් වූ දිනය පොඩ්ඩීට සිහිවෙයි. ජවසම්පන්න පිරිමියෙකු ගෙන් ලද සතුට කිසිසේත් අමතක කළ නොහැක. හැම දිනකම ලබන්නේ ප්‍රහර්ෂයක් ඇති කරවන සුන්දර අත්දැකීමය. පැමිණ සිටින්නේ රට යාමට බව පොඩ්ඩීද දනී. මුල් දිනයේ ඔහු හා අනුරාගයෙන් බැඳුනත් ආදරයක් තිබුනේ නැත. ඔහු කාට අයිති වුවත් ආදරය කිරීමට තමාටද අයිතියක්



ඇති බව ඇය දැන් සිතයි. උදේ ගිය දෙදෙනා තවම නැත. විදුලි පන්දම අතැතිව වලව්වේ උස් පඩි පෙළට වී මග බලා සිටියාය.

දෙනෙත් කඳුලෙන් තෙත්වන බවක් දැනේ. කාටත් නොදුන් දෙයක් මා ඔබට කැමැත්තෙන්ම දුන්නා. හදවත විතරක් නොමේ මේ අහිංසක ජීවිතයම මා ඔබට තෑග්ගක් ලෙස දුන්නා. කාට නැති වුනත් ඔබට මා වටින බව මා දන්නවා. එක දවසකට නොමේ තත්පරයකට වත් නොදැක ඉන්න බෑ. මා දාල ගියොත් ඒ දුක දරන්නේ කොහොමද? ඇයි තවම නැත්තෙ?

මෝටර් සයිකලය එනු දුටු සිතේ බිය තුනීවී ගියේය. ඇය විදුලි පහන දල්වා ගෙන සිටියේ ඉස්කෝලෙ හාමිනේට ඒමට පහසුවීමටය.

රංජිත් පමණක් තනිව එනු දුටු සිතේ බියක් ඇතිවුණි.

"කෝ?" පොඩ්ඩී ඉස්කොලෙ හාමිනේ පිළිබඳව විමසුවාය. ඔහු ඇගේ දෑතින් අල්වා ළයට තද කර ගත්තේය. ලොකු නංගි විසින් ඉවත දමනලද විෂ්ටයක් හැඳ රෙද්දක් කරලා සිටි ඇ මොහොතකට ඔහුගේ ළයෙහි හිස තද කරගෙන සිටියාය. ඉස්කෝලෙ හාමිනේ එතැයි යන බිය නිසා පොඩ්ඩී ඔහුගෙන් මිදීමට සූදානම් වුණි.

ඇය ඔහුගේ කතාව පිළිගත්තේ පසුවය. නොදැනුවත්වම සියුම් සතුටක් ඇගේ හදවත තුළට ගලා ආවේය. මුහුණ සෝදන තෙක් පොඩ්ඩී තුවාය කරලා ඔහු අසලට වී සිටියාය. ඉස්කෝලෙ හාමිනේ වලව්වට පැමිණ විටද හැසිරෙන්නේ මෙපරිද්දෙනි. අද ඔහු තමාගේය. රාත්‍රි ආහාරයෙන් පසු ඉදිරිපස දොර ජනෙල් වසා ඇද්දැයි බලා ඇය රංජිත් නිදන කාමරයට ගියාය. ඔහු දිගු කළ දෑත්

අල්වා ගෙනම ඇය ඇඳේ පසෙක ඉඳ ගත්තාය. මේ දවස අධිපති අපටය.

පරිසරය නිහඬය. රාත්‍රිය සිසිල් බවින් යුතුය. ඇය දැන් එසෙව්වේ ඔහු කරන කටයුත්ත පහසුවීම සඳහාය. පහනේ කහපාට ආලෝකයට වඩා රශ්මියක් ඇය වෙතින් නිකුත් වෙමින් තිබුණි.

ඇතිරිල්ල බිම වැටී සිටින පරිදි නිදන දම්නාට වඩා මැය කොතරම් ලස්සනද? මූණින් තලාව සිටින පොඩ්ඩීගේ රන් පැහැති සුන්දර සිරුර ලොව ඇති සුන්දර නිර්මාණයකැයි ඔහුට සිතේ. 'ශයනෙච ස්ත්‍රී රත්නානි' ස්ත්‍රිය සයනයට රත්නයකි. මිනිහෙක් උපදින්නේ ගැහැණියෙකු ගේ හදවතේ උණුසුමෙනි.

"ලාම්පුව නිවමු" ඇය ඇඳෙන් නැගිටීමට සූදානම් වූනාය.

"එපා" ඔහු ඇගේ නිදහස් තිහඹින් අල්වා ගනිමින් කිවේය. මේ ජීවමාන සෞන්දර්යය දෑසින් දකීමට ඔහු ප්‍රිය කළේය.

"අපි දෙන්නා හෙට කොළඹ යමු"

ඔහු ගොළු බසින් යෝජනා කළේය.

"බෑ බෑ. ඉස්කෝලෙ හාමිනේ මට ගහයි"

ඇය දෑස් ලොකුකර අභිනයෙන් කීවාය. එහෙත් ඔහු දූන් තමා ගේ තිළ තොලත් තීරකයාය. ජීවිතය නැති වුනත් ඔහු කරන යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට දූන් පුළුවන් කමක් නැත. හදිසියෙන් ලැබුණු වාසනා සම්පත අපතේ හැරීමට දෙ දෙනාම අකමැතිව සිටියහ. ඇය මුහුණ දුන්නේ තවත් අත්දැකීම් බහුල රාත්‍රියකටය.



සීතල රැයේ එකම පොරෝණයක් තුළට වැද ගුලිවී. තුරුල්ව ඔව්හු නිදාගත්හ. පාන්දර ඔර්ලෝසුවේ හඬින් පිබිදුණු ඔහු තම උණුසුමට තුරුළුව නිදන හඬින් පොඩ්ඩී පිබිදවීමට සූදානම් වුණි.

"නැගිටින්න." ඔහු ඇගේ නිදහස් දෙවුර පිරිමදිමින් කීවේය. ඇය ඔහුගේ ඉණ වටා අතක් දමා තවත් නිහඬව තුරුල්වූනා විනා නැගිට්ටේ නැත. ඇය මේ ලබන්නේ ජීවිතයේ ඇයට නොලැබුණු වින්දනයන්ය. තවත් මද වේලාවක් උණුසුමේ ලැග සිටි ඈ ඇඳෙන් බැස මුහුණ සෝදා ගමනට සූදානම් වූනාය.

ඔසරි කබලකින් සරසවාගෙන ඇය අගනුවරට කැඳවා ගෙන යාමට නොපුළුවන. මෙම ප්‍රශ්නයට මුහුණ දීමට ඔහු කලින්ම සූදානම් වී ආවේය. ඇගේ වර්ණයට රුවට ගැලපෙන මේ ගවුම අන්දවා ගත්තේ අමාරුවෙනි.

"ම්... ලස්සනයි" ඔහු ඇගේ ඉග දෑතින් තදකර සිනාසෙන විට ඇය ලජ්ජාවෙන් රංජිත්ගේ ළයෙහි හිස හොවා ගත්තාය.

## 21

ජීවිතයේ කිසිදාක ඇය මෙවන් ගමනක් ගොස් නැත. ඉස්කෝලෙ හාමිනේ මසා දෙන චීත්ත ගවුමක්, හංසිනී ඉවත දමන සායක් හැට්ටයක් ඇන්දත් මෙවැනි මෝස්තරයක ඇඳුමක් අඳින්ට ලැබී නැත. හංසිනී නපුරු ගැහැණියක් නොවූවත් මෙවැනි ඉස්තරම් ගවුමක් දෙන්නේ නැත.

ඇත්තටම මේ සිදුවෙමින් පවතින්නේ අහඹු සිදුවීමක් නොවේ. මීට ඉහත කවදාවත් ඔහු තමා දෙස බලා නැත. තමාද එසේය. එහෙත් අපි බැඳුනේ කොහොමද? එම සුන්දර රාත්‍රියේ තමා සතු වටිනාම දේ කිසිම කොන්දේසියක් නැතිව බාරදුන්නේ ඒ පිරිමි කමට මෙල්ල වූ හෙයිනි. අවස්ථානුකූලව ඒ දේ වූහත් දවසින් දවස තමා ඔහුට යාවෙන බවක් ඇයට දූනේ. බොහෝ රාත්‍රිවල තමාට ඔහුගේ උණුසුම නැතිව සිටීමට බැරි





තරම ඒ ආලිංගනය ප්‍රිය කළ හැටි සිහිවෙයි. කිසිම වටිනාකමක් නැති අන් සතු ගොළු ගැහැණියක් මෙච්චර සුන්දරව තබා ගන්නේ ඇයි ? පිවිසුනේ සුඛෝපභෝගී බස් රියකටය. වරකට දෙවරකට වඩා ඇය බසයෙන් ගොස් තිබුණේ නැත. බසයේ අසුන්ගත් පසු ඔහු පොඩ්ඩී තමා දෙසට හරවා ඇගේ අඩ එළිකල උවන දෙස බැලුවේය. රෝස පැහැති ආලේපය ඇතිල්ලූ කලෙක සේ දොතොල් පැහැපත්ය.

"ලස්සනයි" ඔහු හස්ත මුද්‍රාවෙන් කීවේය. කිසිත් නොදෙඹූ ඇය හිස සලා ඔහුගේ උණුසුමට මැදිවුණි. ඇය බොහෝ වේලාවක් ඔහුගේ අතගෙන උරෙහි හිස හොවා සිටියාය. අඳුර පහවී හිරු උදාවෙමින් තිබුණි. ඔහු ඇයට පරිසරය නැරඹීම සඳහා කර්ටනය ඉවත් කළේය.

මේ අලුත් අත්දැකීමෙන් සතුටට පත්ව සිටින බව සැබෑවකි. මෙවන් හැඳුම් හැඳ ඉස්කෝලෙ හාමිනේ දැකීමට යාම තුළින් වෙනත් ප්‍රශ්න ඇතිවීමට පුළුවන. නව මාදිලියේ ගවුමක් හැඳ වත්සුණු තවරා යාන්තමින් වුවද තොල් ආලේප කර ඉස්කෝලෙ හාමිනේ ඉදිරියට ගිය හොත් ඇය මොනවා සිතයිද?

බසය අගනුවරට එනවිට දහවල් වී තිබුණි. තේ පානයෙන් පසු ඔහු ප්‍රථමයෙන්ම ගියේ පාවහන් සාප්පුවකටය. ඇය පැළඳගෙන ආවේ කබල් රබර් සෙරෙප්පු දෙකක් නිසා ඒ වෙනුවට සාරියට හා ගවුමට ගැලපෙන සෙරෙප්පු යුවලක් මිලට ගෙන දුන්නේය. ඇය මේවා ඉවසුවේ හැඬූ කඳුළෙනි. ඇය කියා පෑවේ ඇයට මෙවන් ඇඳුමක් හැඳ රෝහලට යා නොහැකි බවය. රෝහලට ගිය ඔහු පොඩ්ඩි පිටත තබා නැන්දනිය බැලීමට ගියේය.

"අම්මෙ ඔපරේෂන් එකට සල්ලි බැඳලයි තියෙන්නෙ. අද ඔපරේෂන් එකට ගන්නවද?"

"අද ගන්න තමයි හිටියෙ. උන්නු හිටි ගමන් ඇගේ ප්‍රෙෂර් එක වැඩිවුණා. ඒ හින්දා දවසක් දෙකක් ඉන්න වෙයි වගේ" ඇය කතා කළේ බිඳුණු හඬිනි.

"මට දුක මේ ළමයා රට යන්න තියාගෙන ඉන්න සල්ලි ටික මා නිසා වියදම් වෙන එක ගැනයි. දමිතා දැනගත්තොත් දොස් කියයි"

"මේවා රට යන්න තියාගත්තුවා නෙමේ, සල්ලි තියෙන්නෙ වැදගත් වැඩකට වියදම් කරන්නයි. ඔපරේෂන් කළාම කව්රුහරි ළඟ ඉන්න ඕනෑ නේද?"

"ඔපරේෂන් කරන්නෙ කවද්ද කියන එක හවසට දැනගන්න පුළුවන්. එතකොට ගිහින් කෙල්ලව එක්කගෙන එන්න."

බලාපොරොත්තු නොවූ වාසනාවක් ළඟාවනු බවක් පෙනේ.

"මේ සීනි ප්‍රමාණයයි, ප්‍රෙෂර් එකයි අඩුවෙන කල් ඔපරේෂන් කරන එකක් නෑ. කෙල්ලව දවස් දෙකකින් එක්කාගෙන ආවම ඇති. කෙල්ලට තත්වෙ කියලා එන්න නැතිනම් බලා ඉඳිව්."

වාට්ටුවෙන් පිටතට ආ සැනින් පොඩ්ඩි ලෙඩාගේ කොරතුරු විමසුවාය. මෙවන් ඇඳුමකින් සැරසී ලෙඩා ළඟ



සිටීමට නොපුළුවන. ලස්සන ඇඳුමක් ඇද ලස්සන සපත්තු දමා හැඩවී තමාට ඉස්කෝලෙ හාමිනේ ළඟට යාමට පුළුවන් කමක් නැති බව පොඩ්ඩි දනී. ගෙදර උයන, පිහන, වී කම්බන, වලං හෝදන තමා වැනි ගොළු කෙල්ලෙකුට එවන් අයිතියක් නැත.

කොහෙද කියන දේ අහන කෙනෙක් නෙවෙයිනෙ. ඔහු ඇගේ අත ගෙන රෝහලෙන් පිටතට ආවේ සතුටින් යුතුවය. තවත් දින දෙක තුනක් ඇය හා සතුටු වීමට පුළුවන. දන්නා මිතුරන් සිටියත් පිට ගැහැණියෙක් රැගෙන එවන් තැනකට යාමට නොපුළුවන. කවදා හෝ එය දමිතාට ආරන්චි වීමට පුළුවන. කපිතාන් වලගම්බාහු සමග සාදයකට සහභාගි වීමට ගිය නගරාසන්න හෝටලය සිහිවුණි. පොඩ්ඩි කරන්නේ රංජිත් ප්‍රිය කරන දේ පමණි. ත්‍රිවීලරයට පිවිසි පසු ඇය ඔහුගේ අත අල්වා ගත්තාය.

සමුද්‍රාසන්න කුඩා හෝටලයට පිවිසි පසු ඇය රංජිත්ගේ ළඟයෙහි හිස හොවා මද වේලාවක් සිටියාය. හැම මොහොතකම දකින්නේ, කැදවාගෙන යන්නේ අලුත් අත්දැකීමක් වෙතය. ජීවිතයේ කවදාවත් මෙවන් කාමරයකට පිවිස තිබුනේ නැත. වීදුරු කවුළුව තුළින් මහ සයුර පෙනෙයි. එහි කෙළවරක්, අනන්තයක් පෙනෙන්නේ නැත. ඒ දසුන කොතරම් ආශ්වාද ජනකද? මෙතෙක් දැක ඇති ලොකුම දියකඳ තිබුනේ නුවර වැවේය. එහෙත් තමා පුළුල් ලෝකයකට පිවිස ඇතැයි පොඩ්ඩිට සිතෙයි. රංජිත් නිහඬව ඇය ශක්තිමත් දෑතට ඔසවාගෙන විත් සයනයේ තැබුවේය.

"බඩගිනිද ?" ඔහු ඇගේ නිකටින් සොලවා ඇසුවේය.

"ම්හු..." ඇය අඩවන් දෙනෙත් ඔහු දෙස බලා සිටියාය.

සිසිල් බීමකින් සප්පායම් වූ ඔහු යාබද වෙළඳ සැලෙන් ඇයට අවශ්‍ය ඇඳුම් කීපයක් මිළදී ගත්තේය. ත්‍රිකුණාමලෙදි මුහුදේ නෑවාට පසු තවම මුහුදට බැස නැත. ඔහු කොට කලිසම හැඳ ඉතිරි ඩෙනිම් හා කොට කලිසම හා ටීෂර්ටය පොඩ්ඩිට දුන්නේය.

"හා... මේක ඇඳගන්න. අපි මූදට යමු."

ජීවිතයේ කවදාවත් මෙවන් ඇඳුමක් හැඳ නැත. මේවා අඳින්නේ නුවර වැව රවුමේ යන සුද්දියන්ය. එසේත් නැතිනම් ලොකු කාර්වලින් එන කෙල්ලන්ය. හරි කෙහා තමයි.

"බෑ. බෑ" ඇය සිනාමුසුව ප්‍රතික්ෂෙප කළාය. අඩුවශයෙන් හංසිනීවත් මෙවන් ඇඳුම් අඳින්නේ නැත. කව්රුහරි දැක්කොත් මට බණීවි. ඉදිරියට පැමිණි රංජිත් ඇය දෙවුරට තදකරගෙන මද වේලාවක් සිටියේය. හෝටලයෙන් පිටතට පැමිණි රංජිත් පඩිපෙල මත ඉඳ මහසයුර දෙස බලා සිටියේය. මුලදී ගොළු කෙල්ල රමණයේ යෙදීම සඳහා පොළඹවා ගත්තේ සිතේ කැකෑරුණු කාමුක හැඟීම් නිසාය. ඇය ඒ ක්‍රියාවලිය කැමතිවුනත් නැතත් තම ඕනෑකම නිසාම ඒ කටයුත්තට ඇය පොළඹවා ගත් හැටි ඔහුට සිහිවුණි. මහවැලියේ කොන්ත්‍රාත් කරන මිත්‍රයා යටතේ බණ්ඩියාට මුරකාර රස්සාවක් ලබා දුන්නේ ඔහු කෙරෙහි වූ අනුකම්පාවෙන්ද? මිතුරා ලවා බණ්ඩියා ව්‍යාපෘතියේ දෙවෙනි අදියරෙහි වූ ඈත පළාතකට යැව්වේ ඉක්මනින් ගෙදර නොඒමටය. වරදක් කර ඇති බව සැබෑය. එහෙත් ඒ හැම කර



ඇත්තේ සිතේ සතුට වෙනුවෙනි.

ඩෙනිම් කොට කලිසමින් හා ටීෂර්ටයකින් සැරසුණු ඈ රංජිත් ඉදිරියට ආවාය. ඔහු සිනා සෙනු දුටු ඈ දුවවිත් ඔහුගේ ලයේ හිස හොවා ගත්තාය. සමහරවිට ඇය ලජ්ජා වන්ට ඇත්තේ මෙතෙක් කල් වැසී තිබුණු, රංජිත්ට පමණක් ප්‍රදර්ශනය කළ සිරුර දර්ශනය වනවාටය. ඇත්තටම අද තමා කොතරම් සතුටක් ලබනවාද? තමා අත ගත්තේ අපිරිසිදු ගජ්ගඳ හමන කැලෑ වැද්දෙක් සමගය. බුලත් කහට බැඳුණු මුව අපිරිසිදු අභිකුණ්ඨිකයෙකුගේ මෙනි. අපිරිසිදු දත් මැලියම් තට්ටු පිටින් මුවෙහි තිබුණි. ළඟක සිට කතා කරනවාට පොඩ්ඩි අකමැති පිළිකුල නිසාය. මේ කොච්චර පිරිසිදු පිරිමියෙක්ද තමා මේ කෙටි කාලය තුළදී ඔහුගේ සිරුරේ සිප නොගත් තැනක් නැත. ඇය මොහොතක් ළමැද හිස හොවා සිටියාය. තම සිරුර මෙතරම් සිත් ගත් ලෙසින් නිමව ඇති බවක් ඇය දැන සිටියේ නැත. ගමේ අතු අග පිපී පරව යාමට තිබූ වටිනාකමක් නැති කුසුමකට නව අදහසක් දුන්න හැටි.

ඇය ඔහුගේ අතේ එල්ලී මුහුදු වෙරළ දෙසට ගියාය. දියඹේ යට ගලා එන දිය රැළි වලින් ඇගේ දෙපා සේදී යයි. සයුර දෙසට ඇදී යන විට කැගසන්නේ කුඩා දැරියක් මෙනි. කතා කරන්ට පුළුවන්කම තිබුණා නම් ඇගේ වටිනාකම කොපමණද? ඇය ඔහුගේ කලවා මත හිස තබා වැල්ලේ වැතිරුණාය. වැඩ කරන දවසක් නිසා මුහුදු වෙරළේ සිටියේ යුරෝපීය ජාතිකයන් කීප දෙනෙක් පමණි.

ගොළු කෙල්ල මුණ ගැසුණේ තමාට ජීවිතයේ පැහැදිළි වෙනසක් අවශ්‍යව තිබූ වේලාවකය. කොතරම් මුහුද සමීපව

තිබුණත් දමිතා හා දරුවන් කැටිව ප්‍රීතිමෙන්ට ඒමට ලැබී නැත. වැඩි වශයෙන් තම රාජකාරිය නිසා එම පහසුව නැත. ඇයට සතියේ හැමදාම ටියුෂන්ය. ඉරිදා සෙනසුරාදා නම් මරණයක් වුවත් දමිතා පන්ති අවලංගු කරන්නේ නැත. ඇගේ එකම විනෝදය වන්නේ අයිස්ක්‍රීම් ගැළමක් ගෙනැවිත් ටික ටික කෑමය. ඒ අතින් සලකන විට පොඩ්ඩි පිරිමියෙක් වසඟයට ගත හැකි අමුතුම ශක්තියක් ඇත්තියෙකි. මේ ඇසුරට දැන් මාස දෙකකට කිට්ටුය. පිරිමියෙක් විසින් ගැහැණියකගෙන් පතන දේ ඉල්ලන ප්‍රමාණයෙන් වැඩියෙන් දීමට ඇය දනී. අද ඔහු ඇගේ කායික සුන්දර බව මෙන්ම හදවතේ සුන්දර බවද හැඳින ඇත. දිවා ආහාරයෙන් පසු රංජිත් කෙටි නින්දක් ලැබුවේය. පිබිදෙනවිට ඇය තමා දෙස බලාගෙන සිටිනු රංජිත් දුටුවේය.

පොඩ්ඩිට තිබුනේ ලස්සන නිමාවකින් යුතු දේහයකි. ජීන්ස් ඩෙනිමක් අන්දවා යාමට ඔහුට සිතුනේ යාබද විලාසිතා නිවසේ සැරිසරද්දීය. ඔහු ඇය වෙනුවෙන් ජීන්ස් කලිසමක් මිලට ගත්තේය.

පොඩ්ඩි ඒ පිළිබඳව නම් කිසිදු කැමැත්තක් දැක්වූයේ නැත.

"බෑ බෑ" ඇය අතින් සංඥා කොට හෝටලයේ බිත්තියට හේත්තු වී දෑතින් මුහුණ වසා ගත්තාය. ඇත්තටම මේ මොහොතේදී වුවද ඇය ගැහැණියක් ලෙස දරන්නේ අවදානමකි. සතුටේ කොටස් කාරිය වුණා හැර තවත් ඉදිරි අනාගතයක් නැති බව පැහැදිලිවම දනී. ඔබට ඉස්කෝලෙ හාමිනේ ආදරේ ඇති. හිතේ තෙතමනය නොතිබුණු මගේ



හිතට ආදරේ හුරු කළේ ඔබයි. මම තියෙන ආදරේ කට ඇරල කියන්න බෑ. ඇය හඬමින් රංජිත්ගේ ළයෙහි හිස හොවා ගත්තා.

"එපා එපා" අනිත් අතට හැරී කොට්ටයේ හිස හොවා ගොළු බසින් කීවාය. මඳ වේලාවකට පසු ඇඳෙන් බැස යන හඬ ඔහුට ඇසුණි. පොඩ්ඩි කෙරෙහි සියුම් දුකක් පිවිසුනේ තනිවී සිටින විටය. ඉකුත් මාස දෙක මෙපරිද්දෙන් ගෙවී ගියේ තමා පොඩ්ඩි ගේ උණුසුමේ සිටි හෙයිනි. එසේ නොවන්නට මේ සිරගෙදර සිරවූ තමා පිස්සෙක් වන්නට හොඳටම ඉඩ තිබුණි. ඇය දැන් තමාගේ රුචි අරුචිකම් හඳුනන සතුටේ කොටස්කාරියක වී හමාරය.

දමිතා බොහෝ විට සයනයේ දීත් පසුවන්නේ ගණිත ගුරුවරියක් ලෙසිනි. රංජිත්ට අවශ්‍ය තමාට අවශ්‍යව තිබුනේ තම ගැනීමට හැකි සංවේදී ගැහැණියෙකි. එම සතුට රිසි ලෙස බෙදාගන්නවා හැර හොඳ තැන් නරක තැන් ලෙස වර්ගීකරණයක් නැත. ගොළු කෙල්ලගේ ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයක්ම ලැබුනේ එබැවිනි. සතුට වෙනුවෙන් මා විවෘතය. කිසිවෙක් ඇඳේ කොනේ ඉඳ කන් දෙකෙන් සොලවනවා දුනුත නිසා ඔහු හිස එසෙව්වේය. මේ කවිද ජීන්ස් ඩෙනිම ඇඳ ටීෂර්ටය දමා පාවහන් පැළඳ සිටි යුවතියගේ මුහුණේ තිබුණේ සැහැල්ලු සිනාවකි.

"ලස්සනයි" ඔහු හස්ත මුද්‍රාවෙන් කීවේය.

ඇය මුහුණ වසා බිත්තියට පිටදී සිනාසුනාය. ගොළු බව එක්තරා ආබාධයක් පමණි. එහෙත් සතුටට දොරගුළු දමා නැත.

රංජිත්, නැන්දම්මා බැලීමට රෝහලට ගියේ පොඩ්ඩි සමගිනි. ඇය වාට්ටුවෙන් පිටත නැබූ ඔහු වාට්ටුව තුළට ගියේය.

"දැන් කොහොමද අම්මෙ ඇගේ පෙෂර් එක බැහැලද?"

"හෙට දිහාට ඔපරේෂන් එක කරන්න පුළුවන් වෙයි කිව්වා."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"එහෙම නම් මම ගිහින් පොඩ්ඩි එක්කරගෙන එන්නද?"

"දොස්තර ගෙන් අහලා එක්කාගෙන එන්න. මේතන කැතට ඇඳලා හිටියම ලැජ්ජයි හංසිගේ ඇඳුම් ඇති ඒවයින් ඒකක් අඳින්න කියන්න."

"ඕක ප්‍රශ්නයක් නෙවේ. දැන් කොළඹ ඕනෑතරම් ලාබෙට ගවුම් තියෙන්නෙ මා එකක් අරන් යන්නම්"

ඔහු මවගෙන් සමුගෙන එළියට ආවේය. හැඳ සිටි ඇඳුම නිසා ඇගේ යොවුන් දේහය කැපී පෙනුනි. මුදා හැර තිබූ නිදහස් දිගු කෙස් කළඹ නිතඹත් පසුකර ගොස් තිබුණි. මේ සංචාරයේ හැම තැනකදීම ඇය කැපී පෙනෙන රුවැත්තියකව සිටියාය. උසට සරිලන සිහින් දේහයකින් යුත් ඈ හරියටම කැපුනේ රංජිත්ටය. යන හැම තැනකදීම මේ රුව දෙස කාගේත් අවධානය යොමුව තිබුණි. ඇය ගමන් කළේ රංජිත් ගේ අතේ එල්ලීය.

තවත් මෙවන් දිනයක් ජීවිතයේ කිසිදාක නො එළඹෙන බව රංජිත් දැන සිටියේය. තමාගේ හා දමිතා ගේ නෑදෑ



හිතවතුන් කොළඹ නගරාසන්න ව සිටින නිසා වැඩිපුර මෙහි ගැවසීම සුදුසු නැත. සිත් ඇද ගන්නා චර් වර්ණයත් නිල්වන් දෙනයන සිහිනිග පුළුලුකුල වශයෙන් වූ ස්ත්‍රී අංගපසංගයන්ගෙන් අනූන ඇය ඕනෑම විලාසිතාවකට හැඩය. එවැනි බාල ලියක වෙත සිත් සතන් ඇදීයාම පුදුමයක් නොවේ. වයස් පරතරය අතර සැඟෙන නොගැලපෙන බවක් තිබුනත් ඒවා පොඩ්ඩි ට ප්‍රශ්නයක්ව නොතිබුණි. ඇඳුමකින් එකවරම ගැහැණියක් වෙනස් කිරීමට නොහැකිය. කොපමන නැති බැරිකම් තිබුනත් ඇයට තිබුනේ කෙනෙකුට යටත් නොවන තෙදවත් ආඩම්බර ගැහැණුකමකි. ගෙදර වැඩ කටයුතුවලට උදව්වී බත් ටිකක් කැවත් වලව්වේ පවුලේ කිසි කෙනෙකුගේ නීති රීති පොඩ්ඩි මායිම කරන්නේ නැත. එනිසා දමිතා හා පොඩ්ඩි අතර සැඟෙන කලෙක සිට විරසක බවක් ඇත. එසේ වුවත් පොඩ්ඩි තම ජීවිතය, තම පිරිසිදුකම තමාට බාර දීමට පෙළඹුනේ ඇයි? ඇයගේ හැඳුනුම් පත දකින තෙක් ඇගේ නියම නම දැන සිටියේ නැත. කාන්තිනි ලෙව්කේ බණ්ඩාර වශයෙන් නම තිබුනත් ඇය අමතන්නේ පොඩ්ඩි නමිනි. තම බිරිඳ ගේ නම වන්නේද දමිතා ලෙව්කේ බණ්ඩාර වශයෙනි. මැය මෙහෙකාරකමට ගෙනා කෙල්ලක් නම් බිරිඳගේ වාසගම ඇයට ලැබුනේ කෙසේද? ඒවා මෙම ගොළු කෙල්ල ගෙන් විමසා දැනගත හැකි දේවල් නොවේ. ඇය පසුවුනේ අතිශයින් තෘප්තිමත් වූ ගැහැණියක් ලෙසිනි. මෙය අනවශ්‍ය දේවල් විමසා සතුට පලවා හැරිය යුතු වේලාවක් නොවේ.

දිවා ආහාරයෙන් පසු සැඳෑවනතෙක් මහු හෝටලයේ කාමරය තුළටවී සිටියේ තෘප්තිමත්ව බියකින් පසුවූ හෙයිනි. හමුදා

පොලීසියට අසුවුවහොත් දෙන දඬුවම ඔහු දනී. යම් කිසි විදිහකින් ගොළු කෙල්ල සමඟ මෙවැනි අනියම් සම්බන්ධකමක් පවත්වන බව බිරිඳ දැනගතහොත් ඒබව නැන්දම්මා දැනගතහොත් ? මෙවා පිළිබඳව දීර්ඝ ලෙස සිතීමට ඔහු අසතුටු වුණි.

මෙහි රැඳී සිටීමට ඇත්තේ තවත් එක් දිනකි. දැන් පෙරට වඩා ඔහුට ගොළු භාෂාව හුරුය. ගමන් බිමන් යනවාට වඩා ඇයට අවශ්‍ය ව ඇත්තේ ඔහුගේ උණුසුමේ සැතපී සිටීමටය. තමා වෙනුවෙන් මුදල් වියදම් නොකරන මෙන් ඉල්ලා ඇය බැගෑපත් වෙයි. ඇයට ලස්සනට අන්දවා ඇත සිට හැඩ වැඩ බැලීමට ඔහු කැමතිය. සැඳෑ ගමනට ඉස්තරම් ඇඳුමක් අරන් දීමට සූදානම් වුනත් ඇය එය තරයේ ප්‍රතික්ෂේප කළාය. හෝටලයට යාබද සාප්පුවෙන් ඇය තෝරා ගන්නේ එතරම් නොවටිනා ගවුමකි. සිහින් උස හැඩ ඇඟක් ඇති ඇයට රැපවුන්ඩ් සාය හා විස්කෝස් රෙද්දෙන් මසන ලද බ්ලවුසය සිත් ඇද ගන්නා පෙනුමක් ලඟා කළේය. බත් තැම්බීම, වළන් පිඟන් සේදීම දරුවන් වැදීම හා පෝෂණය කිරීම කටයුතු හැරුණු විට ගැහැණු ජීවිතය තුළ මෙතරම් සුන්දර බවක් ඇතැයි ඇය දැන සිටියේ නැත. ආදරය ස්නේහය කොතරම් පුළුල්ද? පිරිමියෙකුට දැක්විය හැකි ආදරය අසීමිතය. එහි කෙළවරක් දැකිය නොහැක. තමාට අයිති නැතිවුනත් තම සිතේ ඔහු වෙනුවෙන් බිහිවූ අසමාන වූ ආදරයක් ඇතැයි පොඩ්ඩිට සිතේ. ඔහු වෙනුවෙන් ජේවී සිටින්ට උණුසුමේ සැතපෙන්ට ඇත්තේ තවත් හෝරා කිපයකි. ඉන්පසු නැවතත් කටුක ජීවිතයට යාමට සිදුවනවා ඇත. නොදැනුවත්වම වාගේ ඇගේ දෙනෙත් කඳුළෙන් තෙත්ව ගියේය.



"අඬන්ට එපා" ඔහු මෘදු ලෙස ඇගේ දෙකම්මුල් සිප ගනිමින් කීවේය. ජීවිතය ගියත් ඔහු රිදවීමට පුළුවන්කමක් නැත. ඇය ආයාසයෙන් සිනාවක් නගා ගත්තාය. කොතරම් ඇඳුම් පැළඳුම් තිළිණ කළත් ඒවා නැවත මැණික්හින්නට ගෙනයාමට පුළුවන් කමක් නැත. වලව්වේ අයටත් වඩා කුපිත වන්නේ බණ්ඩියායි. මේ ඇඳුම් අඳින්නේ රංජිත් සතුටු කිරීමටය.

ඇය සූදානම්ව ඔහුගේ අතගෙන මහමඟට බැස්සාය. කුලී රියේ නැතිව පයින් මාවතේ ගමන් කරද්දී සතුටක් දැනේ. පාලම මත සිටින විට හමා එන සිසිල් සුළං මුහුණේ වදී. මේ කොච්චර සතුටුදායක ජීවිතයක්ද? හෝටලයේ දල්වෙන විදුලි පහන් වලින් මිදී එන සෞම්‍ය ආලෝකය ඇගේ මුහුණේ වදී, නුහුරු නුපුරුදු තැන්වල සැරි සරන්නේ බියෙනි. පන්සලේ බුදුගෙයි පොළවට අල්වන ලද කිරි ගරුඬ වලට වඩා හෝටල් බිම සිත්කළුය. රෙද්දක් පොරවා ගෙන සිටීමට තරම් සිසිල්ය. වලව්වේ හැම දෙනාම කෑම කා නිමවූ පසු මේස අස්කර මැටි කෝප්පයට බත් බෙදාගෙන කුස්සියේ හිරමනය මත හිඳගෙන බත් ගිලදමන ඇයට සිදුව ඇත්තේ මේසය මත ඉඳගෙන හැඳි ගෑරුප්පුවෙන් කෑමටය. තමාට සහාය වන පරිදි ඔහු අතින් කෑම ගැනීම නිසා සිතේ බිය නැතිවෙයි. රාත්‍රී ආහාරයෙන් පසු ඔව්හු හෝටලය වෙත ගියහ.

ඊළඟ දිනයේ සිට වෙන්වන්නට සිදුවන නිසා ඇය පසුවූයේ දුකින් යුතුවය. ඕනෑම දුකක් දරීමට ශක්තිමත්ව තිබූ සිත දැන් දුර්වලව ඇතැයි ඇයට හැඟේ. මුළු රාත්‍රියම ගත කළේ ඔහුගේ උණුසුමේය. පසුදින පොඩ්ඩි සාමාන්‍ය ගවුමකින් සැරසී රංජිත් සමඟ රෝහලට ගියේය. ශල්‍යකර්මය කර තිබූ නිසා පොඩ්ඩිට

ඉස්කෝලෙ හාමිනේ ළඟ සිටීමට සිදුවූයේ දිනකි. දමන ලද කාවය නිසා දෙනොත් පැහැදිලි වූයේ කොතරම් ඉක්මනින්ද? ප්‍රථමයෙන්ම ඉස්කෝලෙ හාමිනේ ළඟ සිටි රුවැත්තිය හඳුනා ගැනීමට ගත් උත්සාහය සාර්ථක වූයේ නැත.

කබල් චීත්තයක් හැඳ දිය මැස්ස ළඟ වලන් සෝදමින්, කුඩා කල සිට වසර 19 ක් බැල මෙහෙවරකම් කළ කෙල්ලද මේ.

"දූත් සනීපද?" පොඩ්ඩි ගොළු බසින් ඇසුවාය.

"සනීපයි"

ඇස් සුවපත් වූ පසු දුටුවේ සුභ දසුනකි. ඇය මෙසේ සිටිනු දකීමෙන් ඇගේ සිතට අමනාපයක් පිවිසුණේ නැත. පොඩ්ඩි වැරහැලි ඇඳ ආවාහම් එය තමාටද මදිකමකි. මෙතෙක් කල් මේ සුන්දර බව සැඟවී තිබුණේ කොහේද? මෙසේ සැරසී එන ලෙස කෙල්ලට උපදෙස් දෙන්ට ඇත්තේ රංජිත් ළමයා විසින් බව දනී.

"මගෙ ඇස් දෙක පෑදුවට මේ දරුවට පින් සිද්ධ වෙනවා."

"ඒවා මොනවද අම්මෙ. ඒවා අපේ යුතුකම්නෙ."

"තව හිටියොත් ඉස්පිරිතාලෙට ගෙවන්න වෙනවා. අපි යමු"

ඇය කීවේ ස්තුති පූර්වකය. දුව වුවත් දමිතා ගෙන් මෙතරම් උපකාරයක් ලෙහෙසියෙන් ලබා ගැනීමට නොපුළුවන.



## 22

දමිතා මේ දිනවල පසුවන්නේ දැඩි සිත් වේදනාවෙන් යුතුවය. දූත් සැමියා සිය ගමට ගොස් මාස දෙකකි. තවම රට රැකියාවට යාම සඳහා වීසා බලපත්‍ර ලැබී නැත. රංජිත් යාමට සිටින රටේ අභ්‍යන්තරික ප්‍රශ්නයක් නිසා තවම පත්වීම සහතික වී නැත. රංජිත්ගේ මව සතියකට වරක් දෙකක් පුතා පිළිබඳ විමසීමට එයි. ඇයට අවශ්‍ය පුතා නොව මුදල්ය. මාස දෙකකින් මුදල් නොලැබීම ඇය තරමක කෝපයට පත්ව සිටියාය.

ටියුෂන් පන්තියට යාම සඳහා උඩින් පල්ලෙන් කැම කමින් සිටියදී නැන්දම්මා ආවාය.

"දමිතා පොඩි මහත්තයා ගැන ආරන්චියක් නැද්ද?" තල්පෙ හාමිනේ සැටියේ කෙළවරක ඉඳගනිමින් ඇසුවාය.

"නෑ අම්මෙ මම දන්නෙ නෑ?"

දමිතා කෑම කා අත පිස දමා ගනිමින් කීවාය.

"යකඩො මේක හරි කතාවක්නෙ, හැංගිලා හිටියත් මිනිහ ඉන්න අහක් තමුන්ගෙ ගෑණිට කියන්නෙ නැද්ද?"

"මන්ද මට නම් කිව්වෙ නෑ" ඇය නොසැලකිලිමත්ව කීවාය.

"මේ හැංගිලා ඉන්න කාලෙට පඩි හම්බවෙන්නෙ නැද්ද?"

දමිතාගේ හිසට යකා නැග්ගේ ඉන් පසුවය.

"ඕගොල්ලන්ට දරුවා හිටියත් එකයි මැරිලා ගියත් එකයි. ඕනෑ සල්ලි විතරයි" හදවතේ වේගය පිටත පැන්නේ නොදනුවත්වමය.

"උඹයි මහ ඉස්කෝලෙ ගෑණියි එක්වෙලා ඉනා දීලා මගේ පුතා අල්ල ගත්තට උඹට ගෑණි වෙන්න කලින් ඒ මගෙ පුතා"

සාරිය ඉනේ ඇන ගනිමින් තල්පෙ හාමිනේ කීවාය. මෙ කල්ල ගැන ඕනෑම දෙයක් හිත රිදෙන්ට කියනවා. දෙනෙතේ කඳුළෙන් පිරීගියේ වේදනාව දරනු බැරිවය.

"කොලුවා ඉන්න තැන නොකිව්වොත් පොලිසියට කියනවා." තල්පෙ හාමිනේ කීවාය.

"පොලීසියෙ නෙමෙයි ඕනෑ කෙනෙකු කියා ගන්නවා. ගෙදරට සතයක වියදමක් දෙන්නෙ නෑ. හැම එකාම සූරා ගන්නවා. ඔය වාහන තියාගෙන බිස්නස් කරන එවුන් ඉන්නෙ. උන්ගෙ ඇඟේ එල්ලෙන්නෙ නැත්තෙ මොකද? කෝ එදා ගෙනිච්ච පොල් තෙල් පාන?"



"මේවා මගේ පුතාගෙ දේවල්. උඹ එනකොට ගෙනාපුව නෙමේ."

"හපොයි මගෙ කට... මේවා මගෙ අප්පච්චිලා දුන්න සල්ලි. මගෙ පඩියෙන් එක්කහු කරපු දේවලින් ගත්ත ඒවා. මට ගෙදරට හම්බ වෙන්නෙ හිස් පේ ශීට් එක විතරයි."

තරමක උස් හඬින් කතා කළේ වේදනාවෙන් යුතුවය. දරුවන් දෙදෙනා විමතියෙන් මෙන් උණුසුම් කතාවට සවන් දෙනු පෙනේ. තල්පෙ හාමිනේ අසුනෙන් නැගිට්ටේ කෝපයෙන් යුතුවය.

"මේ මඟුලම කරන්න ඕනැයි කියල නෑහුනා. හක්මන වාකිස්වලයි අහ හිටියෙ උපාධි ගුරුවරියෙක්."

"අම්මා මෙයා කියන්නෙ නැතිනම් අපි යමු. ඒවට ක්‍රම සහ විධි තියෙනවා."

හිච්චි මහත්තයා නිවසින් පිටතට බසිමින් කීවේය. ඔවුන් ගිය පසු දමිතාගේ හිතට පිවිසුනේ බිය මුසු වේදනාවකි. රංජිත් හැරෙන්ට එම පවුලේ ආශ්‍රය කළ හැකි අයෙක් නැත. ඔක්කොම කුඩු කේඩු හැත්ත. රංජිත් මැණික්හින්නේ සිටිනා බව පොලිසියට හෝ හමුදා පොලිසියට කිව්වොත් මේ ප්‍රශ්න තවත් උග්‍රවනු ඇත.

විභාගය කිට්ටු නිසා ගමට ගොස් ඒමට වේලාවක් නැත. දැන්නම් උගන්වා නිම කිරීමට බැරිතරම් සිසුන් ඇත. දැන් "දමිතා" යන නම වියුෂන් ලෝකයේ සෑහෙන්ට ප්‍රසිද්ධය.

ලොකු නංගිගෙන් උපකාරයක් පැතීමට සිතුවේ කළ යුතු වෙනත් විකල්ප මගක් නැති හෙයිනි. ඒ කැමෙත් පසු ඈ ලොකු නංගිට ලියුමක් ලිව්වාය.

ආදරණීය ලොකු නංගි,

ඔයාට ගුරුපත්වීම ලැබුණු එකට විෂ් කරන්නත් බැරිව ගියා. ඔයත් මා වගේ ගණිත ගුරුවරියක් වුනා නම් කොච්චර හොඳද කියල මට හිතෙනවා. දැන් ගුරු වැටුපත් හොඳා. මට දැන් උගන්වන්න බැරි තරම් ටියුෂන් ක්ලාසස් තියෙනවා. අපේ ටීචර්ස්ලා දැන් පුදුම විදිහට හම්බ කරන්නෙ. වොයිලට් යන වෙලාව හැරුනාම හැම වෙලාවෙම ටියුෂන්. දවල්ට උගන්වමින් බනිස් ගෙඩියක් කාල කොකා කෝලා එකක් බොනවා. ඒ තරම් වෙලා නෑ.

සෞන්දර්ය විෂය තෝරා ගත්ත එකේ පාඩුව ඔයාට පස්සෙ තේරෙයි. සරල ශාස්ත්‍රීය, රාගධාරී සංගීතය ඉගෙන ගත්ත කෙනෙකුට හොඳ කාර් එකක් ගන්න පුළුවන්ද? එක්කො පොප් මියුසික් කරන්න ඕනෑ. දැන් ඉන්න අලුත් කොල්ලො හරි දස්සයි. නාඩගම් ගී කොච්චර කල් තිබුණද? බලන්න සිරිසඟබෝ නාට්‍ය සින්දුව කොච්චර ලස්සනට හදලද? 'සිරිසඟබෝධි රාජ මාළිගාවෙ' කියන සින්දුවට කොල්ලො කෙල්ලො නටනවා. ඔයත් අපේ රංජිත් වගේ මෝඩයි.

අනේ ලොකු නංගි, රංජිත්ගෙ අම්මයි අර හිච්චි මහත්තයා කියන එකයි ඇවිදින් මා එක්ක රණ්ඩු වෙලා ගියා. ඒ මහ ගෑණිට ලොකු තමුන්ගෙ දරුවා නෙමේ. මාව කැන්දාගෙන යන්න මැණික්හින්නට ආපු දවසෙත් අපිට ලැජ්ජා කළා. අයියා දැන් ඇවිදින් මාස දෙකක් ගියාට පත්වීම ස්ථිරයි කියන්න. සමහරවිට ඔය හිච්චි මහත්තයා කියන එකා වලව්වට එන්න ඉඩ තියෙනව අයියව හොයන්න. ගේ ඇතුළට ගන්න එපා. අයියට ගෙයින් පිට වෙන්න එපා කියන්න."

## 14



හංසිනිට අක්කා විසින් එවන ලද ලිපිය ලැබුනේ නවාතැනේ ලිපිනයටය.

ඇය ලිපිය කියෙව්වේ දුකින් යුතුවය. අක්කා මේ හැම කරන්නේ පවුලේ දියුණුව වෙනුවෙනි. එහෙත් ඇය කියන හැම දෙයක්ම පිළිගත නොහැක.

ඉකුත් දශක දෙක තුළ සෞන්දර්ය කලාව විනාශ මුඛයට පත්ව ඇති හැටි අයට නොපෙනේ. උඩරට, පහතරට, සබරගමු නැටුම් සම්ප්‍රදායන් විකෘති කරමින් කරන විනාශය දැරිය නොහැක. අපේ යැයි කීමට ඉතිරිව තිබෙන නැටුම් බයිලා වේදිකාවල ප්‍රදර්ශනය කිරීමට රූපවාහිනි බලධාරීන් සහාය දෙති. අක්කා පැවසූ පරිදි අද අපගේ නාඩගම් සම්ප්‍රදායනට ද කන කොකා වැද ඇත. පැරණි ගීත විකෘති කරන්නෙකුට පිරිතට සංගීතය සැපයීම පන්සිල් වලට ඩාන්ස් කිරීමට ඉඩදීම වැනි ඊනියා නිදහස අර්ථ විග්‍රහ කිරීමට පුළුවන. සල්ලි නැතිවෙන්න පුළුවන්. මා මේ සුන්දර කලාවට කැමතියි.

හංසිනි ඊළඟ සති අන්තයේ නිවසට ගියාය. නිවසට යනවිට තරමක් රෑ බෝ වී තිබුණ නිසා ඇයට රංජිත් අයියා සමග කතා කිරීමට ලැබුනේ නැත. තමා නිවසේ නැති කාලය තුළ අම්මා කොළඹ ගෙනගොස් ශල්‍යකර්මයක් කළ බව දැනගත් පසු රංජිත් කෙරෙහි ඇතිවූයේ දැඩි ගෞරවයකි. ඔහු ඇත්තටම සුවිශේෂ අදහස් ඇති පුද්ගලයෙකි. තමා ගේ ගෙලේ දෙවරක් බැඳි මාලය අක්කා රැගෙන යාම නිසා ඔහු පසුවූයේ අසතුටින් යුතුවය.

ඇය පසුදින පිබිදුනේ කිසිවෙක් පැමිණ සිය හිස පිරිමදිනු දැනීමෙනි. "පොඩ්ඩී" ඇය පොඩ්ඩිගේ අතින් අල්වා ගත්තාය. නොදුටු සතිය තුළ ඇය තවත් සුන්දරම වැඩී සිටියාය.

මුහුණ සෝදා ගත් හංසිනි කිරි වීදුරුව පානය කර නිවසින් පිටත බැස්සාය. වටපිටාවේ අමුතු ශ්‍රියාවක් පැතිර ඇත. රංජිත් අයියා ඉන්දවන ලද බීජවල අංකුර මතුව තිබුණි. මල්ගස් මලින් බරව ගොස්ය. පොඩ්ඩි වෙනදාට වඩා සුන්දරය. මුහුණේ අමුතු ශ්‍රියාවක් පැතිර ඇත. සුවඳක් ගොළු බසින් විමසමින් සිටි ඈ එකවරම හබරල ගාල දෙසට ගොස් ඔක්කාර කරන හඬ ඇසුණි. මේ අහිංසකි පිළිබඳ දැඩි දුකක් හැමදාම හංසිනිගේ සිතේ ඇත. කුස්සිය දෙස සිට එන අම්මා ඇගේ නෙත ගැටුණි.

"ඇයි අම්මා කෙල්ල වමනෙ දාන්නෙ? අසනීපයෙන්ද?"

අම්මාගේ මුහුණේ සිහින් සිනාවක් පැතිර යනු හංසිනි දුටුවාය. ඇය එකවරම පිළිතුරක් දුන්නේ නැත. හංසිනි සෙමින් සෙමින් පොඩ්ඩි සිටින දෙසට ගියාය. මීට පෙර මිදුලේ වැවී තිබුණු කටු පඳුරු අද නැත. රංජිත් අයියා යෝධයෙක් මෙන් නැවුම් පස කොටා පොළව අනිත් අතට හරවා ඇත. ඔහු විසින් ඉන්දවන ලද බීජයන්හි අංකුරවලට හානි නොවන පරිදි ගිය හංසිනි ඇගේ දෙවුරෙන් අල්වා ගත්තාය.

"ඇයි ඇයි වමනෙ දාන්නෙ. අසනීපයක්ද?"

"අසනීපයක් නෙවේ කෙල්ල අම්මා කෙනෙක් වෙන්න යනවා" අම්මා කීවාය.

පිළිතුරක් නොදුන් හංසිනි ඇගේ හිස අත ගෑවාය. මේ ගැහැණියකගේ පැතුම් මල්පල ගැණුන අවස්ථාවකි. විශේෂයෙන් ඉස්කෝලෙ හාමිනේ සතුටුවූයේ තම ගැහැණු දරුවෙකුට ඒ සම්පත ලැබූ අවස්ථාවේදී මෙනි. මේ දරුවා තමාට ලැබුනේ කෙසේදැයි ඉස්කෝලෙ හාමිනේ දනී. පිටස්තර ගැහැණියකගේ ගැහැණු දරුවෙක් හදාගන්නා ලෙස පවසන්නේ ඇයි දැයි ඇය



කිසි දිනෙක සැමියාගෙන් විමසුවේ නැත. පළාතේ දත උගත් පුද්ගලයෙක් ව සිටි සැමියා අතින් සිදුවූ වරද පශ්චාත් පරීක්ෂණයත් කර පවුල කඩා බිඳ විසිරීමට ඇයට සිතුනේ නැත. අනිත් සාමාන්‍ය ගැහැණියක් නොකරන ලද කැපකිරීම නිසා සියළුම රහස් කාලයාගේ වැලි තලාවෙන් වැසී ගියේය. දැන් මේ පෞද්ගලික රහස පවසා මිය ගිය ඇත්තෙකුට හානි කිරීමටද අවශ්‍ය නැත. මේවා දරුවන්ට නොකිය යුතු රහස්ය. පවුලේ අනිත් ගැහැණු ළමුන්ට වඩා ගොළු කෙල්ල ලස්සන වීමෙ රහසද දැන සිටියේ ඉස්කෝලෙ හාමිනේ පමණි.

"ඇත්තමයි අම්මා අපි මේ කෙල්ලව ආදරෙන් බලා ගන්න ඕනෑ"

ඉස්කෝලෙ හාමිනේ කිසිවක් පැවසුවේ නැත. සමහර විට මේ එකම හැඟීම් ඇතිවන්නේ එකම පියෙකුගේ දරුවන් නිසා විය හැක. හංසිනිට රංජිත් අයියා මුණ ගැසුනේ උදේ තේ පානය කිරීමට පැමිණි විටය. ඔහුගේ සුපුරුදු දඟකාරකම් පහව් ඇති සේය. ඇතැම්විට එසේ සිදුවන්නේ මාස දෙකක් මේ නිවසේ සිරව සිටීම නිසා විය හැක. අක්කා ගේ ලිපිය පිළිබඳව ඔවුහු දීර්ඝ ලෙස සාකච්ඡා කළහ. අක්කාගේ ස්ථාවරයේ රැඳී සිටීමට එතරම් කැමැත්තක් ඔහුගේ නොතිබුණු බැව් ඇයට හැඟිණි.

පසුදින යළි විද්‍යාලයට ගියේ තරමක සතුටින් යුතුවය. සිතේ කරදර බොහෝ දුරට තුනීවී තිබුණි. අම්මාගේ සුවපත්වීම නිසා ඇගේ සිතේ ඇතිවූයේ සතුටකි.

මිතුරියගේ නිවසේ සිටීමට ලැබෙන්නේ කෙටි කාලයකි. පුහුණු පාඨමාලාව නිමවනතෙක් නිවාඩු ලැබෙන්නේ නැත. අක්කාට ලිපිය ලිවීමට දින දෙකක් ගතවුණි. ලිපිය තැපැල්

කිරීමට ගියේ තනිවය. රංජිත් අයියා සරල ජීවිතයක් ප්‍රිය කරන්නෙකි. සෞන්දර්යයට කැමතිය. වෘත්තිය ලෙස හමුදා නිලධාරියෙක් ලෙස සේවය කළද ඔහුට ඇත්තේ උණුවන හදවතකි. තමා අද මේ ක්‍රියාව කරන්නේ ඔහු පිහිටවූ හෙයිනි. රංජිත් අය්යා පිළිබඳව සිහිකරමින් යද්දී පෞද්ගලික රෝහලක සිට එළියට එන දෙදෙනා දැකීමෙන් ඈ තිගැස්සී සිටියාය. ලා දම්පාට ඔසරියකින් සැරසී සිටි පොඩ්ඩි රංජිත් අයියාගේ අතේ එල්ලී එනු දුටු හංසිනි මාවත අසලවූ කඩයකට පිවිස ඔවුන් මඟ හැරියාය. දෙයියනේ.... මේ සිදුව ඇත්තේ කුමක්ද? පොඩ්ඩිගේ මුහුණේ පැතිර තිබුනේ ප්‍රසන්න සිනාවකි. කුසේ සිටින දරුවාගේ පියා කව්දැයි ඇගෙන් විමසිය යුතු නැත. තමා නිවසේ සිටියා නම් මෙවන් දෙයක් කිසිසේත් සිදුවන්නේ නැත.

චීත්තයක් හැඳ සිටිනවාට වඩා ඔසරියක් හැඳ සිටින විට ඇගේ රුව කැපී පෙනෙයි. බණ්ඩියා වැනි නිවට පිරිමියෙකුට කිසිදාක මෙවන් කටයුත්තක් කළ නොහැක. කිසිම බියක්, කොන්දේසියක් නැතිව ඇය රංජිත් අයියාට සිය ජීවිතය බාර දෙන්ට ඇත.

හංසිනි ආපසු හැරී නේවාසිකාගාරයට ගියේ තවත් ඉදිරියට යාමට ශක්තියක් නැති හෙයිනි. අක්කාගේ පවුල් ජීවිතය දෙදරා නොයැතැයි කිව නොහැක. ගොළු ගැහැණියක් වුවද ඇයට තිබුනේ ඕනෑම පිරිමියෙක් මෙල්ලකර ගත හැකි අනුරාගයෙන් පිරුණු සිරුරකි. අයියා දරුවන් දෙදෙනා අතැර පොඩ්ඩි හා ජීවත් වෙයිද? තරුණ කතක් උන්මාදයට පත් කරන ජීවි පිරිමිකමට ඇයද උමතුවන්ට ඇත.

ඈය රාත්‍රී ආහාරයවත් ගත්තේ නැත. අක්කාට කරදරයක් නොවේතැයි කිසිසේත් කිව නොහැක. මේ පාපයේ වගකීම



"පොඩ්ඩි අහංකාරයි. ඒවා දෙන්න යන්න එපා. ඔයා ඇඳලා අහකදාන ඒවා ගන්න එකක් නෑ" හංසිනී කීවාය.

ඔවුනතර නිහඬ බවක් ඇතිවූණි. පොඩ්ඩි නිවස අසලින් ගියේ යන්තමින් සිනාවක් මුවග නගාගෙනය.

"දැක්කද අම්මා මෙයාගෙ අහංකාරකම. මා දිහා බැලුවෙවත් නෑ." දමිතා අමනාපයෙන් කීවාය.

"ඉස්කෝලෙ හාමිනේ මම මෙයාත් එක්ක ඉස්පිරිතාලෙට ගිහින් එන්නම්" බණ්ඩියා ඔවුන්ගෙන් සමුගනිමින් කීවේය.

දමිතා දැඩි උනන්දුවකින් බලාපොරොත්තුව සිටියේ සැමියාගේ හමුවීමය. ඉකුත් හමුවීමේදී තමා අතින් මඟ හැරී ගිය රංජිත්ගේ අවශ්‍යතා අද කෙසේ හෝ ලබාදිය යුතුය. මෙට රංජිත් ලංකාවෙන් ගිය පසු වසර දෙක තුනකට ඔහු හා සැතපීමට ලැබෙන්නේ නැත. තට්ටු දෙකේ නිවසක් සදා ඩීසල් වාහනයක් ගෙන හොඳ ජීවිතයක් ගත කිරීමට පුළුවන් වනු ඇත. දරුවන් දෙදෙනා මිතුරියකගේ නිවසේ දමා ආවේ රංජිත්ට ඇති තරම් ප්‍රීතිවීමට ඉඩදීම සඳහාය.

"අම්මා කෝ රංජි තවම නිදිද?"

අම්මා එක්වරම පිළිතුරු නොදුන් නිසා දමිතා වත්ත දෙස බැලුවාය.

"එහෙනම් වත්තෙ වැඩ ඇති"

ඉස්කෝලෙ හාමිනේ නිහඬව ලොකු දුවගේ උරමත අත තැබුවාය.

"රංජිත් ළමයා පෙරේදා උදේ හමුදාවට ගියා"

"අම්මට කිව්වනෙ යවන්න එපා කියලා මම විකට්, වීසා ඔක්කොම අරන් ආවෙ හෙට රෑටයි එයාට යන්න තියෙන්නෙ."

"හමුදාව අතැර ගිය අයට ආපහු බැදෙන්න සමා කාලයක් දුන්න කියලා රංජිත් ළමයා හමුදාවට බැදෙන්න ගියා. දුවට ලියුමක් එවන්නම් කිව්වා."

දමිතා නිහඬව පොළවේ දණ ගසා ගත්තේ සියළු උත්සාහයන් බිඳුණු නිසාය. හංසිනි කඳුළු පිරි දෙනෙතින් යුතුව සොයුරිය අසල දණ ගසා ගත්තාය.

"අඬන්ට එපා අක්කෙ."

ඇය සොයුරියගේ හිස පිරිමැද්දේ දුවී දුකින් යුතුවය. කිව යුතු බොහෝ දේ ඇත. එසේම ඉදිරි අනාගතයේ උද්ගත විය හැකි ප්‍රශ්න වල ස්වරූපය පිළිබඳව අනාගත වාක්‍ය පැවසීමට පුළුවන් කමක්ද නැත. රංජිත් අයියා මණ්ඩියා වැනි නිවටයෙකුට තම ලෙයින් උපන් දරුවා දෙයිද? මණ්ඩියාගේ මුහුණේ නාතරව තිබූ නිවට සිනාවෙහි සිය සුජාත භාවය පිළිබඳ ප්‍රශ්නයක් ඇති බවක් පෙනෙන්ට නොතිබුණි.

හංසිනීගේ සිතේ ඇත්තේ කවදාවත් හෙළි කළ නොහැකි රහසකි. මේ හැම දෙයක්ම බාර දිය යුත්තේ අනාගතයටය.

"වෙන්න තියෙන දෙයක් කවදාවත් අපට වෙන පැත්තකට හරවන්න බෑ. නාඩා ඉන්න"

හංසිනි පහත් හඬින් කීවාය. අක්කාගේ අහිංසක මුහුණේ මහා බියකරු වේදනාවක් තැන්පත්ව තිබුණි.

නැවත හමුවෙමු

kathapothak.blogspot.com



# ප්‍රථම හිරු

## එඩ්වඩ් මල්ලවආරච්චි

මුදුන් වූ සඳ එළිය සුදු දිය දහරක් ලෙසින් බිමට පතිතවෙමින් තිබුණි. සඳ දිය මෙන්ම අඳුර, ගස්වැල්, සුලඟ, නිශාචරයන්ගේ කෙඳිරිලි නාද ස්වභාවයේ දායාදයන්ය. මේ මනුෂ්‍යයන් වන අපද ස්වභාවයට අයිති සමාජ සත්ත්වයන්ය.

ISBN-955-96175-8-3

200/-

මල්ලවආරච්චි ප්‍රකාශකයෝ

200, කොස්වත්ත, තලංගම, දුරකථනය: 2788186